321 වන කාණ්ඩය - 12 වන කලාපය
தொகுதி 321 - இல. 12
Volume 321 - No. 12

2025 ඔක්තෝබර් 10 වන සිකුරාදා
2025 ஒக்ரோபர் 10, வெள்ளிக்கிழமை
Friday, 10th October, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

ගරු දයාසිරි ජයසේකර මහතා විසින් 2025.10.07 දින මතු කරන ලද වරප්‍රසාද ප්‍රශ්නය සම්බන්ධයෙන් තීන්දුව [තීරුව 1937]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 1939]

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා** [තීරුව 1942]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1944-1985]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන අංශවල ගැටලු විසඳීම සඳහා රජයේ වැඩ පිළිවෙළ [තීරුව 1985]

මැණික් කර්මාන්තය අපනයන ඉලක්කගත කර්මාන්තයක් බවට පත් කිරීම [තීරුව 1988]

**වරප්‍රසාද යෝජනා:**

2025.05.28 දින "අද" පුවත් පත් වාර්තාව [තීරුව 1995]

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා:**

රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම [තීරුව 1998]

පිටිගල, උඩුගම, නෙළුව, සහ දෙනියාය නගර අයත් පරිසර පද්ධතිය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම [තීරුව 2018]

පාසල් විෂය මාලාවට නීතිය සහ ආචාර ධර්ම ඇතුළත් කිරීම [තීරුව 2031]

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම [තීරුව 2045]

ගොවි ජනතාව වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීම [තීරුව 2060]

**කල් තැබීමේ යෝජනාව:**

ජාතික පොලිස් කොමිෂන් සභාවේ ස්වාධීනත්වය තහවුරු කිරීම [තීරු 2072-2120]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

மாண்புமிகு தயாசிறி ஜயசேக்கர அவர்களால் 2025.10.07ஆம் திகதி எழுப்பப்பட்ட சிறப்புரிமைக் கேள்வி தொடர்பான தீர்மானம் [ப: 1937]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 1939]

**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்** [ப: 1942]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1944-1985]

**தனி அறிவித்தல் மூல வினா:**

கல்வி மற்றும் உயர் கல்வித் துறைகளிலுள்ள பிரச்சினைகளைத் தீர்ப்பதற்கான அரசாங்கத்தின் முன்முயற்சி [ப: 1985]

இரத்தினக்கல் கைத்தொழில்துறையை ஏற்றுமதி சார்ந்த துறையாக மாற்றுதல் [ப:1988]

**சிறப்புரிமைப் பிரேரணைகள்:**

2025.05.28ஆந் திகதிய “அத” பத்திரிகை அறிக்கை [ப: 1995]

**தனிநபர் பிரேரணைகள்:**

ருவன்புர அதிவேக நெடுஞ்சாலையின் நிர்மாணப் பணிகளைத் தொடர்ந்து முன்னெடுத்துச் செல்லல் [ப: 1998]

பிட்டிகல, உடுகம, நெலுவை மற்றும் தெனியாய ஆகிய நகரங்கள் அமைந்துள்ள சூழல் கட்டமைப்பைச் சுற்றுலா வலயமாகப் பிரகடனப்படுத்தல் [ப: 2018]

பாடசாலைக் கலைத்திட்டத்தில் சட்டம் மற்றும் ஒழுக்கவியல் விடயதானங்களை உள்ளடக்குதல் [ப: 2031]

தேசிய மருந்துகள் தர உத்தரவாத ஆய்வுகூடத்தை உரிய முறையில் தொழிற்படவைப்பதற்கான வேலைத்திட்டமொன்றைத் தயாரித்தல் [ப: 2045]

விவசாயிகளுக்கான காப்புறுதித் திட்டமொன்றை ஆரம்பித்தல் [ப: 2060]

**ஒத்திவைப்புப் பிரேரணை:**

தேசிய பொலிஸ் ஆணைக்குழுவின் சுயாதீனத் தன்மையை உறுதிப்படுத்தல் [ப: 2072-2120]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Ruling on Question of Privilege Raised by Hon. Dayasiri Jayasekara on 07.10.2025 [Col. 1937]

AUDITOR-GENERAL'S REPORT [Col. 1939]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 1942]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1944-1985]

QUESTION BY PRIVATE NOTICE:

Government Initiative to Resolve Issues in Education and Higher Education Sectors [Col. 1985]

Transformation of Gem Industry to an Export-oriented Industry [Col. 1988]

PRIVILEGE MOTIONS:

News Report in "Ada" Newspaper of 28.05.2025 [Col. 1995]

PRIVATE MEMBERS' MOTIONS:

Continuing the Construction Work of Ruwanpura Expressway [Col. 1998]

Designation of the Ecosystem Comprising the Towns of Pitigala, Udugama, Neluwa and Deniyaya as a Tourist Zone [Col. 2018]

Integrating Law and Ethics to the School Curriculum [Col. 2031]

Formulating a Programme for the Proper Functioning of the National Drug Quality Assurance Laboratory [Col. 2045]

Initiation of an Insurance Scheme for the Farming Community [Col. 2060]

ADJOURNMENT MOTION:

Upholding Independence of National Police Commission [2072-2120]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 ඔක්තෝබර් 10 වන සිකුරාදා***
*2025 ஒக்ரோபர் 10, வெள்ளிக்கிழமை*
*Friday, 10th October, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,

MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### ගරු දයාසිරි ජයසේකර මහතා විසින් 2025.10.07 දින මතු කරන ලද වරප්‍රසාද ප්‍රශ්නය සම්බන්ධයෙන් තීන්දුව
### மாண்புமிகு தயாசிறி ஜயசேக்கர அவர்களால் 2025.10.07ஆம் திகதி எழுப்பப்பட்ட சிறப்புரிமைக் கேள்வி தொடர்பான தீர்மானம்
### RULING ON QUESTION OF PRIVILEGE RAISED BY HON. DAYASIRI JAYASEKARA ON 07.10.2025

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Members, I wish to deliver my Ruling on the matter of Privilege raised by the Hon. Dayasiri Jayasekara, Member of Parliament, on the 07th of October, 2025, as the issue raised concerns the Privileges of Parliament as a whole in terms of Standing Order No. 29(1) of Parliament. The Hon. Member alleged that the Leader of the House had misled the Constitutional Council during the process of nominating a candidate to the post of Director General of the Commission to Investigate Allegations of Bribery or Corruption -CIABOC- on 24th October, 2024, thereby committing a breach of Privilege under Section 4 of Schedule A to the Parliament (Powers and Privileges) Act. The Hon. Member, therefore, requested that the matter be referred to the Committee on Parliamentary Privileges for investigation.

Having carefully considered the matter, I now proceed to give my Ruling.

**Nature of the Constitutional Council**

The first issue that requires determination is whether the Constitutional Council - CC - is a Committee of Parliament, so as to attract the application of the provisions of the Parliament (Powers and Privileges) Act.

Under Article 41A of the Constitution, the Constitutional Council is established as a distinct and independent constitutional body. It consists of the Prime Minister, the Speaker, the Leader of the Opposition, one Member of Parliament nominated by the President and several other Members who are either *ex officio,* from the civil society or appointed by the President on the nomination of the Prime Minister and the Leader of the Opposition.

It is thus not a Parliamentary Committee established under the Standing Orders of Parliament. The Constitutional Council functions under the Constitution itself and not under the authority of Parliament or its Standing Orders. Therefore, any proceedings or decisions of the Constitutional Council cannot be regarded as proceedings of Parliament or of a Committee of Parliament within the meaning of the Parliament (Powers and Privileges) Act.

**Applicability of Section 4 of Schedule A to the Parliament (Powers and Privileges) Act**

Section 4 of Schedule A to the Parliament (Powers and Privileges) Act provides for offences in relation to the misleading of Parliament or a Committee of Parliament. Since, as I have already stated, the Constitutional Council is not a Committee of Parliament, the said provision does not apply to the acts or deliberations of the Constitutional Council.

Accordingly, even if it is alleged that a Member of Parliament made an incorrect or misleading statement before the Constitutional Council, such conduct would not fall within the ambit of a breach of Parliamentary Privilege as contemplated by Section 4 of Schedule A of the said Act.

**Finality of Decisions of the Constitutional Council**

Furthermore, Article 41J of the Constitution explicitly provides that the decisions of the Constitutional Council are final and conclusive, and shall not be called in question in any court or tribunal, except by way of an application made to the Supreme Court under Article 126 of the Constitution alleging a violation of fundamental rights.

I am informed that, in relation to the said appointment, three Fundamental Rights applications were indeed filed before the Supreme Court, naming the Members of the Constitutional Council as Respondents. It is also noted that those applications had subsequently been withdrawn by the Petitioners without proceeding further.

This confirms that the proper constitutional mechanism to challenge the decision of the Constitutional Council lies before the Supreme Court, not within the forum of Parliament.

[ගරු කථානායකතුමා]

**Ruling**

In view of the foregoing, I am of the considered opinion that:

1. The Constitutional Council is not a Committee of Parliament but a distinct body established under Article 41A of the Constitution.
2. The provisions of Section 4 of Schedule A to the Parliament (Powers and Privileges) Act are, therefore, inapplicable to its proceedings.
3. The allegation made by the Hon. Member does not disclose any matter of breach of Parliamentary Privilege.
4. Any grievance or challenge concerning the decisions of the Constitutional Council must be pursued only through the constitutional remedy available under Article 126 of the Constitution.

Accordingly, I rule that no Question of Privilege arises in this matter and hence, the issue raised by the Hon. Dayasiri Jayasekara, Member of Parliament, will not be referred to the Committee on Ethics and Privileges.

## II

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2025 ඔක්තෝබර් 10 සිකුරාදා, එනම් අද දින මධ්‍යාහ්න 12.00ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලුදෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

## A

## I

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ X, XI, XII, XIII, XIV හා XV කොටස්, සිව්වැනි කාණ්ඩයේ V කොටස සහ හයවැනි කාණ්ඩයේ I, II, III හා IV කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය" යි මමයෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## II

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දසවැනි කාණ්ඩයේ -

- ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මාර්ගගත වීසා නිකුත් කිරීමේ ක්‍රමවේදය පිළිබඳ විශේෂ විගණන වාර්තාව;
- සේවය හැරගිය රජයේ වෛද්‍ය නිලධාරින්ගෙන් රජයට අයවිය යුතු හිඟ මුදල් හා විදෙස් පුහුණුව ලද විශේෂඥ වෛද්‍ය නිලධාරින් අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාව; සහ
- 2022 හා 2023 වර්ෂවල ඖෂධ අවශ්‍යතාව, ප්‍රසම්පාදනය, සැපයුම, බෙදාහැරීම හා නියාමනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව (දෙවැනි කොටස) මම ඉදිරිපත් කරමි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තා මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## B

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXIII කොටස;
- 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXVI කොටස;

- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLVIII කොටස; සහ
- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ VIII, XII, XIII, XIV හා XV කොටස්, තෙවැනි කාණ්ඩයේ X, XI, XII හා XIII කොටස් සහ නවවැනි කාණ්ඩයේ VI හා VII කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තා මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)

ගරු කථානායකතුමනි, කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2023 වර්ෂය සඳහා මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iii) 2022 වර්ෂය සඳහා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iv) 2022 වර්ෂය සඳහා සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තාව; සහ

(v) 2023 වර්ෂය සඳහා ශ්‍රම වාසනා අරමුදලේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) රත්ගම, රණපනාදෙනිය, රන්සිරි උයන යන ලිපිනයෙහි පදිංචි ඩී.එච්. තිලක් දේශප්‍රිය මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) පිටිවැල්ල, ධීවර නිවාස, ඔරොප්පු වත්ත, අංක 13 යන ලිපිනයෙහි පදිංචි නිපුල් වඩුගේ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) තල්පේ, කන්දෙවත්ත, හීනටිගල දකුණ යන ලිපිනයෙහි පදිංචි යූ.කේ. විජේසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, වාද්දුව, දකුණු තල්පිටිය, දළදා වත්ත පටුමග, අංක 19/3 E යන ලිපිනයෙහි පදිංචි චන්ද්‍රිකා ද සිල්වා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
ගරු කථානායකතුමනි, දොඩම්ගස්ලන්ද, ලිහිණිවැහැර ජනපදය යන ලිපිනයෙහි පදිංචි පී.ඒ. ලලිත් ෆ්‍රැන්සිස් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බී. ආරියවංශ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) වාද්දුව,පොතුපිටිය උතුර, රවුම් පාර, අංක 15 යන ලිපිනයෙහි පදිංචි ජේ.එච්. ගාමිණී කීර්තිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කොළඹ 10, මරදාන, පොලිස් නිවාස, අංක 12 එච් යන ලිපිනයෙහි පදිංචි නදීප් කාවින්ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ඊ.එම්. බස්නායක මහතා**
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)
ගරු කථානායකතුමනි, උඩතලවින්න, ගලදෙනිය මඩිගේ, අංක 13 යන ලිපිනයෙහි පදිංචි ජේ. ජමාල්ඩීන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) වලල්ලාවිට, මගුරුමස්විල, පාසල් මාවත යන ලිපිනයෙහි පදිංචි ඒ.එම්. බේබි නෝනා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) බදුරලිය, හැඩිගල්ල ජනපදය යන ලිපිනයෙහි පදිංචි බී.එල්. අභයපාල මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) පැලවත්ත, ගල්ලෙන මුල්ල, අංක 46 යන ලිපිනයෙහි පදිංචි කේ.ටී. පියසේන මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු කංචන වැලිපිටිය මහතා**
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)
ගරු කථානායකතුමනි, මාවනැල්ල, දෙහිමඩුව, අම්බුලුගල පාර, අංක සී/174 යන ලිපිනයෙහි පදිංචි කේ. ජයන්ත කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -116/2024- (2), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට රීති ප්‍රශ්නයක් අහන්න තිබෙනවා, ස්ථාවර නියෝග 23 (3), ස්ථාවර නියෝග 24 සහ ස්ථාවර නියෝග 40ට අදාළව. ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23 (3) අනුව අද දවස විපක්ෂයේ දවස. ඒ වාගේම ස්ථාවර නියෝග 24 කියන්නේ, පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ යෝජනා. ඒකත් අපේ දවස. නමුත්, අද අපේ පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ යෝජනාවලට වෙන් වෙලා තිබෙන කාලය සීමා කර තිබෙනවා. ඒක එහෙම වෙන්න බැහැ.

එතකොට, ස්ථාවර නියෝග 23 (3)හි සඳහන් වන මේ දිනය පිළිබඳ පක්ෂ නායක රැස්වීමේදී කථා කරලා තීන්දුව ගන්න එක හොඳයි. නමුත්, මම මේ රීති ප්‍රකාරව කියන්නේ, ගරු කථානායකතුමනි. එක්කෝ අද මුළු දවසම විපක්ෂයට දෙන්න, කල් තැබීමේ යෝජනාවට ගන්න. ඒකත් විපක්ෂයේ යෝජනාවක් තමයි. හැබැයි, ඉතිහාසයේ කවදාවත් පෞද්ගලික මන්ත්‍රී වරයන්ගේ යෝජනාවලට කාලය අඩු කිරීමක් සිදු වුණේ නැහැ. ඒ කාලය අඩු කිරීම වෙනුවෙන්,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේක Parliamentary Business Committee එකේදි කථා කර තීරණය කරපු කාරණාවක්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව දෙන්න, තව කාරණයක් ඉදිරිපත් කරන්න තිබෙනවා. මට ස්ථාවර නියෝග 40 (2) ගැන කියන්න බැරි වුණා. ඒ නිසා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. අද දින මගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉදිරිපත් කිරීමට නියමිතව තිබෙනවා. එම යෝජනාව අද දින ගන්නේ නැතුව වෙනත් දිනයක ඉදිරිපත් කිරීමට මට ඔබතුමා අවස්ථාව ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ස්ථාවර නියෝග 40 (2) කියවන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ස්ථාවර නියෝග 40 (2)හි තිබෙන්නේ ලිඛිතව පවරන්න කියලා. නමුත්, මම ඔබතුමාගෙන් ඉල්ලනවා, මට ඒ සඳහා පැය භාගයක කාලය මදි නිසා සභාවේ එකඟතාව අරගෙන මගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව වෙනත් දිනයකට යොමු කර දෙන්න කියලා. එහෙම කරන්න පුළුවන්. එම යෝජනාව අද දිනයේ ගන්නේ නැතුව වෙනත් දිනයකට යොමු කර දෙන්න කියලා මම ඉල්ලන්නේ. මොකද, අසාධාරණයකට ලක් වෙලා තිබෙනවා, කාලය අඩුවීම නිසා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක අපි Parliamentary Business Committee එකට යොමු කරමු.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති, මේ සම්බන්ධයෙන් විපක්ෂයේ ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා යෝජනාවක් ඉදිරිපත් කළාම විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත්, අපේ පැත්තෙනුත් එකඟතාවකට ඇවිල්ලා තමයි අද දවසේදී මේ කාලය අපි විනාඩි 210කට සීමා කළේ කියන එක. *[බාධා කිරීමක්]* ඔව්, එතුමා කියන්නේ ඒක. ඒ කියන්නේ, අපි මෙතැන මුළු සභාවම එකඟතාවකට ආපු නිසායි ඒ තීරණය ගත්තේ. ඔබතුමාට මතක ඇති, ඇත්තටම මේක පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී නොවෙයි තීරණය වුණේ. මෙතැනදී අපි එකඟතාවකට ආවා, පෞද්ගලික මන්ත්‍රී යෝජනා සඳහා වන කාලය අපි විනාඩි 210කට සීමා කරනවා, ඒ අනුව පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් විවාද කරන්න විනාඩි 30 බැගින් ලබා දෙනවා, එතැනින් පසු ඔබතුමන්ලා ගෙන එන යෝජනාවට පැය 2ක් ලබා දෙනවාය කියලා. ඒක එකඟතාවෙන් කටයුතු කළ අවස්ථාවක්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒ ගැන පෞද්ගලික මන්ත්‍රී යෝජනා ඉදිරිපත් කරන අපෙන් අහන්න ඕනෑ නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, පොලිස් කොමිසම පිළිබඳව ප්‍රශ්නයක් මතු වුණු වෙලාවේදී එය හදිසි කටයුත්තක් හැටියට සලකලා තමයි මන්ත්‍රීවරු 20දෙනෙකුට වැඩි පිරිසක් නැඟිටලා අද දිනට කල් තැබීමේ යෝජනාවක් ඉල්ලුවේ. ඒක එදාම දිය යුතු එකක්. ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාගේ ඉල්ලීම තිබෙන්නේ, ඒ කාලය අඩුවීම නිසා එතුමාගේ යෝජනාවට අසාධාරණයක් වෙනවා, ඒ නිසා ඒක ඊළඟ දවසකට දමන්න පුළුවන් ද කියන එකයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව වෙනත් දවසක ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ සඳහා සභාවේ එකඟතාව තිබෙනවාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට ඒ සඳහා වෙන දවසක් ලබා දෙන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂය වෙනුවෙන් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා වශයෙන් මම දෙයක් ඉදිරිපත් කළාම ඔබතුමා සලකනවා, ඒක ආණ්ඩු පක්ෂයේ මතය කියලා. ඒ වාගේම තමයි, විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා යම් මතයක් ඉදිරිපත් කළාම අපි සලකනවා, විපක්ෂය විසින් ඉදිරිපත් කරපු මතයක් කියලා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට අපි එකඟ වුණාම, විපක්ෂයේ ඉන්න එක් එක් මන්ත්‍රීවරුන්ගේ මතය විමසා කථා කරන්න බැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කැමැත්ත පරිදි ඒ යෝජනාව ඉවත් කර ගන්න පුළුවන්. නමුත්, සම්ප්‍රදායයක් හැටියට විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා එකඟ නම් අපි ඒක විපක්ෂයේ මතය හැටියට භාර ගන්නවා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද අපි ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාගේ Motion එක ගන්නේ නැතිව ඉඳිමු. ඒක අපි වෙනත් දිනයකදී ගනිමු, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ Motion එක වෙනත් දිනයකදී ගන්නම්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට කරුණක් පැහැදිලි කර ගන්න පොඩි අවස්ථාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඇත්තටම ඒ මොහොතේ ගෙනාපු යෝජනාව ස්ථාවර නියෝග අනුව ඔබතුමාට ඒ වෙලාවේදීම විමසලා අවසන් කිරීමටයි තිබෙන්නේ. ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි, මම මේක ඉල්ලා සිටියේ අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ තීන්දුව අභිභවා යෑමක් විධියට නොවෙයි. ලැබුණු වේලාව තුළ ඒ යෝජනාව ඉදිරිපත් කරන්න කාලය මදි නිසා තමයි මම සාධාරණව එවැනි ඉල්ලීමක් කළේ. ඔබතුමා ඒ අවස්ථාව ලබා දුන්නා. බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
It is regarding what the Hon. Chief Government Whip said. ගරු කථානායකතුමනි, එතුමා කිව්වේ,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක,-

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
නැහැ, මේක පොඩි පැහැදිලි කරගැනීමක්. මේක පැහැදිලි කර ගන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලි කර ගැනීමක් මෙතැන නැහැ, ගරු මන්ත්‍රීතුමා. ඕකේ point of Order එකක් නැහැ නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
යෝජනා ටික අඩු කරගෙන තමයි වෙලාව දෙන්න එකඟ වුණේ. එහෙම නැතිව, වෙලාව අඩු කරන්න නොවෙයි ඒ වෙලාවේදී එකඟ වුණේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි. ඔබතුමා වාඩිවෙන්න.

ප්‍රශ්න අංක 2 -205/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -228/2024- (1), ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් මේ පාර්ලිමේන්තුවේ-

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
It is under Standing Order No. 92. ගරු කථානායකතුමනි, ඒක කියවන්න ඕනෑද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Standing Order No. 92හි කීයද?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Standing Order No. 92(2)(a) states, I quote:

> "A member may in any proceedings question whether proper procedures have been or are being followed by making a point of order except at a time when a division is in progress."

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණාවට, point of Order එකෙන් මෙතුමා කථා කරපු එකට දැන් තීරණය දීලා ඉවරයි. ඔබතුමා නැවත වතාවක් ඒ ගැන කථා කරනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
එතුමා කථා කරපු එක ගැන නොවෙයි මම කියන්නේ. මේක වෙන point of Order එකක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඔබතුමා කියන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
එතුමාගේ කාරණාව වෙනම එකක්. ගරු කථානායකතුමනි, අපි සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගන්නකොට Standing Orders අනුව එදාම ඒකට අවසර දෙන්න ඕනෑ. ගරු ඇමතිතුමාත් එක්ක තිබෙන සුහදත්වය අනුව තමයි අපි එකඟ වුණේ, එය තව දිනයක පවත්වන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒකට සභාවේ එකඟතාවක් තිබුණා. සභාවේ ඒ එකඟතාව තුළින් තමයි එය සිද්ධ වුණේ. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, point of Order එකක් නැහැ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
එකඟතාව ආවේ ඒ විධියට. යෝජනා ප්‍රමාණය අඩු කරලා තමයි මේ- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, අපි මේ සභාවේ අමාරු ප්‍රශ්නයක් ඇහුවාම උත්තර ලැබෙන්නේ නැහැ. ගරු අගමැතිතුමියගෙන් අපි ඇහුවා, ඉන්දියානු ගිවිසුම් ගැන. අපිට ඒවාට උත්තර දුන්නේ නැහැ, අද වෙනකම්. ඊළඟට, එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගැන ඇහුවා. උත්තර දුන්නේත් නැහැ අද වෙනකම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම 3 වන ප්‍රශ්නය අහනවා, ගරු කථානායකතුමනි.

අද මම අහලා තිබෙනවා, දූෂණ විරෝධී පියවර ගැන. ගරු අධිකරණ ඇමතිතුමා මට ඊයේ කථා කරලා කිව්වා, එතුමාට අද මේ තොරතුරු අරන් දෙන්න අමාරුයි කියලා. මාස 6කට වැඩියි, ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය යොමු කරලා. මම ඇමතිතුමාට පෞද්ගලිකව දෝෂාරෝපණය කරන්නේ නැහැ. නමුත්, අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා අවංකව වැඩ කරනවා නම්, මේවාට උත්තර දෙන්නත් ඕනෑ ඒ වේගයෙන්ම. ගරු අධිකරණ ඇමතිතුමනි, අඩු ගණනේ මට ඊළඟ සතියේ හෝ මේ වැදගත් ප්‍රශ්නයට උත්තරය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම මගේ තිබෙන මහත්මා ගතිගුණ නිසා එතුමාට ඊයේ කථා කරලා කිව්වා, එම තොරතුරු හොයා ගැනීමේ පමාව මතු වන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාවෙනුත් තොරතුරු කැඳවන්න තිබෙන නිසා කියලා. ඒ වාගේම ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට මම මින් පෙර කාලය ඉල්ලා නැහැ. පළමුවැනි වතාවටයි මේ ප්‍රශ්නයට කල් ඉල්ලන්නේ. අහපු අනෙක් හැම ප්‍රශ්නයකටම මම උත්තර දීලා තිබෙනවා. මම ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා, මම ඔබට දැක්වූ මහත්මා ගුණය ඔබත් මට දක්වන්නය කියලා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි වාද විවාදවලට නොයා ඉදිමු, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, එතුමා සති දෙකකින් පිළිතුර දෙනවා කිව්වා නේ. මෙය විවාදයක් නොවෙයි.

මීළඟට, ප්‍රශ්න අංක 4 -315/2024- (1), ගරු රවී කරුණානායක මහතා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නය අහන්න ඉස්සෙල්ලා කියන්න ඕනෑ, මම මේ ප්‍රශ්නය භාර දීලා අවුරුද්දක් වන බව. දැන් මට මෙතැන පෙනෙනවා, ඇමතිවරයා උත්තර දෙන්නේ නැහැ කියලා. අපට මාසයකට සැරයක් එක ප්‍රශ්නයක් අහන්න පුළුවන්. ඒකටත් කල් ගන්නකොට පිළිතුරු ලැබෙන්නේ කවදාද? අපි දැන් දීලා තිබෙන ප්‍රශ්න ප්‍රමාණය අනුව මේ පාර්ලිමේන්තුවේ කාලය ඉකුත් වුණාම තමයි උත්තර ලැබෙන්නේ. ගරු කථානායකතුමනි, ඒ

[ගරු රවී කරුණානායක මහතා]

ප්‍රශ්නවලට කොහොමද උත්තර ලබා දෙන්නේ කියලා යම් විධිමත් ක්‍රියාවලියක් ඇති වන්න අවශ්‍යයි. මම ප්‍රශ්නය දීලා තිබෙන්නේ 2024දී. දැන් 2025 වර්ෂයේත් අවසානයේ තමයි ප්‍රශ්නය න්‍යාය පත්‍රයට ඇතුළත් වෙලා තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගන්න. අපි නැවත ප්‍රශ්නය සංශෝධනය කරලා දෙනවා නම් වෙන ප්‍රශ්නයක් කියලා කියාවි. මේ සම්බන්ධව මොකක් හරි ක්‍රමවේදයක් පාවිච්චි කරන්න වෙයි නේද? ඔබතුමා ස්ථාවර නියෝග අනුව වැඩ කරනවා. එහෙම නම් මෙතුමන්ලා දින අනුව වැඩ කරන්න අවශ්‍යයි. අපි මෙතැන තැළෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එතුමා අහලා තිබෙන්නේ 2024 දෙසැම්බර් 31 දිනට ණය ඇතුළු විස්තර නේ. ඉතින්, කොහොමත් උත්තර දෙන්න වෙන්නේ 2025දී තමයි. ඒ නිසා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න සති දෙකක් කල් ගන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතතුමනි, මම තවම ප්‍රශ්නය ඇහුවේ නැහැ. ප්‍රකාශය කළා මිසක් මම ප්‍රශ්නය ඇහුවේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය අහනවා නම් අහන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අහන්න තමයි මම ඉස්සෙල්ලා හැදුවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නය අහනවාද? ගරු මන්ත්‍රීතුමනි, මට ඊළඟ ප්‍රශ්නයට යන්න සිද්ධ වෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පෙර සූදානමකින්, අපේ රටේ තිබෙන දැවෙන ප්‍රශ්න අනුව,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මට ඊළඟ ප්‍රශ්නයට යන්න වෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට ප්‍රශ්නය අහන්න,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නය අහන්නකෝ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමාට ඕනෑ විධියට මම ප්‍රශ්නය අහන්නයි, ප්‍රශ්නය දෙන්නයි- *[බාධා කිරීමක්]* කරුණාකරලා ශීලාචාරව අපටත් අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට තිබෙන්නේ ප්‍රශ්නය අහනවාද, නැද්ද කියන එක ප්‍රකාශ කිරීම විතරයි. Standing Orders බලන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මට පෙර සූදානමින් පෙනෙනවා උත්තර දෙන්න අවස්ථාව නැහැ කියලා. මේ ප්‍රශ්නය අවුරුද්දකට ඉස්සෙල්ලා අහනකොට,- *[බාධා කිරීමක්]* අපට මාසයකට සැරයයි ප්‍රශ්නයක් අහන්න පුළුවන් වන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නය අහනවාද, නැද්ද? ප්‍රශ්නය අහනවා නම් අහනවා කියන්න. ඊට පසුව එහා පැත්තෙන් ප්‍රතිචාරයක් දෙයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කනගාටුයි. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නය අහනවාද, නැද්ද? ප්‍රශ්නය අහනවා නම් අහනවා කියන්න. ඊට පසුව එහා පැත්තෙන් ප්‍රතිචරයක් දෙයි. දැන් ගරු ඇමතිතුමාත් ඉන්නවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මෙහෙම නේ. බෝලයක් bowl කරන්න ඉස්සෙල්ලා දුවගෙන එන්න තිබෙනවා නේ. ඒ වාගේ තමයි, අහන්න ඉස්සෙල්ලා

පොඩ්ඩක් ලැහැස්ති වෙන්නේ. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමා umpire. Umpire no-ball කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා. *[බාධා කිරීමක්]* ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, වාඩි වෙන්න. ඔබතුමා ප්‍රශ්නය අහන්නේ නැහැ නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමාට මම පැහැදිලි කරලා කිව්වා නේ. *[බාධා කිරීමක්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම ප්‍රශ්නය අහනවා, ඇමතිතුමාට උත්තර දෙන්න කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැන් නේ ඔබතුමා ප්‍රශ්නය අහන්නේ. ගරු මන්ත්‍රීතුමා, කාලය නාස්ති කරන්න එපා. ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමා, අපි ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙමු. ඔබතුමාට ඊළඟට අවස්ථාව ලබා දෙන්නම්.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, බොහොම ස්තුතියි. බලන්න, මම එතුමා වෙනුවෙන් කොච්චර වෙලා බලාගෙන හිටියාද කියලා. මම දැනගත්තා එතුමා උත්තර දෙනවා කියලා. දැන් එතුමාට අවස්ථාව දෙන්න, උත්තරය දෙන්න.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, බොහොම ස්තුතියි. අහලා තිබෙන මේ ප්‍රශ්නයේ ස්වරූපය මත දත්ත එකතු කර ගැනීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ප්‍රිවෙල්ත් ග්ලෝබල් (පුද්.) සමාගමේ සිදු වූ මුදල් වංචාව: ගත් ක්‍රියාමාර්ග
பிரிவெல்த் குளோபல் (தனியார்) கூட்டுத்தாபனத்தால் செய்யப்பட்ட பண மோசடி: நடவடிக்கை
SWINDLE BY PRIVELTH GLOBAL (PVT.) LIMITED: ACTION TAKEN

342/2024

**5. ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සමන්තුරේ, කල්මුණේ, පොතුවිල්, එරාවූර් සහ මරුදමුනේ යන ප්‍රදේශවල Privelth Global (Pvt.) Ltd. නමින් මූල්‍ය ආයතනයක් 2014.02.05 වන විට පවත්වාගෙන ගිය බවත්;

(ii) එම මූල්‍ය ආයතනයේ අධ්‍යක්ෂකවරුන් ලෙස කටයුතු කරන ලද අහමඩ් ෂෙරීම් මුහම්මුදු ෂිහාබ් (ෂිහාබ් ෂෙරීම්) සහ ෆාතිමා ෆර්සානා මාකාර් යන අය විසින් පුද්ගලයන් 1,400 දෙනෙකුගෙන් රුපියල් කෝටි 170කට අධික මුදලක් වංචා කර ඇති බවත්;

(iii) පසුගිය දෙසැම්බර් මස 26වන දින ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට හරවා එවා ඇති මෙම පුද්ගලයන් මේ වන විට අතුරුදහන්ව සිටින බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත අ(ii)හි සඳහන් අය සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(ii) ඔවුන් වංචා කර ඇති මුදල් නැවත අයිතිකරුවන්ට ලබා දීමට පියවර ගන්නේද;

(iii) ඒ සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) මෙවැනි මූල්‍ය ආයතන සම්බන්ධයෙන් විධිමත් අධීක්ෂණයක් සිදු කර විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சம்மாந்துறை, கல்முனை, பொத்துவில், ஏறாவூர் மற்றும் மருதமுனை ஆகிய பிரதேசங்களில் Privelth Global (Pvt.) Ltd. எனும் பெயரில் நிதி நிறுவனமொன்று 2014.02.05 காலப்பகுதியில் நடாத்தப்பட்டது என்பதையும்;

(ii) மேற்படி நிதி நிறுவனத்தின் பணிப்பாளர்களாகப் பணியாற்றிய அஹமட் ஷெரீம் முஹம்மது சிஹாப் (சிஹாப் ஷெரீம்) மற்றும் பாத்திமா பர்சானா மார்கார் ஆகியோரால் 1,400 பேரிடம் சுமார் 170 கோடி ரூபாய்க்கும் அதிகமான பணம் மோசடி செய்யப்பட்டுள்ளது என்பதையும்;

(iii) கடந்த டிசெம்பர் மாதம் 26ஆம் திகதி இந்தியாவிலிருந்து இலங்கைக்குத் திருப்பி அனுப்பப்பட்டுள்ள இவர்கள் இன்றளவில் காணாமல் போயுள்ளனர் என்பதையும்;

அவர் அறிவாரா?

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

(ஆ) (i) மேலே (அ) (ii) இல் குறிப்பிடப்பட்டவர்கள் தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) இவர்கள் மோசடி செய்துள்ள தொகையை மீள அதன் உரிமையாளர்களுக்குப் பெற்றுக் கொடுப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளப் படுமா என்பதையும்;

(iii) அது தொடர்பில் பின்பற்றப்படும் நடவடிக் கைகள் யாவை என்பதையும்;

(iv) இவ்வாறான நிதி நிறுவனங்கள் தொடர்பாக முறையான கண்காணிப்பை மேற்கொண்டு நம்பகத்தன்மையை உறுதிப்படுத்துவதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Is he aware that -

(i) a financial institution named Privelth Global (Pvt.) Ltd. had been in operation in the areas of Samanthurai, Kalmunai, Pottuvil, Eravur and Marudamunai as at 05.02.2014;

(ii) Ahmed Shereem Muhammadu Shihab (Shihab Shereem) and Fatima Farsana Markar, who functioned as Directors of that financial institution, have swindled 1,400 persons out of over Rs. 1,700 million; and

(iii) the above-named persons, who were deported from India to Sri Lanka on 26th December last year, are missing at present?

(b) Will he inform this House -

(i) the action that will be taken against the two individuals referred to in (a) (ii) above;

(ii) whether steps will be taken to return the money these individuals have swindled to its owners;

(iii) the measures taken for it; and

(iv) whether steps will be taken to ensure credibility by conducting proper monitoring over such institutions?

(c) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 2020 ජූලි මාසයේදී Privelth Global (Pvt.) Limited යන ආයතනය සම්බන්ධයෙන් පැමිණිලි 3ක් එරාවූර් සහ නින්දවූර් යන ප්‍රදේශවල පදිංචි පුද්ගලයන් වෙතින් ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබී ඇත. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 42 වගන්තිය යටතේ ඇති බලතල අනුව ඉහත ආයතනය සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කරන ලද අතර, එම විමර්ශනය අතරතුර මූල්‍ය හා වාණිජ අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත 2021.07.28 දින එවන ලද වාර්තාවට අනුව Privelth Global (Pvt.) Limited යන ආයතනය කල්මුණේ, මරුදමුනේ, සමන්තුරේ සහ පොතුවිල් යන ප්‍රදේශවල ක්‍රියාත්මක වී ඇත.

(ii) ඉහත සඳහන් විමර්ශනය අතරතුර, විමර්ශන කණ්ඩායම විසින් Privelth Global (Pvt.) Limited යන ආයතනයේ කොළඹ 03 පිහිටි ප්‍රධාන කාර්යාලය පරීක්ෂා කළ අතර එහිදී එම ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු වන අහමඩ් සරීම් මොහමඩ් ෂිහාබ් යන අයගෙන් 2020.09.15 දින ප්‍රකාශයක් ලබාගෙන ඇත. එහිදී ඔහු ප්‍රකාශ කර ඇත්තේ 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා Privelth Global (Pvt.) Limited යන ආයතනය විසින් පුද්ගලයන්ගෙන් ණය ලබා ගැනීම් සහ එම ණය පියවීම් සිදු කළ බවත්, ප්‍රකාශය ලබා දෙන අවස්ථාව වන විට එලෙස ලබා ගත් ණය මුදල් රුපියල් මිලියන 800ක් පමණ පියවීමට තිබූ බවත් ය. තවද, මූල්‍ය හා වාණිජ අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත 2021.07.28 දින එවන ලද වාර්තාව අනුව Privelth Global (Pvt.) Limited යන ආයතනය පුද්ගලයන් 1,150 දෙනෙකුගෙන් රුපියල් මිලියන 1,356ක් ලබා ගෙන ඇත.

(iii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම විමර්ශනය සිදු කරගෙන යන අතරතුර Privelth Global (Pvt.) Limited යන ආයතනයේ අධ්‍යක්ෂවරුන් වන අහමඩ් සරීම් මොහමඩ් ෂිහාබ් සහ ෆාතිමා ෆර්සානා මාකාර් යන අය ඉන්දියාවට පලා යෑමට උත්සාහ කිරීමේදී ඉන්දියානු වෙරළාරක්ෂක නිලධාරීන් ඔවුන් අත්අඩංගුවට ගත් බව වාර්තා වී තිබේ. ඉන්පසුව ශ්‍රී ලංකා පොලීසිය **වෙතින්** සිදු කරන ලද විමසීමට අනුව, Privelth Global (Pvt.) Limited ආයතනයේ අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කරන ලද, අහමඩ් සරීම් මොහමඩ් ෂිහාබ් යන අය සහ ඔහුගේ බිරිඳ වන ෆාතිමා ෆර්සානා මාකාර් යන අය ඉන්දියාවෙන් හරවා එවීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ බන්ධනාගාරගත කර ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුවට අනාවරණය වී ඇත.

(ආ) (i) Privelth Global (Pvt.) Limited යන ආයතනය සම්බන්ධයෙන් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ සිදු කරන ලද විමර්ශනයෙන් පසුව එම ආයතනය මුදල් ව්‍යාපාර පනතට පටහැනිව මුදල් ව්‍යාපාර සිදු කර ඇති බවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිශ්චය කළහොත්, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 64 වන වගන්තිය ප්‍රකාරව, ඒ සම්බන්ධයෙන් නඩු පැවරීම සලකා බැලීම සඳහා ගරු නීතිපතිතුමා වෙත යොමු කර තිබේ.

(ii) ඉහත (ආ) (i)හි සඳහන් ක්‍රියාමාර්ගයෙන් අනතුරුව ගරු නීතිපතිතුමා විසින් මහාධිකරණයේ නඩු පැවරීමෙන් අනතුරුව, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 56(1) වගන්තිය ප්‍රකාරව, තැන්පත්කරුවන්ද ඇතුළුව එකී ආයතනයේ සියලු බාහිර පාර්ශ්වකරුවන්ගේ වගකීම් පියවීමේ

යන්ත්‍රණයකට අදාළ කටයුතු අධිකරණමය ක්‍රියාවලියකදී තීරණය විය යුතුය.

(iii) ඉහත (ආ) (i) සහ (ii)හි සඳහන් ක්‍රියාවලිය අනුගමනය කරයි.

(iv) Privelth Global (Pvt.) Limited යන ආයතනය, බැංකු ව්‍යාපාරයක් පවත්වාගෙන යෑම සඳහා 1988 අංක 30 දරන බැංකු (සංශෝධන) පනත යටතේ හෝ මහ ජනතාවගෙන් තැන්පතු භාර ගනිමින් මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ හෝ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත යටතේ හෝ කල්බදු මූල්‍ය ව්‍යාපාරයන්හි නිරත වීම සඳහා 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලපත්‍ර ලබාගෙන ඇති ආයතනයක් හෝ උක්ත පනත්වල ප්‍රතිපාදනවලින් නිදහස් කළ ආයතනයක් හෝ නොවන අතර, එවන් ආයතන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය හෝ සුපරීක්ෂණය කිරීම සිදු නොකරයි. කෙසේ නමුත්, මුදල් ව්‍යාපාර පනතට පටහැනිව අනවසර ලෙස මහ ජනතාවගෙන් තැන්පතු ලබා ගන්නා ආයතන හෝ පුද්ගලයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විමර්ශනයන් සිදු කර එම පනත ප්‍රකාරව නීතිමය ක්‍රියාමාර්ග ගනු ලබයි.

(ඇ) පැන නොනඟී.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

බොහොම ස්තුතියි පිළිතුර ලබා දුන්නාට, ගරු අමාත්‍යතුමනි. ඔබතුමාගේ පිළිතුරේ අවසන් කොටසෙන් Central Bank එකත් එක්ක මේ ආයතනයේ ගනුදෙනුවක් නැහැ කියන කාරණය පැන නැඟුණා. Central Bank එකේ register -

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

Central Bank එක යටතේ මුදල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන්න නම්, තිබෙන පනත්වලට අනුව ලියාපදිංචි වෙන්න ඕනෑ. මේක සමාගම් පනත යටතේ ලියාපදිංචි වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි සුපරීක්ෂණය අමාරු වෙන්නේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, Privelth Global (Pvt.) Limited එකේ deposit කරපු කණ්ඩායම්වලට ගැටලුවක් තිබෙනවා. නීතිමය ක්‍රියාමාර්ගයක් හරහා ගියොත් මේකේ ඇත්ත depositorsලාට ඒ මුදල් ටික ලැබෙයිද නැද්ද කියන එක පිළිබඳව ඔවුන්ට සැකයක් තිබෙනවා. ඒකට හේතුව, මේ වාගේම 2009දී ද ෆිනෑන්ස් ආයතනයත් bankrupt වෙන්න යනවා කියලා දැනගෙන, Central Bank එකේ regulations යටතට අරගෙන, Central Bank එකෙන් ඒක monitor කරලා, 2019 වනකල් ද ෆිනෑන්ස් සමාගම කරගෙන ගියා. 2019දී, ඒ කියන්නේ Central Bank එක යටතේ Rs. 1 billion depositorsලාට අලුතින් සල්ලි fixed deposit දාන්න කියලා, ඊට මාස කිහිපයකට පස්සේ Central Bank එකෙන්ම මේක liquidate කරන්න ඕනෑ කිව්වා. නමුත් අද වනතුරු ඒ depositorsලාට කිසිම සාධාරණයක් නැති තත්ත්වයක් තිබෙනවා. මේක පිටුපස දේශපාලන කුමන්ත්‍රණයක් තිබුණා කියලා අපට සැකයක් තිබෙනවා. මොකද, ඒ යම් යම් depositorsලාට සල්ලි ගෙවලා තිබෙනවා. මේ ගැන ඔබතුමන්ලා හොයා බලන්න.

පසුගිය මාසයේ මඩකලපුවේ -மண்முனை தென் எருவில் பற்று ප්‍රාදේශිය සභාවේදී මේ ගැන යෝජනාවකුත් ඉදිරිපත් කළා. ඒ ප්‍රදේශයේ සියයට 200, 300 වාගේ පොලියකට ණය ලබා දෙනවා. ඒ ආයතන එකක්වත් Central Bank එකේ register කරලා නැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තමයි ඒ ආයතන register කරලා තිබෙන්නේ. මම ඔබතුමාට මේ කරුණු ටික විස්තරාත්මකව ඉදිරිපත් කරන්නම්.

ගරු අමාත්‍යතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ද ෆිනෑන්ස් සමාගමේ depositorsලාටත් අසාධාරණයක් වෙන එක නවත්තලා, ද ෆිනෑන්ස් එකේ අසාධාරණයට ලක් වුණු අයටත් ඒ මුදල් ලබා දෙන්න ආණ්ඩුව ක්‍රියාමාර්ග ගන්නවාද? මූල්‍ය ආයතන ඒ ඒ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් මට්ටමින් විතරක් register කරගෙන, සියයට 300ක වාගේ අධික පොලියකට මුදල් දෙන්න පුළුවන්ද? ඔබතුමන්ලා Central Bank එක හරහා මේවා හරි විධියට govern කරනවාද කියන එක තමයි මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය.

ගරු අමාත්‍යතුමනි, අද උදෑසන වන විට ආණ්ඩුව කෙරෙහි යම් විශ්වාසයක් රටේ ජනතාවට ඇවිල්ලා තිබෙනවා. මොකද, අද උදෑසන බිමල් රත්නායක ඇමතිතුමා වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය ධුරවලින් අයින් කළා කියන news එක දැක්කා. Container case එක නිසාද දන්නේ නැහැ අයින් කළේ. එතුමා ඉවත් කළා කියලා දැක්කා. ආණ්ඩුවට සුබ පතනවා container case එකට සම්බන්ධ පුද්ගලයෙක් ඒකෙන් ඉවත් කරලා පරීක්ෂණයක් කරනවා කියලා කියපු නිසා. ආණ්ඩුව කෙරෙහි ඒ විශ්වාසය ගොඩ නැඟී තිබෙන බවත් කියමින් මගේ අතුරු ප්‍රශ්නය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

කැබිනට් සංශෝධනය පිළිබඳව ඉදිරියේදී පාර්ලිමේන්තුවට වාර්තා කරයි. එහෙම ඉවත් කිරීමක් නොවෙයි සිද්ධ වෙලා තිබෙන්නේ. අපි වඩාත් උචිත විධියට, අපේ අරමුණ කරා යෑමට විෂයයන් ටිකක් සංශෝධනය කරලා තිබෙනවා. එතුමාගේ අලුත් වගකීම ඊට වඩා වැඩියි. වැඩි වගකීමක් එතුමාට පැවරිලා තිබෙනවා. ඒක ඉදිරියේදී දැනුම් දේවි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කළ ද ෆිනෑන්ස් සමාගම සම්බන්ධ ප්‍රශ්නය, registered financial institution එකක් යටතේ ඒකේ monitoring සිද්ධ වුණාද නැද්ද, අඩු පාඩු තිබෙනවාද කියලා අපි සොයා බලමු. ඒක යම්තාක් දුරට ගැටලුවක හිර වෙලා තිබෙන්නේ කියලා අපි කවුරුත් දන්නවා. ඒක විතරක් නොවෙයි තව ආයතන ගණනාවක්ම තිබෙනවා විවිධ ආකාරයේ උපක්‍රම භාවිත කරන.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ලියාපදිංචිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේද?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

නැහැ, ප්‍රාදේශීය ලේකම් නොවෙයි. එතැන තිබෙන ප්‍රශ්නය අපේ තිබෙන නීති රාමුව ඇතුළේ ඒකට ඉඩකඩක් ලැබිලා තිබෙන එක. විශේෂයෙන්ම මුදල් හැසිරවීමේදී ඒ ඒ පනත් යටතේ යන්න ඕනෑ. නමුත් සමාගම් පනත යටතේ ලියාපදිංචි වෙලා, එයාලාගේ Articles of Association යටතේ සමහර පුංචි පුංචි කරුණු දාගෙන තිබෙනවා. ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විධියට තිබෙන්නේත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විධියට ලියාපදිංචි කළ ඒවා නොවෙයි. Central Bank එකට පරිපාලනය කරන්න බැහැ එළියේ තිබෙන ඒවා. ඒවාට සාමාන්‍ය අපරාධ නීතිය යටතේ මූල්‍ය වංචා විධියට නඩු පැවරීම් කරන්න සිද්ධ වෙනවා. අපේ පැත්තෙන් අපි මේවායේ තිබෙන ගැටලු සොයා බලමින් සිටිනවා. විශේෂයෙන් ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙනුත් අලුතින් පනත් කෙටුම්පතක් ගෙනැල්ලා වැඩ කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කළ ප්‍රස්තුත සමාගම වන Privelth Global (Pvt.) Limited එකේදි ඉතුරු වෙලා තිබෙන්නේ එකම එක ආකාරයයි ඒ තැන්පත්කරුවන්ට සාධාරණයක් ඉෂ්ට කරලා මුදල් අරගෙන දෙන්න. ඒක තමයි ඒගොල්ලන් තැන්පතු බාර ගත්තාය කියලා සාක්ෂියකින් ඔප්පු කර ගන්න ඕනෑ. තවම ඒක ඔප්පු කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒගොල්ලන් රටින් පැන්නා. හැබැයි, අපි තැන්පත්කරුවන්ටත කියනවා මොකක් හෝ සාක්ෂියක් තිබෙනවා නම් ඒ අය තැන්පත් භාර ගත්තා කියලා කියන්න, ඒවා අපට ඉදිරිපත් කරන්න කියලා. එතකොට ඒ මත අපට යන්න පුළුවන්. බොහෝදුරට ඒ සමාගම් උපක්‍රමශීලිව, අපේ මූල්‍ය සාක්ෂරතාවේ තිබෙන ගැටලු නිසා documents භාවිත කරන්නේ නැතිව විවිධ උපක්‍රම භාවිත කරනවා. නමුත් අපි ඒකට මැදිහත් වෙන්නම්.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු ඇමතිතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා පිළිතුර ලබා දීම ගැන. ඒ වාගේම අපි ඔබතුමා වාගේ වැඩ කරන්න පුළුවන් ඇමතිවරු එක්ක එකතු වෙලා වැඩ කරන්න ලෑස්තියි. අලුතින් පත් වූ වරාය ඇමතිතුමාත් එක්කත් වැඩ කරන්න අපි ඉතා උනන්දුවෙන් බලාපොරොත්තු වෙනවා, වරායවල් ටික හදාගන්න.

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහත්මයා අසනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු අමාත්‍යතුමනි, විශේෂයෙන්ම රට පුරාවටම අනීතික මූල්‍ය ආයතන විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවා අද ඊයේ නිර්මාණය වුණු ඒවා නොවෙයි. මේක අවුරුදු ගණනාවක් තිස්සේ තිබෙන බරපතළ ප්‍රශ්නයක්. අනීතික මූල්‍ය ආයතන හරහා අපේ රටේ ජනතාව සහමුලින්ම අනාථභාවයට ලක් කරලා තිබෙනවා. ඒකට එක උදාහරණයක් තමයි නැහෙනහිර හේවාගම්කෝරළ සමුපකාර සමිතිය. ඇත්ත වශයෙන්ම ඒ තැන්පත්කරුවන්ගේ කෝටි ප්‍රකෝටි ගණනක මුදල් අහිමි වෙලා තිබෙනවා. එතැන 40,000ක් 50,000ක් තැන්පත්කරුවන් අනාථභාවයට පත් වෙලා තිබෙනවා.

ඒ වාගේම, විවිධ පුද්ගලයන් විදේශීය රටවලින් මේ රටට ඇවිල්ලා online ණය ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරලා ගනුදෙනුකරුවන් blackmail කරලා ඒ මුදල් අය කර ගැනීම කරනවා. ඒ අය සේවය කරන ස්ථානවලට විවිධ බලපෑම් කරලා, ඒ අයගේ නම් ප්‍රසිද්ධ කරලා ඒ කටයුතු කරනවා. විශේෂයෙන් සමාජ මාධ්‍ය හරහා online loan mafia එකට මේ රටේ අහිංසක ජනතාව, පොඩි මනුෂ්‍යයන් සම්බන්ධ කරගෙන ඒ මුදල්වලට විශාල පොලියක් අය කර ගන්නා අනීතික මූල්‍ය ජාවාරමක මේ අය නියැළී සිටිනවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම මම ඔබතුමාට මතක් කරන්නට කැමතියි, වාහන seize කරන කණ්ඩායම් පවා අනීතික ක්‍රියාවලියට යොමු වෙලා තිබෙන බව. අපේ පොලිස්පතිවරයාගේ නියෝග නොතකා අහිංසක මිනිසුන්ගේ වාහන උස්සන වැඩ පිළිවෙළකට යොමු වෙලා තිබෙනවා. මෙන්න මේ ප්‍රශ්නවලට ඔබතුමාගේ අවධානය යොමු කරලා මේ අනීතික ක්‍රියාවල නියැළෙන online loan mafia එකෙනුත්, අනීතික ක්ෂුද්‍ර මූල්‍ය ණය ජාවාරම්කරුවන්ගෙනුත් සහ වාහන seize කරන ඒ සීසර්ලාගේ මාෆියාවෙනුත් අපේ රටේ ජනතාව බේරා ගන්නට ගන්නා පියවර මොකක්ද කියලා මම අහන්න කැමතියි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

බොහොම ස්තුතියි, ගරු විපක්ෂ නායකතුමනි.

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා මතු කළ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හෝ අනීතික මූල්‍ය ආයතන ගැන කියනවා නම්, ඇත්තටම මුදල් පරිහරණය, නැත්නම් මූල්‍යමය කටයුතු කිරීම කියන පැත්තෙන් ඒවා අනීතිකයි. නමුත්, ඒගොල්ලෝ සමාගම් පනත යටතේ හෝ නීතිමය පුද්ගලභාවයක් අරගෙන තිබෙනවා. එතැන තමයි මේ ගැටලුව පැනනැඟිලා තිබෙන්නේ. ඒ වාගේම, යම් යම් අතීත නීති රීති තුළින් ඇති වන ගැටලු වාගේම, පවත්වාගෙන යන මෙවැනි මූල්‍ය ව්‍යාපාරවලට සෘජුව හෝ වක්‍රව යම් ප්‍රබල පුද්ගලයන්, සමහර අවස්ථාවල දේශපාලන කණ්ඩායම් සම්බන්ධ වෙලා බලය අත් පත් කරගෙන කරපු වැඩ කටයුතු කිහිපයකුත් තිබෙනවා. විපක්ෂ නායකතුමනි, කෙසේ වෙතත් අපි මේ තත්ත්වයට ක්‍රමයෙන් මැදිහත් වෙලා අදාළ ක්‍රියාමාර්ග අරගෙන, මේවා යම් අධීක්ෂණයකට, ක්‍රමවේදයකට ගෙන එන්නට ඕනෑ. ඒ සඳහා අවශ්‍ය වැඩ කටයුතු සිදු කරමින් ඉන්නවා. ඒ වෙනුවෙන් අපි දැනටමත් "Anti-Money Laundering and Countering the Financing of Terrorism" කියන framework එක ඇතුළේ මහ බැංකුවත් එක්ක වැඩ කටයුතු කරනවා. එහි ඊළඟ සමාලෝචනය 2026 මාර්තු මාසයේදී සිද්ධ වෙන්න තිබෙනවා. ඒ වාගේම, Financial Intelligence Unit - FIU - එකේ වැඩ කටයුතු වේගයෙන් සිදු කරමින් යනවා. ඒ වාගේම අපේ අධීක්ෂණයට ලක්වෙලා නැති යම් ආයතන තිබෙනවා නම් අපි ඒවා ගෙනෙන්න කටයුතු කරනවා. ඒත් එක්කම, ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කියන එක තමයි ගම් මට්ටමින් ඉතාම නරක තත්ත්වයට පත්වෙලා තිබුණේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වෙලා තිබෙන්නේ ආයතන 4ක් හෝ 5ක් පමණයි. නමුත්, අනීතික ආයතන දහස් ගණනක් තිබෙනවා. මේ පනත සම්මත වීමත් එක්ක ඒවා නියාමනය කිරීමට අවශ්‍ය ක්‍රියාදාමයන් ගෙනැල්ලා අදාළ වැඩ කටයුතු කරන්න අපි මැදිහත් වෙනවා.

ඒ වාගේම online හරහා සිදු වන වංචා හෝ වෙනත් ආකාරයෙන් සිදු වන මූල්‍ය අපරාධ, ඒ වාගේම අපේ මූල්‍ය පනත්වලට පිටින් සිදු වන කටයුතුවලට විරුද්ධව සාමාන්‍ය නීතිය යටතේ අපි කටයුතු කරනවා. ගොඩක් සිදු වෙන්නේ වංචා. ඒ වංචා කරන පුද්ගලයන් සම්බන්ධයෙන් කටයුතු කරන්න මැදිහත් වන අතරේ, මම මේ අවස්ථාවේ තවත් කාරණයක් සභාවට ඉදිරිපත් කරනවා.

එම වංචාවලට සම්බන්ධ වන අය විශාල ප්‍රතිලාභ ලබමින් ඉන්නවා. මොකද, අපේ රටේ අකුරු හැකියාව සියයට 98ක්, නැත්නම් සියයට 100ට කිට්ටු වෙන්නම තිබෙනවා. හැබැයි, එක පැත්තක මූල්‍ය සාක්ෂරතාව ඉතාම අඩු මට්ටමකයි තිබෙන්නේ. අනෙක් පැත්තේ මූල්‍ය සාක්ෂරතාව තිබුණත්, සමහර අවස්ථාවලදී මිනිස්සු වැඩි ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා මෙවැනි විවිධ ආකාරයේ කටයුතුවලට පෙළඹෙනවා. ඒවාට හසුවෙනවා. හැබැයි, රටේ පොලී අනුපාතයට වඩා සියයට 50ක්, සියයට 200ක්, සියයට 300ක් ගෙවනවා කියලා කිව්වාම එතැන වංචාවක් තිබෙනවා කියන එක ගැන අපට සාමාන්‍ය අවබෝධයක් තිබෙන්නට ඕනෑ. කලින් කථා කරපු මන්ත්‍රීතුමාත් ඒ ගැන සඳහන් කළා. මේවා පිරමීඩ ආකාරයේ වංචා. අපි මේ සියලු කටයුතු ක්‍රමවත්ව, විධිමත්ව, පියවරෙන් පියවර, අදාළ අධීක්ෂණයන්ට යටත්ව කරලා, නිවැරදි ක්‍රමවේදයකට ගෙන එන්න බලාපොරොත්තු වෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -552/2025 - (1), ගරු දයාසිරි ජයසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## මී උණ රෝගය: පාලනය කිරීම
### எலிக் காய்ச்சல்: கட்டுப்படுத்தல்
### LEPTOSPIROSIS: CONTROL

561/2025

**7. ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා මී උණ (ලෙප්ටොස්පයිරෝසිස්) රෝගයට ගොදුරුවී ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ එම රෝගය හේතුවෙන් මරණයට පත්වූ පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මී උණ රෝගය පාලනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் தற்போது வரை எலிக் காய்ச்சல் (லெப்டொஸ்பைரொசிஸ்) நோயால் பீடிக்கப்பட்ட ஆட்களின் எண்ணிக்கை மற்றும் அந்நோய் காரணமாக இறந்த ஆட்களின் எண்ணிக்கை என்பன ஆண்டுவாரியாகத் தனித்தனியே யாது என்பதையும்;

(ii) எலிக் காய்ச்சலைக் கட்டுப்படுத்துவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -

(i) number of persons infected with leptospirosis and the number of deaths caused by leptospirosis from 2015 up to now in respect of each year, separately; and

(ii) measures that will be taken to control leptospirosis?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඇමුණුම මඟින් දක්වා ඇත.

ඇමුණුම:


රජයේ රෝහල්වල නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් ගේ ඇද ඉහපත් ආශ්‍රයෙන් රැස්කළ තොරතුරු මත 2015 සිට 2024 දක්වා මී උණ රෝගයට අදාලව පහත රෝහල්ගතවීම් වාර්තාවී ඇත.

**මී උණ රෝගයට අදාලව රෝහල්ගතවූ රෝගීන් ගණන සහ වාර්තා වූ මරණ ගණන 2015-2024**

| වර්ෂය | මුළු රෝහල් ගතවීම් ගණන | වාර්තා වූ මරණ ගණන |
|---|---|---|
| 2015 | 10036 | 264 |
| 2016 | 7681 | 199 |
| 2017 | 8428 | 166 |
| 2018 | 11586 | 202 |
| 2019 | 13424 | 228 |
| 2020 | 17433 | 198 |
| 2021 | 18618 | 281 |
| 2022 | 17025 | 311 |
| 2023 | 19651 | 325 |
| 2024* | 21963 | 286 |

* 2025.09.15 දිනට වාර්තාවූ දත්ත

**මී උණ රෝගයට අදාලව රෝහල්ගතවූ රෝගීන් ගණන සහ වාර්තා වූ මරණ ගණන 2015-2024**




* 2025.09.15 දිනට වාර්තාවූ දත්ත

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(ii) 1. ජාතික මාර්ගෝපදේශක කමිටුව පිහිටුවීම.

මී උණ රෝගය වැළැක්වීම හා පාලනය සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් ජාතික මාර්ගෝපදේශක කමිටුව පිහිටුවා ඇති අතර, එමඟින් රාජ්‍ය මට්ටමින් උපදෙස් ලබා දීම, අධීක්ෂණය කිරීම, ප්‍රතිපත්ති හා මහපෙන්වීම් ලබා දීම සිදු කරයි.

2. දිස්ත්‍රික් මට්ටමේ මාර්ගෝපදේශ කමිටු පිහිටුවීම.

දිස්ත්‍රික් ලේකම් සහ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ සම සභාපතිත්වයෙන් දිස්ත්‍රික් මාර්ගෝපදේශ කමිටු පිහිටුවා ඇති අතර එමඟින් පෙර සූදානම් වැඩසටහන් සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ විශ්ලේෂණය කිරීම් කටයුතු සිදු කරයි. එහිදී මී උණ රෝගය සඳහා අධි අවදානම් දිස්ත්‍රික්ක 12ක් හඳුනාගෙන තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒවා තමයි, ගාල්ල, රත්නපුරය, කළුතර, කෑගල්ල, කුරුණෑගල, මාතර, හම්බන්තොට, අනුරාධපුරය, පොළොන්නරුව, බදුල්ල, ගම්පහ සහ මොනරාගල කියන දිස්ත්‍රික්ක.

3. බහු ආංශික විද්වත් කමිටුව පිහිටුවීම.

විවිධ ක්ෂේත්‍රවලට අයත් විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් සමන්විත බහු ආංශික විද්වත් කමිටුවක් පිහිටුවා, විශේෂ උපකමිටු 4ක් සම්බන්ධ කර එම උපකමිටු හරහා, මී උණ රෝගය වැළැක්වීම, පාලනය සහ ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශනය ලබා දීම එමඟින් සිදු කරයි.

4. මාධ්‍ය ප්‍රචාර මඟින් ජනතාව දැනුවත් කිරීම.

රාජ්‍ය අනුග්‍රහය මඟින් යල සහ මහ කන්න වගා කිරීමට සහ අස්වනු නෙළීමට ප්‍රථම සහ මෝසම් වැසි සමයට පෙර ගුවන් විදුලි පණිවුඩ, රූපවාහිනී වැනි විද්‍යුත් මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතිනවා.

5. පෝස්ටර් සහ තොරතුරු පත්‍රිකා හරහා ප්‍රජාව දැනුවත් කිරීම.

6. පූර්ව ප්‍රතිකාර ලබා දීම.

ඔබතුමන්ලා දන්නවා, අපි prophylaxis එකක් හරි doxycycline ලබා දෙන බව. ඒක ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දෙනවා වාගේම ලබා ගැනීමට අවශ්‍ය පෙලඹවීම ඇති කිරීම සඳහා තමයි අපි ඒ දැනුවත් කිරීම කරන්නේ.

7. රෝහල්වල මී උණ මරණ සමාලෝචනය.

රෝහල් මට්ටමින් මරණ සමාලෝචනය කරමින්, මරණයට හේතු හඳුනා ගැනීම මඟින් ප්‍රතිකාර, මාර්ගෝපදේශ ශක්තිමත් කිරීම.

අපට මේ මරණ වළක්වා ගැනීමට තිබෙන හොඳම ක්‍රමයක් තමයි ඒ ක්‍රියාවලිය.

8. සායනික මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීම.

බහු ආංශික විද්වත් කමිටුව නවතම සාක්ෂි සහ පර්යේෂණ යාවත්කාලීන කර, තාක්ෂණික උපකමිටු සහ වෛද්‍ය විශේෂඥයන්ගේ දායකත්වයෙන් සංශෝධනය කරමින් පවතී.

9. වෛද්‍ය නිලධාරින් පුහුණු කිරීම සහ දැනුවත් කිරීම.

වෛද්‍ය නිලධාරින් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර, නිරීක්ෂණ වාර්තා සහ රෝග කළමනාකරණය වැඩි දියුණු කර මරණ සහ සංකූලතා අවම කර ගැනීමට ක්‍රියා කිරීම.

10. පර්යේෂණ ක්‍රියාත්මක කිරීම.

මී උණ රෝගය පැතිරීම පිළිබඳ දැනුම ජාත්‍යන්තර මට්ටමින් පවා අවම මට්ටමක පවතින අතර, ඒ පිළිබඳ වැඩිදුර අධ්‍යයනය සඳහා සතුන්ගේ බලපෑම, කාලගුණ තත්ත්වය සහ පාරිසරික සාධක පිළිබඳ පර්යේෂණ ක්‍රියාත්මක කිරීම.

11. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ප්‍රමුඛ බෝවන රෝගයක් ලෙස පිළිගැනීම.

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් මී උණ රෝගය ප්‍රමුඛ බෝවන රෝගයක් ලෙස පිළිගැනීම සඳහා 2025 ලෝක සෞඛ්‍ය සමුළුවේ යෝජනා කිරීමට ශ්‍රී ලංකාව පුරෝගාමී වීම.

(ආ) පැන නොනඟී.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

බොහොම ස්තූතියි, ගරු ඇමතිතුමනි. දීර්ඝ උත්තරයක් ලැබුණා. රාජ්‍ය මැදිහත්වීමක් වාගේම මේ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන බවක් සහ සෞඛ්‍ය අංශයේ මැදිහත්වීමක් තිබෙන බව බොහොම පැහැදිලියි. නමුත් ඔබතුමා ඉදිරිපත් කරපු වාර්තා අනුවම පැහැදිලි වෙන කාරණය තමයි, අපි බලාපොරොත්තු වන ප්‍රමාණයට වඩා වාර්ෂිකව මී උණ රෝගීන් වාර්තා වීම ඉහළ ගිහිල්ලා තිබෙනවා කියන එක. මහ කන්නය ආරම්භ කිරීම සඳහා මේ මාසය, ලබන මාසය වෙනකොට ගොවීන් සියලුදෙනාම කුඹුරුවලට බහින කාල සීමාව තමයි උදා වෙලා තිබෙන්නේ. මේ කාලසීමාවේ තමයි doxycycline කියන පෙත්ත ගන්නට උනන්දු කරන්න ඕනෑ. ඒ සඳහා විශාල වශයෙන් ක්‍රියාත්මක වීමකුත් වෙනවා. ගරු ඇමතිතුමනි, ඒක ප්‍රමාණවත් මදි කියන එක තමයි දැනෙන්නේ. ඔබතුමා කිව්වා වාගේම රාජ්‍ය මාධ්‍ය හරහා ඒ දැනුවත් කිරීමේ කටයුත්ත සිදු කෙරෙනවා. ඊට වැඩිය ජනතාව අතර ප්‍රචලිතව තිබෙනවා, පෞද්ගලික මාධ්‍ය. ඔබතුමන්ලාට පෞද්ගලික මාධ්‍යවලින් ඉල්ලීමක් කළ හැකියි, ප්‍රජා සත්කාරයක් විධියට ඒ කටයුත්ත කරන්න කියලා.

අනෙක් පැත්තෙන්, ඔබතුමන්ලාට මේ දේ කරන්න පුළුවන් ද? පොහොර සහනාධාරය ලබා ගැනීම වෙනුවෙන් ගොවීන් සියලුදෙනාම ලියාපදිංචි වෙනවා. පොහොර සහනාධාරය ලබා ගන්නට ලියාපදිංචි වෙන මොහොතේම ඒ දේ කරන්න පුළුවන්. කුඹුරට බහින්න කලින් පොහොර සහනාධාරය ලබා දීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරන්න ඕනෑ නේ. ඒ කටයුතු සිදු වෙනවා නම් එතැනදී මේ සඳහාත් යම් පෙලඹවීමක් සිදු කිරීමට කටයුතු කරනවා නම්, මේ කාරණයේදී ගොවියා ආරක්ෂා කර ගන්න අපට පුළුවන් වෙයි. ගරු ඇමතිතුමනි, රෝගී තත්ත්වයට පත් වුණාම ICU වලට යොමු කරන්න සිදු වෙනවා. අපේ තිබෙන ICU ඇඳන් ප්‍රමාණයත් එක්ක මේ රෝගීන්ට ලැබෙන ප්‍රමුඛතාව අඩු වෙලා ඒ අය නිරපරාදේ මියැදෙන එක තමයි අපට දකින්නට තිබෙන්නේ. අපට තිබෙන්නේ සීමිත කාලයක්. මේ කෙටි කාලයේදී ඔබතුමාට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද කියලා දැන ගන්න මම බලාපොරොත්තු වෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ සාධනීය යෝජනාවලට හා මැදිහත්වීමට බොහොම ස්තුතියි. විශේෂයෙන්ම වී සම්බන්ධයෙන් ගත්තොත්, වගා කරන බිම් ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. යෙදෙවෙන ගොවීන් ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ඔබතුමාත් දන්නවා ඇති, පොහොර සහනාධාරය සඳහා ලබා දෙන මුදලට තවත් රුපියල් මිලියන 5,000ක් එකතු කරන්න කැබිනට් මණ්ඩලයෙන් අනුමත කළ බව. මොකද, ඉඩම් වැඩි ප්‍රමාණයක් වගාවට යෙදවීම නිසා. ඒ කරුණ එකක්. දෙවැනි කරුණ මෙයයි. වෙන දා වගාවේ නොයෙදුණු පිරිස් වගාවට ආවාට පස්සේ, අපි මාධ්‍ය මඟින් කොතරම් ප්‍රචාරය කළත් ඒගොල්ලන්ට සාමාන්‍ය ගොවියා වාගේ ඒ ක්‍රියාවලිය ගැන හොඳ අවබෝධයක් නැති වෙන්න පුළුවන්.

ගොවීන් දැනුවත් කිරීමේ කටයුත්ත වෙනුවෙන් පෞද්ගලික මාධ්‍ය යොදා ගන්න කියා ඔබතුමා සඳහන් කළ යෝජනාව ගැන අපි සාකච්ඡා කරන්නම්. ඉදිරි මාස 3 සඳහාම අවශ්‍ය ප්‍රමාණයට doxycycline රජය සතුව පවතිනවා. ඒ වාගේම හෙට අනිද්දා වෙනකොට තව මාස 9කට අවශ්‍ය ප්‍රමාණය ලැබෙනවා. ඒ කියන්නේ, තව සතියක් යනකොට අවුරුද්දකටම අවශ්‍ය ප්‍රමාණය අප අතට පත් වනවා. සාමාන්‍යයෙන් මාසයකට අවශ්‍ය ප්‍රමාණය කලින් ප්‍රමාණයට වඩා දැන් වැඩි වෙලා තිබෙන්නේ. මාසයකට ලක්ෂ 10ක පමණ ප්‍රමාණයක් දැන් අවශ්‍යයි. කවුරුවත් ඒක ප්‍රශ්නයක් කරගන්න අවශ්‍ය නැහැ. වසරකට අවශ්‍ය doxycycline ප්‍රමාණය පවතිනවා. ඔබතුමා කිව්වා වාගේම දැන් ඕනෑකම තිබෙන්නේ කුඹුරට බහින ගොවියා මේ සම්බන්ධව දැනුවත් කර ඉක්මනට එම prophylaxis ගැනීමට යොමු කරවීමයි. ඒ සම්බන්ධව අපේ සෞඛ්‍ය අංශ අවධානය යොමු කරමින් ඉන්නවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. මේ කාරණය සම්බන්ධව අවධානය යොමු වෙලා තිබෙනවා, කටයුතුත් සිදු වෙනවා. මේ සඳහා අපි ඉක්මනින්ම ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාව තමයි තිබෙන්නේ. ඒ සඳහා කටයුතු කරන්න කියා ඉල්ලන ගමන්, ඊළඟට මම කියන්න යන්නේ වකුගඩු රෝගීන් ගැන ගැන නිසා මී උණ ගැන අහලා වකුගඩු රෝගය ගැනත් අහනවා කියලා චෝදනා කරන්න එපා කියලාත් ඔබතුමාගෙන් ඉල්ලනවා.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කය ඇතුළු ප්‍රදේශ ගණනාවක ජනතාව අද වෙනකොට විශාල වශයෙන් මුහුණ දෙන ගැටලුවක් තමයි, වකුගඩු රෝගය. මම දැක්කා, ඊයේත් මේ සම්බන්ධව පාර්ලිමේන්තුවේදී කථා කළා. ගරු ඇමතිතුමනි, මේ වන විට ටෙන්ඩර්වල වෙච්ච මොකක් හරි අතපසුවීමක් නිසා dialysis කරන වකුගඩු රෝගීන්ට ඒ සඳහා අවශ්‍ය කටුවල හිඟයක් තිබෙනවා. විශාල මුදලකට ඒවා මිලදී ගැනීමේ හැකියාවක් නැති නිසා dialysis නොකර ගෙවල්වලට යන රෝගීන් ප්‍රමාණයකුත් අද වාර්තා වෙමින් තිබෙනවා.

වකුගඩු රෝගය නිසා විශාල වශයෙන් පීඩාවට පත් වුණු ජනතාවක් සිටින දිස්ත්‍රික්කයක් තමයි, අනුරාධපුර දිස්ත්‍රික්කය. විශේෂයෙන්ම මැදවච්චිය ආසනය ගත්තාම එවැනි රෝගීන් විශාල වශයෙන් වාර්තා වෙනවා. පසුගිය කාලයේ අපි ඒ සම්බන්ධව බොහෝ දේවල් කළා. පරීක්ෂණ කරලා, ක්‍රියාමාර්ග අරගෙන, වතුර filters සවිකර ගොඩක් දේවල් කරලා අපි ඒ සම්බන්ධව යම් කිසි ප්‍රගතියක් අත් කර ගත්තා. හැබැයි, දැන් ආපසු බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. Dialysis කරන්න එක රෝගියෙකුට එක වාරයකට රුපියල් 8,000ක විතර වියදමක් දරන්න රජයට සිද්ධ වනවා. හැබැයි, එතැනට එනකොට එම රෝගියාගේ ජීවිතය අවදානම් තත්ත්වයකට ඇවිත් තිබෙන්නේ. ඒ වාගේම ඒ වෙනකොට එම රෝගියාගේ පවුලේ අනාගතයත් සම්පූර්ණයෙන්ම ඉවරයි, පවුලේ ආර්ථික මට්ටම විනාශ වෙලා. ඒ අය කුඹුරු උකස් කරලා, තිබෙන දේවල් විකුණලා කොහොම හරි එම රෝගියා තව අවුරුද්දක්, දෙකක් හෝ ජීවත් කරගන්න සියලු උත්සාහ දරනවා. එම රෝගියා මැරෙනකම් බලාගෙන ඉන්න බැරි නිසා ඒ තත්ත්වයට ඔවුන් පත් වනවා. පසුගිය කාලයේ ජාතික වකුගඩු රෝග නිවාරණ හා පර්යේෂණ ඒකකයෙන් මේ සම්බන්ධව විශාල කාර්යභාරයක් ඉෂ්ට වුණා; කල්ඇතිව පූර්ව පරීක්ෂණ සිදුකර, වකුගඩු රෝගීන් විශාල වශයෙන් හඳුනා ගෙන, කල් වේලා ඇතිව අවශ්‍ය ප්‍රතිකර්ම යෙදුවා. ගිය වසරේ -මේ ජනවාරි වෙනකම්- දවසකට 350ක් විතර පරීක්ෂණ සිදු කර තිබෙනවා. හැබැයි, මේ වසරේ ජනවාරි මාසයේ ඉඳලා අද වන විට මාස 10ක් සම්පූර්ණ වෙන්න එනවා, නමුත් මේ මාස 10 පුරාවට එම ආයතනයෙන් එකදු පූර්ව පරීක්ෂණයක්වත් සිදු කර නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්නය කෙටි කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

හොඳයි.

ගරු ඇමතිතුමනි, එහෙම පරීක්ෂණ නොකළාම කල්වේලා ඇතිව රෝගීන් හඳුනා ගන්න හම්බ වෙන්නේ නැහැ. රෝගී තත්ත්වයට පත් වෙලා, dialysis කළේ නැත්නම්, අසාධ්‍ය තත්ත්වයට පත් වුණාම තමයි රෝගීන් හඳුනා ගන්නේ. එතකොට රජයට විශාල වැය බරක් දරන්නත් වෙනවා. අනෙක් පැත්තෙන්, ජීවිත අවදානම් තත්ත්වයකුත් මතු වෙනවා. ඒ නිසා කලින් කරගෙන ආවා වාගේ එම පරීක්ෂණ කටයුතු සිදු කිරීමටත්, ප්‍රතිකාර සඳහා අවශ්‍ය කටු ටික ඉක්මනින්ම එම රෝගීන්ට ලබා දීමටත් අවශ්‍ය පියවර ගන්නවාද කියා මා දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, මම මීට කලිනුත් මේ ගැන සඳහන් කළා. මම පෞද්ගලිකවම රෝහල් ගණනාවකට කථා කරලා මේ ගැන සොයා බැලුවා. පොළොන්නරුව ජාතික වෘක්කවේද විශේෂිත රෝහලේ ඉඳලාම මේ තත්ත්වය කළමනාකරණය කර ගනිමින් පවතිනවා. ඇත්තටම රෝගීන් හරවා යැවීමක් වාර්තා වෙන්නේ නැහැ. සමහර තැනක ප්‍රාදේශීය මිලදී ගැනීම් ක්‍රියාවලියට ගත වන කාලය නිසා රෝගියෙකුට මේ කටුව එළියෙන් මිලදී ගන්න කියා තිබෙනවා. නමුත් අද වෙනකොට එම කටු මෙරටට ගෙන්වන පෞද්ගලික සමාගම් දෙකක් විසින් ඒවා ගෙනැල්ලා market එකට දමා තිබෙනවා. ඒ අනුව ප්‍රාදේශීය මිලදී ගැනීම් වේගවත් කර තිබෙනවා. මම ඊයේ බදුල්ල ශික්ෂණ රෝහලටත් කථා කළා. බදුල්ල ශික්ෂණ රෝහලේ දවසකට සාමාන්‍යයෙන් රෝගීන් 35ක් විතර dialysis කරනවා. ඒ කටයුතු දැන් කළමනාකරණය කරගෙන යන්න පුළුවන්. වෛද්‍ය සැපයුම් ඒකකය හරහා, රෝහල්වලට කිසිම ප්‍රශ්නයක් ඇති නොවන විධියට fistula needles ලබා දීම තව දවස් කිහිපයක් යනකොට අනිවාර්යයෙන්ම සිද්ධ වෙනවා. දැනට තාවකාලික පිළියමක් හැටියටයි මේ දෙය කරගෙන යන්නේ. පරීක්ෂණ සම්බන්ධයෙන් ඔබතුමා කියපු දේ ගැන මම අවධානය යොමු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -625/2025- (1), ගරු කිංස් නෙල්සන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## තේ කර්මාන්තය: අනාගත සුරක්ෂිතභාවය

தேயிலை கைத்தொழில்: எதிர்கால பாதுகாப்பு
TEA INDUSTRY: FUTURE SECURITY

984/2025

**9. ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වන විට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින තේ කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;
(ii) මෙම වර්ෂය තුළ තේ කර්මාන්තශාලා 225ක් පමණ වැසී ගොස් ඇති බව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් ප්‍රකාශ කර ඇති බව දන්නේද;
(iii) එම ප්‍රකාශය සත්‍යයක්ද;
(iv) ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු හිමියන්ගේ සහ තේ කර්මාන්තයේ අනාගත සුරක්ෂිතභාවය සහතික කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் இன்றளவில் இயங்கிவரும் தேயிலைத் தொழிற்சாலைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;
(ii) இவ்வருடத்துக்குள் சுமார் 225 தேயிலைத் தொழிற்சாலைகள் மூடப்பட்டுள்ளதாக தேயிலை சிறு பற்றுநிலங்கள் அதிகாரசபையின் தலைவர் கூறியிருப்பதை அவர் அறிவாரா என்பதையும்;
(iii) மேற்படி கூற்று உண்மையானதா என்பதையும்;
(iv) இலங்கையில் தேயிலை சிறு பற்றுநில உரிமையாளர்களினதும், தேயிலை கைத் தொழில் துறையினதும் எதிர்கால பாதுகாப்பை உறுதிப்படுத்த முடியுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House-
(i) the number of tea factories which are currently in operational state in Sri Lanka;
(ii) whether he is aware that the Chairman of the Tea Small Holdings Development Authority has stated that about 225 tea factories had been closed down during this year;
(iii) whether the statement concerned is true; and
(iv) whether the future security of the tea smallholders and the tea industry in Sri Lanka will be ensured?

(b) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට උත්තර දෙන්න මම සූදානම්. ඊට ප්‍රථම මට පොඩි අවසරයක් දෙන්න, අපේ අමාත්‍යාංශයට අදාළව ජාත්‍යන්තර මට්ටමින් ලැබුණු ඇගැයීමක්, සම්මානයක් පිළිබඳව පාර්ලිමේන්තුවේදී සතුට ප්‍රකාශ කරන්න.

පසුගිය දවසක ජපානයේ ඔසාකා නුවරදී තේ කර්මාන්තය සම්බන්ධයෙන් ලෝක වෙන්දේසියක් පැවතුණා. ගරු මන්ත්‍රීතුමා අහලා තිබෙන්නේත් තේ කර්මාන්තය සම්බන්ධයෙන්. එහිදී අපි විශේෂ රන් සම්මානයක් ලැබුවා, ගිනස් වාර්තාවලටත් එකතු වුණා. සබරගමුව කලාපයේ රන් ජයග්‍රාහකයා හැටියට නව විතානකන්ද තේ කර්මාන්තශාලාව තේරී පත් වුණා. ලෝකයේ වැඩිම මිලට අලෙවි වුණේ නව විතානකන්ද තේ කර්මාන්තශාලාවේ කළු තේ - black tea - කිලෝ එක. එය, ඇමෙරිකානු ඩොලර් 860ක්. රුපියල්වලින් ගත්තොත්, දෙලක්ෂ පනස් පන්දහසක්. එය අපේ තේ කර්මාන්තයේ උන්නතියට, අනාගතයට බොහෝ වටිනා අවස්ථාවක් හැටියට අපි සලකනවා. ඒ වෙනුවෙන් ඇප කැප වුණු නව විතානකන්ද තේ කර්මාන්තශාලාවේ කළමනාකාරිත්වයට අපේ ස්තූතිය මේ අවස්ථාවේදී පිරිනමනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා තේ මණ්ඩලයත්, කොළඹ තේ වෙළඳුන්ගේ සංගමයත් තමයි මේකට මූලික වුණේ. ඔවුන්ටත් අපේ ස්තූතිය මේ මොහොතේ පිරිනමනවා.

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇසූ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) තේ කර්මාන්තශාලා 567කි.

| | දිස්ත්‍රික්කය | ලියාපදිංචි තේ කර්මාන්තශාලා | වර්තමානය වන විට තේ නිෂ්පාදනය සිදු කරන කර්මාන්තශාලා (2025) |
|---|---|---|---|
| 1 | බදුල්ල | 62 | 57 |
| 2 | කොළඹ | 2 | 1 |
| 3 | ගාල්ල | 116 | 101 |
| 4 | හම්බන්තොට | 1 | 1 |
| 5 | කළුතර | 34 | 29 |
| 6 | මහනුවර | 88 | 73 |
| 7 | කෑගල්ල | 24 | 18 |
| 8 | මාතලේ | 6 | 6 |
| 9 | මාතර | 96 | 79 |
| 10 | මොනරාගල | 0 | 0 |
| 11 | නුවරඑළිය | 129 | 116 |
| 12 | රත්නපුර | 104 | 86 |
| | මුළු එකතුව | 662 | 567 |

(ii) ඔව්.
(iii) එය අසත්‍ය ප්‍රකාශයකි.

ඔබතුමා අහලා තිබුණේ, අපේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා මේ වෙන කොට ලංකාවේ තේ කර්මාන්තශාලා 225ක් වැසී ගොස් තිබෙනවා කියලා අපේ කාලය -පසුගිය මාස කීපයකට පෙර- තුළ කිව්වා, ඒක සත්‍යයක්ද කියලායි. ඒක අසත්‍ය ප්‍රකාශයක්. එතුමා පසුව මාධ්‍ය සාකච්ඡාවක් තියලා එය නිවැරදි කළා, ඒක එතුමා අතින් සිදු වෙච්ච වැරැද්දක් කියලා.

ඒ අනුව මෙම වර්ෂයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් වසා දමා ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව 6යි. ඒ කියන්නේ, 2025 වසරේ වසා දැමූ කර්මාන්තශාලා සංඛ්‍යාව 6යි. හැබැයි, මම සන්තෝෂයෙන් කියන්න ඕනෑ, මේ අවුරුද්දේ කර්මාන්තශාලා 6ක් වැහෙනකොට පසුගිය කාලයේ වසා දමා තිබුණු කර්මාන්තශාලා 16ක් අපි විවෘත කර තිබෙන බව. ඔබතුමාගේ ප්‍රශ්නයට උත්තරයක් හැටියට මම මේ තොරතුරු ටික කියන්නම්.

රත්නපුරේ කර්මාන්තශාලාවක් - ග්‍රීන් මවුන්ට් කර්මාන්තශාලාව - අපි මේ අවුරුද්දේ විවෘත කළා. මේ අවුරුද්දේ ගාල්ල දිස්ත්‍රික්කයේ රත්කන්ද හා පිඹුරගල කියන කර්මාන්තශාලා දෙක විවෘත කළා. මාතර දිස්ත්‍රික්කයේ පසුගිය කාලයේ වසා දමා තිබුණු කර්මාන්තශාලා 6ක් අපි මේ අවුරුද්දේ විවෘත කළා. ඒ තමයි වුඩ්ලන්ඩ් කර්මාන්තශාලාව, සුදුගහහේන කර්මාන්තශාලාව, නිව් ගාමිණී කර්මාන්තශාලාව, තම්මැන්නා කර්මාන්තශාලාව, ත්‍රී ටයිම්ස් කර්මාන්තශාලාව, දන්ලන්ද කර්මාන්තශාලාව.

ඒ වාගේම ගම්පොළ වසා දමා තිබූ කර්මාන්ත ශාලා 6ක් අපි මේ අවුරුද්ද ඇතුළත විවෘත කරනු ලැබුවා. ඒ තමයි, නිව් ෆර්න්ලන්ඩ් කර්මාන්ත ශාලාව, මුරුතලාව කර්මාන්තශාලාව, පුස්සතැන්න කර්මාන්තශාලාව, පුපුරැස්ස කර්මාන්තශාලාව, ගොඩපොළ කර්මාන්ත ශාලාව, පන්සල්තැන්න කර්මාන්තශාලාව. අපි බදුරලියේ නිල්ගහහේන කර්මාන්ත ශාලාවත් විවෘත කළා.

ඒ වාගේම ගරු කථානායකතුමනි, කර්මාන්ත ශාලා වැසී යෑම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට තව පැහැදිලි කිරීමක් හැටියටයි මම මෙය කියන්නේ. 2018 අවුරුද්දේ කර්මාන්ත ශාලා 13ක්, 2019දී 17ක්, 2020දී 20ක්, 2022දී 14ක්, 2023දී 19ක් සහ 2024දී -ගිය අවුරුද්දේ- කර්මාන්තශාලා 17ක් වැහිලා තිබෙනවා. මේ අවුරුද්දේ මේ වෙනකොට කර්මාන්තශාලා 6ක් වැහෙනකොට අපි වහපු කර්මාන්තශාලා 16ක් විවෘත කර තිබෙනවා.

(iv) ඔව්.

තේ කර්මාන්තයේ අනාගත සුරක්ෂිතභාවය වෙනුවෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය විසින් තේ කර්මාන්තශාලා සහ අනෙකුත් තේ කර්මාන්තයේ නියැළෙන පාර්ශ්වකරුවන් සඳහා තේ කර්මාන්තයේ තිරසාර පැවැත්ම සහ නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා විවිධ ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. එම විස්තර ඇමුණුම මගින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය භාර දීලා මේ වනකොට මාස හයක් වනවා. මම මේ ප්‍රශ්නය අහන්න පළමුවෙනි හේතුව මේකයි. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ හිටපු සභාපතිවරයා මාධ්‍ය සාකච්ඡාවක් තියලා කිව්වා, තේ කර්මාන්තශාලා 225ක් අවුරුද්ද තුළ වැහුණා කියලා. මම තමයි මේ පාර්ලිමේන්තුවේදී මේ ගැන ඇහුවේ, මේක අදහා ගන්න බැරි නිසා. මේ ආණ්ඩුව ඇවිල්ලා දැන් අවුරුද්දයි. තේ කර්මාන්තශාලා 225ක් එක අවුරුද්දට වැහුණා කියලා ඒ සභාපතිවරයා කිව්වා. සභාපතිවරයා එහෙම කියපු හින්දා තමයි අපි මේ ප්‍රශ්නය ඇහුවේ, එක වතාවටම 225ක් කොහොමද වැහුණේ කියලා. මේ ප්‍රශ්නයත් අද අහනවා. අපි පාර්ලිමේන්තුවේදී ඒ ගැන කිව්වාට පස්සේ මේ සභාපති නැවත රෑ මාධ්‍ය සාකච්ඡාවක් තියලා ඒක නිවැරදි කර ගත්තා. ඒක තමයි පළමුවෙනි ප්‍රශ්නය.

ඊළඟට, තව ඇමතිවරයෙක් කිව්වා, අපේ තේවලට නොබෙල් තෑග්ගක්ද මොකක්ද හම්බ වුණා කියලා. නොබෙල් තෑග්ග නොවෙයි. ගරු ඇමතිතුමනි, ඔයගොල්ලන්ගේ ඇමති කෙනෙක් තමයි එහෙම කිව්වේ. එහෙම නේද? අපි නොවෙයි, මේවා වරද්දන්නේ. සභාපති වැරැද්දුවා, එක අවුරුද්දේ තේ කර්මාන්තශාලා 225ක් වැහුවා කියලා; ඒක පසුව නිවැරදි කළා. තව ඇමතිවරයෙක් ගිහිල්ලා කිව්වා නොබෙල් තෑග්ග හම්බ වුණා කියලා . හිටපු කථානායකතුමාගේ ලිපිය තවම ජපානයෙන් හම්බ වෙලාත් නැහැ. හිටපු කථානායකතුමා තවම ඒක හොයනවා.

ඇමතිවරයෙක් වරද්දලා කිව්වා, තේවලට නොබෙල් තෑග්ග හම්බ වුණා කියලා. ඒ ඇමතිතුමා කර්මාන්ත ඇමති. ඔබතුමා වැවිලි කර්මාන්ත ඇමති. එක්කෝ, මේ ඇමතිතුමාට ඒ උත්තර දෙන්න ඉඩ දෙන්න ඕනෑ. මැදින් පැනලා ඒ ගැන කියලා ඒකත් වරද්දා ගත්තා. ඒ හින්දා තමයි අපි මේ ප්‍රශ්න අහන්නේ. මේවා වරද්දා ගන්න එපා කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මම ඇහුවේ තේ කර්මාන්තශාලා පිළිබඳව. දැනට අපි තේ කර්මාන්තශාලා ටික කරගෙන යනවා නේ.

ගරු ඇමතිතුමාගෙන් මම මේ කාරණයත් අහනවා. හෙට බණ්ඩාරවෙල ඔප්පු වගයක් දෙනවාය කියලා තිබෙනවා, වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව ජීවත් වන ජනතාවට. ඒක බොහොම හොඳයි. ඒ ගැන අපි සතුටු වෙනවා. ඔයගොල්ලන් ඔප්පු 5,000ක්ද, 3,000ක්ද දෙනවා කියලා තිබෙනවා. ඒ ගැන අපි සතුටු වෙනවා.

ගරු ඇමතිතුමනි, වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය ගැන කථා කරනකොට මම කියන්න කැමතියි, වතුකරයේ ජීවත් වන ජනතාව හැම ආණ්ඩුවකින්ම පඩි වැඩිවීමක් ඉල්ලපු බව. මේ ආණ්ඩුව ඇවිල්ලා මේ වනකොට අවුරුද්දයි. ඔබතුමා වැඩ භාරගෙනත් මාස 11යි. හැබැයි, තව වනතුරු වතු කම්කරුවන්ගේ වැටුප් වැඩිවීමක් වෙලා නැහැ. වතු කම්කරුවන්ගේ වැටුප් වැඩිවීම ගැන ඔබතුමා මොකක්ද කියන්නේ? මේ අවුරුද්දේ හෝ මේ වැටුප් වැඩිවීම සිදු වෙයි කියා වතු කම්කරුවන් විශාල පිරිසක් බලාගෙන ඉන්නවා. අන්න, ඒකට පොඩි උත්තරයක් දෙන්න කියන එක තමයි මම පළමුවන අතුරු ප්‍රශ්නය විධියට ඔබතුමාට ඉදිරිපත් කරන්නේ.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

හොඳයි. ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ අතුරු ප්‍රශ්න ඇතුළේ හතුරු ප්‍රශ්නත් තිබෙනවා; වර්ග දෙකම තිබෙනවා. ඒ නිසා ඒවාට පැහැදිලි කිරීම් කරන්න මම සූදානම්. මෙතුමා කිව්වා වාගේ තේ කර්මාන්තයේ යෙදෙන කර්මාන්තශාලා සම්බන්ධයෙන් අපේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා පැහැදිලි කිරීමක් කළා. ඒ පැහැදිලි කිරීමේදී එතුමාගේ අතින් කියැවුණු වැරැද්දක් තිබුණා. ඊට පසු දින එතුමා මාධ්‍ය සාකච්ඡාවක් පවත්වා එය නිවැරදි කළා. හරි විධියට නම් මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න ඕනෑ නැහැ නේ, ඒක නිවැරදි කළාට පසුව. නමුත්, ප්‍රශ්නය ඉදිරිපත් කළා. ඒක ඔබතුමාගේ අයිතිය. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

දැන් මෙතැනදී අපි පැහැදිලි කළා, තේ කර්මාන්තය සම්බන්ධයෙන් අපේ රටේ කර්මාන්තකරුවෙක් ගිනස් වාර්තාවක් තැබුවාය කියන කාරණය. මම හිතන විධියට, ඒක විපක්ෂයටත් සතුටට කාරණයක් විය යුතුයි, ඔබතුමන්ලාත් ඒක ඇගැයීමට ලක් කළ යුතුයි, ඒ ගැන වචනයක් කිව යුතුයි. මොකද, අපේ රටට විදේශ විනිමය ලැබෙන විශාල ක්ෂේත්‍රයක්, තේ ක්ෂේත්‍රය. ඒක ලෝකයේ ඇගැයීමට ලක් වීම අපි කාටත් සතුටට කාරණයක්. ඒකයි මම හිතන්නේ, ඒ ගැන ප්‍රකාශයක් කරන්න ඕනෑ කියලා. ඒක නොවෙන එක තමයි එක් පැත්තකින් කනගාටුවට කාරණය.

කොහොම නමුත් දැන් ඔබතුමා කර්මාන්තශාලා ගැන අහපු නිසා මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ රටේ කර්මාන්තශාලා වැහෙන හේතු තිබෙනවා. මම දන්නවා, මෙතැන තේ කර්මාන්තය සම්බන්ධයෙන් හොඳට දන්නා හිටපු ඇමතිවරු ඉන්න බව. අපේ මනෝ ගනේසන් මන්ත්‍රීතුමන්ලා මේ ක්ෂේත්‍රය ගැන දන්නවා. එතුමන්ලා මේක හොඳට දන්නා කාරණාවක්. පෙරේදාත් උඩුනක ඇති වූ දෝෂයක් නිසා මස්කෙළියේ ලක්ෂපාන කර්මාන්තශාලාව ගිනි ගත්තා. ඒ වාගේ හේතු නිසා කර්මාන්තශාලා වැහෙනවා. සමහර ඒවා කළමනාකරණ දෝෂ සහිතව වැහෙනවා. ඊයේ පෙරේදා උද්ඝෝෂණයකුත් පැවැත්වුවා, හපුතලේ නගරයේ, කහගල්ල කර්මාන්තශාලාව වැසී යනවාය කියලා. අද උදේත් මම ඒ කර්මාන්තශාලාවේ Factory Manager එක්ක සාකච්ඡා කළා. ඇත්තටම ඒ කර්මාන්තශාලාවේ අඹරන්නේ අමු තේ දළු නොවෙයි, එය කසළ තේ අඹරන තැනක්. ඒ අයට අවශ්‍ය කම්කරුවන් ප්‍රමාණය නැහැ. කම්කරුවන්ගේ හිඟයක් තිබෙනවා. 155දෙනෙක් ඉන්න ඕනෑ තැන 20දෙනායි ඉන්නේ. ඒ නිසා කර්මාන්තශාලාව පවත්වාගෙන යන්න බැහැ. ඒ ගැටලු අපි විසඳන්න ඕනෑ. නමුත්, අපි මේ රටේ තේ කර්මාන්තය ආරක්ෂා කරන්න කටයුතු කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, මම මේ උත්තරය දෙන්නේ ඔබතුමාගේ සැබෑ අතුරු ප්‍රශ්නයටයි. ඔබතුමා ඇහුවා, වතුකරයේ ජනතාවගේ සැබෑ ප්‍රශ්නවලට විසඳුම් දීම සම්බන්ධයෙන්. ඔව්, අපි ඔබතුමාටත් ආරාධනා කර තිබෙනවා, මනෝ ගනේසන් මන්ත්‍රීතුමාටත් ආරාධනා කර තිබෙනවා, මේ වැඩසටහන්වලට. ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් මේ මස 12වැනි දා බණ්ඩාරවෙල මහජන ක්‍රීඩාංගණයේදී මේ රටේ වැවිලි ක්ෂේත්‍රයේ, විශේෂයෙන්ම ලැයිම් කාමරවල ඉන්න මලෙයහම් ප්‍රජාවට අපි නිවාස 2,056කට හිමිකම් පත්‍ර ලබා දෙන්න සැලසුම් කර තිබෙනවා. විශේෂයෙන්ම මම මේ මොහොතේදී ඉන්දියාවට ස්තුතිවන්ත වෙනවා. ඉන්දියානු ආධාරය යටතේ තමයි ඒවා ලබා දෙන්නේ. ඔප්පුව ලබා දෙන්නේ එදිනම නොවෙයි. අපි සංකේතාත්මක වශයෙන් කිහිපදෙනෙකුට ඔප්පු ලබා දෙනවා. ඔප්පු 237ක් ලැහැස්ති කර තිබෙනවා. එයින් පිරිසකට අපි ඔප්පු ලබා දෙනවා. ඒ වාගේම, මේ නිවාස සම්බන්ධයෙන් මම පැහැදිලි කිරීමක් කරන්න කැමැතියි. ඉන්දියානු රජය සහ ලංකා රජය ඒකාබද්ධ වෙලා නිවාස 2,056ක් ලබා දෙනවා. ගරු කථානායකතුමනි, ඒ එක නිවාසයක් හදන්න රුපියල් ලක්ෂ 32ක් අපි වැය කරනවා. පාරවල් ටික හදලා, වතුර ටික දීලා, විදුලිය දීලා, යටිතල පහසුකම් හදලා අපි ඒ නිවාස හදලා දෙනවා. මලෙයහම් ප්‍රජාව මේ රටට ඇවිල්ලා 2023ට වසර 200ක් පිරුණා. වසර 200ක් පිරුණත්, හිටපු අධිරාජ්‍යවාදීන්ටත්, ඔබේ ආණ්ඩුවලටත් මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම විසඳන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. අපිට වුණත් මේ ප්‍රශ්න දවසින් දෙකින් විසඳන්න පුළුවන්කමක් නැහැ කියලා අපි හිතනවා. නමුත්, ඒක ක්‍රමානුකූලව විසඳන්න අපි කටයුතු කරමින් ඉන්නවා. *[බාධා කිරීමක්]* ඒ අනුව නිවාස 2,056ක් සකස් වෙනවා. ඒ අයට පර්චස් 10ක ඉඩමක් ලැබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

கௌரவ அமைச்சர் அவர்களே, ஒரு விஷயம் - *[இடையீடு]* நீங்கள் நேற்றுச் சொல்லியிருந்தீர்கள், எதிர்வரும் 12ஆம் திகதி 2,056 வீடுகளை வழங்குவதாக. நீங்கள் வீடுகளை வழங்கவில்லை, certificateதான் வழங்குவீர்கள்! அவர்களுக்கு இன்னும் வீடு கிடைக்கவில்லை. நீங்கள் அரசாங்கத்தைப் பொறுப்பெடுத்து ஒரு வருடம். இன்னும் ஒரு வீடுகூட நீங்கள் கட்டவில்லை.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, මේක ප්‍රශ්නයක්. කථාවක් කරනවා නම් වෙනම අවස්ථාවක් දෙන්න, ඒක කරගෙන යන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි. ගරු අමාත්‍යතුමා කථා කරන්න.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මම කියන්නේ මේ උදවියට කලබල වෙන්න දෙයක් නැහැ කියන එකයි. කොහොමටත් දැන් නිවාස හිමිකම් පත්‍ර ලබා දෙනවා කියලා අපි කියා තිබෙනවා. නැත්නම්, බණ්ඩාරවෙලට ගිහිල්ලා නිවාස 2,056කට එක සැරේ නිවාස දෙන්න බැහැ නේ. ඒක කාටත් තේරෙන්න එපායැ. ලබා දෙන්නේ නිවාස හිමිකම් පත්‍රය.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ඔප්පු දෙනවාද?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ඔප්පු දෙනවා. අපි 12වැනි දාට නිවාස 2,056කට හිමිකම දෙනවා. ඒ නිවාස 2,056 හදලා අවසන් වෙලා ඒ උදවියට දෙනකොට එදාම ඔප්පුවත් දෙනවා. කඩදාසියක් නොවෙයි දෙන්නේ. ඊයේ ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා කොළයක් පෙන්වමින් කිව්වා, මෙන්න මේ වාගේ කඩදාසියක් දෙන්නේ කියලා. ඔප්පුවක් දෙනවා කියලා ඒ මිනිස්සුන්ට කඩදාසියක් දීලා හරියන්නේ නැහැ නේ. ජනතාවට අයිතිවාසිකමක් කියන්න අදාළ ඔප්පුව ලබා දෙන්න ජනාධිපතිතුමා ඇතුළුව අපි කටයුතු කර තිබෙනවා. *[බාධා කිරීම්]* ඒ වෙනුවෙන් අපි ඉදිරියේදී කටයුතු කරනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

Sir, I rise to a point of Order

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මොකක්ද ඔබතුමාගේ point of Order එක? *[බාධා කිරීම්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු ඇමතිතුමනි,- *[බාධා කිරීම්]* ගරු ඇමතිතුමනි,- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.*[බාධා කිරීම්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු ඇමතිතුමනි, යහ පාලන ආණ්ඩුව කාලයේ අපි පර්චස් ගණනට සින්නක්කර ඔප්පුවක් දුන්නා. අපේ කාලයේ එහෙමයි දීලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

අපි සින්නක්කර ඔප්පු දුන්නේ, වතු කම්කරුවන්ට. *[බාධා කිරීම්]*

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

මට උත්තරේ දෙන්න ඉඩ දෙන්න. *[බාධා කිරීම්]* මම කිව්වේ මේකයි. ඊයේ ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා මෙතැනදී පැහැදිලි කළා, "කඩදාසියක්, මේක නම් දෙන්න එපා" කියලා. මම අද පැහැදිලි කරනවා, කඩදාසියක් දෙන්නේ නැහැ කියලා. අපි දන්නවා ඒ ජනතාවටත් වසර 200ක් පිරීම නිමිත්තෙන් වර්තමාන ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා ගිහිල්ලා හැටන්වලදී ඓතිහාසික ප්‍රකාශයක් කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමනි, පිළිතුර කෙටි කරන්න.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මෙතුමන්ලා අහන ප්‍රශ්නයට ඔබතුමා අවස්ථාව දුන්නාම මම ඒකට උත්තර දෙන්න ඕනෑ. *[බාධා කිරීම්]* ඒකෙදි අපි පොරොන්දු වුණා, ඔවුන්ට ඉඩමක හිමිකම දෙනවා කියලා, නිවසක හිමිකම දෙනවා කියලා. ඒක දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න පුළුවන්.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

*උත්තරය නැහැ නේ. [බාධා කිරීම්]*

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

Hon. Speaker, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, සිංහලෙන් නැත්නම් දෙමළෙන් කියන්නම්. நாங்க ஒண்ணாவது ප්‍රශ්නයට උත්තරය දෙන්න කියන්න.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

கௌரவ அமைச்சர் அவர்களே! Hon. Minister, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කියන්න, ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

கௌரவ அமைச்சர் அவர்களே, நான் ஒரு விஷயத்தை உங்களுக்குச் சொல்ல விரும்புகிறேன். வீட்டை உடனே கட்டிக் கொடுக்க முடியாது; அதை நானும் ஏற்றுக் கொள்கின்றேன். நல்லாட்சி அரசாங்கத்தில் 2,000 சொச்சம் வீடுகள் கட்டப்பட்டன. நான் அமைச்சராக இருந்த ஒரு வருட காலத்தில் 1,300 வீடுகள் கட்டப்பட்டன.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි.

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
දෙවැනි අතුරු ප්‍රශ්නය නොවෙයි, ගරු කථානායකතුමනි. පළමුවැනි අතුරු ප්‍රශ්නයට උත්තරය දුන්නේ නැහැ. වතු කම්කරුවන්ගේ පඩි වැඩිවීම සම්බන්ධව; පඩි වැඩි කරනවාද කියලා ඇහුවාම උත්තර දුන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, පිළිතුර පැහැදිලි කරන්න.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
පැහැදිලි කර කර ඉන්නකොට නේ මේ මැදින් පනින්නේ, ගරු කථානායකතුමනි. ඔක්කෝම කලබල වෙලා තිබෙන්නේ. *[බාධා කිරීම්]* මෙහෙම,-

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ජාතික ප්‍රශ්නයක් නේ.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
නැහැ, නැහැ, නැහැ. මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. මේ කට්ටිය කවුරුත් කැමැතියි, මේකට උප්පැන්නේ දෙන්න. දීගන්න එකක් දීගන්න. අපි ගෙවල් ටික හදනවා.

ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අර ප්‍රශ්නාවලියේ ප්‍රශ්න ගොඩක් තිබුණා නේ. ඒකයි ගරු මන්ත්‍රීතුමනි, ඒ ඔක්කෝටම උත්තර දීගෙන දීගෙන යන්නේ. ගරු කථානායකතුමාත් ඔබතුමාට ඉඩ දෙනවා ප්‍රශ්න ගොඩක් අහන්න. අපිත් ඒවාට උත්තර දෙනවා. දැන් ඔබතුමා ඇහුවේ වතු කම්කරුවන්ගේ වැටුප් ප්‍රශ්නය ගැන නේද? ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට රාජ්‍ය සේවකයන්ගේ මූලික වැටුප ඉහළින්ම වැඩි කරලා දුන්නා. ඒක රජයට කරන්න පුළුවන් දෙයක්. කම්කරු අමාත්‍යතුමාගේ පැත්තෙන් පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කරන්නත් නීතියේ සැලකිය යුතු ඉඩක් තිබෙනවා. ඒකත් වැඩි කරලා දුන්නා. ජනාධිපතිතුමා කිව්වා, "වතු කම්කරුවන්ගේ වැටුප රුපියල් 1,700 දක්වා වැඩි කරන්න අපි රජයක් හැටියට ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන තිබෙනවා. ඒකට මැදිහත් වෙලා කටයුතු කරනවා" කියලා. අන්න ඒ මැදිහත්වීම දැන් සිදුවෙමින් තිබෙනවා. වතු හිමිකරුවන් සමඟ,-*[බාධා කිරීම්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මේ දෙන පිළිතුර සම්පූර්ණයෙන්ම වැරදියි. හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුවේදී ඉන්දියාවේ අගමැති අපේ ගරු පලනි දිගම්බරම් සහ මනෝ ගනේසන් මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම පරිදි නිවාස 5,000ක් ලබා දෙන්න අවශ්‍ය මුදල් 2016 වර්ෂයේ ලබා දුන්නා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න මම අවස්ථාව ලබා දෙනවා, ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමාට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමනි, ඔබතුමාට දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න පුළුවන්.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் மறுபடியும் மறுபடியும் இந்தச் சபையில் பொய் சொல்லிக்கொண்டிருக் கின்றீர்கள்! *[இடையீடு]* நீங்கள் இன்னும் வீடு கட்டவில்லை! நான் கேட்கின்ற கேள்வி என்னவென்றால், - *[இடையீடு]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Hon. Speaker, I am asking a question. Please do not switch off my mike.

நான் கேட்கின்ற கேள்வி என்னவென்றால், *[இடையீடு]* எத்தனை வீடுகளை இந்த ஒரு வருடத்தில் கட்டி இருக்கின்றீர்கள்? அதற்கப்புறம், 2,307 'ஒப்பு'கள் எப்போது தயார் செய்யப்பட்டது? அடுத்து, சம்பளப் பிரச்சினை! சம்பளத்தை உயர்த்தி வழங்க முடியுமா, முடியாதா? அதற்குப் பதில் சொல்லுங்கள்! *[இடையீடு]* கேட்டால் சொல்கின்றீர்கள், பதற்றம் அடைகின்றோமென்று. நாங்கள் எத்தனையோ தடவை கேட்டுக் கொண்டிருக்கின்றோம். ஆனால் நீங்கள் பதில் சொல்ல மறுக்கிறீர்கள்.

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 34 (2) යටතේ තිබෙනවා, "ප්‍රශ්නයක් විවාදයකට ව්‍යාජ හේතුවක් කර නොගත යුත්තේ ය" කියලා. ගරු කථානායකතුමනි, ප්‍රශ්නයක් ඇහුවේ. නමුත්, දැන් එය විවාදයකට යනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලියි, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා හරි.

ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය ඇහුවා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය ඇහුවා, ගරු කථානායකතුමනි. මම ඒකට පිළිතුර පැහැදිලි කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා කියන්නේ, නව රජය හැටියට අපි නිවාස හැදුවේ නැහැ කියලා නේ. ඔබතුමාට මම පැහැදිලි කරන්න කැමැතියි, ඉන්දියානු ආධාර යටතේ නිවාස හදන එක අපි දැන් ආරම්භ කරන බව. තිබුණු සාකච්ඡා අනුව ගිහින් නිවාස 2,056ක් හදන්න දැන් ආරම්භය ගන්නවා. මේ වසරේ පටන් ගන්නවා.

මේ රටේ ජනතාවගේ බදු මුදලින් - භාණ්ඩාගාරයේ මුදල්වලින් - මිලියන 1,300ක් අපේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා ලැබිලා, අපි මේ වනකොට ගෙවල් 456ක් හදන්න ආරම්භ කරලා තිබෙන්නේ. ඊළඟට මම මතක් කරන්න කැමැතියි මේ කාරණයත්. ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා දන්නවා, 2023දී හල්දුම්මුල්ලේ කබරගල වතු යායේ නාය යෑමක් සිද්ධ වුණු බව. එහිදී ලැයිමක්ම ගලවාගෙන ගියා. අන්තිමට, වහලා දාපු තේ ෆැක්ටරි එකක පවුල් 50ක් පදිංචි කළා. අවුරුදු දෙකක් ගත වෙලාත් ඒ පවුල් 50ට ගෙවල් හදලා දෙන්න ඔබතුමන්ලා කටයුතු කළේ නැහැ. හැබැයි, මෙතැන සමහරුන්ගේ ගෙවල් ගිනි ගැහුවා හෝ ගිනි ගහගෙන ඒවාට කෝටි ගණන් වන්දි ගත්තා. අර මිනිස්සුන්ට ගෙවල් හදලා දුන්නේ නැහැ. මෙයාලා වන්දි ගත්තා. අන්න ඒ ගෙවල් 50 මේ වනකොට වහල ගහන මට්ටමට ගෙනැල්ලා තිබෙන්නේ. අපි ත්‍රිවිධ හමුදාවට ස්තුතිවන්ත වනවා. ගෙවල් 50ක් අපි කබරගල හදනවා. හමුදාව යොදවලා හදනවා. ඔව්, අපි එහෙට ගිහින් ශ්‍රමදාන කළා. අපි ගෙවල් හදනවා.

ඒ වාගේම මම මතක් කරන්න කැමැතියි, අපි වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1,700ක් දක්වා වැඩි කරන බව. ඒ මිනිසුන්ගේ ජීවන තත්ත්වයට සරිලන ආදායමක් එන විධියට අනිවාර්යයෙන්ම අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ ආණ්ඩුව ඒ වැටුප වැඩි කරනවා කියන එක මම අද පාර්ලිමේන්තුවේදී මතක් කරන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 -1120/2025- (2), ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## කෘෂිකාර්මික අංශය: 2015 සිට දළ දේශීය නිෂ්පාදනයට දායකත්වය
விவசாயத்துறை: 2015 முதல் மொத்த உள்நாட்டு உற்பத்தியின் பங்களிப்பு
AGRICULTURE SECTOR: CONTRIBUTION TO GROSS DOMESTIC PRODUCT FROM 2015

205/2024

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Nalin Bandara Jayamaha)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය සහ එහි මූල්‍යමය වටිනාකම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වෙනත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය පහළ මට්ටමක පැවතීමට හේතු සාධක කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு முதல் இன்று வரை இலங்கையின் மொத்த உள்நாட்டு உற்பத்தியில் விவசாயத்துறையின் பங்களிப்பு மற்றும் அதன் நிதிசார் பெறுமதி ஆண்டுவாரியாகத் தனித் தனியே யாது;

(ii) பிற நாடுகளுடன் ஒப்பிடுகையில் இலங்கையின் மொத்த உள்நாட்டு உற்பத்தியில் விவசாயத் துறையின் பங்களிப்பு குறைந்த மட்டத்தில் காணப்படுவதற்கான காரணங்கள் யாவை;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iii) இலங்கையின் மொத்த உள்நாட்டு உற்பத்தியில் விவசாயத்துறையின் பங்களிப்பை மேம்படுத்துவதற்காக அமுல்படுத்தப்படுகின்ற வேலைத் திட்டம் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) contribution of the agriculture sector to the Gross Domestic Product of Sri Lanka in each of the years from 2015 up to now along with its financial value, separately;

(ii) causes of the relatively lower contribution of Sri Lanka's agriculture sector in its Gross Domestic Product, compared to that of the other countries; and

(iii) course of action that is implemented to increase the contribution of the agriculture sector to the Gross Domestic Product of Sri Lanka ?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i)

වගුව 1: ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට කෘෂි කාර්මික අංශයේ දායකත්වය. (2015-2024)

| වසර | දළ දේශීය නිෂ්පාදනයට කෘෂි කාර්මික අංශයේ දායකත්වය | | |
|---|---|---|---|
| | ප්‍රතිශතය (%) | වත්මන් මිල ගණන් යටතේ මූල්‍යමය වටිනාකම (රු.මි.) | ස්ථාවර (2015) මිල ගණන් යටතේ මූල්‍ය වටිනාකම (රු.මි.) |
| 2015 | 7.8 | 950,452 | 950,452 |
| 2016 | 7.1 | 930,442 | 906,100 |
| 2017 | 6.9 | 1,069,075 | 889,557 |
| 2018 | 7.1 | 1,165,529 | 945,292 |
| 2019 | 6.9 | 1,154,540 | 949,582 |
| 2020 | 7.1 | 1,291,023 | 941,046 |
| 2021 | 7.3 | 1,548,117 | 950,548 |
| 2022 | 7.5 | 2,032,845 | 911,252 |
| 2023 | 7.9 | 2,227,561 | 925,822 |
| 2024 | 7.5 | 2,481,487 | 937,104 |

(ii) ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික අංශය දැනට දළ දේශීය නිෂ්පාදනයට සියයට 7.5ක් පමණ දායක වේ. මෙය පාකිස්තානය (23.5%) සහ ඉන්දියාව (16.4%) වැනි කලාපීය රටවලට වඩා සැලකිය යුතු ලෙස අඩුය. එසේ වීමට බලපා ඇති හේතු වන්නේ,

1. වැඩිවන ජනගහන ඝනත්වය හේතුකොට ගෙන රටේ වගා කළ හැකි ඉඩම් සීමිත වීම.
2. සේවා සහ කර්මාන්ත අංශය කෘෂි කාර්මික අංශයට සාපේක්ෂව වඩා වේගයෙන් ව්‍යාප්ත වීම.
3. කෘෂි කාර්මික නොවන ක්‍රියාකාරකම්වල ශ්‍රම ඵලදායීතාව ඉහළ මට්ටමක පැවතීම.
4. කෘෂි කර්මාන්තයට ලබා දෙන ප්‍රමුඛතාවට වඩා වැඩි ප්‍රමුඛතාවක්, රාජ්‍ය අනුග්‍රහයක් සහ දිරිගැන්වීමක් අපනයනය අරමුණු කරගත් කර්මාන්ත කෙරෙහි (ඇඟලුම් වැනි) පසුගිය කාලය තුළ ලබා දීම.
5. කෘෂි කාර්මික ක්ෂේත්‍රයට ලබා දී ඇති රාජ්‍ය අනුග්‍රහය සහ දිරිගැන්වීම එම ක්ෂේත්‍රයේ පවතින අවිධිමත්භාවය හේතුවෙන් තිරසර ලෙස උකහාගෙන නොමැති වීම.

ඉහත හේතු වත කර්මාන්ත හා සේවා අංශයේ වර්ධනය කෘෂි කාර්මික අංශයට වඩා ඉහළ අගයක් ගනී.

(iii) "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්තිය යටතේ රජයේ කෘෂිකර්ම ප්‍රතිපත්ති ක්‍රියාකාරකම් හා අනුගතව කටයුතු කිරීම වෙනුවෙන් රට තුළ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා එළඹෙන 2025/26 මහ කන්නයේ සිට "පුනරුදයට අරුණැලු" ජාතික ආහර භෝග ප්‍රවර්ධන වැඩසටහන යටතේ පහත යෝජිත විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක වේ.

- රට තුළ සහල් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා නිෂ්පාදන යාය ජාතික වැඩසටහන
- රට තුළ බීජ සුරක්ෂිතතාව ඇතිකිරීම සඳහා බීජ නිෂ්පාදන ප්‍රවර්ධන ජාතික වැඩසටහන
- අතිරික්ත නිෂ්පාදනයක් සහිත ආහාර භෝග සඳහා අගය එකතු කිරීමේ සහ අපනයන ප්‍රවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන
- කෘෂි යාන්ත්‍රීකරණ ජාතික වැඩසටහන
- ඒකාබද්ධ පාංශු පෝෂක කළමනාකරණ ජාතික වැඩසටහන
- ආරක්ෂිත ගෘහ තුළ භෝග වගාව සහ නව කෘෂි කාර්මික පද්ධති ප්‍රවර්ධන ජාතික වැඩසටහන
- බඩඉරිඟු, මුං, කව්පි, රටකජු, අර්තාපල්, ලොකු ලූනු , රතු ලූනු, උඳු, කුරක්කන්, මිරිස් සහ සෝයා බෝංචි ආදි මූලික අවධානය යොමු වී ඇති අතිරේක ආහාර භෝග වෙනුවෙන් ජාතික නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- කෘෂි කාර්මික සංවර්ධන වැඩසටහන් හා ආහාර භෝග නිෂ්පාදන ප්‍රවර්ධන කාර්යයන්හිදී ස්වේච්ඡා ව්‍යාප්තිකාරකයින් ලෙස සේවය ලබා ගැනීම සඳහා ග්‍රාමීය මට්ටමින් සුදුසු ප්‍රමුඛ ගොවීන් හඳුනා ගැනීම සහ සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 -552/2025- (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 8 -625/2025- (1), ගරු කිංස් නෙල්සන් මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## 1999දී බඳවා ගන්නා ලද උපාධිධාරී අභ්‍යාසලාභීන්: සේවයේ ස්ථිර කිරීම

### 1999இல் ஆட்சேர்ப்புச் செய்யப்பட்ட பட்டதாரிப் பயிலுநர்கள்: சேவையில் நிரந்தரமாக்கல்

### GRADUATE TRAINEES RECRUITED IN 1999: CONFIRMATION IN SERVICE

1120/2025

**10.** **ගරු පද්මසිරි බණ්ඩාර මහතා (ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා වෙනුවට)**
(மாண்புமிகு பத்மசிறி பண்டார - மாண்புமிகு ரவீந்திர பண்டார சார்பாக)
(The Hon. Padmasiri Bandara on behalf of the Hon. Ravindra Bandara)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) රජයේ ප්‍රමුඛතා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා 1999 දී බඳවාගන්නා ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ අභ්‍යාසලාභී පත්වීම් ස්ථිර කරන ලද දිනය කවරේද;

(iii) එම ස්ථිර කිරීම සඳහා උපදෙස්/චක්‍රලේඛය නිකුත් කරන ලද ආයතනය කවරේද;

(iv) එහිදී අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගය කවරේද;

(v) එම උපදෙස් ලිපියේ/චක්‍රලේඛයේ පිටපතක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) ඉහත උපාධිධාරීන් අතරින් ස්ථිර කරන ලද සංඛ්‍යාව, එක් එක් රේඛීය අමාත්‍යාංශය, පළාත් සභා අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව සහ ආයතනය අනුව සහ එක් එක් තනතුරු කාණ්ඩ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් තනතුරු කාණ්ඩ සඳහා අදාළ ආරම්භක වැටුප, වැටුප් පරිමාණය සහ වැටුප් කේත අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ස්ථිර කිරීමෙන් පසුව ඉහත උපාධිධාරීන් සඳහා සේවා ව්‍යවස්ථා/බඳවාගැනීමේ පටිපාටි සකස් කර තිබේද;

(iv) එසේ නම්, ඒවා සකස් කරන ලද වර්ෂය කවරේද;

(v) ඒවායේ පිටපත් ඉදිරිපත් කරන්නේද;

(vi) සේවා ව්‍යවස්ථා/බඳවාගැනීමේ පටිපාටි සකස් කර නොමැති නම්, ඊට හේතු කවරේද;

(vii) සේවා ව්‍යවස්ථා අනුව උසස් කිරීමේ ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்கத்தின் முன்னுரிமைப் பணிகளை நிறைவேற்றுவதற்கான ஆற்றலை விருத்தி செய்வதற்காக 1999ஆம் ஆண்டில் ஆட்சேர்ப்புச் செய்யப்பட்ட பட்டதாரிப் பயிலுநர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவர்களின் பட்டதாரிப் பயிலுநர் நியமனங்கள் நிரந்தரமாக்கப்பட்டுள்ள திகதி யாது என்பதையும்;

(iii) அத்தகைய நிரந்தரமாக்கலுக்கான அறிவுறுத் தல்களை/ சுற்றறிக்கையை வெளியிட்டுள்ள நிறுவனம் யாது என்பதையும்;

(iv) அதன்போது பின்பற்றப்பட்டுள்ள வழிமுறை யாது என்பதையும்;

(v) அத்தகைய அறிவுறுத்தல் கடிதத்தின்/சுற்றறிக்கை யின் பிரதியைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் அறிவிப்பாரா?

(ஆ) (i) மத்திய அரசாங்கத்தின் ஒவ்வொரு நிரல் அமைச்சு, மாகாண அமைச்சு, திணைக்களங்கள் மற்றும் நிறுவனங்கள் வாரியாகவும் அத்துடன் ஒவ்வொரு பதவிக்குரிய வகுதி வாரியாகவும் மேற்படி பட்டதாரிகளில் நிரந்தரமாக்கப் பட்டுள்ளவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) அத்தகைய பதவி வகுதி ஒவ்வொன்றுக்கும் ஏற்புடைய ஆரம்பச் சம்பளம், சம்பள அளவுத் திட்டம் மற்றும் சம்பளக் குறியீட்டு இலக்கம் வெவ்வேறாக யாது என்பதையும்;

(iii) பணி நிரந்தரமாக்கப்பட்டதன் பின்னர் மேற்படி பட்டதாரிகளுக்கான சேவைப் பிரமாணக் குறிப்பு/ஆட்சேர்ப்பு நடைமுறைகள் தயாரிக்கப் பட்டுள்ளனவா என்பதையும்;

[ගරු පද්මසිරි බණ්ඩාර මහතා]

(iv) அவ்வாறாயின், அவை எந்த ஆண்டில் தயாரிக்கப்பட்டுள்ளன என்பதையும்;

(v) அவற்றின் பிரதிகளைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(vi) சேவைப் பிரமாணக் குறிப்பு/ஆட்சேர்ப்பு நடைமுறைகள் தயாரிக்கப்படவில்லை எனின், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(vii) சேவைப் பிரமாணக் குறிப்பின்படி, பதவி உயர்வு வழங்கும் நடைமுறை யாது என்பதையும்;

அவர் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he state -

(i) the number of graduate trainees who were recruited in 1999 for enhancing the capacity to implement the priority functions of the Government;

(ii) the date on which the said trainees were confirmed in their service;

(iii) the name of the institution that issued the instructions/circular for confirming them in their service;

(iv) the course of action that was followed in that regard; and

(v) whether a copy of the said letter of instructions/circular will be tabled?

(b) Will he also state -

(i) the number of those who were confirmed in their service, out of the said graduates in terms of each Line Ministry, provincial ministry, department and institution, and in terms of each category of posts, separately;

(ii) the respective starting salary, salary scale and salary code of each of the said categories of posts, separately;

(iii) whether service minutes/ schemes of recruitments have been prepared for the graduates concerned after confirming them in their service;

(iv) if so, the year in which those were prepared;

(v) whether copies of the said documents will be tabled;

(vi) if service minutes/ schemes of recruitments have not been prepared, the reasons for it; and

(vii) the procedure for promoting the said officers according to the service minutes?

(c) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) " රජයේ ප්‍රමුඛතා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් ප්‍රවර්ධනයට බඳවාගත් උපාධිධාරී අභ්‍යාසලාභීන් ස්ථිර තනතුරුවලට අනුයුක්ත කිරීම" යන මැයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ අත්සනින් නිකුත් කරන ලද, බීඩීජ්/1/29/ජ් සහ 2000.07.25 දිනැති ලිපියේ 02.01 උපලේඛනය පරිදි පුරප්පාඩු තනතුරුවලට අනුයුක්ත කිරීම් සඳහා උපාධිධාරීන් 730ක් ද, නව තනතුරු ඇති කිරීම් තුළින් උපාධිධාරීන් 9,596ක් ද වශයෙන් මුළු සංඛ්‍යාව ලෙස 10,326දෙනෙකු බඳවාගෙන ඇත.

(ii) " රජයේ ප්‍රමුඛතා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් ප්‍රවර්ධනයට බඳවාගත් උපාධිධාරී අභ්‍යාසලාභීන් ස්ථිර තනතුරුවලට අනුයුක්ත කිරීම" යන මැයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ අත්සනින් නිකුත් කරන ලද, බීඩීජ්/1/29/ජ් සහ 2000.07.25 දිනැති ලිපියේ 03.02 ඡේදයේ සඳහන් පරිදි මෙම වැඩසටහන සඳහා උපාධිධාරීන් අවස්ථා තුනකදී තෝරාගෙන ඇති අතර, මෙම තෝරාගත් දිනය අනුව ස්ථිර තනතුරුවලට පත් කිරීමේ දිනය පහත පරිදි වේ.

| පුහුණුවට කැඳවූ දිනය | පත්වීම් දිනය |
|---|---|
| 1999.05.17 | 2000.05.16 |
| 1999.10.01 | 2000.10.02 |
| 1999.11.08 | 2000.11.08 |

(iii) මෙම ස්ථිර කිරීම සඳහා උපදෙස් ලිපිය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙතින් 2000.07.25 දිනෙන් නිකුත් කර ඇත.

(iv) උක්ත උපදෙස් ලිපියේ ඡේද අංක 03 මඟින් මේ සම්බන්ධව උපදෙස් ලබා දී ඇත.

(v) එම ලිපියේ පිටපතක් ඇමුණුම 01** වශයෙන් ඉදිරිපත් කර ඇත.

(ආ) (i) එම තොරතුරු මෙම පත්වීම්ලාභීන් අනුයුක්ත කරන ලද අදාළ ආයතනයන්ගෙන් ලබාගත යුතුය.

(ii) "රජයේ ප්‍රමුඛතා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් ප්‍රවර්ධනයට බඳවාගත් උපාධිධාරී අභ්‍යාසලාභීන් ස්ථිර තනතුරුවලට අනුයුක්ත කිරීම" යන මැයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ අත්සනින් නිකුත් කරන ලද, බීඩීජ්/1/29/ජ් සහ 2000.07.25 දිනැති ලිපියේ (ඇමුණුම 01) 04 වන ඡේදයෙහි මේ පිළිබඳව සඳහන් වේ.

(iii) ඔව්. බඳවා ගැනීමේ පටිපාටි සකස් කර ඇත.

(iv) සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වීමට කැමැත්ත පළ කරන ලද නිලධාරින් සඳහා දැනට ක්‍රියාත්මක වන සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාව යටතේ උසස් වීමේ ක්‍රමවේදය අදාළ වන අතර, එම සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ නොකළ නිලධාරින් සඳහා ඔවුන් අනුයුක්ත කරන ලද දෙපාර්තමේන්තු හා ඒ ඒ ආයතන වෙතින් උසස් කිරීමේ පටිපාටි සකස් කෙරෙමින් පවතින අතර දැනට සකසා අවසන්ව ඇති එවැනි උසස් කිරීමේ පටිපාටි 02ක් නිදසුන් ලෙස ඇමුණුම 02** හා 03** යටතේ දක්වා ඇත.

---

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

(v) සේවා ව්‍යවස්ථා/බඳවාගැනීමේ පටිපාටි මෙම පත්වීම්ලාභීන් අනුයුක්ත කරන ලද අදාළ එක් එක් ආයතනයන්ගෙන් ලබා ගත යුතුය.

(vi) අදාළ නොවේ

(vii) ඉහත iv හි පිළිතුර අදාළ වේ.

(ඈ) පැන නොනඟී.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අංශවල ගැටලු විසඳීම සඳහා රජයේ වැඩ පිළිවෙළ
### கல்வி மற்றும் உயர் கல்வித் துறைகளிலுள்ள பிரச்சினைகளைத் தீர்ப்பதற்கான அரசாங்கத்தின் முன்முயற்சி
### GOVERNMENT INITIATIVE TO RESOLVE ISSUES IN EDUCATION AND HIGHER EDUCATION SECTORS

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මම පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

වත්මන් ආණ්ඩුව බලයට පත් කිරීමට අතිවිශාල කාර්යභාරයක් සහ දායකත්වයක් ලබා දුන් වෘත්තීමය කණ්ඩායමක් තමයි විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, ගුරුවරුන්, අධ්‍යාපන පද්ධතියේ නිලධාරීන් සහ අධ්‍යාපන ක්ෂේත්‍රය සමඟ සෘජුව හෝ වක්‍රව සම්බන්ධ සියලු පාර්ශවයන්. නමුත්, බලයට පත්වීමෙන් පසුව එම අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තීමය ගැටලු විසඳීමට රජය විසින් ගත යුතු ක්‍රියාමාර්ග ප්‍රමාද කරමින් සිටින බව පෙනෙන්නට තිබෙනවා. වෘත්තීය කණ්ඩායම්වලට සිය ගැටලු සඳහා කඩිනම් විසඳුම් ලබා දෙන ලෙස යළි ආණ්ඩුවට සිහි ගැන්වීමට සිදුව තිබෙනවා. එබැවින්, මේ බරපතළ කාරණය පිළිබඳව රජයේ අවධානය යොමු කරවනු පිණිස මා පහත සඳහන් ප්‍රශ්න ඉදිරිපත් කරනවා.

01. රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සේවයේ නියුතු ආචාර්යවරුන්, කථිකාචාර්යවරුන් සහ එකී තනතුරුවල පුරප්පාඩු පිළිබඳ දත්ත ඇතුළත් සවිස්තර වාර්තාවක් සභාගත කළ හැකි ද? එම පුරප්පාඩු සඳහා කඩිනමින් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්/කථිකාචාර්යවරුන් බඳවා ගැනීමක් සිදු වන්නේ ද? එසේ බඳවා නොගැනීම හේතුවෙන් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය කඩා වැටීමේ බරපතළ අර්බුදයට රජය ලබා දෙන විකල්ප විසඳුම් මොනවා ද?

ගරු කථානායකතුමනි, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, කථිකාචාර්යවරුන් විශාල පිරිසක් මේ වන විට රට අත්හැර ගිහින් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් රජයේ විසඳුම මොකක්ද කියා අපි අහන්න කැමැතියි.

02. එළැඹෙන අයවැය මඟින් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැටුප් හා දීමනා ඉහළ නැංවීමට, වැටුප් විෂමතා ඉවත් කිරීමට හා විශ්වවිද්‍යාලයීය පහසුකම් ඉහළ නැංවීමට රජය කටයුතු කරන්නේද? නොඑසේ නම්, එය රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට තවදුරටත් ගුණාත්මක වශයෙන් ඉහළ ආචාර්යවරුන් බඳවා ගැනීමට ඇති බාධාවක් වශයෙන් රජය නොදකින්නේ ද?

මොකද, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ, කථිකාචාර්ය-වරුන්ගේ, මහාචාර්යවරුන්ගේ පමණක් නොව, අනධ්‍යයන කාර්ය මණ්ඩලවලත් බරපතළ ප්‍රශ්න තිබෙනවා. ඒවාට තවමත් විසඳුම් ලැබී නැහැ.

03. රජය අඩු ළමුන් සංඛ්‍යාවක් සහිත පාසල් වසා දැමීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කර ඇති බව වාර්තා වෙනවා. එසේ නම්, එවැනි පාසල් හඳුනා ගැනීම සඳහා රජය විසින් අනුගමනය කරනු ලබන නිර්ණායක මොනවාද? ඒ අනුව කොපමණ පාසල් සංඛ්‍යාවක් මේ වන විට වසා තිබෙනවාද? නැතහොත්, වසා දැමීම සඳහා හඳුනාගෙන තිබෙනවාද? මේ හේතුවෙන්, දරුවන්ට කිසිසේත් අගතියක් සිදු නොවන බව රජය තහවුරු කරන්නේ කෙසේද?

ගරු කථානායකතුමනි, අප අහලා තිබෙන දේ තමයි, කිලෝමීටර තුනෙන් තුනට පාසල් හදනවා කියන පොරොන්දුව. එය, වර්තමාන ජනාධිපතිවරයාම මැතිවරණ සමයේ ඉදිරිපත් කළා. දැන් අපට අහන්න ලැබෙනවා, පාසල් වසා දැමීමේ ක්‍රමවේදයක් ගැන. ඒ පිළිබඳව සියලු දත්ත සහිත වාර්තාවක් ඉදිරිපත් කරන්න ඕනෑ.

මොකද, කිලෝමීටර පහෙන් පහට වැසිකිළි හදනවාට වඩා ඇත්ත වශයෙන්ම අප කරන්නට ඕනෑ, පාසල් පද්ධතිය දියුණු කිරීමයි. එක පාසලක් ඉදි වුණොත් හිර ගෙවල් දාහක් වැහෙනවා කියන එක අප අහලා තිබෙන කථාවක්.

04. අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල වත්මන් තත්ත්වය පිළිබඳව සවිස්තර තොරතුරු මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද? මේ යටතේ ඉතිහාසය හා සෞන්දර්ය විෂය පිළිබඳ ඇති වූ ගැටලු සඳහා රජය මේ වන විට ලබා දී ඇති විසඳුම් මොනවාද? මා හිතන විධියට, මේ සභාවේ හැමෝම එකඟ වෙයි, ඉතිහාසය හර විෂයක් හැටියට අනිවාර්යයෙන් ක්‍රියාත්මක වෙන්නට ඕනෑ කියන කාරණයට. ඒ පිළිබඳව රජයේ මතය මොකක්ද?

05. ගුරුවරුන්ට ලබා දිය යුතු ඉතිරි තුනෙන් දෙකේ වැටුප් වැඩි වීම පොරොන්දු වූ පරිදි 2026 අය වැය මඟින් හෝ ලබා දීමට රජය කටයුතු කරන්නේද? ගුරුවරුන්ට ලබා දෙන දුෂ්කර සේවා දීමනාව ඉහළ නැංවීමට කටයුතු කරන්නේද? ඒ වාගේම "ගුරුසෙත" වැඩසටහනෙන් ලබා දෙන ගුරු ණයවලට අය කරන පොලිය පහළ දමන්නට කටයුතු කරනවාද කියලා මම අහන්න කැමැතියි.

06. 2023.10.30වන දින නිකුත් කරනු ලැබූ ගැසට් නිවේදනයට අනුව කැබිනට් අනුමැතිය සහිත මධ්‍යම පළාත් ගුරු විභාගය හා ප්‍රායෝගික පරීක්ෂණය සමත් 500කට අධික කණ්ඩායමක් මේ වනතෙක් බඳවා නොගැනීම සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු වී තිබේද? පුරප්පාඩු 6,334ක් තිබෙනවා. වට තුනකදී බඳවා ගෙන තිබෙනවා. එක වටයකදී 378ක්, තවත් වට දෙකකදී 1,132ක් බඳවා ගෙන තිබෙනවා. තවත් 500කට ආසන්න පිරිසක් බඳවා ගන්න තිබෙනවා. කවදාද, එම බඳවා ගැනීම් සිදු කරන්නේ? එම කණ්ඩායම බඳවා ගැනීමට රජය කටයුතු කරන්නේද? එය කරන දිනය කවදාද කියලා අපි අහන්න කැමැතියි.

07. පාසල්වල සේවය කරනු ලබන සංවර්ධන නිලධාරින් ගුරු සේවයට බඳවා ගැනීම සම්බන්ධයෙන් වූ ගැටලු නිරාකරණය කිරීම සඳහා රජය ගෙන ඇති පියවර පිළිබඳව මෙම සභාවට පැහැදිලි කිරීමක් කළ හැකි වන්නේද?

ගරු කථානායකතුමනි, කොරෝනා වසංගතය කාලයේ ඉඳලා සහ ඊට පෙර ඉඳන්ම ගුරු හිඟය මහ හරවමින් මේ රටේ දූ දරුවන්ට අධ්‍යාපනය ලබා දුන් ගුරු සංවර්ධන නිලධාරින් 16,600ක් ඉන්නවා. අද ඒ අය මහ පාරේ. සමථකරණ තීන්දුවක් තිබෙනවා. අවුරුදු තුනක් ඇතුළත Postgraduate Diploma එක කරන තෙක්, අභ්‍යාසලාභීන් හැටියට 2 පන්තියේ II

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ශ්‍රේණියට ඒ 16,600 දෙනා බඳවා ගන්න. ඇයි, ඒ දේ ඉෂ්ට කරන්නේ නැත්තේ? ඒ දේ කරනවා කියලා විපක්ෂයේ හිටපු කාලයේ කියපු මන්ත්‍රීවරු අද මේ සභාවේ ඉන්නවා. ඇයි, ඒ ගුරු සංවර්ධන නිලධාරීන්ට ඒ සාධාරණත්වය ඉෂ්ට කරන්නේ නැත්තේ? මම මේ ප්‍රශ්නවලට පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

ස්තුතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව නරඹන්න එන කුඩාම දරුවාත් දන්නවා, වෘත්තයක අරයයි, විෂ්කම්භයයි අතර වෙනස. වෘත්තයක අරය සහ විෂ්කම්භය කියලා දෙකක් තිබෙනවා නේ. දරුවෙකුට කිලෝමීටර 3ක උපරිම දුර සීමාව යටතේ පාසලක් දෙනවා කියන එකෙන් අදහස් කරන්නේ නැහැ, කිලෝමීටර 3න් 3ට පාසල් හදනවා කියලා. කොහෙන් අහගෙනද දන්නේ නැහැ ඒක. කෙසේ වෙතත්, ගරු විපක්ෂ නායකතුමාගේ ප්‍රශ්නයට ගරු අගමැතිතුමිය ලබන පාර්ලිමේන්තු රැස්වීම් සතියේදී උත්තර ලබා දෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කිලෝමීටර 3න් 3ට පාසලක් හදනවා කියලා ගරු ජනාධිපතිතුමාගේ මුවින්ම පිට වුණු ඒ වචන ඉදිරිපත් කරන්න මට අවස්ථාව දෙනවාද? මට අවස්ථාව දෙන්න ඒකට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදයකට යන්න විධියක් නැහැ, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒවා ගරු ජනාධිපතිතුමාගේ මුවින්ම පිට වුණු වචන! ඒ නිසා නොදන්නා දේ ගැන අභියෝග කරන්න එන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ශ්‍රී ලාංකිකයෙකු වශයෙන් මම මේ මොහොතේ ප්‍රථමයෙන්ම අපේ පාපන්දු කණ්ඩායමට සුබ පතනවා, Turkmenistanවලට එරෙහි තරගය දිනා 196වැනි ස්ථානයේ සිට ඉදිරියට පැමිණීම සම්බන්ධයෙන්.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය අහන්න ඉස්සෙල්ලා මම මේ කාරණය කියන්න ඕනෑ. මට පෙනෙන විධියට නම් මේ ප්‍රශ්නයට උත්තර දෙන්න කල් යනවා. ප්‍රශ්නය ඇහුවාට පසුව ලැබෙන උත්තරයෙන් අපට ඒක බලා ගන්න පුළුවන්.

## II

## මැණික් කර්මාන්තය අපනයන ඉලක්කගත කර්මාන්තයක් බවට පත් කිරීම
### இரத்தினக்கல் கைத்தொழில்துறையை ஏற்றுமதி சார்ந்த துறையாக மாற்றுதல்
### TRANSFORMATION OF GEM INDUSTRY TO AN EXPORT-ORIENTED INDUSTRY

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 (2) යටතේ මම පොදු වැදගත්කමකින් යුක්ත පහත ප්‍රශ්නය ගරු කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීම සඳහා ඔබතුමාගේ අවසරය පතනවා. මා මෙම ප්‍රශ්නය ඉදිරිපත් කරන වෙලාව අතරතුර ගරු ඇමතිතුමා සභාවට එයි කියලාත් මම බලාපොරොත්තුවෙන් සිටිනවා.

ගරු කථානායකතුමනි, "මැණික් දූපත" ලෙස ගෞරවයෙන් හැඳින්වෙන ශ්‍රී ලංකාව සියවස් ගණනාවක් තිස්සේ රාජධානීන් සහ ජාත්‍යන්තර විශාරදයන්ගේ සංග්‍රහයන්හි සැරසෙන නිල්මැණික්, රතුමැණික් සහ අනෙකුත් දුර්ලභ මැණික් නිපදවමින් පවතී. එහෙත්, මෙම අසමසම ස්වාභාවික සම්පත් ඇති වුවත්, අපගේ මැණික් කර්මාන්තය එහි විශාල හැකියාවට සාපේක්ෂව තවමත් අඩු සංවර්ධනයක් ලබාගෙන ඇත. විදේශ විනිමය සහ ස්ථාවර රැකියා අවශ්‍යතාව ඉතා උග්‍රව පවතින මේ අවස්ථාවේදී මෙම ක්ෂේත්‍රය සඳහා හදිසි අවධානයක් සහ සංශෝධනයක් අවශ්‍ය වේ.

රජය විසින් නැවත නැවතත් මැණික් සහ ආභරණ කර්මාන්තය ඩොලර් බිලියන ගණනින් උපයන ව්‍යාපාරයක් බවට පත්විය හැකි බව ප්‍රකාශ කර තිබුණද, භූමියේ තත්ත්වය වෙනස් ය. පතල් කැනීම් කිරීම සීමිතය; වටිනාකම වැඩි කිරීම - that is, value addition - දුර්වලය; ජාත්‍යන්තර වෙළෙඳ පොළට ප්‍රවේශය අඩුය. බොහෝ මැණික් අමු හැඩයෙන් රටින් පිටතට යන අතර, එමඟින් වැඩි ආදායමක් ලබා ගන්නට අපහසු වේ. ඒ සමඟම, අකාර්යක්ෂමතාව, භීතය, අධීක්ෂණ දුර්වලතාව සහ ගොඩනැඟීම්, ගබඩා කිරීමේ අක්‍රමිකතා පිළිබඳ චෝදනා හේතුවෙන් ජන විශ්වාසය බිඳ වැටෙයි.

ගරු කථානායකතුමනි, අද තිබෙන තත්ත්වය අනුව මැණික් මේ රටින් පිටතට යනවා. නමුත්, නිල වශයෙන් සල්ලි රටට එන්නේ නැහැ. අද අධික බදු දමලා එම කර්මාන්තය අධෛර්යවත් කරලා තිබෙනවා. එවැන්නකට තමයි පුනර්ජීවයක් ලබා දීලා එය අලුතින් බිහි කරන්න මම මේ උත්සාහ කරන්නේ.

ගරු කථානායකතුමනි, අද මෙම කර්මාන්තය අධික බදු සහ අධික නියාමනයකට ලක් වී තිබේද යන්නද විමසිය යුතුය. සාම්ප්‍රදායිකව, ශ්‍රී ලංකාවේ මැණික් කැණීම් කිරීම පෞද්ගලික සහ පවුල් පදනමක livelihood එකක් වශයෙන් පවතින අතර, පරම්පරාවෙන් පරම්පරාවට උරුම වී ඇත. අධික බලපත්‍ර අවශ්‍යතා, බහු බදු සහ නියාමන බාධක කුඩා පතල්කරුවන් සහ වෙළෙන්දන් මෙය අත්හැරීමට හේතු වී ඇත. එමඟින් බොහෝ දෙනා අනිත්‍ය හෝ නීති විරෝධී නාළිකා වෙත යොමු වී ඇත.

අපේ උරුමයක් වූ මෙම ව්‍යාපාරය ආරක්ෂා කිරීම වෙනුවට අද එය බදු යටතේ ගිලිහෙමින් තිබේ.

අවශ්‍ය වන්නේ සම්පූර්ණ සහ විවෘත ප්‍රතිපත්තියකි.

- නියමිත මැණික් කැනීම් ස්ථාන විශාල කිරීම
- වෙන්දේසි ක්‍රමය නවීකරණය කිරීම
- ශ්‍රී ලංකාව තුළම මැණික් කපන, පිරිසිදු කරන සහ වටිනාකම වැඩි කරන ක්‍රියාවන් සඳහා ප්‍රතිලාභ ලබා දීම

  That is, by adding value and ensuring that gems stay within the country.
- ශ්‍රී ලංකාව සත්‍ය මැණික් සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානයක් ලෙස පිහිටුවීම.

  That is, the auction system.

  එමඟින් බදු පිළිබඳ පැහැදිලි වීම, කුඩා පතල්කරුවන් සඳහා ආරක්ෂාව සහ පාරිසරික ආරක්ෂණය සහතික කිරීම අවශ්‍ය වේ.

මම ගරු අමාත්‍යතුමාගෙන් පහත ප්‍රශ්න විමසමි.

1. 2020-2025 කාලය තුළ ආනයනය කළ මැණික් කිලෝග්‍රෑම් 45,000ක් පමණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේදී නොසැලකිල්ලට ලක් වී ඇතැයි අමාත්‍යතුමා ප්‍රකාශ කර ඇත. ඒක සඳහන් කරලා තිබෙන්නේ "The Morning" පුවත් පතේ, “Sunil searches for missing gems” කියලායි. මෙම අතුරුදන් වූ භාණ්ඩ සොයා ගැනීමට ගත් ක්‍රියාමාර්ග මොනවාද සහ පාර්ලිමේන්තුවට සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබුවේද?
2. නියමිත මැණික් කැනීම් ස්ථාන නොපිහිටවූ ප්‍රදේශවල මැණික් පතල් විශාල කිරීම සඳහා රජය වහාම ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද? බලපත්‍ර ලබා ගැනීම අධික වියදම් සහිත ක්‍රියාවලියක් බවත්, එය මැණික් කැනීමට උනන්දු වන පුද්ගලයන් අත්හැරීමට හේතු වන බවත් දැනුම් දී ඇත.
3. තේ ව්‍යාපාරය වැනි ජාත්‍යන්තර මට්ටමේ විවෘත ව්‍යාපාරික වේදිකාවක් මඟින් මැණික් වෙන්දේසිය නවීකරණය කිරීම සඳහා රජය සූදානම්ද? එය විදේශ විනිමය උපයා ගැනීම සඳහා දැඩි මුදල් ව්‍යාපාරය මත සිදු කළ හැකිද?
4. ශ්‍රී ලංකාවේ මැණික් කපන, පිරිසිදු කරන සහ වටිනාකම වැඩි කරන ක්‍රියා මෙහිදී සිදු කරමින්, අමු හැඩයෙන් අපනයනය වීම වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද?
5. ශ්‍රී ලංකාව සත්‍ය මැණික් සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානයක් ලෙස වෙළෙඳ නාමයක් ප්‍රවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද? සහතික කිරීම, hallmarking කිරීම සහ වෙළෙඳ ප්‍රවර්ධන ක්‍රියාමාර්ග වඩා ශක්තිමත් කිරීම ඇතුළත්ද? අපි ශ්‍රී ලංකා මැණික් සඳහා තිබූ ගෞරවය අහිමි කරගෙන ඇත. එය නැවත ලබා ගැනීම සඳහා ඔබගේ යෝජනා මොනවාද?
6. 2030 වන විට මැණික් සහ ආභරණ අපනයනයෙන් වාර්ෂිකව ඩොලර් බිලියන 1 - 2 උපයා ගැනීම සඳහා රජය ඉලක්කයක් තබාගෙන සිටීද? එම ඉලක්කය සඳහා සහාය වන මාර්ග සටහනක් තිබේද?
7. කුඩා සහ මධ්‍ය පරිමාණ මැණික් පතල්කරුවන් සහ ආභරණ නිෂ්පාදකයන් සඳහා බදු සහන, බදු අඩු කිරීම සහ වාසිදායක මූල්‍ය පහසුකම් වැනි මූල්‍ය ප්‍රතිලාභ ලබාදීම සිදුවේද? එමඟින් කර්මාන්තයේ ව්‍යාප්තිය පුළුල් විය හැකිය. එය කොහේද, කෙසේ වෙනවාද කියලා දැනුවත් කරන්න.
8. මැණික් ගොඩගැනීම, අඩු මිලට ගෙවීම සහ නීති විරෝධී වෙළඳාම පිළිබඳ ව්‍යාප්ත සැකය මත රජය විසින් සීමා පාලනය, සීමා පරීක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද? අධික නියාමනයක් පවතිනවාද? එය වඩා නිදහස් සහ මිතුරන්ට හිතකර -more investor-friendly- බදු ප්‍රතිපත්තියක් බවට පත් කළ හැකිද?

   ගරු කථානායකතුමනි, මම නැවත අහන්නේ මේකයි. මේවා සාක්කුවල දාගෙන රටින් පිට යනවා. ඒකට නීත්‍යනුකූල විධියට රටට මුදල් ගේන්න පුළුවන් පරිසරයක් ඇති කරන්න අවශ්‍යයි. ඒක නැතිවෙලා තිබෙන එක තමයි අපට තිබෙන දුක.
9. ගරු අමාත්‍යතුමා විසින් මැණික් කර්මාන්තයට අදාළව පතල් කැනීමේ සිට කපන හා පිරිසිදු කිරීම, දේශීය විකුණුම් සහ ආපනයන දක්වා සියලු බදු, ගාස්තු සහ බදු වගුවක් සම්පූර්ණයෙන්ම මෙම සභාවට ඉදිරිපත් කරනු ලැබේද? එමඟින් පාර්ලිමේන්තුවට වර්තමාන බදු ව්‍යුහය කර්මාන්තයේ වර්ධනයට සහ තරගකාරීත්වයට සුදුසුද යන්න සමාලෝචනය කිරීමට හැකි වනු ඇත.

ඇමතිතුමා තවම සභාවට පැමිණ නැත.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ඇමතිවරයා ඊළඟ පාර්ලිමේන්තු රැස්වීම් සතියේදී මෙම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2, 3, 4, 5 සහ 6 පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 24(2) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 3.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, පෞද්ගලික මන්ත්‍රී යෝජනා යටතේ මා විසින් අද දින, "වාර්ගිකත්වය සහ ආගමික පදනම අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කළ යුතු බවටත් ශ්‍රී ලංකාවේ දැනට උද්ගතව තිබෙන තත්ත්වය සැලකිල්ලට ගනිමින් වාර්ගික හෝ ආගමික පදනමක් දක්වන නම් දරන දැනට පවතින දේශපාලන පක්ෂවලට ද එවැනි වෙනසක් ක්‍රියාත්මක කළ යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි" කියන යෝජනාව ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණා.

ගරු කථානායකතුමනි, අද උදේ බලනකොට මේ යෝජනාව න්‍යාය පත්‍රයෙන් ඉවත් කරලා තිබුණා. මම අවුරුදු ගණනාවක් මේ පාර්ලිමේන්තුවේ හිටියා. මම 2010 පාර්ලිමේන්තුවේත්, 2015 පාර්ලිමේන්තුවේත් හිටියා. ඒ වාගේම මේ පාර්ලිමේන්තුවේදී පසුගිය නොවැම්බර් මාසයේ සිට ඉදිරිපත් කර තිබෙන මේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව අද දින පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයෙන් ඉවත් කර තිබෙන්නේ කුමන පදනමකින්ද කියලා මම ඔබතුමාගෙන්, අපේ වරප්‍රසාද ආරක්ෂා කරන ගරු කථානායකතුමාගෙන් අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා විසින් "වාර්ගිකත්වය සහ ආගමික පදනම අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කිරීම" මැයෙන් අද දින ඉදිරිපත් කිරීමට නියමිතව තිබූ පා. 30/2025 දරන පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සම්බන්ධයෙන් වූ යෝජනාවක්, පාර්ලිමේන්තුවේ ගරු විරුද්ධ පක්ෂයේ නායකතුමා ඇතුළු විරුද්ධ පාර්ශ්වය නියෝජනය කරන තවත් පක්ෂ නායකයන් සහ මන්ත්‍රීවරයන් 9දෙනෙකුගේ අත්සනින් යුතුව 2025.10.09 වන දින, එනම් ඊයේ සවස් වරුවේ මා වෙත ලිඛිතව භාර දුන්නා.

මම පළමුවෙන්ම ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාට යෝජනා කරන්නේ, මෙම යෝජනාව කර ඇත්තේ විපක්ෂ නායකතුමා ප්‍රමුඛ මන්ත්‍රීවරු 9දෙනෙක් බැවින්, ඒ ගැන එතුමන්ලා සමඟ සාකච්ඡා කරලා ප්‍රශ්නය විසඳා ගැනීම වඩාත් යෝග්‍ය බවයි. එම කාරණාවත් එක්කම ඔබතුමාගේ යෝජනාව විවාදයට ගැනීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා කර තීරණයක් ගන්නා තෙක් පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 146හි විධිවිධාන මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එම යෝජනාව අද දින විවාදයට නොගැනීමට තීරණය කළ බව දන්වා සිටිමි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ මේක අවුරුද්දක් තිබුණා වාගේම, මේ ගැන Parliamentary Business Committee එකේදී මීට සුමාන දෙකකට පෙර සාකච්ඡා කළා. මෙය හැම අවස්ථාවේම Order Paper එකේ පළ කරලා තිබෙනවා. මම මේ යෝජනාව ඉදිරිපත් කරන්න ඉස්සෙල්ලා, - මම අද ඉන්නේ ආණ්ඩු පක්ෂයේ නොවෙයි නේ. මම ඉන්නේ විපක්ෂයේනේ - ඔබතුමාට ලැබී තිබෙන ඉල්ලීමක් මත, මට නොදන්වා එක් වරම එය ඉවත් කිරීම තුළින් මගේ වරප්‍රසාද උල්ලංඝනය වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මේක 2009 Parliamentary Elections (Amendment) Bill එකට හසන් අලි, දිවංගත මාවෛ සේනාධිරාජා, දිවංගත මංගල සමරවීර සහ විමල් රොද්‍රිගෝ යන අය විසින් ඉදිරිපත් කර තිබෙන පෙත්සමකට ලැබී ඇති උසාවි නියෝගයක්. May I cite that particular Determination: "..Determination in terms of Article 123 of the Constitution is inconsistent .." -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මීට පෙර ලබා දුන් තීරණයක් මෙම විරෝධතාව සමඟ එවා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් Attorney-Generalගෙනුත් අපි විමසීම් කරලා තිබෙනවා. අද දින මෙය පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා කරන තෙක් බහා තැබීම කරනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, it is about this matter. ගරු කථානායකතුමනි, ඔබතුමා කිව්වා, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ පිළිබඳව සාකච්ඡා කරන්න තිබුණා කියලා. අපි විපක්ෂ නායකතුමා හරහා ගරු රවී කරුණානායක මැතිතුමාගෙන් ඉල්ලීමක් කළා, මේ යෝජනාව ගන්න එපා කියලා. ගරු කථානායකතුමනි, ඔබතුමා ගත්ත තීන්දුව හරි. මොකද, මේ පිළිබඳව උසාවියේ තීන්දුවක් තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ point of Order එකෙන් පස්සේ ඔබතුමාගේ point of Order එක raise කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, there must be a sense of decency in this Parliament.

ගරු කථානායකතුමනි, මම ඉදිරිපත් කර තිබෙන යෝජනාවට උසාවියෙන් ප්‍රකාශ නොකළ දෙයක් සම්බන්ධ කරලා, ඒ තුළින් මගේ වරප්‍රසාද උල්ලංඝනය කිරීම ඉතාම අශික්ෂිතයි. මේ අවස්ථාවේ මට අවශ්‍යව තිබෙන්නේ මේකයි; this is only an expression of legislative intent. මේක උසාවියේ නීතිගත වෙන්නේ නැහැ. අද ලංකාවේ යුද්ධයක් නැහැ. මෙතැන එකමුතුභාවයක් ඇති කරන්න ඕනෑ. එදා එක්සත් ජාතික පක්ෂය හදනකොට සිංහල, දෙමළ, මුස්ලිම් ඔක්කෝම එකතු වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හදනකොටත් ඒ වගේමයි. සජබය, JVP, NPP, NDF, මේ ඔක්කෝම පක්ෂවලට ජාතිවාදය, ආගම්වාදය නැහැ. මට ඕනෑ කරන්නේ එකමුතුභාවයක් ඇති කරන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වන දේවල්, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මම නැවත වතාවක් කියන්නේ, ස්ථාවර නියෝග 146හි විධිවිධාන යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව මා කටයුතු කර තිබෙන බවයි. ගරු මන්ත්‍රීතුමනි, අද දහවල් 12ට Parliamentary Business Committee එක රැස් වෙනවා. එය රැස් වුණාට පස්සේ සාකච්ඡා කරලා මේ ගැන කටයුතු කරන්න පුළුවන්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ඉදිරිපත් කරන පෞද්ගලික මන්ත්‍රී යෝජනාවලට සමහර මන්ත්‍රීවරුන් කැමති වෙන්න පුළුවන්; සමහර අය අකැමති වෙන්න පුළුවන්. අපි එකඟයි, මේක පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ තවදුරටත් සාකච්ඡා කරන්න. මේ යෝජනා පිළිබඳව කලින් සාකච්ඡා කරලා, දැනුවත්භාවයක් සහිතව තමයි න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, කෙසේ නමුත්, සභාවේ මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා මම ඔබතුමාගෙන් අහන්නට කැමැතියි, මේකට විරුද්ධත්වය පළ කර තිබෙන්නේ පක්ෂ වශයෙන්ද, නැත්නම් නම් වශයෙන්ද කියලා. ඔබතුමා සම්පූර්ණ නාම ලේඛනය කියෙව්වා නම් දැන ගන්න පුළුවන්, මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ සම්බන්ධයෙන් ගරු විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා, ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා, ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමා, ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා, ගරු අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමා යන අය තමයි විරුද්ධත්වය ප්‍රකාශ කරලා තිබෙන්නේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, අපේ ගරු රවි කරුණානායක මැතිතුමා එක්ක අපට ගැටලුවක් නැහැ. ඔබතුමා මේ පිළිබඳව එතුමාට කාරණා ඉදිරිපත් කරන්න වැඩි අවස්ථාවක් ලබා දුන්නා. ගරු කථානායකතුමනි, අපි මේ යෝජනාවට විරුද්ධ වෙන්න ප්‍රධාන හේතුව මොකක්ද කියලා ඉතා පැහැදිලිව කියන්න ඕනෑ. පක්ෂවල තිබෙන නමෙන් පක්ෂ පවත්වාගන්න බැරි -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් මේ කාරණය debate කරන්න,-

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මට විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි. මොකද සභාව නොමඟ යැවීමක් සිදුවන නිසා.

"ශ්‍රී ලංකාව තුළ අපි ඔක්කෝම එකතු වෙලා ඉන්න ඕනෑ, මෙන්න මේ මන්ත්‍රීවරුන් විතරක් විරුද්ධයි" කියන මතයක් සමාජගත වෙන්න ඕනෑ නැහැ. ලංකාව තුළ තිබෙන ජනවාර්ගික ගැටලුව, national question එක, resolve කරපු දවසට අපේ පක්ෂවලට ඒ විධියට නම් තියාගන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ ගැටලුව විසඳන කල් අපට මේ පක්ෂ අවශ්‍යයි. ඊට පස්සේ පක්ෂ ටික විසුරුවලා දාන්න අපි ලැහැස්තියි. රටේ තිබෙන මේ national question එක විසඳන්නේ නැතුව මේ වාගේ යෝජනාවකට අපේ පක්ෂවල විරුද්ධත්වය ප්‍රකාශ කරනවා කියලායි අපි කිව්වේ. ඒකත් අපේ විරුද්ධත්වය නිසාම නොවෙයි. උසාවි තීන්දුවක් තිබෙනවා, Attorney-Generalගේ එකඟතාව යටතේ 2009 පාර්ලිමේන්තු මැතිවරණ පනත පාර්ලිමේන්තුවේ කාරක සභා අවස්ථාවේදී සංශෝධනය කරන කොට, දැන් රවි කරුණානායක මන්ත්‍රීතුමා ගෙනැල්ලා තිබෙන යෝජනාවේ තිබෙනවා වාගේ ඒ කැල්ල ඉවත් කර ගෙන පාර්ලිමේන්තුව ඒ නීතිය සම්මත කළ යුතුයි කියලා. ඒ එකඟතාව මත තමයි, 2009 පාර්ලිමේන්තු මැතිවරණ පනතත් සම්මත කළේ. ඒ නඩු තීන්දුවේ පිටපතක් ඔබතුමාට දීලා තිබෙනවා. නඩු තීන්දුවක් තිබෙන කොට එය පාර්ලිමේන්තුවේ හැල්ලුවට ලක් කරන්නේ නැතුව, ඒ කාරණය සාකච්ඡාවට භාජන කරන්නේ නැතුව ඔබතුමා නීතිපති උපදෙස් පතන්න; නැත්නම් Parliamentary Business Committee එකට

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

යොමු කරන්න. මේ ගැන පාර්ලිමේන්තුවේ විවාදයක් කරන්න දෙන්න එපා. මේක උසාවියේ තීන්දුවක්, ගරු කථානායකතුමනි. ඔබතුමා හරි තීන්දුවක් අරගෙන තිබෙන්නේ. ඔබතුමා ඒ තීන්දුවත් එක්ක හිටගන්න. අපි Parliamentary Business Committee එකේදී කථා කරමු. එහෙම නැත්නම් Attorney-Generalගේ opinion එක ගනිමු. මේක විවාද කළොත් රට තුළ අනවශ්‍ය අදහසක් සමාජගත වෙන්න පුළුවන්. ඒකට ඉඩ දෙන්න එපා කියන ඉල්ලීම කරනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ඔක්කෝම ශ්‍රී ලංකා අනන්‍යතාවක් සහිත පුරවැසියන් ලෙස සලකන්නයි මට අවශ්‍ය වන්නේ. අපි හැමෝම පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු කරන්නේ ව්‍යවස්ථානුකූලව. මම උපුටා දක්වා කියන්නම්. මේකේ වැරදි අර්ථකථනයක් දෙන්න හදනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, මේ කාරණාව ගැන විවාදයකට යන්න අවශ්‍ය නැහැ. මම දැන් කිව්වා නේ. Attorney-Generalගේ තීරණයත් සලකලා, Parliamentary Business Committee එකේදීත් කථා කරලා අපි මේ ප්‍රශ්නය විසඳා ගනිමු.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, Article 3 of the Constitution states that "Sovereignty includes the powers of government, - *[Interruption.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, මේ ගැන දැන් විවාදයකට යන්න පුළුවන්කමක් නැහැ.

ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரேரணைகள்
## PRIVILEGE MOTIONS

### 2025.05.28 දින "අද" පුවත් පත් වාර්තාව
### 2025.05.28ஆந் திகதிய "அத" பத்திரிகை அறிக்கை
### NEWS REPORT IN "ADA" NEWSPAPER OF 28.05.2025

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නලින් හේවගේ මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 ජූලි 09 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.
න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 3, 4, 5, 6 දරන පෞද්ගලික මන්ත්‍රී යෝජනා, එනම් පා. 7/2024, පා.40/2025, පා.42/2025, පා.46/2025, පා.47/2025 ඉදිරිපත් කිරීම.

යෝජනා අංක 1 - පා. 7/2024 - ඉදිරිපත් කිරීම, ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Hesha Withanage Ankumbura Arachchi, you may present your Private Members' Motion.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මට පොඩි වෙලාවකට අවසරය ලබා දෙන්න. වැදගත් කාරණාවක් මෙතැනදී සාකච්ඡාවට භාජන වුණා. මම ඒ පිළිබඳව වාදයකට-විවාදයකට යනවා නොවෙයි. නමුත් වැරදි අරුතක් රටට යෑම ඉතාම අහිතකරයි. විශේෂයෙන්ම මේ කාරණය මම කියන්නට ඕනෑ. ආගම්, ජාති, ජන කොට්ඨාස, කුල, වර්ග කේන්ද්‍ර කරගෙන දේශපාලන පක්ෂ ක්‍රියාත්මක කිරීම ගැන පෞද්ගලිකව මමත් අනිවාර්යයෙන්ම එකඟයි. ඒක ගැන විවාදයක් නැහැ. හැබැයි, අපි හිතා බලන්නට ඕනෑ, ජාතිය අනුව වේවා, ආගම අනුව වේවා, වෙනත් කරුණු කාරණා මත වේවා ප්‍රධාන දේශපාලන පක්ෂවලින්; ප්‍රවාහයන්වලින් ඒ ඒ ජන කොට්ඨාසවල ප්‍රශ්නවලට, ගැටලුවලට නිවැරදි විසඳුම්, අපක්ෂපාතී විසඳුම් ලැබෙනවාද කියලා. ජාතිවාදය, ආගම්වාදය ක්‍රියාත්මක නොවන වාතාවරණය නිර්මාණය වීම තුළ ඔය ජාති, ආගම් කේන්ද්‍ර කරගෙන පක්ෂ අවශ්‍ය වෙන්නේ නැහැ.

ඔබතුමා දන්නවා, පාස්කු ප්‍රහාරයෙන් පසුව මේ රටේ ජාතිවාදය ඉහ වහා ගිය බව. එතකොට ඔය ප්‍රධාන යැයි කියන දේශපාලන පක්ෂවලින් කී දෙනාද, වෙනත් ජන කොට්ඨාස වෙනුවෙන් නැඟී සිටියේ? යම් කාල වකවානුවක් තුළ මේ රටේ ජාතිවාදය, ආගම්වාදය ඉහළින්ම ක්‍රියාත්මක වුණා. කවුද, ඒ ජන කොට්ඨාස වෙනුවෙන් පෙනී සිටියේ? ඇත්ත කථා කරනවා නම්, ඒ ජාතිවාදය ක්‍රියාත්මක කළේ ප්‍රධානතම දේශපාලන ප්‍රවාහයක්. ඒ නිසා මම පැහැදිලිව කියන්නට ඕනෑ, මේක මේ අමුතු දෙයක් නොවෙයි කියන එක. අපි බැලුවොත්, ඉන්දියාව කියන්නේ ලෝකයේ තිබෙන විශාලතම - *[බාධා කිරීමක්]* මට කථා කරන්න අවස්ථාව දෙන්න. මේක ඉතාම වැදගත්. ඉන්දියාව, ප්‍රජාතන්ත්‍රවාදය ඉහළින්ම තිබෙන රටක් හැටියට අපි හඳුන්වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, I think you made your point.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ රටේ භාරතීය ජනතා පක්ෂය, Indian Union Muslim League, AIMIM, Akali Dal, ඒ වාගේම තමිල්නාඩුවේ තිබෙන Dravidian parties යනාදි දේශපාලන පක්ෂ විවිධ ජන කොට්ඨාස අනුව නිර්මාණය වෙන්නේ, ප්‍රධාන දේශපාලන පක්ෂවලින් විසඳුම් නොලැබෙන නිසා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Leader of the Opposition, you have had your time and made your point clear.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ නිසා ප්‍රතිපත්තිමය වශයෙන් අපි ඒකට එකඟයි. ජාතිය, ආගම, කුලය, පන්තිය, තරාතිරම කේන්ද්‍ර කරගෙන දේශපාලන පක්ෂ අවශ්‍ය වෙන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, I am telling you one more time that you have made yourself clear.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නමුත් ඒ ජන කොට්ඨාසවල ප්‍රශ්නවලට විසඳුම් ලැබෙනතෙක්, එය සිදු වෙන්නට ඕනෑ. අනෙක් කාරණය, මේ රටේ ජනතාවගේ මූලික අයිතිවාසිකම් එහෙම කඩකරන්නට බැහැ. ඒ නිසා අපි ප්‍රතිපත්තිමය වශයෙන් ඒකට එකඟයි. නමුත් මේ දුක්ගැනවිලි තිබෙනකම්, මේ රටේ සිංහල නොවන ජන කොට්ඨාසවලට සාධාරණත්වයක්, යුක්තියක් ඉටු වෙනකම් මේ රටේ අනෙකුත් ජනතාවගේ මූලික අයිතිය උල්ලංඝනය කරන්න අපිට බැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාර්ගිකත්වය සහ ආගමික පදනම අනුව දේශපාලන පක්ෂ තහනම් කිරීම කියා යෝජනාවක් මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් කර තිබුණාම, ඒක ඉවත් කරගන්න කියලා පක්ෂ නායකයන් හෝ මන්ත්‍රීවරුන් ලියා දුන්නාම, ඒක භාර අරගෙන පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා කරනවා මිසක්, ඒ ලියා දුන් ලියවිල්ලට අදාළව දැන් තව තව දේවල් පැහැදිලි කරන්න ගියොත් මේක විවාදයක් වෙනවා. ඒ නිසා කරුණාකරලා අපි ඒ සම්බන්ධව දවල්ට සාකච්ඡා කරලා එම යෝජනාව ගන්නවාද, නැද්ද කියලා තීන්දු කරමු.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Hesha Withanage Ankumbura Arachchi, you may present your Private Members' Motion. Your time starts now and you have five minutes.

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා
## தனிநபர் பிரேரணைகள்
## PRIVATE MEMBERS' MOTIONS

### රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම
### ருவன்புர அதிவேக நெடுஞ்சாலையின் நிர்மாணப் பணிகளைத் தொடர்ந்து முன்னெடுத்துச் செல்லல்
### CONTINUING THE CONSTRUCTION WORK OF RUWANPURA EXPRESSWAY

[පූ.භා. 11.16]

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ප්‍රතිලාභ රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නොව බදුල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ජනතාවට ද ලැබෙන හෙයින්, රටේ පවතින ආර්ථික දුෂ්කරතා හමුවේ වුව ද විශාල ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමට හැකියාව ඇති මෙම ව්‍යාපෘති අඛණ්ඩව කොටස් වශයෙන් හෝ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වත්මන් ආණ්ඩුවේ වැඩ පිළිවෙළ යටතේ එක් එක් ඇමතිවරුන් යෝජනා ක්‍රියාත්මක කරන්නේ මොන ආකාරයෙන්ද, ඒවාට මොන විධියටද මැදිහත් වෙන්නේ, කුමන කාරණා පාදක කරගෙනද කටයුතු කරන්නේ කියන එක අද ඉතාම පැහැදිලි වුණා. ඉන්දියානු ණය ආධාර යටතේ නිවාස හදන එක ගැන මාධ්‍යයට කියන්න, රටට කියන්න පාර්ලිමේන්තුවේදී උත්සාහ කළාට, ඒකේ ඇත්ත කථාව මොකක්ද කියලා ඇමතිතුමා කියන්නේ නැහැ. මේක, මීට පෙර පැවති ආණ්ඩුවේ දිගම්බරම් හිටපු ඇමතිවරයා සහ හිටපු ඉඩම් අමාත්‍ය අපේ ගයන්ත කරුණාතිලක මැතිතුමා ඉතාම සාර්ථකව කරගෙන ආ ව්‍යාපෘතියක්. ඒ නිසා මේවා අලුතින් එන දේවල් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රුවන්පුර අධිවේගී මාර්ගය ගැන කියනකොට එක් එක් මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළා, ආණ්ඩුවක් විධියට, රජයක් විධියට මේ වෙනුවෙන් මැදිහත් වෙනවා කියලා. එක එක රජයන්වල ප්‍රතිපත්තිමය කාරණා ක්‍රියාත්මක වෙන්නේ එක් එක් ආකාරයකට. නමුත් මෙතෙක් කල් මේ රට පාලනය කරපු ආණ්ඩුවලට වඩා වෙනස් ආකාරයේ ජනතා මතයක් මේ ආණ්ඩුවට දීලා, ජනතාව වෙනස් ආකාරයේ පිළිතුරු බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒ නිසා අපි හිතනවා පසුගිය

[ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා]

රජයන්වල හිටපු ජනාධිපතිවරුන්ට ඕනෑ විධියට, අගමැතිවරුන්ට ඕනෑ විධියට, විෂය භාර කැබිනට් ඇමතිවරුන්ට ඕනෑ විධියට ව්‍යාපෘති ක්‍රියාත්මක නොකර, වචනවලට පමණක් සීමා වෙලා මේ ව්‍යාපෘති පිළිබඳව කටයුතු කිරීම වැරදියි කියලා. ජනාධිපති නම්, ජනාධිපතිගේ ගම තමයි ඉස්සෙල්ලා හදන්නේ. මේ රුවන්පුර අධිවේගී මාර්ගයේ කටයුත්ත අර විධියේ ප්‍රකාශවලට විතරක් මායිම් නොකර යථාර්ථයක් වෙන්න අවශ්‍යයි. ඒ නිසා විෂය භාර අමාත්‍යවරයා අනිවාර්යයෙන්ම සෘජු පිළිතුරක් දෙන්න ඕනෑ, මේකට වෙන්වන ප්‍රතිපාදන නැත්නම් ණය ආධාර ලබා ගන්නා තැන් ගැන, ඒ වාගේම මෙන්න මේ කාල සීමාවේ තමයි මේ කටයුතු ආරම්භ කරන්නේ කියලා. මේ රටේ මිනිස්සු ජාතික ජන බලවේගයේ රජයකින් බලාපොරොත්තු වුණේ එවැනි කාරණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමතිවරයෙක් කිව්වා, "අපි කොළඹ ඉඳලා පොළොන්නරුවට යනකම් කිලෝමීටර පහෙන් පහට වැසිකිළි හදනවා, ඒවා තමයි විශාල ව්‍යාපෘති" කියලා. ඒක හොඳ ව්‍යාපෘතියක්. අපි ඒවා නරකයි කියනවා නොවෙයි. හැබැයි, ඒක විශාල ව්‍යාපෘතියක් විධියට එතුමන්ලා තේරුම් ගෙන ඉන්නවා නම්, රුවන්පුර අධිවේගී මාර්ගය වැනි ව්‍යාපෘති මේ රටේ මිනිස්සුන්ට ජීවිතේටවත් දකින්න ලැබෙන්නේ නැහැ. එතුමන්ලා තේරුම් ගන්න ඕනෑ, එතුමන්ලා දැන් ඉන්නේ ආණ්ඩුවේ කියලා. දැන් එතුමන්ලා ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරුන් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ව්‍යාපෘතිය හරහා බදුල්ල, මොනරාගල වැනි දිස්ත්‍රික්කවල ජනතාවටත් සහන රැසක් සැලසෙනවා. විශේෂයෙන්ම සංචාරක ආකර්ෂණීය ප්‍රදේශ ගණනාවක්ම තිබෙන, මැණික් කර්මාන්තය හරහා විශාල අපනයන ආදායමක් මේ රටට අරගෙන එන, තේ, කුරුඳු කර්මාන්ත හරහා විශාල අපනයන ආදායමක් අපේ රටට ගෙනෙන රත්නපුර දිස්ත්‍රික්කයේ ජීවත් වන ජනතාවගේ මූලික අවශ්‍යතාවක් වන මාර්ග පහසුකම් සම්බන්ධයෙන් අද ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ආණ්ඩු පක්ෂය යෝජනා කළා, කැලණි වැලි දුම්රිය මාර්ගය දික් කරලා පරණ තිබ්බ විධියට හදනවා කියලා. ඒක හොඳ යෝජනාවක්. ඒ ගැන අපේ කිසිම කුහකකමක් නැහැ. මම පෞද්ගලිකවම විශ්වාස කරනවා ඒක හොඳ යෝජනාවක් කියලා. හැබැයි, මේ යෝජනා දින වකවානු එක්ක රටේ යථාර්ථයක් බවට පත් කිරීම තමයි ජනතාව බලාපොරොත්තු වන්නේ. තමුන්නාන්සේලා කලින් කියපු දේවල් දැන් නැහැයි කියනවානේ. කිලෝමීටර තුනෙන් තුනට පාසල් හදනවා කියපු කථාව ප්‍රතික්ෂේප කරන විධියට දැන් නලින්ද ජයතිස්ස ඇමතිතුමා කථා කරනවා. ඇත්තටම ඒක අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා කියපු කථාවක්. ඒක නලින්ද ජයතිස්ස ඇමතිතුමා කියපු කථාවක් නොවෙයි. ඒක ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා. අපි ඒ ගැන විවිධ වෙලාවලදී ඇහුවා, කොහොමද කිලෝමීටර තුනෙන් තුනට පාසල් හදන්නේ කියලා. දැන් විෂ්කම්භයයි, අරයයි කියලා ඒකෙන් ඇඟ බේරගන්න බැහැ. ඒ විධියට පාසල් හදන්නේ කොහොමද කියන එක දැන් ආණ්ඩුවට පැහැදිලි කරන්න බැහැ. එහෙම පාසල් ප්‍රමාණයක් මේ රටේ හදනවා නම් මේ තිබෙන පාසල් 10,126 දෙගුණයක් හෝ ඊටත් වඩා වැඩි වෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Hesha Withanage, your time is up.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මා අද ඉදිරිපත් කළ යෝජනාව පැහැදිලිවම විය යුතු එකක්. මේ පාර්ලිමේන්තුවේ සිටින කවුරු හරි මේ යෝජනාවට විරුද්ධ වෙයි කියලා මම හිතන්නේ නැහැ. මේ යෝජනාව ක්‍රියාත්මක කිරීම යථාර්ථයක් බවට පත් කිරීමට වත්මන් ආණ්ඩුව අවශ්‍ය පියවර ගන්නවාද කියන කාරණාවට එක එක සීමා දමන්නේ නැතිව දින වකවානු එක්ක මේ පාර්ලිමේන්තුවට සෘජු ප්‍රකාශයක් කරන්න කියා මා ඉල්ලනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chamara Sampath Dasanayake. You have five minutes to second the Private Members' Motion moved by the Hon. Hesha Withanage Ankumbura Arachchi.

[පූ.භා. 11.22]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ හේෂා විතානගේ මන්ත්‍රීතුමා ගෙනා "රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම" පිළිබඳ යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මුලින්ම මේ කාරණය කියන්න ඕනෑ. අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ ප්‍රශ්න අහන්නයි, කථා කරන්නයි. එළියේ ඉන්න සමහර මාධ්‍ය ඩෝබිලා එකතු වෙලා කියනවා පුළුවන් නම් ඒවා එළියේ කියන්න කියලා. පාර්ලිමේන්තුව තිබෙන්නේ බෝක්කු ගානේ නැත්නම් කඩ සාප්පු ගානේ කථා කරන්න නොවෙයි. එහෙම නම් පාර්ලිමේන්තුව වහලා ඔක්කෝම එළියට ගිහින් කථා කරමු. සමහරු කියනවා, අපි පාර්ලිමේන්තු වරප්‍රසාදවලට යට වෙලා බයේ ඉන්නවා කියලා. අපි පාර්ලිමේන්තු වරප්‍රසාදවලට යට වෙලා බයේ ඉන්නේ නැහැ. අපි හිර ගෙදර ඉඳන් ඇවිල්ලාත් මේ පාර්ලිමේන්තුවේ කථා කළා. හිර ගෙදර ඉඳලා ආපු දවසේ ඉඳන් අවුරුද්දක් වනතුරු මම එක දිගට කථා කළා. මම කථා කරපු ඒවාට විරුද්ධව ඊයේ CID එකට ගිහිල්ලා තිබෙනවා; යන්න. මම කථානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා, CID එකට ලියුමක් යවන්න කියලා කටඋත්තර දෙන්න චාමර සම්පත් ඕනෑම වෙලාවක පාර්ලිමේන්තුවෙන් එවනවා කියලා. ඔබතුමාට අයිතියක් තිබෙනවා මා යවන්න. ඒ දාපු පැමිණිලිවලට කටඋත්තර දෙන්න මා යවන්න. අපි ඒකට බය නැහැ. වරප්‍රසාද ඇතිව හෝ නැතිව හෝ අපි ඒවාට බය නැති හින්දා තමයි මේ පාර්ලිමේන්තුවේ උත්තර දුන්නේ. අපි ළඟ සාක්ෂි තිබෙනවා. මම ඒ ගැන ඊට වැඩිය කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

අපි මේ ආණ්ඩුවට මේ කාරණයත් කියනවා. මම යන්නේ බදුල්ලට. අපි කොට්ටාවෙන් පටන් ගත්තාම මත්තලට යනතුරු අධිවේගී මාර්ගයෙන් ගිහිල්ලා තණමල්විල හරහා වැල්ලවායෙන්, ඇල්ලෙන්, බදුල්ලට යනවා. අපි රුවන්පුර මාර්ගයේ යනවා නම් අපට හොරණ, රත්නපුර හරහා බදුල්ලට යන්න තිබෙන්නේ කිලෝමීටර් 250යි. මත්තලින් බදුල්ලට යනවා නම් කිලෝමීටර් 100ක් වැඩියි. මත්තල හරහා යන පාර කිලෝමීටර් 350ක්. නමුත්, අද අපි අධිවේගී මාර්ගයෙන් මත්තලට ගිහිල්ලා, තණමල්විලෙන් වැල්ලවායට ගිහිල්ලා, ඇල්ලෙන් බදුල්ලට යනවා.

හැබැයි, අද වන විට පාරවල් විශාල සංඛ්‍යාවක් හැදිලා තිබෙනවා කියලා ඔබතුමන්ලා දන්නවා. යුද්ධය වැඩියෙන්ම තිබුණු පැතිවල පාරවල් බලන්න. යාපනයට යන පාර බලන්න.

අනුරාධපුරේ යාපනේ හන්දියේ ඉඳන් දිගටම යාපනයටම යන්න පුළුවන් විධියට කාපට් එක තිබෙනවා. හැබැයි, ඒවා යුද්ධය තිබුණු පැති. මේ පැත්තෙන් හබරණ ඉඳන් ත්‍රිකුණාමලයට යනකම් දිගටම අධිවේගී මාර්ගයේ වාගේ කාපට් එක තිබෙනවා. කැකිරාවෙන්, මරදන්කඩවලින් වාගේම දඹුල්ල හරහා පොළොන්නරුවටත් අධිවේගී මාර්ග වාගේ පාරවල් තිබෙනවා. හැම තැනම මාර්ග පද්ධතිය උපරිම වශයෙන් හැදිලා තිබෙනවා. අම්පාර, වෙන්කල්අඩි පැත්තෙන්, ඒ වාගේම මඩකලපුවෙන් ත්‍රිකුණාමලයට එන්න පුළුවන්. ඒ පැත්තෙනුත් පාරවල් හැදිලා තිබෙනවා.

මම මේ ආණ්ඩුවෙන් එක ඉල්ලීමක් කරනවා. "දේවානිගේ ගහේ ප්‍රශ්නයට" නැවතී තිබුණු මහනුවර අධිවේගී මාර්ගය හදන්න මුල්ගල තැබුවා. මිනිස්සු ආණ්ඩුවකින් ගොඩක් දේවල් බලාපොරොත්තු වෙනවා. මිනිස්සු 1970දී මැතිනියගේ ආණ්ඩුවෙන් යමක් බලාපොරොත්තු වුණා. ඒ කාලයේ මැතිනියගේ ආණ්ඩුවෙනුත් ඒවා කෙරුණා. ජේ.ආර්.ගේ ආණ්ඩුවෙනුත් මිනිස්සු යමක් බලාපොරොත්තු වුණා. වික්ටෝරියා, කොත්මලේ වාගේ projects ආවා. මහවැලි "C" කලාපයේ, පොළොන්නරුවේ ජීවත් වෙන මිනිස්සුන්ට අද කියන්න දේවල් තිබෙනවා. අපි මේ ආණ්ඩුවෙනුත් යමක් බලාපොරොත්තු වෙනවා. ජනාධිපතිවරයෙක් ඉන්න, මන්ත්‍රීවරු 159කගෙන් යුත් ඔබතුමන්ලාගේ ආණ්ඩුව යන්න කලින් අපි බලාපොරොත්තු වෙනවා, මේ අධිවේගී මාර්ගය ඉදිකරයි කියලා. නුවර, කඩවත වැඩ නැවතී තිබෙන අධිවේගී මාර්ගය ජාතික ජන බලවේගයේ අධිවේගී මාර්ගය කියලා ඉදිරියේදී අපිත් කියන්න කැමැතියි. අපි නුවරට යන්නේ ජාතික ජන බලවේගය ආණ්ඩුවෙන් හදපු අධිවේගී මාර්ගයේ කියලා කියන්නත්, ඒ අධිවේගී මාර්ගයේ යන්නත් අපි සතුටුයි. අපි ඒ වෙනුවෙන් බලාගෙන ඉන්නවා. *[බාධා කිරීමක්]* මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න කෝ. ඔබතුමන්ලාට හොඳක් කියනකොටත් අපට බණිනවා, නරකක් කියනකොටත් අපට බණිනවා. ඔබතුමන්ලාට මොනවාවත් තේරෙන්නේ නැහැ නේ. ඉන්න කෝ, පොඩ්ඩක්.

ඒ කාලයේ ඔබතුමන්ලා කිව්වා, මහින්ද රාජපක්ෂ මහත්තයාට තංගල්ලට ඇඹුල් තියල් ගෙනියන්න තමයි මේ පාරට කාපට් එක ගැහුවේ කියලා. කමක් නැහැ. මහින්ද රාජපක්ෂ මහත්තයා හදපු පාරේ තමයි දැන් අපිත් යන්නේ. චන්ද්‍රිකා මැඩම් මුල් ටිකට මුල්ගල තැබුවා. අපි ඒකේත් යනවා. නායකයා කවුරු වුණත් අපට කමක් නැහැ. මම ඊයේ-පෙරේදා කෑගල්ලේ ගියා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chamara Sampath Dasanayake, you have one more minute.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක් වැඩි කරන්න.

කෑගල්ලේ යනකොට ඉස්කෝලයක් පෙන්වලා මම ඇහුවා, මේක ඩඩ්ලි සේනානායක මහතා හදපු ඉස්කෝලයක්ද කියලා. වරකාපොලට යනකොට මේක ඩී.එස්. සේනානායක මහතා හදපු ඉස්කෝලයක්ද කියලා මම ඇහුවා. ඒ විධියට ජාතික ජන බලවේගය ආණ්ඩුවෙන් හදපු පාරවල් බලන්නත් අපි ආසයි. දැන් පාරවල් හැදිලා ඉවරයි. පාරවල් බොහෝ ප්‍රමාණයක් ලංකාවේ හැදිලා තිබෙන්නේ. ඉතුරු වෙලා තිබෙන්නේ ඔය රුවන්පුර අධිවේගී මාර්ගයයි, නුවර අධිවේගී මාර්ගයයි. අද කෑගල්ලේ ඉඳන් කොළඹට එන්න ගත වෙනවා පැය තුනක් විතර. පාර block වුණාම පැය තුනකටත් වැඩිය ගත වෙනවා. හැබැයි, නුවර අධිවේගී මාර්ගය හැදුණොත් අපට පැය දෙකෙන් නුවරට යන්න පුළුවන්. එතැන ඉඳන් රන්දෙණිගල පාරේ මට පැය දෙකෙන් බදුල්ලට යන්න පුළුවන්. ඒක තමයි අපේ බලාපොරොත්තුව.

ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය ඇමතිතුමා දැන් මේ සභාවේ ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, රජ මාවත කියලා තිබෙනවා, රන්දෙණිගල මාර්ගය නැතුව හාලිඇල ඉඳලා නුවරට එන්න පුළුවන් මාර්ගයක්. දැන් ඒක භාගෙට හදලා නැවතිලා තිබෙනවා. ඒ රජ මාවත හැදුවොත් පැය දෙකකින් නුවරට එන්න පුළුවන් වලපනේ පැත්තෙන් රිකිල්ලගස්කඩ හරහා. ඒක තමයි නුවරට එන්න තිබෙන කෙටිම මාර්ගය. දැන් ඒකට මුල්ගල තියලා හදාගෙන යනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් මේ අවුරුදු 5ක කාලය තුළ ඒවා කරන්න. සමහර නායකයෝ හිටියා. සමහර නායකයෝ මේවා හදලා බෝඩ් ගැහුවා. ඒවා මිනිස්සු දන්නවා. මෙයා මේක කළා, මේ ආණ්ඩුවෙන් මේක වුණා කියලා ජනතාව දන්නවා.

මටත් කියන්න දේවල් තිබෙනවා. අපි විෂය භාරව කටයුතු කරපු කාලයේ නිමල් සිරිපාල හිටපු ඇමතිතුමා සහ මම බදුල්ලට කරපුවා තිබෙනවා. ඒ ගැන අපටත් සන්තෝෂයි. මම බන්දුල ගුණවර්ධනගේ කකුල් දෙක අල්ලලා වැඳලා හදපු සතොස ඊයේ - පෙරේදා ඔබතුමන්ලා ගිහිල්ලා විවෘත කළා. ඒකට කමක් නැහැ. මට ඒකට ආරාධනා කළේත් නැහැ. නමුත්, මම පහුව දා සතොසට ගිහිල්ලා මාළු කිලෝවක් අරගෙන ආවා. මට ඒ ගැන සන්තෝෂයි. මම බන්දුල ගුණවර්ධනගේ කකුල් දෙක අල්ලලා වැඳලා හදපු ලංකාවේ ලොකුම සතොස ඔබතුමන්ලා ගිහිල්ලා විවෘත කළා. ඒකට කමක් නැහැ. අපි ඒවාට හොඳයි කියනවා. මොකද, අපට දැන් ඒවා විවෘත කරන්න බැහැ නේ. වෙළෙඳ ඇමතිතුමා ගිහිල්ලා, ඊයේ-පෙරේදා ඒක විවෘත කළා. හොඳ දේට අපි හොඳයි කියනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ ඉදිකළ අධිවේගී මාර්ගයකින් අපටත් බදුල්ලට හරි නුවරට හරි නැත්නම් රත්නපුරට හරි යන්න පුළුවන් වෙයි කියලා.

ඒ වාගේම ටී.බී. සරත් නියෝජ්‍ය ඇමතිතුමා හදන්න යෝජනා කරපු toilet එකකටත් යන්න මම බලාගෙන ඉන්නවා. මොකද, කිලෝමීටර් හතරෙන් හතරට අපේ සරත් නියෝජ්‍ය ඇමතිතුමා යෝජනා කරපු toilets හැදුවාම, ඒ කොහේ හරි මහ නතර කරලා ඒ toilet එකකටත් හෙට - අනිද්දාට මම යන්න බලාගෙන ඉන්නවා. ඒක වෙනම වැඩක්. ඒක සරත් නියෝජ්‍ය ඇමතිතුමාගේ හොඳ යෝජනාවක්. මොකද, පොළොන්නරුවේ කට්ටියට බඩේ අමාරුව වැඩියෙන් හැදෙනවා ඇති. එම නිසා ඒ යෝජනාවත් අපි පිළිගන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ රුවන්පුර අධිවේගී මාර්ගයේ යන්න අපට ඉක්මනට අවස්ථාව ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Janaka Senarathna. You have five minutes.

[පූ.භා. 11.29]

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාලයේ ඒ පැත්තේ යුද්දෙ තිබුණා, මේ පැත්තේ සුද්දෙ තිබුණා. ඒ කාලයේ පාරවල් හදපු හින්දා තමයි මීට සති කිහිපයකට කලින් සබරගමුව පළාත් සභාවේ හිටපු පළාත් මාර්ග සංවර්ධන ඇමතිට අවුරුදු 15කට හිරේ යන්න සිදු වුණේ. මම ඒ නම කියන්න අවශ්‍ය නැහැ. ඇයි ඒ? ඒගොල්ලන් සුද්දෙ කළා. මොනවාද? ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ මාර්ග ඇතුළු ව්‍යාපෘති ගණනාවක් කළා කියලා ලියවිලිවලින් විතරක් පෙන්වලා සල්ලි නිකුත් කරලා තිබෙනවා. කොච්චරක්ද? රුපියල් ලක්ෂ 770ක් -රුපියල් හත්කෝටි හැත්තෑලක්ෂයක්- සල්ලි ගෙවලා තිබෙනවා, එක වැලි කැටයක්, ගල් කැටයක් දාන්නේ නැතුව. එහෙමයි ඒ කාලයේ පාරවල් පෙන්වලා සුද්දෙ දැම්මේ.

මේ යෝජනාව ස්ථිර කරපු මන්ත්‍රීතුමා කිව්වා, ගොඩක් පාරවල් හදලා ඉවරයි කියලා. ඉවර නැහැ. රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධාන පාරෙන් මීටර් 100ක්, 200ක් ඇතුළට ගිහිල්ලා බලන්න, ග්‍රාමීය මාර්ගවල තත්ත්වය කොහොමද කියලා. සුද්දෙ විතරයි දාලා තිබෙන්නේ. ඒ වාගේ ගොඩක් පාරවල් තිබෙනවා. පාරට දෙවතාවකට සල්ලි අරගෙන තිබෙනවා.

මේ අධිවේගී මාර්ගය ගත්තාම, 2018 අවුරුද්දේ මේ සඳහා feasibility study එකක් කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පිටු 247ක් තිබෙන දැවැන්ත වාර්තාවක් තිබෙනවා. අවුරුද්දකට රුපියල් මිලියන 6,000ක විතර වාසියක් කහතුඩුව - පැල්මඩුල්ල දක්වා අධිවේගී මාර්ගය සෑදීම හරහා එනවා කියලා ඒ වාර්තාවේ සඳහන් වෙනවා. ඒක විශාල මුදලක්. ඒ කාලයේ යෝජනා කළේ කහතුඩුව- පැල්මඩුල්ල දක්වා අධිවේගී මාර්ගය හදන්න. පැල්මඩුල්ලේ ඒ කාගේ හරි ගෙයක් තිබුණාද කියන්න අපි දන්නේ නැහැ. ඒ feasibility study එකේ කියනවා, මේකේ interchanges 6න් දවසකට වාහන 69,000ක් විතර ඇතුළු වෙනවා සහ පිට වෙනවා කියලා. මේ මාර්ගය පිහිටා තිබෙන්නේ නාය යෑමේ අවදානම තිබෙන ප්‍රදේශයක වුණත්, මේක ආර්ථික වශයෙන් ඵලදායී දෙයක් විධියට ඒ වාර්තාවේ conclusion එකේදී යෝජනා කරලා තිබෙනවා.

දැන් මේ යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීතුමා මෙතැන කරුණු ඉදිරිපත් කළා, මේක හරියට අපි නැවැත්වුවා වාගේ කියලා. නමුත්, "පොහොසත් රටක් -ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රවාහනයට අදාළව අපේ අරමුණ වන්නේ සුවපහසු, ආරක්ෂාකාරී, දැරිය හැකි ප්‍රවාහන සේවයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහිදී දුම්රිය මාර්ග, අධිවේගී මාර්ග, ග්‍රාමීය මාර්ග වාගේම පොදු ප්‍රවාහනය ආදී සියලු දේවල් පිළිබඳව අපි සැලකිලිමත් වෙනවා. ඒකට අවශ්‍ය තීන්දු-තීරණ, ප්‍රතිපත්ති මේ වනවිටත් ගනිමින් ඉන්නවා.

ඒ වාගේම, අගෝස්තු 27වැනි දා "Daily Mirror" පුවත් පතට අපේ රජයේ ප්‍රවාහන ඇමතිතුමා විසින් දීපු ප්‍රකාශයකට අනුව පැහැදිලිව කියා තිබෙනවා, රුවන්පුර අධිවේගී මාර්ගයේ කහතුඩුව සිට ඉංගිරිය දක්වා ඉදිකිරීම ආරම්භ කරන බව. ඒ වාගේම ඒ සඳහා ඉඩම් අත්පත් කර ගැනීම දිගටම කරගෙන යනවා. හැබැයි, ඉංගිරියේ සිට රත්නපුරට යන කොටස නවත්වන්නේත් නැහැ. නමුත්, ඒක නැවත අධ්‍යයනය කළ යුතුව තිබෙනවා. ඒකට feasibility study එකක් කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා. ඒකට හේතුව මේකයි. මෙන්න, 2018දී කරපු study එකට අනුව යෝජිත මාර්ගය මේ map එකේ දක්වා තිබෙනවා. මේක ගංවතුරට නිරන්තරයෙන් ලක් වන, ගංගා පද්ධතියක් අසල තිබෙන මාර්ගයක්. ඒ නිසා ඉංගිරියේ සිට රත්නපුර දක්වා නැවත feasibility study එකක් කරලා redesign කරගත යුතු වෙනවා. ඒ වාගේම, 2018 මේ සැලසුම්වල තිබිලා නැහැ කැලණිවැලි දුම්රිය මාර්ගය පිළිබඳව. දැන් නැවතත් අපි තීරණය කර තිබෙනවා, රත්නපුර දක්වා එම දුම්රිය මාර්ගය ගෙන එන්න. ඒ නිසා මේක නැවත design කරගන්න වෙනවා; මේ expressway එකේ සැලසුම් වෙනස් කරගන්න වෙලා තිබෙනවා.

මෙතැනදී වචනයක් කියන්න ඕනෑ, මේ expressway එකේ වැඩ නැවතුණේ ඇයි කියලා. 2022දී මේ රත්නපුර අධිවේගී මාර්ගයේ කටයුතු නවත්වන්න සිද්ධ වුණේ පසුගිය දශක ගණනක් මේ රටේ සුද්දය දාපු අය මේ රට බංකොලොත්භාවයට පත් කරපු නිසායි. ඒ නිසා තමයි මේ expressway project එක නවත්වන්න සිද්ධ වුණේ.

කැලණිවැලි දුම්රිය මාර්ගයත් රත්නපුර දිස්ත්‍රික්කයට ඉතාම වැදගත්. ඒක 1912දී රත්නපුර දක්වා ඉදිකර, 1919දී ඕපනායක දක්වා ඉදිකර තිබෙනවා. නමුත්, 1976දී මේ මාර්ගය අයින් කරනවා. ඒක අයින් කරන්න මුල් වුණේත් එවකට හිටපු ප්‍රබල ඇමතිවරයෙක්. ඔහුගේ දියණියත් පසු කාලයක අමාත්‍යවරියක විධියට හිටියා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)on.

Hon. (Dr.) Janaka Senarathna, your time is up. Please, wind up now.

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna

මට තව තත්පර කීපයක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මම මේ යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීතුමාටත්, යෝජනාව ස්ථිර කරපු මන්ත්‍රීතුමාටත්, මේ ගරු සභාවටත් කියන්න කැමැතියි, රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීමේ කටයුතු අපේ ආණ්ඩුවෙන් නවත්වා නැහැ, නවත්වන්නේත් නැහැ කියලා. ඒ විතරක් නොවෙයි. 1976දී ගලවා දමපු කැලණිවැලි දුම්රිය මාර්ගයත් නැවත අපි රත්නපුරය දක්වා ගෙනෙනවා.

ඒ වාගේම, මේ යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමා කිව්වා, මැණික්වලින් විශාල ආදායමක් එනවා කියලා. ඒක පට්ටපල් බොරුවක්. ඒකට හේතුව මේකයි. 2024 අවුරුද්දේ ඩොලර් මිලියන 168ක් විතරක් ලංකාවට මැණික්වලින් ඩොලර් ආදායම එනකොට, අවුරුද්දකට පතල් 8,000ක් විතර operate කරන්න ඩොලර් මිලියන 200ක විතර වියදමක් යනවා. ඒ අනුව ඩොලර් මිලියන 4,000ක විතර ආදායමක් රටට එන්නේ නැතුව අහිමි කර තිබෙනවා; ගිලලා තිබෙනවා. අපි ඒවා ගැනත් ක්‍රියාමාර්ග ගන්නවා කියමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have three minutes.

[மு.ப. 11.35]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கௌரவ ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி அவர்களால் இரத்தினபுரி பிரதேசத்திற்கு அதிவேக நெடுஞ்சாலை அமைப்பது தொடர்பான ஒரு பிரேரணை முன்மொழியப்பட்டுள்ளது. அது அவருடைய மாவட்டம் தொடர்பான ஒரு முக்கியமான வேண்டுகோள். அதை நாங்கள் வரவேற்கின்றோம்; அதற்கு நாங்கள் எதிர்ப்பு இல்லை. ஆனால், வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களைப் பொறுத்தளவிலே, அந்தப் பிரதேசங்கள் அபிவிருத்தி அடையாமல் இருப்பதற்குப் பிரதான காரணம், போக்குவரத்திலே இருக்கின்ற சிக்கல்கள்தான். உதாரணமாக, கொழும்பிலிருந்து எமது பிரதேசங்களுக்குச் செல்வதென்றால் கிட்டத்தட்ட 7 - 8 மணித்தியாலம் பயணம் செய்ய வேண்டும். 2013- 2014ஆம் ஆண்டு காலப்பகுதியிலே நெடுஞ் சாலைகளுக்குப் பொறுப்பாக இருந்த அமைச்சருடைய முன்மொழிவின் பிரகாரம், மொனராகலை பிரதேசத்தினூடாக மட்டக்களப்பிற்கு ஓர் அதிவேக நெடுஞ்சாலையைக் கொண்டுவருவது பற்றியும், தம்புள்ளை ஊடாக வடக்கை நோக்கி Northern line என்ற அதிவேக நெடுஞ்சாலை அமைப்பது தொடர்பாகவும் சொல்லப்பட்டிருந்தது. ஆகவே, இந்த விடயங்கள் தொடர்பாகவும் அரசாங்கம் கவனமெடுக்க வேண்டுமென்று இந்த நேரத்தில் முக்கியமாகக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මහනුවර අධිවේගී මාර්ගය හදන එක පිළිබඳව අපි ඇත්තටම සතුටු වෙනවා. ඒ ගැන කිසිම බාධාවක් නැහැ. අපටත් ලේසියි, මහනුවර හරහා ගිහින් මඩකලපුවට යන්න පුළුවන්. හැබැයි රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මේ සභාවේ වැදගත් කාරණයක් මතු කළා. ඩොලර් මිලියන 500ක ණයක් චීනයෙන් ගන්නකොට, 2.5ට තිබුණු interest rate එක fix කරලා, ඒක 3.5ට cap කරන්න පුළුවන් කියන තත්ත්වයට මේ වෙනකොට මාරුවෙලා තිබෙනවා. පසුගිය කාලයේ highways හදනකොට වංචා, දූෂණ සිද්ධ වුණා කියලා විශාල චෝදනා එල්ල වුණා. මම දන්නේ නැහැ, මේ ආණ්ඩුවටත් ඉදිරියේදී එවැනි චෝදනා එල්ල වෙයිද කියලා. මොකද, ඩොලර් මිලියන 500ක පොලී මුදල සම්බන්ධයෙන් විශාල ගැටලුවක් පැන නැඟිලා තිබෙන නිසා. අපේ රටේ ජනතාව හිතයි අපි මේ highways හදන්න එපා කියනවා කියලා. අපි highways හදන්න එපා කියන්නේ නැහැ. නමුත්, චීනයෙන් මේ මුදල ණයක් හැටියටයි දෙන්නේ. හැබැයි, ඉන්දියාවෙන් ඩොලර් මිලියන 63ක ණයක් නොවෙයි, ආධාරයක් දුන්නා කන්කසන්තුරේ වරාය සංවර්ධනය කරන්න. මම හිතන්නේ අද ඇමතිවරයා ඉවත් කර තිබෙනවා. බොහොම හොඳයි- ඩොලර් මිලියන 63ක grant එකක් දුන්නු එක පවා බාර ගත්තේ නැහැ. ණය ගන්න පුළුවන්. නමුත් interest rate එක cap කරන්නේ නැහැ. මේ වාගේ විශාල ගැටලු රාශියක් තිබෙනවා.

ඒ වාගේම, තව කාරණයක් කියන්න ඕනෑ. පසුගිය රජයන් සියල්ලම චීනයත් එක්ක දූෂිත ගනුදෙනුවලට සම්බන්ධ වුණා කියලා වත්මන් ජනාධිපතිවරයාම කියලා තිබෙනවා. මහින්ද රාජපක්ෂ චෙක් ගත්තා කියලා කියා තිබුණා. ඒ companies එක්කම තමයි දැන් මේ වැඩත් කරන්නේ. එතකොට දැන් මේ ආණ්ඩුවේ අයත් චෙක් ගන්නවා ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, we have said - I have said these same words in this House earlier - that China is not even welcome in the North and the East because they do not have the interests of the Tamil people on their agenda. It is very clear that at the UNHRC also China had opposed anything good that could have come through that Council on behalf of the Tamil people, which is why we say the Chinese are trouble in this country.

Having said that, Hon. Deputy Speaker, we would like to urge this Government to increase connectivity to the North and the East by developing the airports and harbours there - the Trincomalee Harbour, the Batticaloa Airport, the Jaffna-Palali Airport and the KKS Harbour. At the same time, if those airports could be developed, we would be able to generate funds or bring in the required donations or grants to build our own highways in the North and the East, only if the Government of the day would allow it.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Rasamanickam, your time is up.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Okay, Sir.

I would like to again thank the Hon. Hesha Withanage for bringing in this important Motion. We are for the District of Ratnapura getting a highway. At the same time, we would like to urge the Government to consider the priorities of the North and the East as well.

Thank you, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Shantha Pathma Kumara Subasingha. You have five minutes.

[පූ.භා. 11.39]

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් විදියට රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් පිළිබඳව අසා තිබෙනවා. ඇත්තටම මේක ප්‍රශ්නයක් විදියට යොමු කරන්න දෙයකුත් නොවෙයි. එතුමා සජබයේ රත්නපුර දිස්ත්‍රික් නායකයා. එම නිසා එතුමාට මේ ගැන අවබෝධයක් තිබෙන්න ඕනෑ. අපි රුවන්පුර අධිවේගී මාර්ගයේ වැඩකටයුතු නවත්වලා නැහැ. ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු මේ වසරේ අය වැයෙන් රුපියල් මිලියන 2,500ක් රුවන්පුර අධිවේගී මාර්ගයට වෙන් කර තිබෙනවා. මේ දිනවල එහි සැලසුම් කටයුතු, ඉඩම් අත්පත් කර ගැනීම් කටයුතු ඒ මිලියන 2,500ට අදාළව කරමින් පවතිනවා. ඊට අමතරව ගරු ජනාධිපතිවරයා අපට පොරොන්දු වෙලා තිබෙනවා, ලබන වසරේ රුවන්පුර අධිවේගී මාර්ගය කහතුඩුව සිට ඉංගිරිය දක්වා පළමු අදියර ඉදි කරන්න. ගරු මන්ත්‍රීතුමනි, ඊට පස්සේ පියවර වශයෙන් තමයි ඊළඟ කොටස ඉදි වෙන්නේ. කහතුඩුව සිට ඉංගිරිය දක්වා කොටස අධිවේගී මාර්ගයක් විදියට පුළුල් වෙලා නිර්මාණය වෙනකොට ඉන් පස්සේ ලොකු වාහන

[ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා]

තදබදයක් ඇති වෙන්න පුළුවන්. එම නිසා ඉංගිරිය සිට රත්නපුරය දක්වා දැනට භාවිත වන මාර්ගය මංතීරු දෙකට පුළුල් කරන්නත් අපේ රජය සැලසුම් කර තිබෙනවා.

ඊට අමතරව දශක 5කට වැඩි කාලයක් තිස්සේ නවත්වා තිබුණු, අතහැර තිබුණු, රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවට සිහිනයක් බවට පත් කරපු කැලණිවැලි දුම්රිය මාර්ගය ඉදි කිරීමේ මූලික කටයුතු සඳහා අපේ ප්‍රථම අය වැයෙන් - 2025 අය වැයෙන්- රුපියල් මිලියන 250ක් වෙන් කළා. ඒ අවශ්‍ය කටයුතු සිදු කරමින් ඉන්නවා. මේ වෙනකොට එහි මිනුම් කටයුතු අවසන් කර තිබෙනවා. කැලණිවැලි දුම්රිය මාර්ගයේ වැඩකටයුතුත් අපි ඉතා ඉක්මනින් ලබන වසරේ ආරම්භ කරනවා.

ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හයිලෙවල් මාර්ගය කියලා හඳුන්වන මාර්ග අංක 122 මාර්ගය මංතීරු 4කින් රත්නපුරය දක්වා සංවර්ධනය කරන්න අවශ්‍ය කටයුතු අපේ රජය විසින් සැලසුම් කර තිබෙනවා. රත්නපුර දිස්ත්‍රික්කය වෙනුවෙන් අපි මේ දේවල් කියන්නේ සන්තෝසයෙන්. ඒ විතරක් නොවෙයි, මේ වසරේත් රුපියල් මිලියන 7,200ක් රත්නපුරය දිස්ත්‍රික්කයේ මහාමාර්ග, ග්‍රාමීය මාර්ගවලට වෙන් කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. දැනට ඒවායේ සංවර්ධන කටයුතු ආරම්භ කර තිබෙනවා. ඊට අමතරව අමාත්‍යාංශයෙන් අප දැනුවත් කර තිබෙනවා, අලුතින් තවත් කිලෝමීටර් 50ක ප්‍රමාණයක් කාපට් ඇතිරීම සඳහා යෝජනා කර තිබෙන බවට. ඔබතුමා නියෝජනය කරන කොළොන්න ආසනයේත් ඇඹිලිපිටිය, උඩගම සිට සුදු පාලම දක්වා මාර්ගයත් කාපට් කරනවා. දැන් ඒ වැඩ කටයුතු ආරම්භ කර තිබෙන්නේ. ඊට අමතරව ඔබතුමාගේම ආසනයේ සූරියකන්ද, ඇරැපෝරුව මාර්ගයේ කිලෝමීටර් 10ක් සංවර්ධනය කිරීමට රුපියල් මිලියන 5,000ක් ඇස්තමේන්තු කරලා, දැනට රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබෙනවා. දැන් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් ඉන්නවා. හෙට-අනිද්දාම ටෙන්ඩර් කරලා ඒ වැඩකටයුතු පටන් ගන්න පුළුවන්, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමනි. ඒකට රුපියල් මිලියන 5,000ක් තමයි ඇස්තමේන්තු කර තිබෙන්නේ. ඒක අති විශාල මුදලක්. එවැනි සංවර්ධන කටයුතු ටිකක් රත්නපුර දිස්ත්‍රික්කයේ සිදු වෙනවා. ඔබතුමා කිව්වා වාගේම හම්බන්තොට දිස්ත්‍රික්කයට, මොනරාගල දිස්ත්‍රික්කයට, බදුල්ලට ඇත්තටම මේක වටිනවා. ඔබතුමා ඉතාම සද්භාවයෙන් තමයි මේ යෝජනාව ගෙනෙන්නේ කියලා අපි දන්නවා. ඒ ගැන අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ අධිවේගී මාර්ග ගැන චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා කථා කළා. වසර ගණනක් තිස්සේ, වසර 10කට වඩා වැඩි කාලයක් නවත්වලා තිබිච්ච මීරිගම- කඩවත අධිවේගී මාර්ගයේ කටයුතු අපි ආරම්භ කළා. 2028 මැද භාගය වෙනකොට ඒ කටයුතු අවසන් කරනවා. එහි ඉතුරු කොටස වන පොතුහැර-රඹුක්කන මාර්ගයේ කටයුතුත් ආරම්භ කරනවා. ඒක 2027 මැද භාගයේ අවසන් කරනවා. ඉන් පස්සේ රඹුක්කන- ගලගෙදර මාර්ගයේ කටයුතු 2029 මැද භාගය වෙනකොට අවසන් කරනවා. දඹුල්ල-කුරුණෑගල කොටසත් ආරම්භ කිරීමට රජය විධියට අපි පියවර ගනිමින් ඉන්නවා. දක්ෂිණ අධිවේගී මාර්ගය හදලා අවසන් කරලා දැන් අවුරුදු 14ක් විතර වෙනවා. දැන් ඒකේ නඩත්තු කටයුතු කරන්න අවශ්‍යයි. ඒ නිසා එහි මුල් කොටස වන කොට්ටාව-දොඩන්ගොඩ කොටසේ පූර්ණ අලුත්වැඩියාවක් සිදු කිරීමට අපි කටයුතු කරමින් ඉන්නවා.

චාමර සම්පත් මන්ත්‍රීතුමා කිව්වා, කකුල් දෙක අල්ලලා වැඳලා තමයි බදුල්ලට සතොස ගබඩාවක් ගත්තේ කියලා. හැබැයි ගරු මන්ත්‍රීතුමනි, අපට නම් කාගේවත් කකුල් අල්ලලා වඳින්නවත්, කකුල් ලෙවකන්නවත් ඕනෑ නැහැ. ගරු ජනාධිපතිතුමා, අමාත්‍යවරු ඇතුළු අපේ රජය විසින් උතුරටද, නැඟෙනහිරටද, බටහිරටද, දකුණටද, වයඹටද කියලා නොවෙයි හැම පළාතකම, හැම දිස්ත්‍රික්කයකම එක හා සමාන ලොකු සංවර්ධනයක් කිරීමට -මාර්ගද, අධිවේගී මාර්ගද, දුම්රියද, SLTB ද- ඒ හැම පැත්තකටම අවශ්‍ය විශාල මුදලක් මේ අය වැයෙනුත් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේ දෙගුණයක්, තෙගුණයක් ලබන අය වැයෙනුත් වෙන් වෙන්න නියමිතයි. අපි ලබන මාසයේ ඒ අය වැය ඉදිරිපත් කරනවා.

ඒ මන්ත්‍රීතුමා කිව්වා, ජාතික ජන බලවේගය හදන අධිවේගී මාර්ගයක යන්න ආසයි කියලා. යන්න වෙන්නේම ජාතික ජන බලවේගයේ මාර්ගවල තමයි. මේ හැම සංවර්ධන කටයුත්තක්ම ජාතික ජන බලවේගයේ තමයි. විශේෂය තිබෙන්නේ නම් ඒවායින් ගහන්නේ නැති එකයි. ඒක තමයි වෙනස.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Jeevan Thondaman. You have three minutes.

[11.45 a.m.]

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

First of all, Hon. Deputy Speaker, I would like to mention that I support the Motion brought forward by the Hon. Hesha Withanage on the Ruwanpura Expressway.

இன்றைக்கு மலையகத்தைப் பொறுத்தவரைக்கும் பல்வேறு வீதிகள் அபிவிருத்தி செய்யப்படாத நிலையில் இருக்கின்றன. நாங்கள் ஒரு வருஷம் அரசாங்கத்தில் இருந்தபோது முக்கியமாக பொகவந்தலாவை வீதியையும், டன்சினன் - நுவரெலியா வீதியையும் புனர்நிர்மாணம் செய்தோம். இந்த இரண்டும்தான் அங்கு இருப்பதிலே பிரதான வீதிகள் என்று சொல்லலாம். அத்துடன், அந்த அரசாங்கத்தில் குறிப்பாக வீதி அபிவிருத்திக்காகப் பல்வேறு நிதி ஒதுக்கீடுகளை நாம் மேற்கொண்டிருந்தோம். இதற்கு முக்கியமான காரணம் என்னவென்றால், வீதி அபிவிருத்தி இருந்தால்தான் பொருளாதார அபிவிருத்தியை ஏற்படுத்த முடியும் என்பதாகும். அதேநேரம், இன்றைக்கு நடந்த ஒரு விஷயத்தையும் நான் இங்கு சுட்டிக்காட்ட வேண்டும். அதற்காக எனக்கு ஒதுக்கப்பட்ட நேரத்தில் சிறிதளவை எடுத்துக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, உங்களுக்குத் தெரியாத விதிமுறைகள் கிடையாது. ஆனாலும், இன்றைக்கு இந்தப் புகாரை நான் முன்வைத்துத்தான் ஆக வேண்டும். அதாவது, கௌரவ சபாநாயகர் அவர்கள் தலைமை வகித்துக்கொண்டிருக்கும்போது கௌரவ அமைச்சர் அவர்கள் கேள்விக்குப் பதில் சொல்லிக் கொண்டிருந்தார். ஓர் அமைச்சர் பதில் சொல்லும்போது அவர் ஒரு தவறான கருத்தை அல்லது பொய்யான ஒரு கருத்தைக் கூறினால் அதைத் திருத்துவதற்குரிய முழு உரிமையும் எனக்கு இருக்கின்றது. இதில் எந்தவிதமான அரசியலும் கிடையாது. அந்த வகையில் நான் அதனைத் திருத்தும் பணியில் ஈடுபட்டபோது,

என்னுடைய ஒலிவாங்கி நிறுத்தப்பட்டது. அதற்குப் பதில் சொல்ல முடியாதவாறு தடுக்கப்பட்டது. அது தவறான ஒரு நடவடிக்கை. அமைச்சர் அவர்கள் 2,000 பேருக்கு வீடுகள் வழங்குவதாகச் சொன்னார். அப்போது நான் சொன்னேன், "அது பொய்! வீடுகள் வழங்கவில்லை. ஒரு certificateஐத்தான் வழங்குகிறீர்கள். அந்த certificateக்கு எந்த சட்டப் பலமும் கிடையாது" என்று. அப்போது அமைச்சர் அவர்கள், "வீட்டை உடனே கொடுக்க முடியுமா?" என்று கேட்டார். உடனே கொடுக்க முடியாது, நான் ஏற்றுக் கொள்கிறேன். ஆனால், நான் அமைச்சராக இருந்த ஒரு வருஷ காலப்பகுதியில் 1,300 வீடுகளுக்கு மேல் கட்டி முடித்து ஒப்படைத்திருக்கின்றோம். வீதிகளையும் அமைத்து ஒப்படைத்திருக்கின்றோம். இன்றைக்கு ஓர் எதிர்க்கட்சி உறுப்பினராக நான் கேட்ட கேள்வி, "நீங்கள் எத்தனை வீடுகள் கட்டியிருக்கிறீர்கள்?" என்பதுதான். நேற்றும் நான் கேட்டேன், பதில் இல்லை! இன்றைக்கும் நான் கேட்டேன், பதில் இல்லை! நாங்கள் கேள்வி கேட்டால், "நீங்கள் ஏன் பதறுகிறீர்கள்?" என்று எங்களிடம் கேட்கிறார்கள். நான் பதறாமல் நிதானமாகத்தான் கேட்டேன். இதற்குமேல் நான் புத்தர் மாதிரி உட்கார்ந்தா கேட்க முடியும்?

அதுபோல், நான் இன்னுமொரு நியாயமான விஷயத்தை இந்தச் சந்தர்ப்பத்தில் சொல்ல விரும்புகின்றேன். இதை நான் எவரையும் அவமதிப்பதற்காகச் சொல்லவில்லை. கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எனக்கு உங்கள் மீதும், உங்கள் ஆளும் கட்சி மீதும் எனக்கு நிறைய மதிப்பிருக்கின்றது. காரணம் என்னவென்றால் நீங்கள் ஒழுக்கத்தைக் கட்டிக்காக்கிறீர்கள். ஆனால், மனிதன் குரங்கிலிருந்துதான் வந்தான் என்பதற்கு ஆதாரமாக நீங்கள் உறுப்பினர் ஒருவரை வைத்திருக்கின்றீர்கள். அவர் இங்கிருந்து அங்கு தாவுகின்றார் கைகுலுக்குவதற்கு. அது சபை நாகரிகம் கிடையாது; சபை விதிமுறைகளில் அது கிடையாது. ஆகவே, தயவுசெய்து அந்த மாதிரியான செயல்களைச் செய்யவிடாது திருத்திக் கொள்ளுங்கள்!

இறுதியாக, நான் ஒரு விஷயத்தை மீண்டும் கேட்கிறேன். நேற்று முன்தினமும் நேற்றைய தினமும் கேட்டதையே நான் மறுபடியும் கேட்கிறேன், உங்களால் எத்தனை வீடுகள் கட்டப்பட்டிருக்கின்றன? இது ஒரு கேள்வி. அடுத்து, நீங்கள் வழங்குவது காணி உறுதிப்பத்திரம். அவ்வாறு 237 காணி உறுதிப்பத்திரங்கள் வழங்கப்படவிருக்கிறது; அதுவும் நான் தயாரித்தது. நீங்கள் எத்தனை பத்திரங்களைத் தயாரித்து மக்களுக்கு வழங்கப் போகின்றீர்கள்? இது இரண்டாவது கேள்வி. மூன்றாவதாக, எதற்காக 2,000 certificatesஐக் கொடுத்துவிட்டு வீடு வழங்குகிறோம் என்று பொய் சொல்ல வேண்டும்?

கடைசிக் கேள்வி, தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தை அதிகரித்துக் கொடுப்பீர்களா, மாட்டீர்களா? கேட்டால் கொடுப்பதாகச் சொல்கிறீர்கள், ஆனால், நீங்கள் ஆட்சிக்கு வந்து ஒரு வருஷமாகிவிட்டது. இன்னமும் அது கிடைக்கவில்லை. அது மட்டுமல்லாமல் 1,700 ரூபாய் சம்பளம் வழங்குவதாகச் சொல்லுகிறீர்கள். 1,700 ரூபாய் நியாயமான சம்பளம் என்று சொல்லுகிறீர்கள். சரி, ஜீவன் தொண்டமான் 1,700 ரூபாயை சம்பள நிர்ணய சபையூடாகக் கொடுக்க முயற்சித்தபோது, "இல்லை, அது வேண்டாம். எங்களுக்கு 2,138 ரூபாய்தான் வேண்டும்" என்று எதிர்த்து நின்ற உறுப்பினர்கள் எங்கே? இந்த ஆதங்கங்கள் எனக்கும் இருக்கின்றது. கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, அதனால்தான் இவற்றை எல்லாம் நான் இங்கு முன்வைக்கின்றேன். இந்தச் சந்தர்ப்பத்தை எனக்கு வழங்கியமைக்காக ஹேஷா விதானகே அவர்களுக்கும் நன்றி தெரிவித்துக் கொள்கின்றேன்.

கடைசியாக, ஒரேயொரு விடயம்! NPP Members எல்லோரிடமும்தான் நான் இதனைக் கேட்கின்றேன். நேற்றைய தினம் அமைச்சர் சமந்த வித்யாரத்ன அவர்களுடைய உரையில் ஒரு விடயத்தைச் சொல்லியிருந்தார். அது எனக்குப் புரியவில்லை. அதாவது, SJB இதைப் பண்ணி இருக்கின்றார்கள், TPA இதைப் பண்ணி இருக்கின்றார்கள், CWC இதைப் பண்ணி இருக்கின்றார்கள் என்று ஒவ்வொரு கட்சியையும் குறிப்பிட்டுத் திட்டினார். இவ்வாறு எதிர்க்கட்சியில் இருக்கின்ற ஒவ்வொரு கட்சியையும் நீங்கள் இப்போது திட்டுகிறீர்கள். அப்புறம் எதற்காக உள்ளூராட்சி மன்றத் தேர்தலின் பின்னர் எல்லோருடனும் கூட்டணி வைத்தீர்கள்? ஏன், நாங்கள் கெட்டவர்கள், நீங்கள் நல்லவர்களா? இதற்கு யாருமே பதில் சொல்கிறீர்களில்லை. ஏனென்றால், முன்புற வழியால் CWC உடன் கூட்டணி; பின்புற வழியால் TPA உடன் கூட்டணி; இன்னொரு வழியால் පොහොට්ටුව உடன் கூட்டணி; இன்னுமொரு வழியால் SJB உடன் கூட்டணி. கொஞ்சமாவது முதுகெலும்பு இருக்க வேண்டுமா, இல்லையா? இதனைத்தான் நான் கேட்க வேண்டுமென்று நினைத்தேன், கௌரவ பிரதித் தவிசாளர் அவர்களே! நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. J.C. Alawathuwala. You have three minutes.

[පූ.භා. 11.50]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදි කිරීම් සම්බන්ධයෙන් ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ගෙන ආවේ ඉතා වැදගත් යෝජනාවක්. මොකද, අධිවේගී මාර්ග අපට ඉතා වැදගත් වනවා, විශේෂයෙන් අපේ කාලය ඉතිරි කර ගන්න. රුවන්පුර අධිවේගී මාර්ගය කිහිප වතාවක්ම මුල්ගල් තියලා, වැඩ ආරම්භ කරපු මාර්ගයක්. නමුත් නොයෙකුත් හේතු මත, විශේෂයෙන්ම පසුගිය කාලයේ මේ රටේ ඇති වුණු ආර්ථික අවපාතය, එහෙම නැත්නම් රට බංකොලොත් වීම ආදිය නිසා එම මාර්ගයේ වැඩ නැවතිලා තිබුණා. වර්තමාන රජය එම මාර්ගයේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කර තිබෙනවා.

එය ඉතා වැදගත් මාර්ගයක් බව අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අපේ රට මැදට, රත්නපුර දිස්ත්‍රික්කය හරහා ඉදි වන එම මාර්ගය විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරයට වාගේම, තවත් කාරණා ගණනාවකට වැදගත් මාර්ගයක්. අපේ රටේ දකුණු අධිවේගී මාර්ගය තිබෙනවා. ඒ වාගේම මධ්‍යම අධිවේගී මාර්ගයේ මීරිගම - කුරුණෑගල කොටසෙහි වැඩ අවසන් වුණා, දේශීය කොන්ත්‍රාත්කරුවන් මාර්ගයෙන්. එහි කඩවත - මීරිගම කොටසේ වැඩ පසුගිය දිනක නැවත ආරම්භ කළා. එහි ඉදිකිරීම් ද දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රමාද වෙමින් තිබුණා. ඒකට එක හේතුවක් තමයි, මේ රට බංකොලොත් වීම. ඊටත් වඩා බලපෑවා එයට විරෝධතා ගණනාවක් ආපු එක. පඩුකරඳ ගහක් මුල් කරගෙන පරිසර ප්‍රශ්නයක් ආපු නිසා එහි ඉදිකිරීම් කටයුතු දිගින් දිගටම ප්‍රමාද වුණා. එම ප්‍රමාද වීම නිසා ඇස්තමේන්තු කළ වියදම වාගේ දෙතුන් ගුණයක් -බිලියන ගණනාවක්- වැඩියෙන් ගෙවන්න අද අපට සිදු වෙලා තිබෙනවා. ඒක තමයි තත්ත්වය. හැම දෙයක්ම දවසින් දවස ප්‍රමාද වෙනවා කියන්නේ, ඒවාට වැය වන මුදල දෙතුන් ගුණයකින් වැඩි වෙනවා කියන එකයි.

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

ගරු ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, විශේෂයෙන් මධ්‍යම අධිවේගී මාර්ගය කියන්නේ ඉතා වැදගත් මාර්ගයක්. එහි ඊළඟ අදියර කුරුණෑගල සිට දඹුල්ල දක්වා දිවෙනවා. ඒක ඉතාම වැදගත්. මොකද, එතැනින් එහාට පොළොන්නරුව, අනුරාධපුරය, ත්‍රිකුණාමලය සහ උතුර දක්වා යන්න තිබෙන මාර්ගයේ ඉතාම අමාරු කොටස තමයි, කුරුණෑගල - දඹුල්ල දක්වා වන කොටස. ඒ කටයුතු ඔක්කෝම ප්‍රමාදයකින් තොරව සිදු කිරීම වැදගත්. මා හිතන්නේ මේ වනකොට ඒ හැම මාර්ගයක් සඳහාම අවශ්‍ය ඉඩම් අත්පත් කරගෙනයි තිබෙන්නේ; සැහෙන වැඩ කොටසක් කරලායි තිබෙන්නේ. කොහොම හරි මුදල් හොයාගෙන ඉතා ඉක්මනින් එහි ඉදිකිරීම් ආරම්භ කරනවා නම් බෙහෙවින් වැදගත් වනවා. යම් යම් හේතු මත ඒවා ප්‍රමාද වුණා. මධ්‍යම අධිවේගී මාර්ගයේ ගලගෙදර දක්වා කොටසේ වැඩ මේ වනකොට ආරම්භ කර තිබෙනවා. යම් වැඩ කොටසක් අවසන් වෙලා යනවා. ඉතිරි කොටස මා නියෝජනය කරන මාවතගම ආසනය හරහායි හැදෙන්නේ. ඒ සඳහා අත්පත් කර ගත් ඉඩම්වලට මුදල් ගෙවලා මේ වනකොට අවුරුදු පහකට වැඩියි. ඒ නිසා ඉතිරි කොටසත් කඩිනමින් ඉදි කළොත් අපටත්, ඒ ප්‍රදේශයේ ජනතාව ඇතුළු හැමෝටමත් පැය දෙකක් වාගේ කෙටි කාලයකින් මහනුවරට යන්න පුළුවන්. මේ වනකොට ඇත්තටම පැය 4ක විතර කාලයක් ගත වනවා.

ඒ වාගේම තමයි රත්නපුරයට යන්න ගියත්. රුවන්පුර මාර්ගයේ තිබෙන වැදගත්කම බැලුවොත්, රත්නපුරට යන්න තිබෙන කිලෝ මීටර් ගණන අඩු වුණාට මේ තිබෙන තදබදයත් එක්ක ඒ සඳහා විශාල කාල වේලාවක් ගත වනවා. එම කාලයෙන් භාගයකට වඩා අඩු කර ගන්න පුළුවන් රුවන්පුර අදිවේගී මාර්ගය ඉදි කළොත්. ඒ නිසා ඉතා වැදගත් මාර්ගයක් තමයි රුවන්පුර අධිවේගී මාර්ගය. අපේ ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ඒ කාරණය මෙවැනි යෝජනාවක් හැටියට ගෙනාපු එක වැදගත් කියලා මතක් කරමින්, එම මාර්ගය ඉදිකිරීමේ කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගන්න කියලා මම රජයෙන් ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Dr.) Prasanna Gunasena. You have 10 minutes for your reply.

[පූ.භා. 11.53]

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (වැඩබලන ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்திப் பதில் அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Acting Minister of Transport, Highways and Urban Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ "රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම" කියන යෝජනාව ගැන කිව්වොත්, ඇත්තටම එම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් ඛණ්ඩනය වෙලායි තිබුණේ. ඒක අඛණ්ඩව පවත්වාගෙන යා යුතුව තිබුණු ව්‍යාපෘතියක්. එම යෝජනාවට අදාළව පිළිතුරු කථාව කිරීමට තමයි මට අවස්ථාව ලැබුණේ. යෝජනාව ස්ථිර කළා, ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. හැබැයි, එතුමා වරද්දා ගත්තා "මධ්‍යම අධිවේගී මාර්ගය" කියලා. මෙහිදී අනෙක් මන්ත්‍රීවරුන් මධ්‍යම අධිවේගී මාර්ගය, ඉඩම් අත්පත් කර ගැනීම් ආදිය ගැන කථා කළාට ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාට සාධාරණයක් වෙන්න නම් රුවන්පුර අධිවේගී මාර්ගය ගැන තමයි කථා කළ යුත්තේ. එම නිසා මම වැඩි බරක් දරා, වැඩි වෙලාවක් අරගෙන ඒ ගැන කථා කරන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ කාරණයට අදාළ ලිඛිත කොටස කියවලා පැහැදිලි කිරීම කරන්නම්. එහි පසුබිම ගත්තොත්, අපි බලයට එන්න කලින් රුවන්පුර අධිවේගී මාර්ගයේ පැවැති තත්ත්වය මේකයි. එම මාර්ගය ආරම්භ කළේ කහතුඩුව සිට රත්නපුර, පැල්මඩුල්ල දක්වා ක්‍රියාත්මක කිරීමටයි. මූලිකව සැලසුම් කරලා තිබුණේ එහෙමයි. එහි පළමු අදියර තමයි කහතුඩුව-ඉංගිරිය කොටස. ඒක කිලෝමීටර් 26.3ක් දුරයි. එහි කොටසක් ඉදිකරන්න 2021 මැයි මාසයේ ආරම්භ කළා. ඒකේ කොන්ත්‍රාත් කාලසීමාව තිබුණේ ඇත්තටම අවුරුදු දෙකහමාරකින් අවසන් කරන්න. ඒක කරන්න පටන් ගත්තේ දේශීය බැංකු ආධාර යටතේ. නමුත් ආර්ථික අර්බුදය නිසා 2022 මැයි මාසයේ ඒක තාවකාලිකව නැවැත්තුවා. ඊට පසු ඔක්තෝබර් මාසය වෙනකොට සම්පූර්ණයෙන්ම නවත්වලා දැම්මා. ඒ තත්ත්වය තමයි අපි බලයට එන්න කලින් තිබුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බලාපොරොත්තු වෙනවා, රත්නපුර අධිවේගී මාර්ගයේ කහතුඩුව - ඉංගිරිය කොටස ඉදිකරන්න. ඒකට තමයි ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු වෙන්නේ. මේ ඉදිකිරීම් කටයුතු නැවත ක්‍රියාත්මක කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය තමයි කටයුතු කරන්නේ. ඒක අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනයක්. අපි ඒ පිළිබඳ සාකච්ඡා පටන් ගත්තා. ජාතික සංවර්ධන වැඩපිළිවෙළට යනකොට අපට තිබෙන සැලැස්ම අනුව ලොකු ව්‍යාපෘති සඳහා තමයි විදේශ ණය ආධාර ගන්න පුළුවන් වෙන්නේ. එහෙම නැතිව පොඩි ග්‍රාමීය පාරවල් හදන්න, පොඩි පොඩි දේවල් හදන්න අපට විදේශ ණය ගන්න අමාරුයි. අපට විදේශීය ආධාර ඇතිව ලොකු projects කරන්න පුළුවන් නම්, ලංකාවේ මුදල්වලින් පොඩි projects ටික කරන්න හැකියාව තිබෙනවා. ඒක තමයි රජයේ සැලැස්ම. ඒ සැලැස්මට අනුව අපි බලාපොරොත්තු වෙනවා - ඒ වාගේම, මේ දවස්වල සාකච්ඡා කරගෙන යනවා - දේශීය ආධාර යටතේ මේ කොටස ඉදිකරන්න පුළුවන්ද කියලා. අපට ආයෝජකයෙක් සොයා ගන්න බැරි වුණොත්, අපි අනිවාර්යයෙන්ම ලංකාවේ මුදල් පාවිච්චි කරලා හෝ මේ කොටස ඉදිකරනවා. ඉතිරි කොටස වන, ඉංගිරිය සිට රත්නපුර දක්වා මාර්ග කොටසේ වංගු අධික ප්‍රමාණයක් තිබෙනවා, වැඩ කරන්න ගත වෙන කාලය වැඩියි. ඒ නිසා අපි අනිවාර්යයෙන් බලාපොරොත්තු වෙනවා, මේක straight line කරලා මංතීරු දෙකකින් රත්නපුර දක්වා දීර්ඝ කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට කිසිම අවස්ථාවක රත්නපුර අධිවේගී මාර්ගය සහ KV line එක - දුම්රිය මාර්ගය - වෙන් කරන්න බැහැ. දුම්රිය මාර්ගය, අධිවේගී මාර්ගය කියන දෙක ඒකාබද්ධ වැඩ පිළිවෙළක් හැටියට කරන්න තමයි අපි සැලසුම් කරලා තිබෙන්නේ. අවිස්සාවේල්ල සිට කොස්ගම දක්වා rail gates හතරක් තිබෙනවා. ඒ ගේට්ටු වහනකොට පාරේ තදබදයක් ඇති වෙනවා. ඒ වාගේම වංගු සහිත මාර්ගයක් තිබෙන නිසා බලාපොරොත්තු වෙන වේගයෙන් දුම්රිය ධාවනය කරන්නත් බැහැ. ඒ නිසා අපේ ප්‍රධාන අවධානය යොමු වෙලා තිබෙනවා, මේ rail gates ටික මඟ හැරලා දුම්රිය මාර්ගය වාගේම ඒ අධිවේගී මාර්ග කොටස realign කරන්න. එතකොට කොස්ගම දක්වා parallel තමයි යන්නේ; තාර පාරට සමාන්තරව තමයි දුම්රිය මාර්ගය යන්නේ. කොස්ගම ඉඳලා එහාට දුම්රිය මාර්ගය මහමාර්ගයෙන් deviate වෙලා යන්නේ. ඇත්තටම මේකේ වැඩ ගොඩක් තිබෙනවා. අපට resettlement එකකට යන්න වෙනවා, දුම්රිය මාර්ගය වෙනස් කරනකොට. අපි බලපු විධියට දළ

වශයෙන් සම්පූර්ණයෙන් ගෙවල් 10ක්, 15ක් වාගේ ප්‍රමාණයක් අයින් කරන්න වෙනවා. එතකොට resettlement එකකට යන්න වෙනවා. තව ඒවායේ කොටස් වශයෙන් අයින් වෙනවා. ඒවාට වන්දි ගෙවන්න තිබෙනවා. ඒ කටයුතු තමයි මේ දවස්වල අපි සැලසුම් කරගෙන යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දුම්රිය දෙපාර්තමේන්තුව හරහාම අපි KV line එක කරන්න ගියොත් ගත වෙන කාලය වැඩියි. අපි මේ ගැන සාකච්ඡා වට කිහිපයක් පැවැත්වූවා. ඉඩම් අත්පත් කර ගන්න සහ දුම්රිය line එක එළන තත්ත්වයට එනකම් surface එක හදාගන්න, ඒ කියන්නේ දුම්රිය මාර්ගය එළන තත්ත්වයට එනකම් පස් පුරවලා structure එක හදාගන්න වැඩ ටික RDA එක හරහා කරගන්න සාකච්ඡා කළා. ඒකට RDA එකඟ වුණා. එතකොට ඒකාබද්ධ විධියට තමයි වැඩේ යන්නේ. ඒ නිසා Cabinet Paper එකක් දමන්න බලාපොරොත්තු වෙනවා, මාර්ග සංවර්ධන අධිකාරිය සහ දුම්රිය දෙපාර්තමේන්තුව ඒකාබද්ධව මේ KV line එක එළන වැඩේ කරන්න.

ඒත් එක්කම මේ කාරණය කියන්න සන්තෝෂයි. එතැනින් එහා කොටසට, ඒ කියන්නේ අවිස්සාවේල්ලේ ඉඳලා රත්නපුර දක්වා කොටසේ feasibility study එක සඳහා Cabinet Approved High Level Procurement Committee එකක් අනුමත කරගන්න Cabinet Paper එකක් ඊයේ ගරු ඇමතිතුමා විසින් අත්සන් කළා. එතකොට ඒකත් ඉදිරියට යනවා. මේ ආකාරයට තමයි KV line එකයි, අධිවේගී මාර්ගයයි සැලසුම් වෙන්නේ.

රත්නපුර සිට පාදුක්ක දක්වා දුම්රිය මාර්ගය single line එකක් විධියට තමයි ඉදිවෙන්නේ. පාදුක්ක සිට මරදාන දක්වා තමයි double lines එන්නේ. මාකුඹුර සිට මරදාන දක්වා සැලසුම් වෙන්නේ පොළොව මට්ටමින් නොවෙයි, ground level එකට උඩින් තමයි ඒ කොටස ඉදි කරන්න වෙන්නේ. ඒ විධියට තමයි මේ රත්නපුර අධිවේගී මාර්ගයට සමාන්තරව දුම්රිය මාර්ගය ඉදිකිරීම වෙන්නේ. අපි බලාපොරොත්තු වෙනවා, රත්නපුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම්වලට වඩා ඉක්මනින් KV line එකේ ඉදිකිරීම් අවසන් කරන්න පුළුවන් වෙයි කියලා. අපේ රජයේ බලාපොරොත්තුවක් තිබෙනවා, KV line එක 2029-30 වෙනකොට අවසන් කිරීමට හැකි වෙයි කියලා. ඒ කියන්නේ එළීමේ වැඩ පටන් ගෙන සැහෙන දුරකට යෑමේ බලාපොරොත්තුවක් අපට තිබෙනවා, 2030 වාගේ වෙනකොට. මේක තමයි මේ වටා ගෙතෙන කථාව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මධ්‍යම අධිවේගී මාර්ගය පිළිබඳවත් අවධානය යොමු කළා. අපි මධ්‍යම අධිවේගී මාර්ගයේත් ඉදිකිරීම් පටන් ගත්තා. සැප්තැම්බර් මාසයේ 17දා සිට කඩවත-මීරිගම කිලෝමීටර් 37ක දිගකින් යුත් කොටස සහ පළවෙනි connectivity එකේ Outer Circular Highway එකට සම්බන්ධ වන මීටර් 500 කොටසේ ඉදිකිරීම් ආරම්භ කළා. 2028 වර්ෂය අවසන් වෙන්න කලින් මේ ඉදිකිරීම් අවසන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එතකොට Outer Circular Highway එකේ ඉඳලා සම්පූර්ණ connectivity එක එනවා, කඩවත සිට කුරුණෑගල දක්වා. පොතුහැර - රඹුක්කන කොටස සහ රඹුක්කන - ගලගෙදර කොටස අදියර දෙකකින් ඉදිවෙන්නේ. පොතුහැර - රඹුක්කන කොටසේ සැහෙන ප්‍රමාණයක් ඉදිකර ටෙන්ඩර් award කර තිබෙනවා, surfacingවලට. ඒ කියන්නේ කාපට් එළීම සඳහා. ඒක ටෙන්ඩර් තුනකට යන්නේ. ඒ වුණාට මම හිතන හැටියට එකම ආයතනය තමයි ටෙන්ඩර් ලබා ගත්තේ. ඒ කටයුතු අවසන් කළාම 2027 අවසන් වෙනකොට රඹුක්කන දක්වා මාර්ගය සම්පූර්ණ වෙනවා. රඹුක්කන - ගලගෙදර කොටස ඉදිකිරීමේ කටයුතු සඳහා විදේශ ආයෝජකයෙක් හොයා ගන්න -රත්නපුර මාර්ගයට වාගේ- අපි බලාපොරොත්තු වෙනවා. බැරිවුණොත්, ලංකාවේ මුදලින් හරි ඒ ඉදිකිරීම් පටන් ගන්නවා.

තව මන්ත්‍රීවරයෙක් අපට ප්‍රශ්නයක් මතු කළා, කුරුණෑගල - දඹුල්ල දක්වා වන කිලෝමීටර් 66ක වාගේ දිගකින් යුතු කොටස ගැන. ඒ කොටසේත් ඉදිකිරීම් කටයුතු පටන් ගන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි ඒ කටයුතු නවත්වලා නැහැ. ඒ සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට තිබෙනවා. ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතුවල තමයි මේ දවස්වල නිරත වෙන්නේ.

මේ ආකාරයෙන් තමයි අධිවේගී මාර්ග සහ දුම්රිය මාර්ගවල සැලසුම තිබෙන්නේ. මේ වැඩ පිළිවෙළත් එක්ක තමයි අපි බලාපොරොත්තු වෙන්නේ ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවන්න. අපි දන්නවා, රත්නපුර ඉඳලා එන්න ගියාම ගත වෙන කාලය; නුවර ඉඳන් එන්න ගියාම ගත වෙන කාලය. අපි විශ්වාස කරනවා, මේ අධිවේගී මාර්ග හරහා ගම්වල තිබෙන නිෂ්පාදන ආර්ථිකය කොළඹට ළඟා කර ගැනීමේදී කාලය අඩු කරගන්න පුළුවන් වෙයි කියලා. මේ ආකාරයට තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සැලසුම් සකස් වෙන්නේ.

ෂාණක්කියන් මන්ත්‍රීතුමා කිහිපවරක්ම කිව්වා, උතුරට සංවර්ධනය ගලා එන්නේ නැහැ කියලා. මම අවස්ථා කිහිපයක් කියන්නම්. අපි සංවර්ධන කටයුතු වැඩි ප්‍රමාණයක් ගේන්නේ, උතුරට. අපි සංවර්ධනය පටන් ගත්තේත්, උතුරෙන්. මාර්ග සංවර්ධන අධිකාරිය පැත්තෙන් විතරක් ගත්තොත්, මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ මුලතිව් මාර්ගයේ නන්දිකඩාල් කලපුව ආශ්‍රිතව පිහිටා ඇති වට්ටුවාකල් පාලම රුපියල් බිලියන 1.4 ක මූල්‍ය ආධාර යටතේ මංතීරු දෙකකින් යුතුව සංවර්ධනය කිරීමේ කටයුතු අපි පටන් ගත්තා. ඒ කටයුත්ත තමයි මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ඉස්සෙල්ලාම අපි පටන් ගත්තේ. ඇත්තටම, ඒක ලොකු project එකක්. යුද්ධය හේතුවෙන් අධිආරක්ෂිත කලාපයක් ලෙස නම් කර තිබූ පලාලි සිට පේදුරුතුඩුව මංසන්ධිය දක්වා වූ මාර්ගය වසර 34ක් තිස්සේ වහලා තිබුණා. ඒ පාර අපි විවෘත කළා. මේ වෙනකොට එහි කිලෝමීටර් 4ක දුර ප්‍රමාණයක් අපි විවෘත කර තිබෙනවා. ඒ පහසුව උතුරේ ජනතාවට ලැබී තිබෙනවා. ඒ වාගේම යුදමය තත්ත්වය හේතුවෙන් දීර්ඝ කාලයක් වසා තිබූ යාපනය - පලාලි මාර්ගය විවෘත කරලා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ මාර්ග අංක 749 යටතේ බස් රථ ධාවනය පටන් ගත්තා. ඒ වාගේම යාපනයේ දුම්රිය මාර්ගයේ මහව සිට ඕමන්ත දක්වා වූ දුම්රිය මාර්ග සංඥා පද්ධති නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කළා. එතැන වනඅලින් සම්බන්ධ ගැටලුවක් තිබෙනවා. ඒ නිසා අලි සංචරණය සඳහා උමං මාර්ගයක් ඉදිකිරීමට කටයුතු කර ඇති අතර, දැනට එහි සියයට 85ක පමණ වැඩ අවසන් කරලා තිබෙනවා. ඒ වාගේම යාපනය දුම්රිය මාර්ගයේ වසර 100ක් පැරණි දුම්රිය පාලම් 5ක් වෙනුවට නව දුම්රිය පාලම් 5ක් සවි කිරීමට අලුතින් වැඩ කටයුතු පටන් ගෙන තිබෙනවා. මේ ආකාරයෙන් අපි උතුරේ සංවර්ධනයත් පටන් ගත්තා. අපි උතුරට තමයි වැඩි බරක් දැම්මේ, ඒ ප්‍රදේශය සංවර්ධනයෙන් ඈත් වෙලා තිබුණු නිසා. මේ ආකාරයට තමයි අපේ වැඩ පිළිවෙළ අරගෙන යන්නේ.

අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ, රත්නපුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුත්තත් අපි ආරම්භ කරනවා කියලායි. ඊට ඉක්මනින් රත්නපුර දුම්රිය මාර්ගයේ ඉදිකිරීම් කටයුතුත් විධිමත් ආකාරයෙන් කරන්න බලාපොරොත්තු වෙනවා.

ෂාණක්කියන් මන්ත්‍රීතුමා මේ කාරණයත් කිහිපවරක්ම මතක් කළා. අපේ අමාත්‍යාංශය ප්‍රවාහන, මහා මාර්ග, වරාය සහ ගුවන් සේවා විධියට තිබ්බේ. වරාය සහ ගුවන් සේවා වෙනුවට නාගරික සංවර්ධන අමාත්‍යාංශය අපට ඒකාබද්ධ කළා. අපට චෝදනා එල්ල කළා, වරාය නිසා බිමල් රත්නායක ඇමතිතුමා අයින් කළා කියලා. ඒ මන්ත්‍රීතුමාට කියන්න තිබෙන්නේ මෙන්න මේකයි. අපි හැමෝටම හීන තිබෙනවා. කුඩා කාලයේ ළමයෙකුට හීනයක්

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

තිබෙනවා, විශ්වවිද්‍යාලයට ගිහිල්ලා වෛද්‍යවරයෙක් වෙන්න, ඉංජිනේරුවෙක් වෙන්න. වැඩි දෙනෙකුගේ හීනය ඒකයි. ඒ හීනයට අනුව "A" 4ක් අරගෙන, මොරටු කැම්පස් එකට ගිහිල්ලා, Engineering Faculty එකට select වෙලා, අවුරුද්දකින් ඒක අතහැරලා සමාජ පරිවර්තනයක් වෙනුවෙන් කැපවෙච්ච මනුස්සයෙක් කන්ටේනරයකට යට කරන්න පුළුවන් කියලා හිතනවා නම්, අපි ගැන තේරුම් අරගෙන නැහැ කියන එක තමයි කියන්න තිබෙන්නේ. ඒ වාගේ පිරිසක් තමයි මේ ඉන්නේ. ඒ නිසා ඒ වාගේ කථා කියලා අප අධෛර්යවත් කරන්න පුළුවන්කමක් නැහැ.

මේ ක්ෂේත්‍ර ඒකාබද්ධ කිරීමට ප්‍රධාන හේතුව මේකයි. "ප්‍රවාහන, මහා මාර්ග, වරාය, ගුවන්" කිව්වාට, ඇත්තටම ප්‍රවාහන, මහා මාර්ගවලට වඩා ළඟින් යන්නේ නාගරික සංවර්ධනය. අපේ බලාපොරොත්තුවක් තිබෙනවා, අපේ අමාත්‍යාංශය හරහා multimodal centres විශාල ප්‍රමාණයක් හදන්න. ලබන අවුරුද්දේ 9ක් පටන් ගන්නවා. ඒ හරහා තමයි, ප්‍රවාහන ක්ෂේත්‍රය ඉහළට ගන්න පුළුවන් වෙන්නේ. ඒ විධියට ඉහළට ඔසවන්න නම් ඇත්තටම අපට ඒකාබද්ධ විය යුතු කොටස තමයි නාගරික සංවර්ධන අමාත්‍යාංශය. ඒ නිසායි මේ ඒකාබද්ධ කිරීම කරන්නේ. ඇත්තටම, නාගරික සංවර්ධන අමාත්‍යාංශය විතරක් නොවෙයි, අපට නගර සභාත් ගන්න පුළුවන් නම් වඩාත් ලේසියි මේ අමාත්‍යාංශය කරගෙන යන්න. හැබැයි, ඒක අපට ගන්න බැහැ. ඒ කාරණයත් කියමින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හේෂා විතානගේ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අපි අගය කරනවා. මොකද, ඇත්තටම ඒක අපි වෙනුවෙන් කරන වැඩක්.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Hesha Withanage, you have five minutes to reply.

[අ.භා. 12.04]

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුවන්පුර අධිවේගී මාර්ගය කඩිනමින් ඉදි කරන්න, වැඩ පටන් ගන්න කියන යෝජනාව තමයි මම කළේ. ඒ යෝජනාව ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා ස්ථිර කළා. ඒ යෝජනාව සම්බන්ධයෙන් ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා, ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා, ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මන්ත්‍රීතුමා, ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මන්ත්‍රීතුමා සහ ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා කථා කළා. ඒ වාගේම ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඒකට පිළිතුරු ලබා දුන්නා.

ඒ කථා කරපු කවුරුත් දන්නවා, මේ යෝජනාව පෞද්ගලික අවශ්‍යතාවක් වෙනුවෙන් කරපු යෝජනාවක් නොවෙයි, පොදුවේ කරපු යෝජනාවක් බව. විශේෂයෙන්ම ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මන්ත්‍රීතුමන්ලා-අපි රත්නපුර දිස්ත්‍රික්කයේ මිනිස්සුන්ට තිබෙන මේ ප්‍රශ්නය හොඳට අවබෝධ කරගෙන තිබෙන නිසා තමයි මේ කටයුතු කඩිනම් කරන්න කියලා අද මේ යෝජනාව ඉදිරිපත් කළේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ උත්තරය තුළින් සහ අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමා වන ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මන්ත්‍රීතුමා කියපු ඉලක්කම් එක්ක, මේ මාර්ග ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක වෙනවා කියන එක පැහැදිලි වෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, හැබැයි එක තැනක පොඩි අපැහැදිලි බවක් තිබෙනවා. මොකද, මේ මාර්ගය පෙර සැලසුම් කරලා තිබුණු ආකාරයෙන් සිද්ධ වෙනවා කියන කාරණාව ඔබතුමා කියන්නේ නැහැ. පිළිගන්නේ නැති වෙන්න පුළුවන්. නමුත් යම් ගැටලුසහගත තත්ත්ව තිබෙනවා කියලා මාත් පිළිගන්නවා. මොකද, ඉංගිරිය දක්වා වන ව්‍යාපෘතිය ගැන ඔබතුමා නිශ්චිතව කිව්වත්, එතැනින් එහාට රත්නපුරයට යන්නේ කොහොමද, රත්නපුරයෙන් පැල්මඩුල්ලට ගිහිල්ලා ඉදිරියට යන්නේ කොහොමද කියන කාරණාව ගැන මේ වෙනකොට ඔබතුමන්ලා තීන්දු-තීරණ අරගෙන නැතුව ඇති කියලා මා විශ්වාස කරනවා. එකවරම කිලෝමීටර 100ක්, 150ක් හදන්න පුළුවන් රටක නොවෙයි අපි ඉන්නේ කියන එකත් අපි දන්නවා. රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව බලාපොරොත්තුවෙන් සිටින, බදුල්ල, මොනරාගල දිස්ත්‍රික්කවල ජනතාව බලාපොරොත්තුවෙන් සිටින බලාපොරොත්තුවට සාධාරණයක් කරන්න, මේ මාර්ගයේ වැඩ ආරම්භ කරන්න පුළුවන් නම්, ඒක ලොකු සතුටක් කියලා මම කියනවා. අපට අද ඒ කොළ එළිය පත්තු වුණා. මොකද, ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඒ ගැන ප්‍රකාශයක් කළා, අපේ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමාත් ඒ ගැන ප්‍රකාශයක් කළා. මේ ව්‍යාපෘතියේ වටිනාකම තේරුම් අරගෙන, මේ ව්‍යාපෘතියට මුදල් වෙන් කිරීම වෙනුවෙන් මේ ආණ්ඩුවට අපේ ගෞරවය පුද කරනවා.

ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මන්ත්‍රීතුමා අසත්‍ය කාරණයක් කිව්වා, මැණික්වලින් මහා විශාල අපනයන ආදායමක් එන්නේ නැහැ කියලා. ඒ නිසා එතුමාට දීලා තිබෙන ඒ සංඛ්‍යාලේඛන පිළිබඳව පොඩ්ඩක් සොයා බලන්න කියලා කියනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ මැණික්වලින් අපේ රටට කොපමණ මුදල් ප්‍රමාණයක් එනවාද කියන එක නිශ්චිතව සොයා ගන්න අපේ රටේ ක්‍රමයක් නැති එක ප්‍රශ්නයක්. මොකද, මැණික් ගලකට එන වටිනාකම අනුව මැණික් අපනයනකරුවාට ඒ නිවැරදි මිල රටට හෙළි කරන ක්‍රමයක්, නීතියක් නැහැ. ඒ නිසා අපි කියනවා නම් රත්නපුරේ මැණික්වලින් ජාතික ආදායම, එහෙම නැත්නම් අපනයන ආදායම ලෙස මහා විශාල ආදායමක් එන්නේ නැහැ කියලා, මම හිතන විධියට ඒක අපේ කියවා ගැනීමේ වරදක්. මේ රටට විශාල අපනයන ආදායමක්, ඩොලර් ආදායමක් ගෙනෙන කර්මාන්තයක් තමයි මැණික් කර්මාන්තය. මැණික් කර්මාන්තයේදී ජාත්‍යන්තර වෙළෙන්දෙක් කොළඹට ඇවිල්ලා, බේරුවලට ගිහිල්ලා මැණික් මිලදී ගන්නේ නැතිව, රත්නපුරෙන් මැණික් මිලදී ගන්න යන්න පුළුවන් විධියට මාර්ග පහසුකම්, ඒකට අවශ්‍ය සුදුසු පරිසරය හදන එක තමයි වැදගත් කියන එකයි මම කියන්නේ. එතකොට මීට වැඩිය ලොකු වටිනාකමක් රත්නපුරේ මැණික් කර්මාන්තයට, පතල් කර්මාන්තයට ලැබෙයි. අන්න ඒක තමයි මගේ යෝජනාවේ අන්තර්ගතය වුණේ. එහෙම නැතුව මේ පතල් කර්මාන්තය හරහා, මැණික් වෙළෙඳාම හරහා අපේ රටට වියදමට සාපේක්ෂව ආදායමක් එන්නේ නැහැ කියලා කවුරු හරි කියනවා නම්, ඒ නිර්ණායක පට්ටපල් බොරු. ඕනෑ නම් අපි ඒ ගැන තර්ක කරමු.

අවසාන වශයෙන් මේ යෝජනාව ස්ථිර කරපු, ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා ඇතුළු යෝජනාවට සහයෝගය දක්වපු සියලු මන්ත්‍රීවරුන්ටත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. මේ යෝජනාව සැබෑවක් බවට පත් කරගෙන, රත්නපුර දිස්ත්‍රික්කයට විතරක් නොවෙයි මේ පහසුකම ලබන සියලු ජනතාවට හයියක් වෙන්න, මේ යෝජනාව වෙනුවෙන් සහයෝගය දීපු ඔබ සියලුදෙනාට ස්තුතිවන්ත වෙමින්, මගේ වචන කිහිපය අවසන් කරනවා.

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. (Dr.) Janaka Senarathna?

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කරමින් කිව්වා, මම අසත්‍ය කාරණයක් කිව්වා කියලා. මම මේ පිළිබඳව එතුමාගේ අවධානය යොමු කරනවා. කරුණාකරලා පසුගිය අවුරුදු 10ක මහ බැංකු වාර්තා ඔබතුමා අධ්‍යයනය කරන්න. ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමනි, ලංකාවේ මැණික් අපනයන ආදායම ගණනය කරනකොට, දියමන්ති - diamonds - export කරපු ගණන එකතු කරන්නේ නැතුව, ලංකාවේ මැණික්වලින් - දේශීය මැණික්වලින් - ගත්ත ආදායම බලන්න. ඒ සඳහා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ Annual Reports බලන්න. Export Development Board එකේ reports බලන්න.

ගිය අවුරුද්දේ ඩොලර් මිලියන 168යි. පසුගිය අවුරුදු 20ක් ගත්තොත්, ඩොලර් මිලියන 100 අවට ගණන් තමයි ලැබිලා තිබෙන්නේ. හැබැයි, පතල් 8,000ක operation cost එක ගණනය කරලා තිබෙනවා, ඩොලර් මිලියන 200ක් කියලා. මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ හිටපු සභාපතිතුමා අවසානාවන්ත ලෙස මිය ගියා. මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ mining engineersලාගෙන් ඔබතුමා අහලා බලන්න. Research paper එකක් තිබෙනවා පිටු 120 ගණනක. ලංකාවේ gem industry එකෙන් economy එකට තිබෙන impact එකයි, environmental impact එකයි ගැන කරපු research papers තිබෙනවා. ඒවා study කරලා බලන්න. අපි ඒ ගැන වෙනම කථා කරමු.

බොහොම ස්තුතියි.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Hesha Withanage is on his feet. Yes, Hon. Member?

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තත්ත්පර 30කින් කියන්නම්. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමා අභියෝගයට ලක් කළා නොවෙයි. ඔබතුමා ඒ විෂයය පිළිබඳව ඔය documents එක්ක කියන කථාවට වඩා ප්‍රායෝගික තත්ත්වය වෙනස්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැණික් ගලක් මිලට ගන්න කෙනා හරි මුදල declare කරලා අපනයනය කරන්නේ නැහැ කියන කාරණාව තමයි මම කිව්වේ. ඒ සම්බන්ධ නීති හදලා නැහැ. අපේ රටේ එහෙම නීතියක් නැහැ. එවැනි නීතියක් තිබුණා නම් කවදාවත් මැණික් කර්මාන්තය තුළින් මේ රටේ අපනයන ආදායමට පාඩුවක් වෙන්නේ නැහැ කියන එක තමයි මම කියන්නේ.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, Private Members' Motion - P. 40/2025 - to be moved by the Hon. T.K. Jayasundara. You have ten minutes, Hon. Member.

## පිටිගල, උඩුගම, නෙළුව සහ දෙනියාය නගර අයත් පරිසර පද්ධතිය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම

பிட்டிகல, உடுகம, நெலுவை மற்றும் தெனியாய ஆகிய நகரங்கள் அமைந்துள்ள சூழல் கட்டமைப்பைச் சுற்றுலா வலயமாகப் பிரகடனப்படுத்தல்

DESIGNATION OF THE ECOSYSTEM COMPRISING THE TOWNS OF PITIGALA, UDUGAMA, NELUWA AND DENIYAYA AS A TOURIST ZONE

[අ.භා. 12.09]

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ශ්‍රී ලංකාව නව පුනරුදයකට අවතීර්ණ වී ඇති අවස්ථාවක රටේ සංචාරක ව්‍යාපාරය දේශීය ආදායම ඉහළ නැංවීමට හේතු වන හෙයින්ද, ශ්‍රී ලංකාවේ පහතරට වැසි වනාන්තර අතරින් ලෝක උරුමයක් වන සිංහරාජ වනාන්තරයද, විශේෂිත සත්ත්ව හා ශාක විශේෂවලින් ගහන වූ කන්නෙලිය වනාන්තරය සහ හිනිදුම කන්ද ඇතුළත් කඳු වැටියේ (හේකොක්) ජෛව පද්ධතිය විදේශීය ජනතාවගේ විශේෂ අවධානය දිනා ගත් පරිසර පද්ධතියක් වන හෙයින්ද, මෙම පරිසර පද්ධතිය ඇතුළත් පිටිගල, උඩුගම, නෙළුව, දෙනියාය සහ රත්නපුර නගර අයත් පරිසර පද්ධතිය සංචාරක කලාපයක් ලෙස නම් කර එය සංවර්ධනය කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ කථා කරන්න හදන්නේ ලංකාවේ පෙණහැල්ල පිළිබඳව. ලංකාවේ පෙණහැල්ල විධියට අපට කථා කරන්න පුළුවන් ප්‍රධාන කොටස් ටිකක් තිබෙනවා. පළමුවැනි එක තමයි සිංහරාජ ලෝක උරුම වනාන්තරය. ඒක අවිවාදිතයි. ලෝක උරුමයක් වන සිංහරාජ වනාන්තරය තමයි අපට තිබෙන ලොකුම සම්පත. දෙවැන්න තමයි විශාල ශාක විවිධත්වයකින් යුක්ත වූ ලෝකප්‍රසිද්ධ කන්නෙලිය. වර්ග කිලෝ මීටරයක් තුළ වැඩිම ශාක විවිධත්වයක් තිබෙන වනාන්තරය තමයි කන්නෙලිය. ඊට පසුව දකුණේ උසම කන්ද සහ කඳුවැටිය වන හිනිදුම් කන්ද. ඒක අපි දැන් නම් කරන්නේ "හිනිදුම් කන්ද" කියලා වුණාට බ්‍රිතාන්‍ය ජාතිකයන් ඒක නම් කළේ, "හේකොක්" කියලා. ඒ ආශ්‍රිත මහා දැවැන්ත වනාන්තර

[ගරු ටී.කේ. ජයසුන්දර මහතා]

පද්ධතියක්, ඒකට උරුම වෙච්ච සර්ම කලාපීය අඩි 2,000-3,000 අතර පරතරය තිබෙන සදාහරිත තෙත් වනාන්තර පද්ධතියක්, මනුෂ්‍ය වාසයට ඉතාම හිතකර වූ පරිසර පද්ධතියක් ගැන තමයි අපි මේ කථා කරන්නේ.

මම ඒ සඳහන් කළ විශේෂ වනාන්තර තුන ත්‍රිකෝණයක් - තුන් ඈඳුතු - ලෙස සලකන්න පුළුවන්. ඒවා වැඩි දුරක නොවෙයි පිහිටා තිබෙන්නේ. ඒ තුන් ඈඳුතු වනාන්තර ප්‍රදේශය නිතරම මීදුමෙන් වැහිලා තිබෙන නිසා තමයි අපි "හිනිදූම් කන්ද" කියන්නේත්. සිංහරාජයත් නිතරම මීදුමෙන් වැහිලා තිබෙන්නේ. ඒ නිසා ඒ ප්‍රදේශය මීදුම් ත්‍රිකෝණයක් - mist triangle එකක් - හැටියට හඳුන්වන්න පුළුවන්. ඒ mist triangle එක වටා බැඳිච්ච නගර ගණනාවක් තිබෙනවා. එක පැත්තකින් උඩුගම, පිටිගල, නෙළුව, ඇල්පිටිය, සූරියකන්ද, කලවාන, දෙනියාය, රත්නපුර නගර තිබෙනවා. ඒ නගරත් එක්ක බැඳිච්ච කඳු පද්ධතියක්, ඇලි, ගංගා සහිත ජල මූලාශ්‍ර පද්ධතියක් සහිත සොබා සෞන්දර්යයෙන් අනූන දැවැන්ත පරිසර පද්ධතියක් ගැන තමයි අපි අද මේ කථා කරන්නේ. ඒ පරිසර පද්ධතිය විශේෂයෙන්ම මේ මොහොතේ අපට වැදගත් වෙනවා. මොකද, ජාතික ජන බලවේග රජයක් යටතේ ජාතිය අවදි වන අවස්ථාවක, ජාතිය නැඟිටින අවස්ථාවක ඒ හරහා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ නව පැතිකඩක් විවර කර ගන්න අපට අවස්ථාවක් තිබෙනවා.

ඒ පරිසර පද්ධතියේ විශේෂත්වය මොකක්ද? ඒ වනාන්තර පද්ධතියට කොළඹ පැත්තෙන් ඇවිල්ලා මතුගම, පැලවත්ත පැත්තෙන් ඇතුළු වෙන්න පුළුවන්. ඊට පස්සේ අනෙක් පැත්තෙන්, හික්කඩුව, බෙන්තර, අම්බලන්ගොඩ පැත්තෙන් ඇවිල්ලා ඇල්පිටිය, පිටිගල පැත්තෙන් ඇතුළු වෙන්න පුළුවන්. අනෙක් පැත්තෙන් ගාල්ල, හික්කඩුව, උඩුගම පැතිවලින් ඇවිල්ලා තවලම, නෙළුව හරහා ලංකාගම පැත්තෙන් ඇතුළු වෙන්න පුළුවන්. අනෙක් පැත්තෙන් ගාල්ල, මාතර පැත්තෙන් ඇවිල්ලා දෙනියාය පැත්තෙන් ඇතුළු වෙන්න පුළුවන්. අනෙක් පැත්තෙන් උඩවලව, කලවාන, රත්නපුර පැත්තෙන් ඇතුළු වෙන්න පුළුවන්. ලංකාවේ පැති හයකින්, හතකින් ඒ ප්‍රදේශයට ඇතුළු වෙන්න පුළුවන්.

නමුත් අපේ සංචාරක ව්‍යාපාරය ගැන කථා කරනකොට, සංචාරකයා මේ ප්‍රදේශය මඟ හැරලා තමයි අපේ රටේ වෙනත් ප්‍රදේශවලට ගමන් කරන්නේ. දකුණේ ඉන්න සංචාරකයෙකුට සීතල දේශගුණයක් සහිත ප්‍රදේශයකට ගිහිල්ලා කඳුකර පරිසරයත් එක්ක කාලය ගත කරන්න නම් ඔහුට යන්න වෙනවා, ඇල්ල, නුවරඑළිය වාගේ ප්‍රදේශවලට. නමුත්, මෙතැන ඉතාම ළඟ ප්‍රදේශයක්. මේ ප්‍රදේශය හම්බන්තොට දිස්ත්‍රික්කය, කොළඹ දිස්ත්‍රික්කය, රත්නපුර දිස්ත්‍රික්කය කියන මේ හැම දිස්ත්‍රික්කයක්ම සම්බන්ධ වෙන මැද කොටසක්. ඒ නිසා මේ පරිසර පද්ධතිය ගැන තමයි අද අපි කථා කරන්නේ. මේ පරිසර පද්ධතියෙන් කොහොමද අපේ රටට ආදායමක් උපයා ගන්නේ? මේ පරිසර පද්ධතිය අපේ ප්‍රදේශයේ ජනතාවගේ නව ජීවන රටාවක් බවට පත් කර ගන්නේ කොහොමද? මේ පිළිබඳ සාකච්ඡාවක් තමයි අද අපි කරන්නේ.

මෙහිදී අපි විශේෂයෙන්ම කථා කරන්න ඕනෑ, මේ හරහා ලෝකයේ සංචාරක ව්‍යාපාරය අපට ආකර්ෂණය කර ගන්නේ කොහොමද කියන එක පිළිබඳව. විශේෂයෙන්ම ඔබ දන්නවා, ලංකාව කියන්නේ ප්‍රසිද්ධ දූපතක් බව. ලංකාව, ලෝකයේ ප්‍රසිද්ධයි සුන්දර වෙරළ තීරයක් තිබෙන රටක් හැටියට. හැබැයි, ලෝකයේ දියුණු රටවලින් මේ රටට එන සංචාරකයන් අපේ මුහුද පාවිච්චි නොකරන්න හේතුවක් තිබෙනවා. ඒ තමයි, Blue Flag කියන recognition එක අපට නොලැබීම. ඒ නිසා ලෝකයේ දියුණු රටවලින් එන සංචාරකයෝ අපේ මුහුදේ නාන්න කැමැති නැහැ. ඒකට හේතුව තමයි, E. coli කියන බැක්ටීරියාව අපේ මුහුදු ජලයේ තිබීම. අපේ මුහුද ලස්සන වුණාට ඒ මුහුද පවිත්‍ර මුහුදක්, නොඉඳුල් මුහුදක් බවට පත් කර ගන්න අපට බැරි වෙලා තිබෙනවා. විදේශ සංචාරකයා ඉල්ලන නොඉඳුල් කලාපයක්, නොඉඳුල් ජල ප්‍රවාහයක් තිබෙනවා මම කියන මේ කලාපය ඇතුළේ. අපේ රටේ සුව විඳින්න එන සංචාරකයාට crystal water, එහෙම නැත්නම් නොඉඳුල් ජල මූලාශ්‍ර තිබෙන ප්‍රදේශයක් තමයි මේ ප්‍රදේශය. එම නිසා සංචාරකයාගේ ඒ අවශ්‍යතාව සපුරා ගන්න හොඳම තැනක් තමයි මේ කලාපය.

ඊළඟ කාරණය තමයි, මේ ප්‍රදේශය ඔක්සිජන් ප්‍රතිශතය ඉහළ ප්‍රදේශයක් වීම. අපේ රටට එන සංචාරකයන් ඉතාම කැමැතියි, ඔක්සිජන් අධික ප්‍රදේශයක ජීවත් වෙන්න. ඔවුන් අපේ රටේ ඉන්න ඒ කෙටි කාලය ඔක්සිජන් සාන්ද්‍රණය ඉතා ඉහළ පරිසර පද්ධතියක් තුළ ගත කරන්න කැමැතියි. ඒකට හොඳම ප්‍රදේශය තමයි, මා කලින් සඳහන් කළ වනාන්තර තුන ආශ්‍රිත මීදුම් ත්‍රිකෝණ කලාපය. එක පැත්තකින් හම්බන්තොට වියළි කලාපයටත්, තව පැත්තකින් නුවරඑළිය වාගේ සීතලම කලාපයටත් සම්බන්ධ වන මේ දෙකටම මැද තිබෙන ඉතා මෘදු දේශගුණ කලාපයක් - soft climate එකක් - තමයි මේ ප්‍රදේශයේ තිබෙන්නේ. ඒ නිසා වියළි-සීත කියන දෙකටම අයිති නැති, සමට ඉතාම හිතකර දේශගුණ කලාපයක් මේ ප්‍රදේශයේ තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපේ ගොඩක් සංචාරක කලාප කාලයක් තිස්සේ පරිහරණය කිරීම නිසා යල් පැන ගිහිල්ලා තිබෙන්නේ. නමුත්, නොඉඳුල් සංචාරක කලාපයක් තමයි මම මේ කියන කලාපය. මේ නොඉඳුල් සංචාරක කලාපය sustainable විධියට ඉතා පරිස්සමින් ගොඩනැඟීම තුළින් අපට පුළුවන් ලංකාවේ ඉතාම ඉහළ හොඳ සංචාරක බිමක් බවට මේ ප්‍රදේශය පත් කර ගන්න.

ඒ විතරක් නොවෙයි. අපේ රට තේවලට, කුරුඳුවලට, කුළුබඩුවලට, මැණික්වලට ප්‍රසිද්ධයි. මේ කලාපය තුළ මේ සියල්ල එකට කැටිව තිබෙනවා. අම්බලන්ගොඩ, බෙන්තර පැත්තෙන් එනකොට ඇල්පිටිය කුරුඳු කලාපය තිබෙනවා. ගාල්ල, මාතර පැත්තෙන් එනකොට තේ කලාපය තිබෙනවා. රත්නපුර පැත්තෙන් එනකොට මැණික් කලාපය තිබෙනවා. මේ කලාප සියල්ල ගත්තාම හොඳම කුළුබඩු නිෂ්පාදනය කරන කලාපයක් තමයි මේ කලාපය. ඒ නිසා සංචාරකයාට මේ කලාපය ඉතාම වටිනා කලාපයක් බවට පත් වනවා.

මෙහි ඓතිහාසික ප්‍රදේශත් තිබෙනවා. මේ ඓතිහාසික ප්‍රදේශ ගත්තාම අපේ පැරණි සාහිත්‍යයට සම්බන්ධ වෙච්ච කලාප තිබෙනවා. විශේෂයෙන් මේ කලාපය තුළ පල්ලි තිබෙනවා. ඒ අතරින් හිනිදුම පල්ලිය විශේෂයි. හිනිදුම කියන්නේ කල්වාරි කන්ද සහ ගිං ගඟ අසබඩ තිබෙන ඉතාම දර්ශනීය ප්‍රදේශයක්. ඒ පල්ලිය තිබෙන්නේ මේ කලාපය ඇතුළේ. හිනිදුම කන්දත්, කන්නෙලියත් මැද තමයි මේ පල්ලිය තිබෙන්නේ. ඉතා වටිනා පන්සල් පවා මේ ප්‍රදේශයේ තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මෙය සංස්කෘතික විවිධත්වයක් සහිත ප්‍රදේශයක්. මෙය වතුකරයේ ජනතාව, දෙමළ, මුස්ලිම්, සිංහල ඇතුළු විවිධ සංස්කෘතිවලට අයත් ජනතාව ජීවත් වන, ග්‍රාමීය සංස්කෘතියක් සහිත අර්ධ නාගරික ප්‍රදේශයක්. මෙහි adventurous places තිබෙනවා. ඒ කියන්නේ, මිනිසුන්ට විවිධ අත්දැකීම් ලබන්න පුළුවන් හොඳ කලාප මේ තුළ තිබෙනවා. පක්ෂීන් ඇතුළු විවිධ සතුන් සිටින, විවිධ ශාක සහිත ප්‍රදේශ මෙම කලාපයේ තිබෙනවා. ඒ නිසා මේ කලාපය ඉතා වැදගත් කලාපයක්. මේ නව සංචාරක කලාපය අපේ ප්‍රදේශයේ පිහිටි නිසාම ඒ තුළින් අපට විශාල ජාතික ආදායමක් ලබන්න පුළුවන්.

ඒ විතරක් නොවෙයි. බෙන්තර, අම්බලන්ගොඩ සහ හික්කඩුව කලාපයට යනකොට කුරුඳු, තේ, කිතුල් සහ කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදනවලට නව පණක් ලැබිලා, ඒ ආශ්‍රිත කර්මාන්ත කරන

ජනතාවට විශාල ආදායමක් ලැබෙන්න පටන් ගන්නවා. ඒ වාගේම කොග්ගල, හික්කඩුව, කන්නෙලිය, ලංකාගම සංචාරක කලාපයට එනකොට ගිං ගඟ ආශ්‍රිත ප්‍රදේශයේදී සංචාරකයන්ට විවිධ adventures දෙන්න පුළුවන්, බෝට්ටු සවාරි දෙන්න පුළුවන්, කඳු නැඟීම ආදී නව අත්දැකීම් දෙන්න පුළුවන්. මේ හැම පැත්තකින්ම ජනතාවට ආදායම් මාර්ග ලබා ගන්නත් පුළුවන්. ඊට පස්සේ උඩවලව හරහා එනකොට අලි බලන්න පුළුවන් කලාපයක් බවටත් මෙම කලාපය පත් වනවා.

මෙහිදී අපි බලාපොරොත්තු වනවා, මෙන්න මේ කලාපයට අදාළව නව සංචාරක ප්‍රවේශයක් ගන්න. අද මේ යෝජනාවට අදහස් එකතු කරන පක්ෂ විපක්ෂ සියලු කථිකයන්ගේ දැනුමත්, අපේ ඇමතිතුමාගේ අදහසුත් එකතු කරලා මේ ප්‍රදේශය නව සංචාරක කලාපයක් බවට පත් කරන්න ඔබ සියලුදෙනාගේ ආශීර්වාදය ලබා දෙන්න කියා ඉල්ලමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Lal Premanath. You have five minutes to second that Motion.

[අ.භා. 12.20]

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමා ගෙන එන ලද සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ යෝජනාව ස්ථිර කරමින්, එම යෝජනාව පෝෂණය කිරීම සඳහා මාගේ පැත්තෙනුත් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. මාතර දිස්ත්‍රික්කයේ දෙණියාය, කොටපොල, පිටබැද්දර වැනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ස්වාභාවික සෞන්දර්යයෙන් අනූන, තේ වතු, වැසි වනාන්තර සහිත සංචාරක විභවයක් ඇති, විශාල වැදගත්කමින් යුතු ප්‍රදේශ. ජයසුන්දර මන්ත්‍රීතුමා සඳහන් කළ එම කොට්ඨාස ත්‍රිත්වය තුළ විශේෂයෙන් මාතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය සිසිල් දේශගුණයක් සහිත කලාපය නියෝජනය කරනවා.

එතුමාගේ යෝජනාවට අනුව මෙම ප්‍රදේශවල සංචාරක ව්‍යාපාරය නැංවීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග විශාල ප්‍රමාණයක් තිබෙනවා. එක පැත්තකින් දැනටමත් හඳුනා ගත් සහ දැනටමත් සංවර්ධනය කළ දේවල් තිබෙන අතර, අලුතින් හඳුනා ගත යුතු දේවලුත් තිබෙනවා. ඉන් තොරතුරු කිහිපයක් මම මේ සභාවට ඉදිරිපත් කරන්න කැමැතියි.

දෙණියාය, කොටපොල, පිටබැද්දර කියන කලාපයේ සංචාරක විභව ලෙස සංස්කෘතිකමය වශයෙන් අව්‍යාජභාවය සහිත මිනිසුන් ජීවත් වන ස්වභාව සෞන්දර්යයෙන් අනූන පරිසරයක් හඳුනා ගන්න පුළුවන්. ඒ පරිසරය සංචාරක ව්‍යාපාරය සඳහා යොදා ගන්න පුළුවන්. Authentic cultural tourism and ecotourism සඳහා සුවිශේෂ විභවයක් සහිත කලාපයක් තමයි අපි මේ හඳුනා ගෙන තිබෙන කලාපය. ඒ වාගේම සංචාරකයන්ගේ මනදොළ පිනවීම සඳහා adventure පැත්තෙන් ගත්තොත්, සිංහරාජ පිවිසුම් මාර්ගය, දියඇලි වාගේම තේ කර්මාන්තශාලා පවා මේ කලාපය තුළ තිබෙනවා.

කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාව සලකා බැලීමේදී, විශේෂයෙන් එය ග්‍රාමීය මට්ටමින් පවතින කෘෂි කාර්මික සංචාරක ව්‍යාපාරයක් පෝෂණය කරන්න පුළුවන් ප්‍රදේශයක්. ඒ වාගේම මේ ප්‍රදේශය තේ, කුරුඳු, කරාබුනැටි වැනි විශේෂ කුළුබඩු වර්ග වැවෙන සිසිල් දේශගුණයක් සහිත, ගැමි අව්‍යාජත්වය පිරිණු ප්‍රදේශයක්.

පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගත්තොත්, එහි සොඳුරු කඳු සහිත ග්‍රාමීය පසුබිමක් තිබෙනවා. ඒ වාගේම පාරම්පරික කෘෂි කාර්මික උරුමයක් දකින්න පුළුවන්. කලින් සඳහන් කළා වාගේම පැළෑටි උද්‍යාන, කුළු බඩු වගාව, හුදෙකලාව නිදහසේ ඇවිදින්න පුළුවන් ස්වාභාවික මං මාවත් මේ ප්‍රදේශය තුළ අපට හඳුනාගන්න පුළුවන්. දැනට හඳුනාගෙන තිබෙන සංචාරක ස්ථාන අතර ඇති සිංහරාජ වැසි වනාන්තරය තිබෙන්නේ දෙණියාය ප්‍රදේශය ආසන්නයේයි. සිංහරාජයට යන එක් පිවිසුම් මාර්ගයක් තිබෙන්නේ ලංකාගම ප්‍රදේශයේයි. සිංහරාජ වැසි වනාන්තරය UNESCO ලෝක උරුම අඩවියක් හැටියට නම් කළ එකක්. එය ජෛව විවිධත්වය සහිත පක්ෂීන් නැරඹීම, කඳු නැඟීම ඇතුළු සියලු විවිධත්වයන් නැරඹීමට හැකි පරිසරයක් සහිත වනාන්තරයක්.ආගමික සහ සංස්කෘතික පැත්තෙන් ගත්තොත්, කොටපොල ගැටබරු රජමහා විහාරස්ථානය තිබෙනවා. එය දැනටමත් ලෝකය පුරා ප්‍රසිද්ධ, රට වටෙන්ම බැතිමතුන් එන, වන්දනාමාන කරන ඓතිහාසික වටිනාකමක් සහිත ගමනාන්තයක්.

ඒ වාගේම තව විශේෂ ස්ථානයක් තිබෙනවා. ඒ තමයි, දෙනියාය, විහාරහේන කඳු මුදුනේ ඇති Patna Sliding Rock එක. මෙහි විශේෂත්වය වන්නේ ස්වාභාවික පාෂාණ මත ලිස්සා යා හැකි ස්ථානයක් හැටියටත්, වික්‍රමාන්විත ජල ක්‍රීඩාවල, ඒ කියන්නේ adventurous ක්‍රීඩා කරන්න පුළුවන් තැනක් හැටියටත් ප්‍රසිද්ධ වීමයි. ඒ වාගේම හත්මාලේ ඇල්ල, ඇතාමල ඇල්ල සහ ඌරන් වැටුණු ඇල්ල ආදී ඡායාරූපකරණයට සහ වීඩියෝකරණයට ගත හැකි ස්ථාන සහිත විශේෂ වැදගත්කමකින් යුත් දිය ඇලි විශාල ප්‍රමාණයක් මෙහි තිබෙනවා. එමෙන්ම තවමත් හඳුනා නොගත් ස්ථානත් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව තත්පර කීපයක් දෙන්න.

ඒ වාගේම viewpoints විශාල ප්‍රමාණයක් තිබෙනවා; hiking trails තිබෙනවා. ගරු ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි මේවා පිළිබඳව අවධානය යොමු කරලා, මේවා උසස් මට්ටමට නංවා ගන්න අපට පුළුවන් වුණොත්, මේ ප්‍රදේශ ත්‍රිත්වය සංචාරක ව්‍යාපාරයට විශාල පිටිවහලක් කර ගන්න පුළුවන් ප්‍රදේශයක් හැටියට පත් කර ගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Upul Kithsiri. You have five minutes.

[අ.භා. 12.25]

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමා විසින් "පිටිගල, උඩුගම, නෙළුව සහ දෙනියාය නගර අයත් පරිසර පද්ධතිය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම" කියන පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ගෙනැවිත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක ක්ෂේත්‍රය ගත්තාම, දේශීය, විදේශීය සංචාරකයන් වැඩි වශයෙන්ම ආකර්ෂණය දිනා ගත් රටක් බවට මේ වනවිට අපේ රට පත් වෙලා තිබෙන බව අපි දන්නවා. අපේ රටේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කරන්න නම් ප්‍රධාන ක්ෂේත්‍ර 4ක් ඔස්සේ අපට සංචාරක කර්මාන්තය දියුණු කළ හැකි බව අපි දන්නවා. ඉන් ප්‍රධානම ක්ෂේත්‍රයක් තමයි, අපේ රටේ තිබෙන ස්වාභාවික පරිසර පද්ධතිය. සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමෙහි ලා අපේ රටේ තිබෙන සංස්කෘතික පසුබිමත් අපට දායක කර ගන්න පුළුවන්. අපේ රටේ සංස්කෘතිය තුළ තිබෙන ආගන්තුක සත්කාරයත් අපට සංචාරක කර්මාන්තයට විශේෂයෙන්ම යොදා ගන්න පුළුවන්. ඒ වාගේම, විවිධ ආකාරයේ අධ්‍යයන කටයුතු සඳහා සහ අධ්‍යාපන කටයුතු සඳහා අපේ රටට සංචාරකයන් පැමිණෙන බව අපි දන්නවා. ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද විශේෂ ස්ථාන ආශ්‍රිත එම ප්‍රදේශය සංචාරක කලාපයක් බවට පත් කිරීමේදී, ඒ ආශ්‍රිතව තිබෙන සිංහරාජ වනාන්තරය ප්‍රධාන කරගෙන එම සංචාරක කලාපය නම් කරන්න කියන එක තමයි එතුමාගේ යෝජනාව වුණේ.

සිංහරාජ වනාන්තරය ගත්තොත් එය ලෝකයේ තිබෙන ස්වාභාවික වනාන්තර අතර ඇති ප්‍රධානම වනාන්තරයක් බව අපි දන්නවා. ඒ නිසා තමයි UNESCO සංවිධානය 1989 වසරේදී සිංහරාජ වනාන්තරය ලෝක උරුමයක් බවට නම් කරන්නේ. සිංහරාජ වනාන්තරයේ විවිධ සත්ව විශේෂ 20කට අධික ප්‍රමාණයක් ජීවත් වන බව අපි දකිනවා. ශාක විශේෂ ගත්තොත්, සිංහරාජ වනාන්තරය තුළ ශාක විශේෂ 340ක් පමණ දකින්න තිබෙනවා. එමෙන්ම ලංකාවට ආවේණික ශාක විශේෂ 192ක්, සිංහරාජ වනාන්තරයට ආවේණික වූ ශාක විශේෂ 15ක් පමණ දකින්නත් පුළුවන්කම තිබෙනවා.

සංචාරකයන්ට සිංහරාජ වනාන්තරයට පිවිසිය හැකි ප්‍රධාන මාර්ග 4ක් තිබෙනවා. ඒවා තමයි, දෙනියාය පල්ලේගම මාර්ගය, කලවාන වැද්දාගල මාර්ගය, රක්වාන මෝනින්සයිඩ් මාර්ගය සහ හිනිදුම නෙළුව මාර්ගය. ගරු මන්ත්‍රීතුමා යෝජනා කළ පරිදි විදේශිකයන් පවා සිංහරාජය ආශ්‍රිතව ගමන් කළ මාර්ගය තමයි, ගාල්ලේ සිට රත්නපුර දක්වා වූ මාර්ගය. එම මාර්ගය හරහා එද්දී විශේෂයෙන්ම නෙළුව, දෙනියාය, මෝනින්සයිඩ් යන සිංහරාජ පිවිසුම් සහ රක්වාන ප්‍රදේශයෙන් සිංහරාජ වනාන්තරයට ඇතුළු වෙන්න තිබෙන පිවිසුම සංචාරක කලාපයක් හැටියට ප්‍රවර්ධනය කරන්න පුළුවන් කියලා අපි දකිනවා. සිංහරාජයට පිවිසීම සඳහා ඇති රක්වාන, සූරියකන්ද මාර්ගය මේ වෙනකොට සකසා අවසන් වෙලා තිබෙනවා. ඇඹිලිපිටියේ සිට සූරියකන්ද දක්වා මාර්ගය ඉදි වෙමින් පවතිනවා. ගාල්ලේ සිට දෙනියාය හරහා රත්නපුර දක්වා වූ කොටසද මේ වෙනකොට සංවර්ධනය කරලා අවසන් කර තිබෙනවා.

එම නිසා සංචාරකයන්ට ඒ කලාපයට පැමිණීමේ පහසුකම් මේ වෙනකොට සලසා දී තිබෙනවා. එය ප්‍රධාන වශයෙන්ම සංචාරක කලාපයක් කරනවා වාගේම, ඒ ප්‍රදේශ සංචාරකයන්ගේ ආකර්ෂණය දිනා ගත හැකි ආකාරයට අන්තර්ජාලය හරහා ජාත්‍යන්තර වශයෙන් හා දේශීය වශයෙන් දැනුවත් කිරීම තුළින් සංචාරක ප්‍රවර්ධනය සඳහාත් යොදවා ගන්න පුළුවන්. ඒ මහා පරිසර පද්ධතියත් ආරක්ෂා කරගනිමින් සංවර්ධනය කිරීම තමයි ප්‍රධාන කාර්යය වන්නේ. ඒ ප්‍රදේශය සංචාරක කලාපයක් හැටියට සංවර්ධනය කිරීම සඳහා ගරු ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමා විසින් මේ ගෙන එන ලද යෝජනාව ඉතා කාලෝචිත හා සුබවාදී යෝජනාවක් ලෙස මා දකිනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Gayantha Karunathilleka. You have five minutes.

[අ.භා. 1.00]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ පළාත හා සම්බන්ධ ඉතා කාලෝචිත යෝජනාවක් පෞද්ගලික මන්ත්‍රී යෝජනා යටතේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු වන ගරු ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරද්දී, විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වුණත් ඒක අනුමත කරමින් වචන දෙක-තුනක් කථා කරන්නයි මා අදහස් කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාත්‍යන්තර සංචාරක මඟ පෙන්වන ආයතන වාගේම, ලෝක ප්‍රකට සංචාරක සඟරා විසින් මෑත කාලයේදී ලෝකයේ සංචාරයට සුදුසුම රටවල් අතරින් ඉහළම රටක් හැටියට ලංකාව නම් කර තිබෙනවා. විශේෂයෙන්ම අද මේ යෝජනාවේ සඳහන් ප්‍රදේශ ගත්තාම දේශීය වශයෙනුත්, විදේශීය වශයෙනුත් සංචාරක ආකර්ෂණයට ඉතාම සුදුසු ප්‍රදේශයක් දියුණු කරන්න කියලා තමයි එතුමා මේ යෝජනා කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි සඳහන් කර තිබෙන නියාගම, පිටිගල, නාගොඩ, උඩුගම, නෙළුව, තවලම කියන ප්‍රදේශවල පවතින සුවිශේෂී ආකර්ෂණීය ස්ථාන, එම ප්‍රදේශවල ඉතා සුහදශීලී හා ආචාරශීලී ජනතාවක් සිටීම සහ ඔවුන් සතු ඉතා ඉහළ ආගන්තුක සත්කාරය වාගේම එහි පවතින ගැමි සුන්දරත්වය එම පළාතට ආවේණික ලක්ෂණ හැටියට අපි කවුරුත් පිළිගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පළාත් අතරින් ගාලු දිසාවේ පිහිටි නෙළුව කියන්නේ, විවිධ භූ විෂමතා පද්ධතිවලින්, ඒ වාගේම ජෛව විශේෂත්වයකින් සමන්විත හෙක්ටෙයාර 15,348ක් පුරා විහිදුණු ප්‍රදේශයක්. ලෝක උරුමයක් වුණු සිංහරාජ වනාන්තරයේ මායිමත් නෙළුවට සම්බන්ධ වෙනවා. දූලි ඇල්ල, බ්‍රාහ්මණ ඇල්ල, මල්මොර ඇල්ල, හැරියාව දොළ වැනි

සංචාරක ආකර්ෂණය දිනා ගන්න පුළුවන් ස්ථාන රාශියක් නෙළුව වටපිටාවේ තිබෙනවා. ඒ වාගේම ලංකාගම, කොස්මුල්ල, වාරුකන්දෙණිය වැනි සංචාරකයන්ගේ නෙත් සිත් ඇද ගන්නා ප්‍රදේශ නෙළුවට අයත් වෙනවා. මම ඊයේ පෙරේදා දවසක නෙළුවේ, ලංකාගමට ගියා. ඒ යනකොට මම දැක්කා, වාහන විශාල සංඛ්‍යාවක් ඒ ප්‍රදේශයට ඇවිත් තිබුණු බව. දේශීය සංචාරකයෝත් පිරිලා හිටියා, සති අන්තයේ.

ලෝක උරුමයක් ලෙස නම් කර තිබෙන ඉතා රමණීය හා සංවේදී සිංහරාජ වනාන්තරය අධ්‍යාපන හා සංචාරක කටයුතු සඳහාත් ඉතාම වටිනා තැනක් හැටියට අපි දකිනවා. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව මේ වනාන්තර පද්ධතිය තුළ ශාක විශේෂ 192ක් හඳුනාගෙන තිබෙනවා. ඒ අතරින් දේශීය වශයෙන් වඳ වී යන ශාක විශේෂ 30ක්ද, ගෝලීය වශයෙන් වඳ වී යන ශාක 116ක්ද හඳුනා ගෙන තිබෙනවා. ඒ වාගේම සත්ව විශේෂ 102කුත් හඳුනා ගෙන තිබෙනවා. ඒ තුළ දේශීය සත්ව විශේෂ 50ක් සහ වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සත්ව විශේෂ 3ක්ද සිටින බව අපට දැන ගන්න ලැබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා සඳහන් කළ තවත් ප්‍රදේශයක් තමයි පිටිගල. ඒ කියන්නේ නියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය. බෙන්තර ගඟේ ඉහළ මිටියාවතේ පිහිටි හෙක්ටයාර 11,110කින් සමන්විත රමණීය කඳු වැටි, ඒ හරහා ගලා බසින කුඩා දිය ඇළි මෙන්ම කෙත්වතු, තේවතු සහිත සංචාරක ආකර්ෂණය කරගන්නා ඉතාම සුන්දර ප්‍රදේශයක් විධියට එම ප්‍රදේශය හඳුන්වන්න පුළුවන්.

කලුදිය පොකුණ, අඩාහැලෙන ඇල්ල වැනි ආකර්ෂණීය සංචාරක ස්ථානවලින් සමන්විත වන අතර, සාම්ප්‍රදායිකව සිදු කරන පැණි හකුරු කර්මාන්තය ඒ ප්‍රදේශයට බොහොම ආවේණික කර්මාන්තයක්. ඒ වාගේම තේ කර්මාන්තය බහුලව පවතින ඉතාම සුන්දර ප්‍රදේශ මේවා.

මේ කියන ප්‍රදේශවල ආරණ්‍ය සේනාසන ගණනාවකුත් පිහිටා තිබෙනවා. ආගමික පරිසරයක් සහිත නිස්කලංක ප්‍රදේශයක්. මානසික සුවය බලාපොරොත්තුවෙන් එන සංචාරකයන් සඳහා ඉතාම හොඳ ගමනාන්තයක් ලෙස මෙතුමා හඳුන්වපු නියාගම, පිටිගල, තවලම, උඩුගම, නෙළුව යන ප්‍රදේශ හඳුන්වන්න පුළුවන්. මේ ප්‍රදේශයට ගැළපෙන ඉතාම හොඳ යෝජනාවක් තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් හොඳට දන්නා දිස්ත්‍රික්කයක් තමයි ගාල්ල දිස්ත්‍රික්කය. ඔබතුමා කිව්වා, වෛද්‍යවරයකු හැටියට ඔබතුමා ඒ ප්‍රදේශයේ සේවය කළා කියලා. ඒක සංචාරක ආකර්ෂණය බොහොම ඉහළින් තිබෙන දිස්ත්‍රික්කයක්. විශේෂයෙන් මුහුදුබඩ තීරයේ බෙන්තර, හික්කඩුව, ගාල්ල, උණවටුන, අහංගම කියන්නේ විශාල වශයෙන් සංචාරකයන් එන ප්‍රදේශ. ඒ ප්‍රදේශවල අයටත් ඉතාම කෙටි වෙලාවක් ඇතුළත තවත් සුන්දරත්වයක් විඳ ගන්න අවස්ථාවක් තිබෙන ප්‍රදේශ දියුණු කරන්න කියලා තමයි මේ යෝජනා කර තිබෙන්නේ.

අපි බෙන්තර, දෙද්දුව ප්‍රදේශයේ විශාල ව්‍යාපෘතියක් පටන් ගත්තා, "දෙද්දුව සංචාරක ව්‍යාපෘතිය" කියලා, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේත් පූර්ණ ආශීර්වාදය ඇතිව. අපි ඉඩම් අක්කර ගණනාවක් අත්පත් කරගෙන, දැන් ඒවාට වන්දිත් ගෙවා තිබෙනවා. හොඳ යෝජනා ක්‍රමයක් ඒකේ තිබෙන්නේ. අද බෙන්තරට එන සංචාරකයන්, ලංකාවේ බොහෝ ප්‍රදේශවලට යන සංචාරකයන් මුහුදු තීරයටයි, හෝටල් කාමරයටයි සීමා වෙනවා. ඒ නිසා ජල ක්‍රීඩා, golf, horse racing ආදී නොයෙක් ක්‍රීඩා යෝජනා කරලා තිබෙනවා. වර්තමාන අපේ සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිතුමාත් - ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීතුමාත් - ඉන්න මේ වෙලාවේ මම ඉල්ලීමක් කරන්න කැමැතියි. මේකට පක්ෂ භේද ඕනෑ නැහැ. කවුද මේක පටන් ගත්තේ, කවුද වන්දි ගෙව්වේ කියන එක ඕනෑ නැහැ, පළාතම දියුණු කරන්න පුළුවන් මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න පටන් ගන්න.

මම නැවත නැවතත් කියනවා මේක කාලෝචිත යෝජනාවක් කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලාපයේ සෙසු තරගකාරී රටවල සංචාරක ගමනාන්ත සමඟ තරග කිරීම සඳහා සම්ප්‍රදායෙන් ඔබ්බට ගිහිල්ලා මේ වාගේ සංචාරක කලාප හඳුන්වා දීම වැදගත් කියන එක ප්‍රකාශ කරමින් මේ යෝජනාවට අපි සම්පූර්ණයෙන්ම අපේ අනුමැතිය ලබා දෙනවා. ඒ වාගේම මම ස්තුතිවන්ත වෙනවා, ජයසුන්දර මන්ත්‍රීතුමාට. තමුන්නාන්සේලා හොඳ යෝජනාවක් මේ ගෙනැල්ලා තිබෙන්නේ. අපි හොඳ දේවල්වලට හැමදාම සහාය දෙනවා. ඒ වාගේම අඩු පාඩුවක් තිබුණොත් පෙන්වලා දෙනවා. අපි විපක්ෂයේ කාර්යභාරය ඒ විධියට තමයි ඉෂ්ට කරන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Prof.) Ruwan Ranasinghe. You have 10 minutes to reply.

[අ.භා. 1.08]

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගාල්ල දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවට පක්ෂව කරුණු දැක්වීම සම්බන්ධයෙන් විපක්ෂයේ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දශක 7කට අධික කාලයක් මේ සංචාරක කර්මාන්තය, වාණිජ කර්මාන්තයක් විධියට අපේ රටේ කරගෙන ගියත්, අපේ සංචාරක අත්දැකීම් එහෙම නැත්නම් අපේ රටේ සංචාරක නිෂ්පාදන විවිධාංගීකරණය කර ගැනීමට අපි අසමත් වෙලා තිබෙනවා ඒ දශක ගණනාව පුරාම. විපක්ෂයේ මන්ත්‍රීතුමාත් සඳහන් කළා වාගේ මුහුදු තීරය, යාල, සීගිරිය වැනි සාම්ප්‍රදායික සංචාරක ගමනාන්තවලින් එළියට ගිහින් අලුත් සංචාරක අත්දැකීම් නිර්මාණය කරලා ඒක ලෝක වෙළඳ පොළට ප්‍රවර්ධනය කරන්න අපි අසමත් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි සංචාරක ගමනාන්තයක් විධියට අපට කලාපයේ තරගකාරීත්වයක් ගොඩ නඟා ගන්න බැරිවෙලා තිබෙන්නේ.

විශේෂයෙන් සංචාරක වෙළඳ පොළ ගත්තාම අපිත් එක්ක තරග කරන වියට්නාමය, මැලේසියාව, තායිලන්තය වාගේ රටවල් ගත්තොත් ඒ අයත් බොහෝ වෙලාවට අපි වාගේම තමයි. සර්ම කලාපීය පරිසර පද්ධති, වනසතුන්, මුහුදු තීරය තිබෙනවා. හැබැයි, ඒගොල්ලන් ලෝක වෙළඳ පොළේ හොඳ සංචාරක නිෂ්පාදන අලෙවි කරන්න සමත් වෙලා තිබෙනවා. ඒ නිසා මම හිතනවා, අපට අභියෝගාත්මක කර්මාන්තයක් තිබෙනවා කියලා. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා සඳහන් කළා, දෙද්දුව ඉඩම් අත්පත් කර ගත්තා කියලා.

[ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා]

දශක ගණනාවක් ඒ ඉඩම එහෙම ම තිබෙනවා. Encroachersලා ඒ ඉඩම්වලට ඇවිල්ලා දේශපාලන බලය පාවිච්චි කරලා ඒවා අනීතිකව අත්පත් කරගෙන තිබෙනවා. ඒවා නැවත නිරවුල් කරන්න අවශ්‍යයි. ඒ ඉඩම් සම්බන්ධයෙන් ජර්මන් ආයෝජකයෙකු එක්ක අපි මීට සති දෙකකට කලින් සාකච්ඡා කළා. වයෝවෘද්ධ කණ්ඩායම්වලට ජීවත් වීමට පහසුකම්, සෞඛ්‍ය පහසුකම් සහ විනෝදාස්වාද කටයුතු සඳහා වන පහසුකම් සංවර්ධනය කිරීමට අදාළව විශාල වෙළෙඳ පොළක් ලෝකයේ අද ගොඩනැඟෙමින් තිබෙන බව අපි දන්නවා. දෙද්දූව ප්‍රදේශයට අදාළව එවැනි ව්‍යාපෘතියක් සඳහා වන දැවැන්ත ආයෝජනයක් සඳහා අපි මේ වන විට ජර්මනිය සමඟ සාකච්ඡා කරමින් ඉන්නවා.

කෙසේ වෙතත්, පසුගිය කාලය තුළ අපේ රට අසමත් වෙලා තිබෙනවා, සංචාරකයන්ට අපේ සාම්ප්‍රදායික සංචාරක අත්දැකීම්වලින් එළියට යන සංචාරක නිෂ්පාදනයක්, නව ආස්වාදයක්, අත්දැකීමක් ලැබිය හැකි දේවල් ගොඩ නඟලා වෙළෙඳ පොළට ගෙන එන්න. නමුත්, පසුගිය වසර දෙකේ ඉතාම හොඳ සංචාරක අත්දැකීමක් නිර්මාණයක් කරන්න අපි සමත් වුණා. ඒ තමයි, Pekoe Trail. එය කිලෝමීටර් 320ක ගමනක්. Stages 22කට බෙදලායි තිබෙන්නේ. ගිය මාසයේ United Statesවල "Time" magazine එක rank කළා, Pekoe Trail එක ලෝකයේ top සංචාරක අත්දැකීම් 10න් එකක් කියලා. පසුගිය දශක හතේ අපේ සාම්ප්‍රදායික ගමනාන්තවලින් ඔබ්බට ගිහින් අපි යම් දෙයක් කළා නම්, ඒක තමයි Pekoe Trail එක.

මා මුලින් කිව්වා වාගේ අපේ රටේ මේ තිබෙන අත්දැකීම් පාදක කරගෙන අපේ ස්වාභාවික සම්පත් ප්‍රයෝජනයට ගන්න පුළුවන්. මේ යෝජනාවේ සඳහන් කරන ප්‍රදේශ ඉතාම සංවේදී පරිසර කලාප. Endemic flora and fauna සහිත පරිසර පද්ධති කලාපයක් තමයි සංචාරක අත්දැකීමක් ලබාගත හැකි ලෙස දියුණු කරන්න කියලා මේ යෝජනා කරන්නේ. මා මුලින් සඳහන් කරපු යාල, විල්පත්තුව, වස්ගමුව කියන වනෝද්‍යාන සහ ආර්ථික කටයුතුවලට යොදා ගන්න පුළුවන් ප්‍රදේශ හඳුනාගෙන සංචාරක කර්මාන්තයේ අලුත් අත්දැකීම් ලබා දෙන දේවල් ලෙස දියුණු කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම තමයි, wreck diving. ක්‍රි.පූ. 2 සියවසේ ship එකක් අපට ගොඩවායේදී දැකගන්න පුළුවන්. අපේ මුහුදු තීරයේ තමයි තිබෙන්නේ ලෝකයේ මුල්ම purpose-built aircraft carrier එක. ඒක, graveyard එකක්; underwater museum එකක්. ඒවා කේන්ද්‍ර කරගත් සංචාරක අත්දැකීම් නිර්මාණය කරන්න අවශ්‍යයි.

ඒ වාගේම, Kurundu Trail එකත් ඒ ප්‍රදේශය ආශ්‍රිතව තිබෙන එකක්. Pekoe Trail කියන්නේ කන්ද උඩරට තේ කර්මාන්තයත් එක්ක බැඳුණු අත්දැකීමක්. Kurundu Trail එක දකුණු පළාත කේන්ද්‍ර කරගනිමින් අලුත් trail එකක් ලෙස දියුණු කරන්න ආසියානු සංවර්ධන බැංකුවත් එක්ක සාකච්ඡා කරලා අපි මේ වනකොට ගිවිසුම්ගත වෙලා ඉන්නවා. තවත් එකක් තමයි, Red rice Trail. එය අපේ රජරට කලාපයට සම්බන්ධයි. අපේ රටේ විතරයි, red rice කියන එක දැකගන්න පුළුවන්. ඒකත් එක්ක කේන්ද්‍රගත වුණු අපේ එල්ලංගා පද්ධතියත් එක්ක අලුත් trail එකකට අදාළවත් ලෝක බැංකුව සමඟ සාකච්ඡා කරලා මේ වන කොට අවශ්‍ය consultancyවලට යෝජනා යොමු කර තිබෙනවා.

මේවාත් එක්ක තමයි අලුත් සංචාරක අත්දැකීම් ලබා දෙන්න අප කටයුතු කරන්නේ. විශේෂයෙන් අපේ රටේ ස්වාභාවික සම්පත් ඇතුළු වන සම්පත, වන සතුන්, ජන ජීවිතය, සංස්කෘතිය, ඓතිහාසික උරුමයන්, අපේ සාගරය, ජලජ සම්පත්, විනෝදාස්වාද අත්දැකීම් ආදිය කේන්ද්‍ර කරගත් අද්විතීය සංචාරක අත්දැකීම් නිර්මාණය කරලා වෙළෙඳ පොළට ගෙනෙන එක තමයි අපට මේ වෙලාවේ තිබෙන අභියෝගය. මා හිතන හැටියට අප කළ යුතු වන්නේත් එයයි. අපේ ගරු ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමා යෝජනා කරන්නේ පිටිගල, උඩුගම, නෙළුව සහ දෙණියාය කියන ප්‍රදේශ කේන්ද්‍ර කරගත් සංචාරක අත්දැකීමක් සහිත සංචාරක කලාපයක් විධියට ඒ ප්‍රදේශය දියුණු කළ යුතු බවයි.

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අප මේ වනකොටත් ඒ ක්‍රියාවලිය ආරම්භ කරලායි තිබෙන්නේ. විශේෂයෙන්ම දෙණියාය ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් සංචාරක අත්දැකීමක් ලැබෙන සංචාරක කලාපයක් නිර්මාණය කරන ව්‍යාපෘතිය මීට වසර කීපයකට කලින් ආරම්භ කරලා තිබෙනවා. අපි දැන් ඒ ක්‍රියාවලියේ නියැළෙමින් ඉන්නේ. මේ යෝජනාවෙන් ඒකට තවත් ප්‍රදේශ කීපයක් ඇතුළත් කරන්න තමයි යෝජනා වන්නේ. ඉතින් මම මේ පිළිබඳව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සංවර්ධන අංශයත් එක්ක සාකච්ඡා කළා. ඒ අය මට ලබා දුන් පිළිතුරත් මෙතැන තිබෙනවා. මම ඒකත් ගරු මන්ත්‍රීතුමාට ඉදිරිපත් කරන්නම්. ඒ පිළිතුර මෙසේයි.

"ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය දෙණියාය හා ඒ අවට ප්‍රදේශයේ බෙහෙවින් දක්නට ඇති ස්වාභාවික උරුමයන් හේතුවෙන් එම ප්‍රදේශය ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා එහි පවත්නා සුවිශේෂී විභවතා දැනටමත් හඳුනාගෙන ඇත. සුවිශේෂී සංචාරක අත්දැකීමක් ලබා දෙන මෙම කලාපය සිංහරාජ වන රක්ෂිතයට හා වෙනත් වැසි වනාන්තරවලට සුවිශේෂී ජෛව විවිධත්වයන්ට මෙන්ම, ඒකදේශීය ශාක හා සත්ව විශේෂවලට සහ දුර්ලභ පරිසර පද්ධතීන් ඇතුළු විවිධ සංචාරක සම්පත්වලට නිවහන වන හෙයින් සංචාරක කලාප ලෙස නුදුරු අනාගතයේදී ප්‍රකාශයට පත් කිරීම සඳහා දැනටමත් හඳුනාගෙන ඇති ප්‍රදේශ ලැයිස්තුවේ දෙණියාය ප්‍රදේශය ඇත.

කෙසේ වෙතත්, 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(2) වගන්තියට අනුව සංචාරක සංවර්ධන ප්‍රදේශයක් කලාපයක් නිල වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට, ගැසට් පත්‍රයක් නිකුත් කිරීමට පෙර නිශ්චිත ක්‍රියාවලියක් අනුගමනය කළ යුතුය. මෙම ක්‍රියාවලියේ එක් කොටසක් ලෙස අදාළ ප්‍රදේශවල පදිංචිකරුවන්ට හා අනෙකුත් ප්‍රධාන පාර්ශ්වකරුවන්ට ප්‍රමාණවත් කාලයකට පෙර පූර්ව දැනුම්දීමක් සිදු කර මහජන අදහස් විමසීම් පැවැත්වීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය බලාපොරොත්තු වේ. මෙම මහජන අදහස් විමසීම්වලට පෙර, යෝජිත සංචාරක කලාපයේ සීමා මායිම් පැහැදිලිව හඳුනා ගැනීම සහ නිශ්චය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පාර්ශ්වකරුවන් සඳහා උපදේශන රැස්වීමක් සංවිධානය කළ යුතු අතර, එහිදී පිටිගල, උඩුගම, නෙළුව වැනි අනෙකුත් ප්‍රකාශිත ප්‍රදේශ ද මෙයට ඇතුළත් කිරීම පිළිබඳව සාකච්ඡා කර සලකා බැලිය හැක. මෙම රැස්වීම පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිචාර ලබා ගැනීම, අරමුණු පැහැදිලි කිරීම සහ සැලසුම් ක්‍රියාවලියට ඒවා ඇතුළත් කිරීම තහවුරු කිරීම සඳහා පවත්වනු ලැබේ. පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් යුතුව අදහස් විමසීමෙන් හා ප්‍රසිද්ධ දැන්වීම පළ කිරීමෙන් පසුව සංචාරක ප්‍රදේශය ගැසට් පත්‍රයේ පළ කිරීමේ පටිපාටියට යොමු කරනු ලැබේ. ස්ථානීය සහ භූ ලක්ෂණ සිතියම්, ඉඩම් පරිහරණ විස්තර, ජන විකාශන විස්තර, ස්වාභාවික හා සංස්කෘතික ආකර්ෂණීය ස්ථාන පිළිබඳ ලැයිස්තු, යෝජිත කලාපය තුළ පවත්නා සංචාරක ක්‍රියාකාරකම්, ප්‍රවේශ මාර්ග, ප්‍රවාහන ජාල, දේශගුණික හා පාරිසරික දත්ත, පවත්නා හෝටල්, නිවාඩු නිකේතන සහ සංචාරක සේවා, මූලික යටිතල පහසුකම් පැවතීම සහ දේශීය සංචාරක සංගම් සහ ප්‍රජා පාදක සංචාරක ක්‍රියා මාර්ග වැනි ප්‍රධාන සැලසුම් සහ අදාළ වන්නා වූ

සියලු තොරතුරු ඇතුළත් සාධක මත පදනම් වූ තක්සේරුවකින් මෙය සමන්විත වනු ඇත."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව පිළිබඳ සලකා බැලීමේදී කිව යුතුයි, මා මුලින් සඳහන් කළා වාගේ අප දෙණියාය ප්‍රදේශය කේන්ද්‍ර කරගෙන මේ ක්‍රියාවලිය සිදු කරමින් සිටි බව. මේක ටිකක් සංකීර්ණ ක්‍රියාවලියක්. මේ කියන කලාපයත් ඒකට ඇතුළත් කරලා, තවත් වසර කීපයක් ඇතුළත සියලු කර්තව්‍යයන් ඉටු කරලා, ඒ ප්‍රදේශවල සියලු කණ්ඩායම් ඒකරාශි කරගෙන සාකච්ඡාවෙන්, stakeholder consultancy තුළින් ඒ ප්‍රදේශවල සීමා නිර්ණ හඳුනාගෙන තමයි එය ගැසට් කළ යුතු වන්නේ. ඉතින්, සංචාරක සංවර්ධන අධිකාරිය විධියට අපට ඒ ප්‍රවේශය ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ සඳහා යම්කිසි කාලයක් ගත වෙයි. කෙසේ වෙතත්, මම නැවත වරක් ඒ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, ඉතාම කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන.

මා මුලින් සඳහන් කළා වාගේ ශ්‍රී ලංකාවේ අලුත් සංචාරක අත්දැකීම් නිර්මාණය කරන්න අවශ්‍යයි, අලුත් සංචාරක ගමනාන්ත නිර්මාණය කරන්න අවශ්‍යයි. ඒ හරහා තමයි අප ජනතාවට පොරොන්දු වුණු තිරසාර සහ සහභාගිත්ව සංචාරක ආර්ථිකයක් ගොඩ නඟන්න අපට පුළුවන් වන්නේ. මේ වගකීම ඉටු කරන්න අමාත්‍යාංශය විධියටත්, සංචාරක සංවර්ධන අධිකාරිය විධියටත් අප කැප වන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. T.K. Jayasundara, you have five minutes to make the wind-up speech.

[අ.භා. 1.18]

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මගේ යෝජනාව ස්ථිර කළ ගරු ලාල් ප්‍රේමනාත් මන්ත්‍රීතුමා සහ අද මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා සහ අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු සියලුදෙනාටම මුලින්ම ස්තුතිවන්ත වෙනවා.

මගේ අරමුණ වන්නේ, මේ යෝජනාවේ සඳහන් Southern Mist Triangle එක, ඒ කියන්නේ හිනිදුම් කන්ද, කන්නෙලිය සහ සිංහරාජය කියන ඒ ත්‍රිකෝණය - triangle එක - මීදුමෙන් පිරිච්ච ඒ කලාපය ඒ ප්‍රදේශයේ සංචාරක කලාපයක් බවට පත් කිරීමයි.

එහිදී නව සංචාරක පරිපාලන ප්‍රවේශයක් ගන්න අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියපු විධියටම මේ ප්‍රදේශය ගැසට් කරන්නත්, මේවා පරිපාලනය කරන්න සංචාරක අමාත්‍යාංශය මැදිහත් වෙලා යම් පරිපාලන අධිකාරියක් ගොඩනගන්නත් ඕනෑය කියන අදහසට මම එකඟ වෙනවා. ඒක ඉක්මනින්ම කර ගන්න තමයි අපට ඕනෑකම තිබෙන්නේ.

දෙවෙනි එක, මේ නොඉඳුල් ප්‍රදේශයට හානි නොකර මේ ප්‍රදේශය මේ ආකාරයෙන්ම ආරක්ෂිතව පවත්වාගෙන යන්න අපි සියලුදෙනා පරිසරය ආරක්ෂා කිරීම පැත්තෙන් මහන්සි වෙන්න ඕනෑකම තිබෙනවා. ලෝකයේ ධනපති පන්තියේ ගොඩක් අයගේ එපා වෙච්ච ජීවිතවලට සැනසුමක් ලබා ගන්න මේ වාගේ ප්‍රදේශවලට ඇවිල්ලා නිස්කලංකව ගත කිරීමේ වුවමනාවක් තිබෙනවා. එවැනි විවේක දිවියක් ගත කරන්න සුදුසු නිවාස මේ ප්‍රදේශයේ ගොඩනගන්න ඕනෑකම තිබෙනවා. මේ දර්ශනීය ස්ථාන ඉලක්ක කරගෙන අපට සංචාරක ගම්මාන පිහිටුවන්න පුළුවන්කම තිබෙනවා. මේ ගම්මානවල වෙසෙන සාමාන්‍ය ගැමියා එක්ක ගත කරන්න පුළුවන් homestay system එකක් පටන් අරගෙන, ඒ homestay මූලධර්ම ජනතාවට හඳුන්වා දීමත් වැදගත්. එතකොට සංචාරකයන්ට පහසුකමක් ලැබෙනවා වාගේම, අපටත් පහසුවෙන් ඉතා අඩු මුදලකින් සංචාරක කර්මාන්තයේ යෙදෙන්න පුළුවන්. ඉතින් අමාත්‍යාංශ මැදිහත්වෙලා ඒ ආකාරයේ නව සංචාරක ප්‍රවේශයන් හදලා දෙන්න කියන ඉල්ලීම කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රදේශයේ හෙලිකොප්ටර් අංගණ හදන්න පුළුවන්, ගොල්ෆ් පිටි හදන්න පුළුවන්, සුඛෝභෝගී රෝහල් මෙන්ම ආයුර්වේද රෝහල් හදන්න පුළුවන්, අශ්වගාල් හදන්න පුළුවන්. ඒ එක්කම කේබල් කාර් වාගේ ඒවා භාවිත කරන්න පුළුවන් අවස්ථා හදන්න පුළුවන්, භාවනා මධ්‍යස්ථාන, යෝගාශ්‍රම හදන්න පුළුවන්. ඒ වාගේම හොඳ තේ, කිතුල්, කුරුඳු, කුළු බඩු වාගේ නිෂ්පාදන ගන්න පුළුවන් තැන් හදන්න පුළුවන්. ඒ වාගේම, නරඹන්න පුළුවන් තැන්, කාබනික ආහාර ගොවිපළවල් හා අළෙවි සැල් හදන්න පුළුවන්. මේ ප්‍රදේශවල විශේෂයෙන් ආංගිරි ඇල්ල, දූවිලි ඇල්ල, ලංකාගම බ්‍රාහ්මණ ඇල්ල, කන්නෙලිය, අනගිමල ඇල්ල වාගේ ඇලි තිබෙනවා. ඒ වාගේ ස්ථාන සංවර්ධනය කරලා ඒ මිනිසුන්ට අත් දැකීම් ලබන්න පුළුවන්, විනෝද වෙන්න පුළුවන් තැන් බවට ඒ ස්ථාන පත් කරන්න පුළුවන්. ඒ වාගේම මේ ප්‍රදේශයේ 360-degree view එක තිබෙන තැන්, කඳු මුදුන් විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේවා ඉතාම දර්ශනීය තැන්. මෙන්න මේ වාගේ තැන් සංවර්ධනය කරලා සංචාරකයන්ට සතුටු වෙන්න පුළුවන් තැන් බවට ඒවා පත් කරන්න පුළුවන්.

ඒ විතරක් නොවෙයි, අපේ ප්‍රදේශවල ජනතාවගේ දේශීය ආහාර, ඒ සංස්කෘතිය, ආගන්තුක සත්කාරය කියන මේ ඔක්කෝම දේවල් අළෙවි කරන්න පුළුවන් තැන් බවට ඒ තැන් පත් වෙනවා. එතකොට අපේ ජනතාවගේ ආර්ථික සමෘද්ධිය ගොඩනැගෙන තැන් බවට ඒ ස්ථාන පත් වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මේ යෝජනාව ඇතුළේ අපි බලාපොරොත්තු වුණේ ඉතාම කෙටි කාලයකින් මේ සඳහා ප්‍රවේශයක් ලබා ගැනීමයි. මේ සඳහා අපට විවිධ ආයතනික ව්‍යුහ අතර උදවු ඕනෑ නම්, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට ජනතාවට උදවු ලබා දෙන්න ඕනෑ නම්, අපට ඒ උදවු ලබා දෙන්න පුළුවන්. මොකද, මේවා සඳහා ජනතාවගේ විශාල ඉල්ලුමක් තිබෙනවා. විශාල වුවමනාවක් තිබෙනවා, උනන්දුවක් තිබෙනවා, සංචාරක ව්‍යාපාරය ඒ ප්‍රදේශවලට ගේන්න කියලා. ඒ නිසා අපට ඒ පිළිබඳ බාධාවක් නැහැ. මම කියන්නේ ඒකට ලොකු මුදල් වුවමනාවකුත් වෙන එකක් නැහැ. අපට මුලින්ම වැදගත් වෙන්නේ සංචාරක කලාපයක කොහොමද හැසිරෙන්න ඕනෑ කියන එක. ඒ සඳහා මඟ පෙන්වන්නන්, කෑම සපයන්නන්, මාර්ගෝපදේශකයන් කියන ඒ සියලුදෙනාට පුහුණු වැඩසටහන් පැවැත්වීම තමයි පළමුවෙන් කළ යුතු දේ. ඒ ගොල්ලන්ට උගන්වන්න ඕනෑ, මේ පරිසරයත්, මේ සමාජයත් වෙනස් නොකර සංචාරකයන් ගෙනැල්ලා ඒ ගොල්ලන්ට අපේ දේ අළෙවි කර ගන්නේ කොහොමද කියලා. නව නිෂ්පාදන, විශේෂයෙන්ම කිතුල් රා, කිතුල් පැණි මේ ප්‍රදේශවල ඉතාම ප්‍රසිද්ධයි. ඒවා අපට අළෙවි කරන්න පුළුවන්. ඒ හරහා ඒ ගොල්ලන්ට අත් දැකීම් ලබන්න පුළුවන් තැන් බවට මේ තැන් පත් කරන්න පුළුවන්.

[ගරු ටී.කේ. ජයසුන්දර මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රත්නපුර පැත්තෙන් ආවත්, ගාල්ල පැත්තෙන් ආවත්, මාතර පැත්තෙන් ආවත්, මතුගම පැත්තෙන් ආවත්, කොයි පැත්තෙන් ආවත් මේ එකම කලාපයක්. භූ විෂමතා ලක්ෂණ මොනවා තිබුණත්, පළාත් වශයෙන් අපි සීමා වෙන් කරගෙන හිටියත් මේ ඔක්කෝම එක කලාපයක්. ඒ නිසා මේ සියල්ලටම පොදු වෙච්ච එක පරිපාලන ව්‍යුහයක් හදන්න කියන යෝජනාව ඉදිරිපත් කරමින්, ඉතාම කෙටි කාලයකින් ජනතාවට මේ වාසිය ලබා දෙන්න අවශ්‍ය කටයුතු කිරීමේ හැකියාව ලැබේවා කියාත් ප්‍රාර්ථනා කරමින් අද ගෙනා මේ යෝජනාව සාර්ථක කර ගන්න දායක වූ සියලුදෙනාටත්, ඔබතුමාටත්, කාර්ය මණ්ඩලටයත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Private Members' Motion No. - P. 42/2025 - to be moved by the Hon. Ruwan Mapalagama. Hon. Member, you have five minutes.

## පාසැල් විෂය මාලාවට නීතිය සහ ආචාර ධර්ම ඇතුළත් කිරීම
## பாடசாலைக் கலைத்திட்டத்தில் சட்டம் மற்றும் ஒழுக்கவியல் விடயதானங்களை உள்ளடக்குதல்
## INTEGRATING LAW AND ETHICS TO THE SCHOOL CURRICULUM

[අ.භා. 1.23]

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "මෙරට පොදු ජනතාව මුහුණ දෙන එදිනෙදා ගැටලුවලට ප්‍රධාන හේතුවක් ලෙස එදිනෙදා ජීවිතයට අවශ්‍ය මූලික නීතිය පිළිබඳ නොදැනුවත්කම හඳුනාගෙන ඇති හෙයින් ද, නීතිය නොදැන සිටීම නීතිය ඉදිරියේදී නිදහසට කරුණක් නොවන හෙයින්ද, පාසැල් විෂය මාලාව සංකීර්ණ වීම වළක්වා ගනිමින් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පාසැල් දරුවන්ගේ පුරවැසි අධ්‍යාපනය විෂය නිර්දේශයට රටේ මූලික නීතිය පිළිබඳ ඉගැන්වීම් ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ගරු සභාවට පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස අද මම ඉදිරිපත් කරන්න කැමැතියි, ලංකාවේ පාසල් අධ්‍යාපනයේ 6 ශ්‍රේණියේ සිට විෂය මාලාවට නීතිය නම් විෂය ඇතුළත් කිරීමේ යෝජනාව. රටක් ලෙස, ජාතියක් ලෙස ගත්තාම, විශේෂයෙන්ම ගුරුවරු සහ දෙමාපියන්ට මෙන්ම ලංකාවේ දරුවන්ට මෙහි තිබෙන වැදගත්කම නිසායි පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස මා මෙම යෝජනාව ඉදිරිපත් කරන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි දන්නවා, ලංකාවේ අධිකරණ පද්ධතිය තුළ "නීතිය නොදැන සිටීම නිදහසට කාරණාවක් නොවෙයි" යන පදනම තිබෙන බව. අධිකරණය බලාපොරොත්තු වෙනවා සෑම පුරවැසියෙකුම මූලික නීතිය පිළිබඳව යම් අවබෝධයකින් සිටිය යුතු බව. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවාසනාවට මෙරට පාසල් අධ්‍යාපනය ලබන අපේ දරුවන්ට මෙතෙක් නීතිය යන විෂය පාසලේ විෂය මාලාවට විධිමත් විෂයක් ලෙස ඇතුළු වෙලා නැහැ. දැනට අපේ රටේ ක්‍රියාත්මක වන අධ්‍යාපන විෂය මාලා තුළ නීතියේ ඇතැම් කොටස් යම් යම් විෂයයන් තුළ ඉගැන්වීම සිදු කරනවා. උදාහරණ කිහිපයක් කියනවා නම්, 6 ශ්‍රේණිය සිට 11 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබන දරුවන්ට පුරවැසි අධ්‍යයනය විෂය තුළ නීතියේ යම් යම් කොටස් ඉගැන්වීම සිදු කරනවා. 12 සහ 13 ශ්‍රේණිවල දරුවන්ගේ උසස් පෙළ කලා අංශයට නියමිත තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය - Logic and Scientific Method - යන විෂය තුළ එක් පාඩමක් ලෙස නීතියේ සුළු කොටසක් අන්තර්ගත වෙලා තිබෙනවා. රටේ තිබෙන පරිසර නීතිය භූගෝල විද්‍යාව විෂය තුළ ඉගැන්වීමක් කරනවා. වෙළඳාම, ව්‍යාපාර පිළිබඳ නීතිය වාණිජ්‍ය විෂය තුළ ඉගැන්වීමක් කරනවා. Patent එකක් ලබා ගැනීම පිළිබඳ නීතිය උසස් පෙළ තාක්ෂණවේදය විෂය තුළ ඉගැන්වීම් කරනවා. අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ නීතියේ යම් කොටසක් සුළු වශයෙන් ඇතුළත් වෙලා තිබෙනවා උසස් පෙළ ජීව විද්‍යාව විෂයයට. නමුත්, මේ එකක්වත් විධිමත් ආකාරයට දරුවන්ට ඉගැන්වීමක් කරන්නේ නැති බව තමයි නිරීක්ෂණය කළ හැකි වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි වෙනත් රටවල් දෙස බැලුවොත්, ෆින්ලන්තය තුළ 5 ශ්‍රේණිය සිට සියලු දරුවන්ට Civic and Legal Education අනිවාර්යය විෂයයක්. එක්සත් රාජධානිය තුළ Citizenship and Law කියන විෂයය GCSE මට්ටමේ අනිවාර්යය විෂයයක්. එක්සත් ජනපදයේ බොහෝ ප්‍රාන්තවල Civic and Government කියන විෂයය අනිවාර්යය විෂයයක්. අපේ අසල්වැසි ඉන්දියාව තුළත් Political Science and Legal Literacy කියන විෂයය 8 ශ්‍රේණියේ සිට අනිවාර්යය විෂයයක්.

ඒ නිසා තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය උගන්වපු හිටපු ගුරුවරයකු විධියට, මේ විෂයෙහි වැදගත්කම දන්නා කෙනෙකු විධියට, දෙමාපියෙකු විධියට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට මම මේ ගරු සභාවට යෝජනා කරනවා අපේ රටේ පාසල් විෂය මාලාවට නීතිය පිළිබඳ ඉගැන්වීම ඇතුළත් කළ යුතුයි කියා. මම යෝජනා කරන්නේ නැහැ මේ සඳහා අලුත් විෂයයක් ගෙනෙමු කියලා. 2026 වසරේ සිට අපේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වෙනවා, 6 ශ්‍රේණියට. අලුත් විෂයයක් ගෙන ඒම සඳහා නොවෙයි මම මේ යෝජනා කරන්නේ. දැනට තිබෙන "පුරවැසි අධ්‍යයනය" කියන විෂයේ නම "නීතිය සහ පුරවැසි අධ්‍යාපනය" ලෙස වෙනස් කරමු කියා යෝජනා කරනවා. දැනට පුරවැසි අධ්‍යයනය කියන විෂයය ඇතුළේ ලබන වසරේ 6 ශ්‍රේණියේ තුන්වන වාරයට සකස් කරන මොඩියුල තුළට නීතිමය කොටස් ඇතුළත් කර තිබෙන බව ජාතික අධ්‍යාපන ආයතනයේ ජ්‍යෝෂ්ඨ කථිකාචාර්යවරු සමඟ සාකච්ඡා කිරීමේදී දැනගන්නට ලැබුණා. නමුත්, මේ විෂයයට අවශ්‍ය නිවැරදි බර ලබා ගැනීම සඳහා, නිවැරදි සමාජ අවධානය යොමු කර ගැනීම සඳහා මම යෝජනා කරනවා මේ විෂයයේ නම "නීතිය සහ පුරවැසි අධ්‍යාපනය" ලෙස වෙනස් කරමු කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙරට ඉතිහාසය තුළදී, අවස්ථා ගණනාවකදී මේ උත්තරීතර සභාව තුළත් ඒ ගැන සාකච්ඡා වී තිබෙනවා. නවවැනි පාර්ලිමේන්තුවේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව තුළ නීතිය ඇතුළත් කිරීම පිළිබඳව සාකච්ඡා වෙලා තිබෙනවා. ඒ වාගේම, ඒ පිළිබඳ මන්ත්‍රී අනු කමිටුවක් පත් කරලා තිබෙනවා.

මේ අවස්ථාවේදී මේ කාරණයත් කියන්න අවශ්‍යයි. නීතිඥ සංගමය වෙනුවෙන් එහි සභාපති රජීව් අමරසූරිය මහතා 2025.08.19 වන දින අග්‍රාමාත්‍ය හරිනි අමරසූරිය සහෝදරියට ලිපියක් යවමින් ඉල්ලා තිබෙනවා, නීතිය පාසල් විෂය මාලාවට ඇතුළත් කරන ලෙස. ඒ වාගේම, ඒ ලිපියෙන් එතුමා නීතිඥ සංගමය විධියට ඒකට සහාය දෙන්න කැමැත්ත පළ කර තිබෙනවා. ඒ පිළිබඳ අපි නීතිඥ සංගමයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මෙය අලුත් විෂයයක් ලෙස එකතු කරන්න කියන එක නොවෙයි මා කියන්නේ. පාසල් වයසේ සිටම දරුවන්ට විධිමත්ව නීතිය පිළිබඳව අවබෝධය ලැබෙන විට වටිනාකම වැඩියි. අපට අවශ්‍ය නැහැ රටේ සියලුදෙනා නීතිඥයන් බවට පත් කරන්න. නමුත් දරුවෙකු ලෙස, පුරවැසියෙකු ලෙස දැනගත යුතු මූලික නීතිය දැනගැනීම සඳහා මෙය ඇතුළත් කරන්න යැයි යෝජනා කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මගේ කථාව අවසන් කරන්නම්, ප්‍රවීණ අධ්‍යාපනඥයකු මෙන්ම නීති විශාරදයකු වන මහාචාර්ය නීල් ඩයස් මහතාගේ ප්‍රකාශයකින්. එතුමා ප්‍රකාශ කරනවා, "Our education must not only produce workers, but responsible citizens who understand the rule of law" යනුවෙන්, මේ ගරු සභාවට මම මෙම යෝජනාව ඉදිරිපත් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Priyantha Wijerathna. You have five minutes to second the Motion.

[අ.භා. 1.29]

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිදහසින් අවුරුදු 76කට පස්සේ මේ රටේ නීතියේ ආධිපත්‍ය, එහෙම නැත්නම් නීතියේ පාලනය ස්ථාපිත කරන්න උත්සාහ කරන රජයක් විධියට ජාතික ජන බලවේගයේ ආණ්ඩුව පත්වෙලා වසරකට ආසන්න කාලයක් තුළ අපේ රටේ පාසල් දරුවන්ගේ විෂය මාලාවට නීතිය පිළිබඳ දැනුම ඇතුළත් කළ යුතුයි කියලා ගරු රුවන් මාපලගම මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද මෙම යෝජනාව ඉතා කාලෝචිතයි කියා සඳහන් කර අතර මේ යෝජනාව ස්ථිර කරමින් මගේ කථාව ආරම්භ කරනවා.

ඇත්තටම නීතිය කියන්නේ අතිශය ගැඹුරු විෂයයක්. ඒ වාගේම, පුළුල් විෂයයක්. නිරන්තරයෙන්ම යාවත්කාලීන වන විෂයයක්. මෙම විෂය තුළ සියල්ල දන්නා, සියල්ල ඉගෙන ගත හැකි, සියලු දැනුමෙන් පරිපූර්ණ වෙච්ච කෙනෙක් සොයා ගන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ තරම් මේක පුළුල් විෂයක්. හැබැයි නීතියේ පාලනය ස්ථාපිත කරන්න අවශ්‍ය නම් සාමාන්‍ය සමාජයේ ජනතාව තුළ නෛතික දැනුම තිබීමත් අනිවාර්යය අංගයක් බවට පත් වෙනවා කියලා අපි දන්නවා. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේම නීතිය නොදැනීම නිදහසට කාරණයක් නොවෙයි කියන එක නීතියේ පාලනය ස්ථාපිත කිරීමේදී අත්‍යවශ්‍ය අංගයක් බවට පත් වෙනවා. එහෙම නැත්නම් යම් කෙනෙකුට නීතිය කඩ කරලා, මම නීතිය නොදන්නා නිසා තමයි නීතිය කඩ කරන්න සිද්ධ වුණේ කියලා නිදහසට කරුණු ඉදිරිපත් කරන්න පුළුවන් වුණොත්, ඒක නීතියේ පාලනය ක්‍රියාත්මක කිරීමේදී බාධාවක් බවට පත් වෙනවා. එහෙම නම් අපි කරන්න ඕනෑ දේ තමයි, අපේ රටේ සාමාන්‍ය ජනතාවට නීතියේ දැනුම සම්ප්‍රේෂණය කරන එක. ඒක කරන්න හොඳම විධිය තමයි, කුඩා දරුවන්ගේ මනසට මේ නීතිමය සංකල්ප ඇතුළත් කරන එක. ඒක කරන්න පුළුවන් වන්නේ පාසල් විෂය මාලාවට නෛතික සංකල්ප අන්තර්ගත කිරීම තුළින්.

ඇත්තටම මේ පිළිබඳ සාකච්ඡාවක් 2019 අවුරුද්දේත් සිදුවෙලා තිබෙනවා. ඒකට සමගාමීව, එහි ප්‍රතිඵලයක් විධියට අපේ රටේ වර්තමානයේ ක්‍රියාත්මක වන අධ්‍යාපන ක්‍රමය තුළ, විෂය නිර්දේශ තුළ නීතිමය කාරණා අන්තර්ගත වෙලා තිබෙනවා. විශේෂයෙන්ම 10 සහ 11 වසරවල දරුවන්ට ලබාදෙන පුරවැසි අධ්‍යාපනය විෂය නිර්දේශය තුළ යම් යම් නීතිමය සිද්ධාන්තයන්, නීතිමය කාරණා වර්තමානයේ දීත් දකින්නට ලැබෙනවා. ඒ තුළ නීතියේ පාලනය ගැන කියා තිබෙනවා. ඊළඟට, අපේ රටේ නීති මූලාශ්‍ර ගැන හඳුන්වා දීලා තිබෙනවා. ඒ තුළින් අපේ රටේ අධිකරණ පද්ධතිය ගැන හඳුන්වාදීමක් කර තිබෙනවා. අධිකරණයේ ස්වාධීනත්වය, විනිශ්චයකාරවරුන් පත් කිරීම ආදී යම් යම් කාරණා පිළිබඳව මේ විෂය නිර්දේශය තුළ අන්තර්ගත වෙනවා. නීතිය පිළිබඳ දැනුම මහ ජනතාවට ලබාදීමට යම් ආකාරයක ප්‍රවේශයක් මේ හරහා ඇති කර තිබෙන බවත් අපට දකින්නට ලැබෙනවා.

ඒ වාගේම, අපේ මන්ත්‍රීතුමාගේ යෝජනාව අනුව මෙය තව පුළුල් කළ හැකිද, නීතිය විෂයක් ලෙස පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කළ හැකිද, එය ඇතුළත් කළ යුතුද, එහෙනම් ඒ කුමන සීමාවන් තුළද? උදාහරණයක් විධියට අපරාධ නීතිය පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කළ යුතුද, එහෙම නැත්නම් පරිසර නීතිය පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කළ යුතුද, එහෙම නැත්නම් අල්ලස් හෝ දූෂණ සම්බන්ධයෙන් වන නීති පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කළ යුතුද යන කාරණා තීරණය කරලා ඒවා පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කළ යුත්තේ කුමන ආකාරයෙන්ද යන්න තීරණය කිරීම අධ්‍යාපන විශේෂඥයන්ට භාර කාර්යයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් ප්‍රතිපත්තියක් විධියට අපේ රට තුළ නීතියේ ආධිපත්‍ය ස්ථාපිත කරන්න නම්, නීතිය පිළිබඳ දැනුම පුළුල් කළ යුතු වෙනවා. ඒ ගැන තර්කයක් නැහැ. ඒක තමයි අපේ ප්‍රතිපත්තිය වන්නේ.

ගරු රුවන් මාපලගම මන්ත්‍රීතුමා මේ යෝජනාව කළා. ඒ යෝජනාව සාර්ථකව අපේ රටේ අධ්‍යාපන පද්ධතියට, එහෙම නැත්නම් අපේ රටේ පාසල් දරුවන්ට උගන්වන විෂය නිර්දේශයට ඇතුළත් කිරීමේ වගකීම විධායකයට පැවරෙනවා. සීමා තුළ, දරුවන්ට බරක් නොවන ආකාරයට එය සිදු කළ යුතුයි. මේ වෙනකොටත් අපේ දරුවන්ගේ පාසල් පොත් බෑග් එක බරයි. ඒකෙන් ඔළුවට ලොකු බරක් දැනෙනවා. ඒ බර හැල්ලු කරලා අවශ්‍ය දේවල් ඔළුවට දමන්න පුළුවන්, ඒ සංකල්ප දරුවන්ගේ මනස තුළ ස්ථාපනය කරන්න පුළුවන් ආකාරයට මේ නෛතික සිද්ධාන්ත අපේ විෂය නිර්දේශයට ඇතුළත් කළ යුතුයි කියන යෝජනාව ස්ථිර කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. M. Nizam Kariapper. You have five minutes.

[1.35 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Hon. Deputy Speaker, the Motion brought by the Hon. Ruwan Mapalagama is, I believe, a good starting point for a deeper discourse on future education reform. Sir, I believe - I do not know, I am not sure - we belong

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

to the same era where we studied Social Studies. It is not just about teaching law and ethics to prepare students for examinations and to become professionals; it is not for that, I would say. Learning, as we did in our good old school days, was part of a broader social studies curriculum which went far beyond textbooks. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා අර පුරවැසි අධ්‍යාපනය - civics - පිළිබඳව. It was not merely about maps and mountains; it was about understanding who we are, where we belong and how we relate to the larger family of nations. From our earliest years of primary school, we were taught history, geography, civics and moral values. We used to have a scrapbook for social studies. We also engaged in many practical exercises such as reading aloud in classrooms, drawing and pasting pictures and displaying our work proudly on classroom walls. Leaning was alive, creative and deeply connected to our sense of identity and belonging.

It is vital that our future generations are made aware of our true geographical and historical realities. That is why it has to be broadened without focusing only on civic studies but also focusing on social studies as a whole.

Sir, we are now in a digital world and people think that we are living in a virtual reality. But, there are physical realities that we must be conscious about. Few among us truly appreciate that throughout our long history, there were South Indian kings who were trusted and even revered by the up-country Sinhalese and Buddhist priesthood. Tamil, at one time, was the language of royal administration and high learning, a testament to the deep cultural and linguistic harmony that once flourished on this Island. Those rulers of South India did not betray the trust placed in them and governed with honour and unity. It was the colonial intruders, not our regional kin, who divided and weakened us.

අපේ උඩරට රජවරුන්ගේ කාලයේ ඉඳලා රජ වාසලේ රාජකීය - royal - භාෂාව විධියට තිබුණේ දෙමළ. සමහර විට දන්නේ නැතුව ඇති. අපි මේක කියන්නේ ඇයි? අපේ ඉතිහාසය සම්බන්ධ කරගෙන මේ විෂය පුළුල් කළාම අපිට නීතිය පිළිබඳවත්, අපේ අයිතිවාසිකම පිළිබඳවත්, අපගේ වගකීම් පිළිබඳවත් දැනගන්න ලේසි නිසා.

මම තව ලස්සන උදාහරණයක් කියන්නම්. අපි පොඩි කාලයේ ඉගෙන ගත්තා what our rights are. මට තවමත් මතකයි, ඒ කාලයේ අපට practical class එකක් තිබුණා. ඒකෙදි අපි හතර, පස් දෙනෙක් හැරමිටියක් අරගෙන සොලවා සොලවා යනවා. You have a right to walk with a walking stick swinging that, but it stops at where it touches the other man. එය ඔබගේ වගකීම. Those things that we learnt in the past are still in our mind. And, these are very vital things for us to understand.

Then, we talk about Fundamental Rights. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි ව්‍යවස්ථාවේ තිබෙනවා මූලික අයිතිවාසිකම් පිළිබඳව. අදාළ මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ සභාවේ නැහැ. නැත්නම් එතුමාගේ නම කියලා ම මම මේක කියනවා. That Article speaks about freedom of expression, freedom of association and so on. යම්කිසි පදනමක් මත එකතු වෙලා යම්කිසි සංවිධානයක්, සමාගමක්, පක්ෂයක් පිහිටුවා ගැනීම අපේ අයිතියක්. ඒකේ මහා ලොකු වරදක් නැහැ. ඒකවත් නොදැන තමයි සමහර මන්ත්‍රීවරු අද අනවශ්‍ය ප්‍රශ්න මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙන්නේ.

Sir, I want to conclude my speech by just saying that, as we reflect on the past, it is important for us and our great neighbour India to remember that our destinies have always been intertwined. India has long stood as a pillar of strength with links to our culture, civilization and our religions and with a historical background, of which we did not know fully. Our country must not be an isolated nation, but a member of this particular region we are in. It is important for us to understand ourselves, both in terms of our rights and obligations, and I really welcome the Motion that has been brought in by the Hon. Ruwan Mapalagama. It gives me great pleasure to support it. I would request this to be expanded to have a larger scope so that these could be taught from the primary and not merely as a subject to pass examinations and for students to become professionals.

Thank you very much, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani. You have five minutes.

[අ.භා. 1.40]

**ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)

මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

පාසල් විෂය මාලාවට නීතිය හා ආචාර ධර්ම ඇතුළත් කිරීම වෙනුවෙන් අද මේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව මම ගරු රුවන් මාපලගම මන්ත්‍රීතුමාට ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටක ජීවත් වන හැම පුරවැසියෙක්ම ඒ රටේ පවතින නීතියට අවනත විය යුතුයි. හැබැයි අපේ රටේ පවතින වර්තමාන තත්ත්වය දිහා බලනකොට අපේ මේ අපේක්ෂාව මොනතරම් දුරට සාක්ෂාත් කරගන්න පුළුවන් වෙලා තිබෙනවාද කියලා අපට අද ප්‍රශ්නයක් ඉතිරි වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "න්‍යායෙන් තොර භාවිතය අන්ධ බවත්, භාවිතයෙන් තොර න්‍යාය වඳ බවත්" අපි අහලා තිබෙනවා. විශේෂයෙන්ම මොනම මොහොතකවත් රටක පුරවැසියෙක් නීතිය නොදැන සිටීම කිසිම වරදකින් බේරීම සඳහා වූ නිදහසට කාරණයක් බවට පත් වන්නේ නැහැ. හැබැයි අධ්‍යාපනය තුළින් පුරවැසියන්ගේ එදිනෙදා කටයුතුවලදී බලපාන නීතිමය තත්ත්ව වාගේම නීතිය තමන්ට කොයිතරම් දුරට බලපානවාද කියන එක දැන ගැනීමට මේ වනතෙක් මේ රටේ පුරවැසියන්ට අවස්ථාවක් ලැබිලා නැහැ.

රටක ජීවත් වන හැම පුරවැසියෙකුම නීතිය පිළිබඳව විශේෂයෙන් දැනගත යුතුම කාරණා කිහිපයක් තිබෙනවා කියන එක මම විශ්වාස කරනවා. හැම සමාජයක්ම නීතියට අනුව පාලනය වන බව ඒ රටේ ජීවත් වන පුරවැසියෝ දැනගෙන ඉන්න

ඕනෑ. ඒ වාගේම නීතියට ගරු කිරීමේ සහ නීතියට අවනත වීමේ පුරවැසි වගකීම මොකක්ද කියන එක පිළිබඳවත් රටේ පුරවැසියන්ට අවබෝධයක් තිබෙන්න ඕනෑ. නීතියේ ප්‍රධාන පරමාර්ථ මොනවාද කියන එක සම්බන්ධයෙනුත් රටේ පුරවැසියන්ට අවබෝධයක් තිබෙන්න ඕනෑ. ජීවත් වීමේ අයිතිය හා දේපළ අයිතිවාසිකම් ආරක්ෂා වන අන්දමට මානව හැසිරීම් පාලනය කරගත යුතු බවට වූ අවබෝධයක් ද රටේ පුරවැසියන්ට තිබෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම සදාචාරාත්මක සමාජයක් ගොඩනඟා ගැනීම වාගේම ආකල්පමය වශයෙන් දියුණු මිනිසෙක් බිහි කර ගන්න නම් ඒ රටේ පුරවැසියන්ට නීති අධ්‍යාපනය ලබා දීම අත්‍යවශ්‍ය කාරණාවක් බවට පත් වනවා. එම නිසා නීතිගරුක, සදාචාරාත්මක හා විනයගරුක පුරවැසියන් බිහි කිරීම සඳහා ප්‍රායෝගික ජීවිතයට බලපාන නීතිමය කාරණා පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීමට අපි බලාපොරොත්තු වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දරුවන්ගේ ආරක්ෂාව, රැකවරණය හා ගෞරවය රැකීම වාගේම දරුවා නීතිය තුළ සවිබල ගැන්වීම තමයි පාසල් විෂය නිර්දේශයට නීතිය ඇතුළත් කිරීමේ අපේ ප්‍රමුඛ අරමුණ වෙලා තිබෙන්නේ. 2026 අවුරුද්දේ ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල මූලික පරමාර්ථය වන්නේ, විසිඑක්වන සියවසේ සහ ඉන් ඔබ්බට වූ අභියෝග ජයගැනීම සඳහා අඩිතාලම දැමීම සහ රටේ තිරසාර ජාතික සංවර්ධනය සහ සාමය සඳහා දරුවන් දායක කර ගැනීමයි.

විශේෂයෙන්ම 2021 වර්ෂයේදී පාසල් විෂය නිර්දේශයට නීතිය ඇතුළත් කිරීම සම්බන්ධයෙන් 2019 වර්ෂයේදී, ගරු පාර්ලිමේන්තුවේ තිබුණු කථා බහ යථාර්ථයක් බවට පත් කරන්නට අපේ ආණ්ඩුවේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇතුළේ ඉඩකඩ ලැබිලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු රුවන් මාපලගම මන්ත්‍රීතුමා කිව්වා වාගේ, ශ්‍රී ලංකා නීතිඥ සංගමයත් කියනවා, සිවිල් දැනුවත්භාවය හා ප්‍රජාතන්ත්‍රවාදී සහභාගිත්වය රටක පුරවැසියන්ගෙන් බලාපොරොත්තු වනවා නම් පාසල් විෂය නිර්දේශයට නීතිය ඇතුළත් කරන්න කියලා. ඒ ඉල්ලීම ඔවුන් කරනවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වනවා, 6 ශ්‍රේණියේ ඉඳලා මොඩියුල ක්‍රමය යටතේ පුරවැසි අධ්‍යාපන විෂය නිර්දේශය ඇතුළේ නීතිය රටේ දරුවන්ට උගන්වන්න. එය අපි අරමුණු කර ගන්නවා.

ඒ වාගේම 6 ශ්‍රේණිය ගත්තොත් "ජීවිතයට නීතිය", 7 ශ්‍රේණියේදී "ළමයා හා නීතිය", 8 ශ්‍රේණියේදී "පරිසරය හා නීතිය", 9 ශ්‍රේණියේදී "නීතිය හා සමාජ සුරක්ෂිතතාව", 10 ශ්‍රේණියේදී "පුරවැසියා හා නීතිය", 11 ශ්‍රේණියේදී "ආණ්ඩුව හා නීතිගරුක පුරවැසියා" කියන මාතෘකා යටතේ අපි බලාපොරොත්තු වනවා, රටේ දරුවන්ට නීතිගරුක පුරවැසියකු විධියට කොහොමද මේ රටේ ජීවත් වෙන්නේ කියන අවබෝධය ලබා දෙන්න. පාසල් විෂය නිර්දේශයට නීතිය කියන විෂය ඇතුළත් කරන්න අපි බලාපොරොත්තු වනවා. ඒ අනුව 6 - 9 ශ්‍රේණිවල අවසාන වාරයේදී අනිවාර්ය මොඩියුලයක් හැටියටත්, 10 සහ 11 ශ්‍රේණිවලදී අභිමතය පරිදි ඒ මොඩියුලය තෝරා ගැනීමටත් දරුවන්ට අපි අවස්ථාව දීලා තිබෙනවා. ඒ වාගේම අපේ සමාජය වසාගෙන පවතින සමාජ අපචාර වන කාන්තා හා ළමා අපයෝජන, මත් ද්‍රව්‍ය ව්‍යසන, මූල්‍ය අපරාධ, වංචා හා දූෂණ හා පාරිසරික විනාශ කියන ඒ සියලු ව්‍යසනවලින් තොර, අපරාධවලින් තොර රටක් නිර්මාණය කිරීම වෙනුවෙන් අපි පාසල් විෂය නිර්දේශයට නීතිය ඇතුළත් කරමින් දරු පරපුර පෙළ ගැස්වීම වෙනුවෙන් කටයුතු ආරම්භ කරන්නමේ වනකොටමේ වනකොට සූදානමින් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දඬුවමට ඇති බිය නිසා වැරදි නොකරන සමාජයක් වෙනුවට, නීතිමය තත්ත්ව පිළිබඳව අවබෝධයක් සහිත දියුණු මානවයෙක් සහිත සමාජයක් බිහි කරන්න අපට වුවමනා කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් 2026 අවුරුද්දේ ඉඳලා පාසල් විෂය නිර්දේශයට පුරවැසි අධ්‍යාපන විෂය යටතේ නීතිය ඇතුළත් කරමින්, නීතිගරුක සමාජයක් හෙට දවසේ බිහි කිරීමට අවශ්‍ය අඩිතාලම අපි දමා තිබෙනවා. මේ යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමාට මම නැවත වරක් ස්තුතිය පළ කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාටත් ස්තුතිය පළ කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Ajith P. Perera. You have five minutes to speak on this Private Members' Motion.

Order, please! Will an Hon. Member propose the Hon. Chanaka Madugoda to the Chair?

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

Sir, I propose that the Hon. Chanaka Madugoda do now take the Chair.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[අ.භා. 1.46]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදයේ ඉදිරියට යන්න කලින් මම එක දෙයක් දැනගන්න කැමැතියි. අපේ ගරු රුවන් මාපලගම මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි, මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන. අවසානයේ කථා කළ ගරු මන්ත්‍රීතුමිය කියපු විධියට දැනටමත් රජය තීරණය කරලා තිබෙනවා, ලබන වසරේ සිට විෂයයක් විධියට පාසල් විෂය නිර්දේශයට නීතිය ඇතුළත් කරන්න. ඒක හරිද? ඒක හරි නම් එය අතිශය සතුටට කරුණක්.

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිය විෂයයක් හැටියට ඇතුළත් කිරීම නොවෙයි, ලබන වසරේ සිට 6 වසරේ තුන්වැනි වාරයට පුරවැසි අධ්‍යාපනය විෂයයට නීතිය පිළිබඳ මොඩියුලයක් එකතු කරන්න අපි සූදානම් වෙලා ඉන්නවා. ඒ විධියටම පුරවැසි අධ්‍යාපනය විෂයට 6 වසර සිට 11 වසර දක්වා හැම වසරකම තුන්වැනි වාරයට නීතිය පිළිබඳ මොඩියුලයක් එකතු කිරීමට අපි සූදානමින් සිටිනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
දැනටමත් එකඟ වෙලා තිබෙනවා?

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)
ඔව්, එකඟ වෙලා තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එතැනිනුත් ඔබ්බට ගිහින් නීතිය සහ ආචාර ධර්ම සම්පූර්ණ විෂයයක් වශයෙන් එකතු කිරීමයි ඔබතුමාගේ යෝජනාව?

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)
ඔව්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බොහොම ස්තුතියි. ඒක හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම අපි රජයට ඒ වෙනුවෙන් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපි දීර්ඝ කාලයක් තිස්සේ මේ ගැන කථා කරලා තිබෙනවා. මේ සභාවේ මේ මාතෘකාව ගැන පෞද්ගලික මන්ත්‍රී යෝජනා යටතේ කථා කරන්න මම සම්බන්ධ වන තුන්වැනි විවාදය තමයි මේ. පසුගිය අවුරුදු 20ක විතර කාලය තුළ තුන් වතාවක් මේ යෝජනාව මේ සභාවේ විවාද කරලා තිබෙනවා. එහි ඉදිරි පියවරක් විධියට රජය ලබන වසරේ සිට දැනට තිබෙන පුරවැසි අධ්‍යාපනය විෂය නිර්දේශය තුළට නීතිය පිළිබඳ මොඩියුල වැඩිපුර එකතු කරන්න ගත්ත තීරණය වැදගත් එකක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා නීතිඥ සංගමය නිවැරදිව සඳහන් කරලා තිබෙන ආකාරයට අපේ රටේ අපි ගණිතය විෂයයක් වශයෙන් ඉගෙන ගන්නවා, විද්‍යාව විෂයයක් වශයෙන් ඉගෙන ගන්නවා, බුදු දහම විෂයයක් වශයෙන් ඉගෙන ගන්නවා, ඉංග්‍රීසි විෂයයක් වශයෙන් ඉගෙන ගන්නවා. අපි ඒ විෂයයන් විශේෂිතව යම්කිසි ප්‍රමාණාත්මක තත්ත්වයෙන් ඉගෙන ගන්නවා. මක් නිසාද? ඒවා අපේ ජීවිතයට වැදගත් වන නිසා. හැබැයි, නීතිය හැම ක්ෂේත්‍රයකදීම අපේ ජීවිතය සමඟ බැඳෙනවා. සෑම පුරවැසියෙක්ම නීතිය දැන සිටීම නෛතික වගකීමක් වාගේම, නොදැන සිටීම වරදක්. කිසිම අවස්ථාවක නිදහසට කරුණක් විධියට නීතිය නොදන්නවා කියලා කියන්න බැහැ. හැබැයි, නීතිය ප්‍රමාණවත් තරම් විධිමත් ලෙස ඉගෙන ගැනීමේ අවකාශයක් සාමාන්‍ය පුරවැසියන්ට අධ්‍යාපන ජීවිතය තුළ ලැබෙන්නේ නැහැ. අපරාධ නීතිය පිළිබඳ මූලික දැනුමක් ඕනෑම කෙනෙකුට අවශ්‍යයි. මූලික අයිතිවාසිකම් පිළිබඳ මූලික දැනුමක් ඕනෑම කෙනෙකුට අවශ්‍යයි. ඒ වාගේම ආචාර ධර්ම පිළිබඳ පුළුල් අවබෝධයක් ඕනෑම කෙනෙකුට අවශ්‍යයි. සිවිල් නීතිය පිළිබඳ, පරිපාලන නීතිය පිළිබඳ, ව්‍යවස්ථා නීතිය පිළිබඳ මූලික දැනුමක් හෝ අපට අවශ්‍යයි. හැබැයි, ඒ ප්‍රමාණවත් දැනුම දැනට අපේ විෂය නිර්දේශයේ නැහැ. ඒ නිසා අලුත් මොඩියුල තුළින් එය එකතු වෙනවා නම් සතුටුයි.

නමුත් මේ යෝජනාව ඉදිරිපත් කළ ගරු රුවන් මාපලගම මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි මේකට තවත් බරක් දීලා ඉදිරියට යන්න අවශ්‍යයි. මගේ යෝජනාව මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නීතිය පිළිබඳ විෂයයේ තිබෙන බැරෑරුම්කමත්, කෙනෙක් කුමන වෘත්තියකට ගියත් සාමාන්‍ය ජීවිතයේදී නීතිය අවශ්‍යයි කියන මූලික අවබෝධයත් තිබිය යුතුයි. ඒ සියල්ලෙන් ඔබ්බට ගිහින් ළමයෙකුට කැමැති නම් නීතිය තෝරා ගතහැකි විෂයයක් විධියට - optional subject එකක් විධියට - සාමාන්‍ය පෙළටත්, උසස් පෙළටත් හදාරන්න, විෂයයක් වශයෙන් විභාගයට ලියන්න අවස්ථාව දෙන්න ඕනෑ. නමුත් අපට කියන්න පුළුවන්, නීතිය නමින් අලුත්ම විෂයයක් අරගෙන ආවොත් දැනට තිබෙන තෝරා ගැනීම් අනුව පටලැවිල්ලක් ඇති වෙන්න පුළුවන් කියලා. නමුත් යම් ශිෂ්‍යයෙකුට සාමාන්‍ය පෙළදීත්, උසස් පෙළදීත් නීතිය විෂයයක් හැටියට හදාරන්න අවස්ථාව දෙනවා නම්, ඒක ගැටලුවක් වන්නේ නැහැ. ඒක ඒ ළමයාගේ තෝරා ගැනීම. මොකද, අද ළමයි එකම විෂය ක්ෂේත්‍රයක් ඉගෙන ගන්නේ නැහැ. සමහර වෙලාවට එක තැනකින් තොරතුරු තාක්ෂණය ගන්නවා, තව තැනකින් ව්‍යාපාර අධ්‍යයනය ගන්නවා, තව තැනකින් ඉංග්‍රීසි භාෂාව ගන්නවා. ළමයි ඒ විධියට විවිධ විෂයයන් තෝරා ගන්නවා; එකතු කිරීම් කරගන්නවා.

අපේ රටේ විශාල පිරිසක් අද ලන්ඩන් සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ කරනවා. ඒක Edexcel වුණත්, Cambridge වුණත්, ඒ හැම ළමයෙකුටම සාමාන්‍ය පෙළ විභාගයේදී නීතිය කියන විෂයය තෝරා ගන්න පුළුවන්. ඒ වාගේම උසස් පෙළටත් නීතිය කියන විෂයය තෝරා ගන්න පුළුවන්. එක පැත්තකින් නීතිය පිළිබඳව තිබෙන බර දැනට අනිවාර්යයෙන් ඉගෙන ගත යුතු විෂය නිර්දේශයට එකතු කරලා ඒක ශක්තිමත් කිරීමට යෝජනා කරන අතර, තෝරා ගන්නා විෂයයක් හැටියට - optional subject එකක් හැටියට - සාමාන්‍ය පෙළට හා උසස් පෙළට නීතිය විෂයය ඇතුළත් කිරීම සුදුසු, අත්‍යවශ්‍ය දෙයක් බව යෝජනා කරන්න මම කැමැතියි.

ඒ විෂයය ගැන විශේෂ කැමැත්තක් තිබෙන ශිෂ්‍යයන්ට එය විශේෂිතව හදාරා තමන්ගේ ජීවිතය නීති වෘත්තිය මඟට අරගෙන යන්න පුළුවන්. නීතිය හදාරන හැමෝම නීතිඥයන් විය යුතු නැහැ. නීතිය හදාරන අයට ලෝකයේ විවෘත වීම් ගොඩක් තිබෙනවා. ඒ නිසා මම මේ යෝජනාව අගය කරමින්, රජය දැනටමත් මේ අලුත් විෂය නිර්දේශයට වැඩිපුර යමක් එකතු කර තිබෙනවා නම් ඒකත් අගය කරමින්, එතැනිනුත් පියවරක් ඉදිරියට ගිහිල්ලා මේ යෝජනාව පරිදිම කටයුතු කරන්න ශක්තිය ලැබේවා කියාත් ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, පිළිතුරු කථාව ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න නියෝජ්‍ය ඇමතිතුමා. - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් මෙවැනි විවාදයකදී විෂය භාර ඇමතිවරයා පිළිතුරු කථාව කරලා රජය වෙනුවෙන් තමන්ගේ ස්ථාවරය ප්‍රකාශ කරනවා. නමුත්, එතුමා මේ විවාදය අවස්ථාවේ සභාවේ නොමැති වීම ගැන මම කනගාටු වෙනවා. ඒ වාගේම අමතර වශයෙන් මම යමක් කියන්නත් කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ රටේ විෂය නිර්දේශ සකස් කිරීමේදී තිබෙන ලොකුම අභියෝගයක් තමයි, "දැනටමත් විෂය කරුණු බොහොමයක් ඇත, දැනටමත් ළමයින්ගේ අධ්‍යාපන බර වැඩිය, දැනටමත් ළමයි ඕනෑවට වඩා දේවල් ඉගෙන ගන්නවාය, පාසල්වල ඉගැන්වීම සඳහා ගුරුවරුන්ට අවශ්‍ය කරන කාල පරිච්ඡේද නැත, ඒ නිසා අලුත් විෂයයන් එකතු කරන්න බැහැ" කියන එක. එතැනදී අවශ්‍ය වන දේ තමයි, මොකක්ද තෝරා ගැනීම, මොකක්ද ප්‍රමුඛතාව කියන එක, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

නීතිය පිළිබඳව අපි අනිවාර්යයෙන් දැනගන්නත් ඕනෑ. නීතිය නොදැන සිටීම නිදහසට කාරණයකුත් නොවෙයි. ලෝකයේ ජීවත් වන හැම තලයකම කෙනෙකුට නීතිය අවශ්‍යයි. ඉංජිනේරුවෙකුට වුණත් නීතිය අවශ්‍යයි, වෛද්‍යවරයෙකුට වුණත් නීතිය අවශ්‍යයි, ව්‍යාපාරිකයෙකුට වුණත් නීතිය අවශ්‍යයි. සාමාන්‍ය ගුරුවරයෙකුට, සාමාන්‍ය විදුහල්පතිවරයෙකුට, රාජ්‍ය සේවයේ යෙදෙන කෙනෙකුට, පෞද්ගලික අංශයේ ව්‍යවසායකයෙකුට තමන්ගේ ක්ෂේත්‍රවලට අදාළව නීතිමය දැනීම අවශ්‍යයි. හැබැයි, අවාසනාවකට එවැනි වෙලාවක ඒ බර, ඒ වටිනාකම දෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා තමයි ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් මේ පිළිබඳව විධිමත් යෝජනාවක් සම්මත කරලා අවශ්‍ය පියවර ගන්න කියලා විෂය භාර අමාත්‍යවරුන්ට දැනුම් දුන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කනගාටු වෙනවා, මේ තරම් වැදගත්, බරපතළ කාරණයක් ගැන මේ පාර්ලිමේන්තුවේ අද විවාද වෙනකොට ඊට පිළිතුරු දීම සඳහා අදාළ ඇමතිවරයා සභාව තුළ නොමැති වීම පිළිබඳව. අපේ ගරු රුවන් මාපලගම මන්ත්‍රීතුමා අද මේ විවාදයේදී වැදගත් කරුණු කිව්වා. ඒ සම්බන්ධයෙන් මොකක්ද රජයේ ස්ථාවරය? ඒක තමයි මටත් විවාදය ආරම්භයේදී,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමා තව තත්පර කීපයක් අරගෙන කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඇත්ත වශයෙන්ම මටත් ප්‍රශ්නයක් තිබෙනවා, මේ සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය මොකක්ද කියලා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් අවසර පතනවා, මේ පිළිබඳ යමක් පැහැදිලි කරන්න. මේ කටයුත්තේදී ස්ථාවර නියෝග අනුව ඉතා පැහැදිලිව ඇමතිවරයා උත්තර දිය යුතුයි. එසේ නොමැති නම් ස්ථාවර නියෝග 25 අනුව කටයුතු කළ හැකිද කියන කාරණය ඔබතුමා පරීක්ෂා කරන්න. මොකද, මේක ඊළඟ සභා වාරයට ඉදිරිපත් කළොත් මේ යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමාට ලොකු පාඩුවක් වෙනවා. මොකද, ඒ යෝජනාව ස්ථිර වෙලා ක්‍රියාත්මක නොවුණොත් ආණ්ඩු පක්ෂයේ ඒ මන්ත්‍රීවරයාට විශාල ගැටලුවක් පැන නඟිනවා. ඒ නිසා ස්ථාවර නියෝග 25 අනුව මේ යෝජනාව ඉදිරියට ගෙනියන්න පුළුවන්ද කියලා බලන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමා කියන කාරණය පැහැදිලියි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම මම කනගාටු වෙනවා, මේ තරම් බරපතළ -අනෙක් යෝජනා බරපතළ නැහැයි කියනවා නොවෙයි- රජයේ මන්ත්‍රීවරයෙක් ම ඉදිරිපත් කරපු බැරෑරුම්, වැදගත්, ශ්‍රී ලංකා නීතිඥ සංගමය මෑතකදී රජයේ අවධානයට ලක් කරපු, පාර්ලිමේන්තුවේ තුන්වැනි වරටත් ඉදිරිපත් කරපු -මගේ මතකයේ හැටියට පසුගිය වසර දෙක තුළත් ඉදිරිපත් කරපු - කාරණයක් සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය දක්වන්න විෂය භාර ඇමතිවරයා හෝ නියෝජ්‍ය ඇමතිවරයා මේ සභාවේ නොසිටීම පිළිබඳව. ඒක අතිශයින්ම කනගාටුදායකයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාගේ දැන් කථාව අවසන් කරන්න. ඔබතුමාට දීර්ඝ කාලයක් ලබා දුන්නා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

නීතිය නොදැනීම සමාවට කරුණක් නොවෙයි කියනවා වාගේම, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව ඇමතිවරයෙකුට සහ නියෝජ්‍ය ඇමතිවරයෙකුට පාර්ලිමේන්තුව තුළ තිබිය යුතු වගකීම පැත්තෙන් හිතුවත් මෙය කනගාටුදායකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න ඇමතිතුමිය.

[අ.භා. 1.57]

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව වෙනුවෙන් අදහස් දක්වන්නට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි.

[ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය]

අද දින ගරු රුවන් මාපලගම මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරපු පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ඇත්තටම ඉතා වැදගත් සහ කාලෝචිත යෝජනාවක්. ඊට පක්ෂ-විපක්ෂ භේදයක් නැතුව සහයෝගය ලැබෙනවා කියන එක අපි දන්නවා. මේ පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය ගරු අමාත්‍යවරිය හෝ ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් දැනුම් දෙනු ඇති. නමුත්, ඒ අතරවාරයේදී මම කාරණයක් කියන්න කැමැතියි. නීතිය කොයි ආකාරයටද විෂය මාලාවට ඇතුළත් වෙන්න ඕනෑ කියන එක සම්බන්ධයෙන් අපි අධ්‍යාපනය සම්බන්ධ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදීත්, වෙනත් යම් යම් අවස්ථාවලදීත් සාකච්ඡාවක් කළා. එහිදී තිබුණු අදහස තමයි, දැනට නීතිය උගන්වනවා, නමුත් ඒක ප්‍රමාණවත් මදි කියන එක. මොකද, ජනතාව එදිනෙදා ජීවිතයට අවශ්‍ය නීතිය, සිවිල් නීතිය ගැන දැනගත යුතුයි කියන ස්ථාවරයේ රජය ඉන්නවා. ඒ නිසා නීතිය විෂයයක් ලෙස පාසල් විෂය මාලාවට ඇතුළත් කළ යුතුයි කියන එක ගැන කිසිදු විවාදයක් නැහැ. ඒ කියන්නේ, එයට එකඟයි සහ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් ඒ සම්බන්ධව කටයුතු සිදු වෙන බවයි. නමුත්, මගේ දැනීමේ හැටියට ඒක ඇතුළත් කළ යුතු වන්නේ කොයි ප්‍රමාණයෙන්ද, ඇතුළත් කරන්නේ කොතැනදීද යන්න පිළිබඳ සාකච්ඡාව තවම අවසන් නැහැ. මම බලාපොරොත්තු වෙනවා, මේ ගැන ගරු ඇමතිතුමිය හෝ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා යම් අවස්ථාවකදී ප්‍රතිචාර දක්වයි කියලා. නමුත්, අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා රජයේ ස්ථාවරය ගැන අහපු නිසායි මම මේ ප්‍රතිචාරය දැක්වූයේ.

මට කථා කරන්න කාලය ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රුවන් මාපලගම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.58]

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පාසල් විෂය මාලාවට නීතිය ඇතුළත් කිරීම පිළිබඳව ඉදිරිපත් කරපු පෞද්ගලික මන්ත්‍රී යෝජනාව වෙනුවෙන් අද අදහස් දැක්වූ නීතිඥ ප්‍රියන්ත විජේරත්න මන්ත්‍රීතුමාට, ජනාධිපති නීතිඥ නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමාට, චතුරි ගංගානි මන්ත්‍රීතුමියට සහ නීතිඥ අජිත්.පී. පෙරේරා මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වෙනවා.

මේ යෝජනාව තුළින් දැනටමත් අපේ රටේ තිබෙන පුරවැසි අධ්‍යාපනය කියන විෂයය තවත් පුළුල් කර, මේ නීතියේ කොටස පුරවැසි අධ්‍යාපනය කියන විෂයයට ඇතුළත් කරලා, "නීතිය සහ පුරවැසි අධ්‍යාපනය" ලෙස වෙනස් කරමු යැයි මේ ගරු සභාවට මම යෝජනා කරනවා. පාසල් කාලයේ සිටම නීතිය පිළිබඳව නිසි අවබෝධයක් සහිත වුණාම, නීතිය අනුව ජීවත් වන්නේ කෙසේද, මොන ක්‍රියාවද නීත්‍යනුකූල වෙන්නේ, මොන ක්‍රියාවද නීති විරෝධී වෙන්නේ කියන ඒවා පිළිබඳව දරුවෙකුට අවබෝධයක් ලැබෙනවා. ඒ වාගේම කුඩා කල සිටම නීති අධ්‍යාපනය ලැබීම තුළින් දරුවන්ට අවබෝධයක් ලැබෙනවා, තමන් සතු අයිතිවාසිකම් සහ වගකීම් මොනවාද කියන කරුණු පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, චතුරි ගංගානි මන්ත්‍රීතුමියගේ අදහස් දැක්වීමේදී ප්‍රකාශ කළා වාගේම ලංකාවේ සිදු වන ඇතැම් ළමා අපචාර, නීතියට, පොලීසියට, අධිකරණයට වාර්තා නොවන්නේ එවැනි අපචාර සිදු නොවන නිසා නොවෙයි. ඒ අපචාරයට ලක් වූ දරුවා දන්නේ නැහැ, තමන්ට අපචාරයක් සිදු වුණු බව. ඇතැම් විට නීතිය පිළිබඳව තිබෙන නොදැනුවත්කම නිසා ඔහු හෝ ඇය සිතනවා, තමුනුත් එයට හවුල්කරුවෙක්ද කියලා. ඒ නිසාත් නීතිය කියන විෂයය පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීම වැදගත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඇතුළේ "නීතිය සැමට සමානව ක්‍රියාත්මක විය යුතුයි" කියන දෙය නව රජයේ ප්‍රතිපත්තියක් වෙනවා. නීතිය සැමට සමානව ක්‍රියාත්මක විය යුතුයි කියන කාරණය ගැන ලංකාවේ අනාගතය භාර ගන්න ඉන්න අපේ දරු පරපුරට පාසල් කාලයේ සිටම අවබෝධයක් දිය යුතුයි. පාසල් පන්ති කාමරය තුළදී කුඩා කල සිටම සැමට නීතිය සාධාරණ බවට අවබෝධය ලැබුණාම, අධ්‍යාපනයක් ලැබුණාම, දැනට අප රටේ පොදුවේ පිළිගන්නා ධනවතාට එක නීතියක්, බලවතාට එක නීතියක්, දේශපාලන බලය තිබෙන අයට එක නීතියක්, පවුල් පරිසරය අනුව තව කෙනෙකුට තව නීතියක් ආදී වශයෙන් සමාජයේ තිබෙන දුර්මත වෙනස් කිරීමට අපට හැකියාවක් ලැබෙනවා. නීතිඥ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා වාගේම මේ පාර්ලිමේන්තුව තුළ අවස්ථා ගණනාවකදී, දශක කිහිපයක් මේ ගැන සාකච්ඡා කර තිබෙනවා. නමුත්, ඒ කිසිම රජයකට හැකියාවක් ලැබිලා නැහැ, මේ පිළිබඳව මහ පොළොවේ වැඩ කරන, මහ පොළොව තුළ පැළ කරන යෝජනාවක් සම්මත කර ගන්න.

මෙය ජාතික ජන බලවේගය රජයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වෙමින් යන අවස්ථාවක් නිසා අධ්‍යාපන ඇමතිතුමිය වන ගරු අග්‍රාමාත්‍යතුමියට මම යෝජනා කරනවා, දැනට තිබෙන "පුරවැසි අධ්‍යාපනය" කියන විෂයයේ නම "නීතිය සහ පුරවැසි අධ්‍යාපනය" කියා වෙනස් කරමු කියලා. ඒත් එක්කම සමාජය තුළ, දරුවන් තුළ, දෙමාපියන් තුළ මේ විෂයයට තිබෙන හැඟීම, බර වැඩිවීම තුළ දරුවන් වැඩි ප්‍රමාණයක් 10 සහ 11 ශ්‍රේණිවලදී මේ විෂයය තෝරා ගැනීමටත් යොමු වෙයි කියලා මා අදහස් කරනවා.

ඒ වාගේම අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාගේ කථාවේදී යෝජනා කළා, අපොස සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ දරුවන්ට නීතිය වරණීය විෂයයක් හැටියට හදාරන්න, විභාග සඳහා ලියන්න තෝරා ගන්න අවස්ථාවක් දෙන්න යෝජනා කරමු කියලා. මා ස්තුතිවන්ත වෙනවා, එතුමාගේ ඒ යෝජනාවටත්. ඒ වාගේම මේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව වෙනුවෙන් අදහස් දැක්වූ සියලුදෙනාටත් ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 2.02]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම වැඩි කාලයක් ගන්නේ නැහැ. ඉතාම කෙටියෙන් අපේ ස්ථාවරය කියන්නම්. මෙය ඉතාම වැදගත් යෝජනාවක් හැටියට මා සලකනවා. අපි දැනටමත් පුරවැසි අධ්‍යාපනය කියන විෂයයට නීතිය පිළිබඳ කොටසක්

එකතු කරලා තිබෙනවා. මේ මගේ අතේ තිබෙන්නේ, 6 වැනි ශ්‍රේණියේ තුන්වැනි වාරයේ පුරවැසි අධ්‍යාපනය පිළිබඳ මොඩියුලය. ඒ මොඩියුලයේ objectives හැටියට තිබෙන්නේ, ශික්ෂිත සමාජයක් සඳහා නීතිය පිළිබඳව දැනුවත් වීම, නීතිය සමාජයේ යහපත උදෙසා ක්‍රියාත්මක වන ආකාරය විමර්ශනය කිරීම, දෛනික ජීවිතයේදී වැදගත් වන නීතිමය ලේඛන නිවැරදිව, උචිත පරිදි, වගකීම්සහගතව භාවිත කිරීම, එදිනෙදා ජීවිතයේදී නීතිගරුකව රටක් කිරීමෙන් යහ පුරවැසි ගුණාංග ප්‍රගුණ කිරීම, යහ පුරවැසි ගුණාංගවලට අනුගතව ජාතික සංවර්ධනයට දායක වීම කියන කරුණු. මේ, 6 වසරේ තුන්වැනි වාරයේ මොඩියුලය. ඒ අනුව 6, 7, 8 වසර වෙනකල්ම පුරවැසි අධ්‍යාපනයේ එක මොඩියුලයක් නීතිය වෙනුවෙන් වෙන් කරන්න අපි යෝජනා කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් තමයි අපි සූදානම් වෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ යෝජනාව වන්නේ මේකේ name change එකක් කරන්නය කියන එක. ඒ ගැන අපි සාකච්ඡා කරන්නම්. ඒ වාගේම අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා, O/L වලදී විෂයක් හැටියට -

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Optional subject එකක් හැටියට.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ඔව්, optional subject එකක් හැටියට මෙය හඳුන්වා දෙන්න කියන එක යෝජනා වුණා. මම හිතන විධියට, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා අලුත් විෂයයන් ගණනාවක් ඉදිරියට හඳුන්වා දෙන්න අපට පුළුවන් වෙනවා. එතැනදී නීතියත් විෂයයක් හැටියට හඳුන්වා දෙන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. ඒ ගැන අපි සාකච්ඡා කරමු. ඒ පිළිබඳව කිසිම විවාදයක් නැහැ. මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳවත්, ඒ ගැන කථා කරන්න මට කාලය ලබා දීම පිළිබඳවත් බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, යෝජනා අංක - පා. 46/2025 - ඉදිරිපත් කිරීම, ගරු වෛද්‍ය කවින්ද හේෂාන් ජයවර්ධන මැතිතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

## ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම

## தேசிய மருந்துகள் தர உத்தரவாத ஆய்வுகூடத்தை உரிய முறையில் தொழிற்படவைப்பதற்கான வேலைத்திட்டமொன்றைத் தயாரித்தல்

## FORMULATING A PROGRAMME FOR THE PROPER FUNCTIONING OF THE NATIONAL DRUG QUALITY ASSURANCE LABORATORY

[අ.භා. 2.04]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය පිහිටුවා මේ වන විට වසර 35ක් පමණ ගතවී ඇති හෙයින්ද, එම පරීක්ෂණාගාරය මේ වන විට නිසි පරිදි ක්‍රියාත්මක නොවන හෙයින්ද, ආනයනික ඖෂධ වැඩි ප්‍රමාණයක් නිසි තත්ත්ව පරීක්ෂාවකට ලක් නොවන හෙයින්ද, එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා නිසි වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට ගෙනෙන ඖෂධ සහ අපේ රටේ නිෂ්පාදනය කරන ඖෂධ ගුණාත්මක ඖෂධ බවට පත් කිරීමත්, ඒ ගුණාත්මක ඖෂධ රෝගීන්ට ලබාගත හැකි මිලකට ලබා දීමත් ප්‍රමුඛ කාර්යයක් වෙනවා. අපේ රටේ NMRA - National Medicines Regulatory Authority - එක තිබෙනවා. 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ තිබෙන්නේ, "safe, efficacious and good quality medicine provided to Sri Lankans ensuring the ability to afford the cost" කියලා. එතකොට අපි ඒ ආයතනයෙන් බලාපොරොත්තු වන කාරණා කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම කියන්න ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, according to a recent Audit Report, it seems that NMRA has doubled its profits in the last three financial years, and Sri Lanka does not have a well -equipped updated laboratory to test the quality of medicine. එතකොට ප්‍රධාන වශයෙන්ම National Medicine Quality Assurance Laboratory - NMQAL - එකක් ස්ථාපනය කරලා, ඒ තුළින් අපේ රටේ රෝගීන්ට අවශ්‍ය, තත්ත්වයෙන් උසස් ඖෂධ ලබා දීම සඳහා අපි කටයුතු කළ යුතුයි.

හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අවුරුදු 35කට වඩා පරණ මේ පරීක්ෂණාගාරය ජාත්‍යන්තර මට්ටමේ ඖෂධ පරීක්ෂණාගාරයක් ලෙස පවත්වාගෙන යෑමේ හැකියාවක් නැහැ. මොකද, මේක outdated. එතකොට පැහැදිලිවම මේකේ වගකීම තිබෙන්නේ NMRA එකේ Chairman වන වෛද්‍ය ආනන්ද විජේවික්‍රම මහත්මයාට. මේ ආයතනයේ දීර්ඝ කාලයක් වැඩ කරපු නිසා එතුමාට වගකීමක් තිබෙනවා, ආණ්ඩුවත් එක්ක කථා කරලා ඖෂධවල තත්ත්වය පරීක්ෂා කරන්න තත්ත්ව පරීක්ෂණාගාරයක් ස්ථාපනය කරන්න. රුපියල් බිලියන 5කට ආසන්න ප්‍රමාණයක් තමයි මේ පරීක්ෂණාගාරය ස්ථාපනය කළොත් අපට වියදම් කරන්න වෙන්නේ. එතකොට සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය බැලුවාම මේක ක්‍රියාත්මක කරන්න පුළුවන්. නමුත්, ඇයි මේ දේ ක්‍රියාත්මක කරන්නේ නැත්තේ කියන එක පිළිබඳව අපට සාධාරණ සැකයක් සහ ප්‍රශ්නයක් තිබෙනවා. Sir, far back in 2022 and 2023, it was a well-admitted fact by the Chairman of the NMRA, Dr. Ananda Wijewickrama, that NMRA laboratory facilities were not accredited by the Sri Lanka Accreditation Board.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇයි මේ නිලධාරින් වගකීම් විරහිතව කටයුතු කරන්නේ කියන එක පිළිබඳව පැහැදිලිවම අපට සාධාරණ සැකයක් මතු වෙනවා. අපට මතකයි, එදා කෙහෙළිය රඹුක්වැල්ල සෞඛ්‍ය ඇමතිවරයාගේ කාලසීමාව තුළ prednisolone නමැති ඖෂධය, ඒ තත්ත්වයෙන් බාල ඖෂධ ලබා දීමෙන් රෝගීන් 150කට ආසන්න ප්‍රමාණයකගේ ඇස් අන්ධ වුණා සදාකාලිකවත්, තාවකාලිකවත්. අපි මැදිහත් වෙලා ඒ රෝගීන් 17දෙනෙකුට විතර වන්දි ලබා දෙන්න පුළුවන් වුණා. හැබැයි, මේ ආණ්ඩුව පත් වුණත් ඉතුරු රෝගීන්ට වන්දි ලබා දීම සඳහා මැදිහත් වෙලා නැහැ.

ඒ වාගේම අපට මතකයි, bupivacaine, propofol වාගේ නිර්වින්දන ඖෂධ නිසා වෙච්ච දේ. මා ළඟ තිබෙනවා, ඒ වාර්තා. ඒ වාර්තා අනුව quality fail වෙච්ච, තත්ත්වයෙන් බාල ඖෂධ - substandard drugs - තුළින් අහිංසක රෝගීන්ගේ ජීවිත අහිමි වුණු බව පැහැදිලිව පෙනී යනවා. ඒ වාර්තා එදා අපි කෙහෙළිය

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

රඹුක්වැල්ලට එරෙහිව ගෙනාපු විශ්වාස භංග යෝජනාවේදී පැහැදිලිව ඉදිරිපත් කළා. රෝගීන්ට මේ ඖෂධ ලබා දෙන්නේ අප රට තුළ තත්ත්ව පරීක්ෂාවක් කරන්නේ නැතිවයි. රටට ගෙන්වන මේ ඖෂධ රෝගීන්ට ලබා දීමේදී සංකූලතා ඇති වනවාද කියන කාරණයට අවධානය යොමු නොකර ලබාදීමේ ප්‍රතිඵලය නිසා තමයි අහිංසක රෝගීන්ට ජීවිතවලින් වන්දි ගෙවන්න සිද්ධ වුණේ.

ඒ වාගේම 2024 වසරේ දහවෙනි මාසයේ නිකුත් කළ, human immunoglobulin නැමති ඖෂධය තත්ත්වයෙන් බාල බවට පෙන්නුම් කරන "Report on failing sample" නැමැති Report එක මගේ අතේ තිබෙනවා. ඒ Report මම **සභාගත*** කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ ඖෂධ ඉදිරිපත් කළා, ලබා ගත්තා, රෝහල්වලට ලබා දුන්නා. එතකොට NMRA එකේ සභාපතිතුමා ඇතුළු ඒ කණ්ඩායමට වගකීමක් තිබෙනවා, මේකට මැදිහත් වෙච්ච අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්නත්, ඒ මුදල් නැවත ලබා ගන්නත්. ඒ නිසා මේ රටේ ඖෂධ පිළිබඳව කථා කරනකොට අපි පැහැදිලිව කියනවා, මේ රටට අනිවාර්යයෙන්ම ඖෂධ තත්ත්ව පරීක්ෂණාගාරයක් ස්ථාපනය කළ යුතුයි කියලා. මේ රටට ගෙන්වන ඖෂධත්, මේ රටේ නිෂ්පාදනය කරන ඖෂධත් උසස් තත්ත්වයේ තිබෙනවාද කියලා පරීක්ෂා කරලා, ඉන්පසු රෝගීන්ට ලබා දෙන්න අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීම අපි කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.11]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු කවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමා විසින් ගෙනාපු යෝජනාව ස්ථිර කරමින්ම, එතුමා කථා කළ කාරණාවලට පරිබාහිර කාරණා කිහිපයක් කථා කරන්න මා බලාපොරොත්තු වෙනවා.

ඔබතුමන්ලා දන්නවා කාලයක් තිස්සේ සෞඛ්‍ය සේවාව සම්බන්ධව, විශේෂයෙන් ඖෂධ සම්බන්ධව මේ රටේ ඇති වුණු ප්‍රශ්න ගැන. ඉතිහාසයේ පළමුවෙනි වතාවට හිටපු කැබිනට් අමාත්‍යවරයෙකු හිර ගෙදරට ගිය කාලයක් මේ. ඖෂධයක් කියන්නේ ජීවිතයක්. ඒ ජීවිතය රැක දීම අප සියලුදෙනාගේ වගකීම. ඒ ජීවිතය රැක දෙන්න අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ඒ කටයුතු පාලනය කිරීම, පරිපාලනය කිරීම ආදි සියල්ල කළ යුත්තේ සහ එයට විධානය දිය යුත්තේ ආණ්ඩුව හැටියට තමුන්නාන්සේලායි. විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යතුමා සහ ජනාධිපතිතුමා ප්‍රමුඛ කණ්ඩායමයි. නමුත්, අපි දකිනවා එහි විශාල අඩුපාඩු රාශියක් තිබෙන බව.

NMRA එක ගැන කාලයක් තිස්සේ කථා කරනවා, එහි සභාපතිවරයා ගැන කථා කරනවා. ඇත්තටම එතැන අධ්‍යක්ෂ මණ්ඩලයේ ඖෂධවේදියෙක් නැහැ; ඖෂධ ගැන දන්නා කෙනෙක් නැහැ. අපි දන්නවා ඒ අය හොඳ දොස්තර මහත්වරු බව; දක්ෂ අය බව; වෛද්‍ය වෘත්තියේ හොඳින් වැඩ කරන අය බව. හැබැයි ඒ අයට ඖෂධ නියාමනය සම්බන්ධ ප්‍රමාණවත් දැනුමක් තිබෙනවාද? අපේ රට වටේට තිබෙන අනෙක් රටවල් ගත්තාම ඒ හැම රටකම ඖෂධ නියාමනය කරන අය හැටියට ඖෂධවේදීන් ඇතුළු ඖෂධ ගැන දන්නා, හදාරා තිබෙන කණ්ඩායම් තමයි ඉන්නේ. හැබැයි මෙහේ එහෙම නොවෙයි. මේ කියපු සභාපතිවරයා ගැන විශේෂයෙන් කිව යුතුයි. දේශීය ඖෂධ නිෂ්පාදනාගාර සම්බන්ධයෙන් ඔහුගේ ක්‍රියා කලාපය කුමක්ද? දේශීය වශයෙන් ඖෂධයක් නිෂ්පාදනය කරනවා නම්, අද මේ රටේ ආර්ථික තත්ත්වය අනුව, ඒ ඖෂධ නිෂ්පාදනය කරන අයට අතහිත දෙන එක විතරක් නොවෙයි, ඒ අය ශක්තිමත් කරන එක, ඒ අය දිරිමත් කරන එක, ඒ අයගේ ක්‍රමවල අඩු පාඩුවක් තිබෙනවා නම් ඒවා සකස් කරන එක රජයේ වගකීමයි. හැබැයි NMRA එකේ සභාපතිවරයා ප්‍රමුඛ ඒ කණ්ඩායම -විශේෂයෙන්ම වෛද්‍ය ආනන්ද මහත්මයා- ක්‍රියාත්මක වෙන්නේ පිට රටවල multinational companiesවලට වාසිසහගත වන විධියට. ඉතිහාසයේ පළමුවෙනි වතාවටයි, NMRA එකේ සභාපතිවරයා තැන් තැන්වල චැනල් සේවාව ලබා දෙන්නේ. පෞද්ගලික ආයතනවල චැනල් සේවය ලබා දෙන කෙනෙක් කොහොමද ඖෂධ නියාමනය සම්බන්ධයෙන් තිබෙන ආයතනයේ සභාපතිවරයා හැටියට කටයුතු කරන්නේ? එහෙම නම්, මෙතැන තිබෙන ප්‍රශ්නය මොකක්ද කියලා හරියට හඳුනා ගන්න ඕනෑ. මෙතැන යම් ආකාරයක කුමන්ත්‍රණයක් තිබෙනවා. ඒ කුමන්ත්‍රණය සිදු වෙන්නේ කොතැනින්ද කියන බරපතළ ප්‍රශ්නය අපට තිබෙනවා. දේශීය කර්මාන්තකරුවා ඖෂධ නිෂ්පාදනය කරනවා. එක පැත්තකින්, ඒ කර්මාන්තකරුවා සම්පූර්ණයෙන් කඩා වට්ටනවා, එයා දිරිමත් කරන වැඩසටහන් ක්‍රියාත්මක කරන්නේ නැහැ. අනෙක් පැත්තෙන්, multinational companies එක්ක තමයි ගනුදෙනුව තිබෙන්නේ, ඒ ආයතන රැක ගන්න තමයි වැඩසටහන් ක්‍රියාත්මක කරන්නේ.

විශේෂයෙන් වෛද්‍ය රසායනාගාරය ගැනත් මා කිව යුතුයි. ඒ සම්බන්ධව අප ළඟ තොරතුරු තිබෙනවා. එතුමා මීට අවුරුද්දකට පෙර COPE එකට ඇවිල්ලා පොරොන්දුවක් දීලා ගිහින් තිබෙනවා, එය දියුණු කරනවා, ඒ වෙනුවෙන් ක්‍රියා කරනවා, එය ලෝකයේ අනෙක් රටවල් හා සමානවම දියුණු තත්ත්වයට පත් කරනවා කියලා. දියුණු තත්ත්වයට පත් කරනවා තියා අද වනකල් ඒකට අත තියලා නැහැ. ඒක බරපතළ ප්‍රශ්නයක්. ඇයි ඒක නොකරන්නේ?

අපි දන්නවා සෞඛ්‍ය අමාත්‍යාංශය භාර ගරු අමාත්‍යවරයා ඒ වැඩ කොටස කරන්න ලොකු වෙහෙසක් ගන්නවා කියලා. හැබැයි ඒ වැඩ කොටසට ශක්තිය ලබා දෙනවාද ඒ ආයතනයෙන්? මොකක්ද ඒ අය කරන්නේ? ඇයි ඒ සභාපතිතුමා තියාගෙන ඒ ආයතනය තව තවත් පල් කරන්නේ? ඒ ආයතනය පල් කරන්නේ ඇයි කියන එක බරපතළ ප්‍රශ්නයක්.

විශේෂයෙන්ම ඒ සභාපතිවරයාට විරුද්ධව චෝදනා විශාල ප්‍රමාණයක් එල්ල වෙනවා. මට මෙතැනදී ඒ චෝදනා එකින් එක කියන්න බැරි නිසා ඒවා සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා, විශේෂයෙන් ප්‍රශ්න හැටියට. ප්‍රශ්න කිහිපයක්, ප්‍රශ්න 15කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. ඒ ප්‍රශ්න ටික සභාගත කරන්න මම බලාපොරොත්තු වෙනවා. අපි රජයෙන් සහ ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා NMRA එකේ සභාපතිවරයා සම්බන්ධව කරුණාකර තීන්දුවක් ගන්න කියලා. එසේ තීන්දුවක් ගත්තේ නැත්නම් ඉදිරි කාලය තුළ ඒ සියලු වගකීම් ඔබතුමන්ලාට භාර ගන්න සිද්ධ වෙයි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඊළඟට, ඖෂධ හිඟය සම්බන්ධයෙන් තීන්දු නොගත්තොත් රටේ ඖෂධ නැතිව ජනතාව තැන් තැන්වල මිය ගියාම අන්න ඒ වගකීමත් ඔබතුමන්ලාට බාර ගන්න සිද්ධ වෙයි. දේශීය කර්මාන්තකරුවන් කඩා වට්ටලා, විදේශීය නිෂ්පාදකයන්ට, එහෙම නැත්නම් විදේශීය වෙළෙන්දන්ට අවශ්‍ය සහයෝගය ලබා දීම තුළින් රටට ලැබෙන්න තිබෙන විදේශ විනිමය අහිමි වෙනවා. දේශීය නිෂ්පාදකයන් බොහෝ වෙලාවට ඖෂධ අපනයනය කරනවා.

එම අපනයනය සඳහා ඔවුන්ට අවස්ථාව ලබා දෙන්න ඕනෑ. එක පැත්තකින්, එය ලංකාවට කීර්තියක්. අනෙක් පැත්තෙන්, විදේශ විනිමය උපයා ගැනීමේ මාර්ගයක්. ඒ සියලු කටයුතු කඩාකප්පල් කිරීම සම්බන්ධ වගකීම් ටික ඇමතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව භාරගන්න ඕනෑ.

ඒ වාගේම, අපි විශේෂයෙන් මතක් කරනවා ඖෂධවල තත්ත්ව පරීක්ෂාව ගැන. එම කටයුතු සිදු කරන රසායනාගාරවල තිබෙන අඩුපාඩු නිසා මේ රටේ සෞඛ්‍ය පැත්ත ගැන ආණ්ඩුවට නැවත වතාවක් බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු විය හැකියි. ඒ වගකීම ඔබතුමන්ලාගේ කර මත තිබෙනවා. විශේෂයෙන්ම NMRA එකේ සභාපතිවරයාගේ ක්‍රියා කලාපය පිළිබඳ වගකීම භාර ගනිද්දී, ප්‍රශ්න සියල්ල එකට කැටි වෙලා, එක ගොන්නක් හැටියට තමයි ඔබතුමන්ලාගේ කර මතට එන්නේ. එම නිසා ඒ සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්න. මම මේ අවස්ථාවේ එම ප්‍රශ්න ටික **සභාගත*** කරනවා.

මම මේ ප්‍රශ්න ටිකට පිළිතුරු බලාපොරොත්තු වෙනවා. මේ මොහොතේ -මේ කාල සීමා තුළ- මේ සියල්ල ගැන කථා කරන්න වෙලාවක් නැති නිසායි මා මෙම ප්‍රශ්න ටික සභාගත කරන්නේ.

ඒ වාගේම, මම විශේෂ ඉල්ලීමක් කරනවා. හිතන්න එපා, මේක පුංචි කාරණයක් කියලා. අප පොඩි වෙලාවක් තුළ කථා කළත් මෙය සැහැල්ලුවට ගන්න එපා. මේ සම්බන්ධයෙන් විධිමත්ව තීන්දු තීරණ අරගෙන මේ රටේ සෞඛ්‍ය අංශයේ තිබෙන ප්‍රශ්න ටික, විශේෂයෙන්ම NMRA එකේ තිබෙන ප්‍රශ්නය සහ වෛද්‍ය රසායනාගාර සම්බන්ධ ප්‍රශ්න ටික විසඳලා මේ රටේ ජනතාවට විධිමත් සෞඛ්‍ය සේවාවක් ලබා දෙන්න කියා අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.18]

**ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜகத் குணவர்தன)
(The Hon. (Dr.) Jagath Gunawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම" මැයෙන් විපක්ෂයේ ගරු වෛද්‍ය කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමට මාහට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා.

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ පවතින ආයතනයක්. ගුණාත්මක, ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී, නිවැරදි තත්ත්වයෙන් යුත් ඖෂධ සහ වෛද්‍ය උපකරණ මහ ජනතාවට ලබා දීමේ මූලික අරමුණ තමයි NMRA එකට තිබුණේ. NMRA එකේ මූලික අරමුණ එය වුවත්, පසුගිය රජයයන් පැවැති කාලවලදී ඒ මූලික අරමුණ හරියාකාරව ඉටු නොවුණු බව අපි කවුරුත් දන්නවා. ඉහත කී අරමුණ ඉටු කර ගැනීම සඳහා ස්ථාපිත කර ඇති, ඒ සඳහා විශාල වශයෙන් තාක්ෂණික සහාය ලබා දෙන, NMRA එක යටතේ තිබෙන ආයතනයක් තමයි "ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය" කියන්නේ. ඖෂධ සහ වෛද්‍ය උපකරණවල තත්ත්ව සහතික පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය එම පරීක්ෂණාගාරවලින් සපයනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය ස්ථාපිත කරලා තිබෙන්නේ 1990දී. එය ආරම්භ කරලා දැනට අවුරුදු 35ක් පමණ වෙනවා. එහි මූලික කාර්යය වන්නේ, නිෂ්පාදනවල ගුණාත්මකභාවය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය, ඒ කියන්නේ quality, safety and efficacy තීරණය කිරීම සඳහා අවශ්‍ය රසායනාගාර පරීක්ෂණ පැවැත්වීමයි. ඇත්තටම එම ආයතනය තුළ ඉතාම සංවිධානාත්මක වැඩ පිළිවෙළක් තිබෙනවා. දේශීයව නිෂ්පාදනය කරන වාගේම ආනයනය කරන ලද ඖෂධ හා වෛද්‍ය උපකරණ බෙදා හැරීමේ දාමයේ විවිධ අවස්ථා විශ්ලේෂණය කිරීම මෙම රසායනාගාරය තුළින් සිද්ධ වෙනවා. ඒ වාගේම පූර්ව අළෙවිකරණ සහ පශ්චාත් අළෙවිකරණ අදියර විශ්ලේෂණය කිරීමත් ඒ මඟින් සිදු වෙනවා. මෙහිදී රජයේ ආයතනවලින් මෙන්ම පෞද්ගලික ආයතනවලින් එකතු කරන samples පරීක්ෂා කිරීම, විශ්ලේෂණය කිරීම සිදු වෙනවා. නොයෙකුත් samples පරීක්ෂා කිරීම, ඒ කියන්නේ ලියාපදිංචි කර නැති ඖෂධ සහ එම ඖෂධ ලියාපදිංචි කරන අවස්ථාවේදී යම්කිසි පැමිණිල්ලක් ආවාම ඊට අදාළ samples හෙවත් පැමිණිලි නියැදි, ඒ වාගේම ටෙන්ඩර් නියැදි සහ නිරීක්ෂණ නියැදි ආදි samples පරීක්ෂාව එහිදී සිදු කරනු ලබනවා.

මෙහි ප්‍රධාන අංශ වශයෙන් රසායනික අංශයක් තිබෙනවා, ක්ෂුද්‍ර ජීව අංශයක් තිබෙනවා, ජීව විද්‍යාත්මක අංශයක් තිබෙනවා. ඒ වාගේම ක්‍රමාංකන අංශයක් තිබෙනවා, උපකරණ අංශයක් තිබෙනවා. මෙවැනි සංවිධානාත්මක වැඩ පිළිවෙළක් මේ ආයතනය තුළ තිබුණත්, එම පරීක්ෂණාගාරයෙන් බලාපොරොත්තු වුණු අරමුණ පසුගිය කාලයේ සිද්ධ වුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගුණාත්මක, ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී, නිවැරදි තත්ත්වයෙන් යුත් ඖෂධ මහජනතාවට ලබා දෙන බවට වූ මූලික අරමුණ සාක්ෂාත් කර ගැනීමට ස්ථාපිත කර ඇති NMRA එකට සමහර විශේෂ, හදිසි අවස්ථාවලදී ඖෂධ ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතික නිකුත් කරන්න සිද්ධ වුණා. හදිසි අවස්ථාවලදී ඖෂධ ලියාපදිංචි කරන්නේ නැතුව ඒවාට තත්ත්ව සහතික නිකුත් කරන්න සිද්ධ වුණා. පවතින නීති රීතිවලට අනුගතව හා ඖෂධවල ගුණාත්මකභාවය තහවුරු කර

---

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා]

ගනිමින් ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතික නිකුත් කරන්න සිද්ධ වුණා. නමුත් පසුගිය රජයන් පැවති කාලවලදී ඒ දේ හරියට සිද්ධ වුණේ නැහැ. ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතික නිකුත් කිරීමේදී තාක්ෂණික කමිටුවක නිර්දේශය මත එය සිදු කළ යුතු වුවත්, ඒ අවම ක්‍රමයෙන් බැහැරව, විශේෂ ක්‍රමයක් - special pathway එකක් - යටතේ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික නිකුත් කිරීමට ඔවුන් කටයුතු කළා. ඒ අනුව ඉතා බාල ඖෂධ මේ රටට ගෙනෙනු ලැබුවා. ඒ හරහා රෝගීන් විශාල සංඛ්‍යාවක් අනතුරට පත් වුණා. ඖෂධවල ගුණාත්මකභාවය, ආරක්ෂාකාරී බව පරීක්ෂා කෙරෙන බවට තහවුරු කෙරෙන අවම ක්‍රමයකින් හෝ තොරව ඒ special pathway එක හරහා රටට ඖෂධ ගෙන්වා රෝගී ජනතාව අනතුරට ලක් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, NMRA එක ඖෂධවල ගුණාත්මකබව, ආරක්ෂාකාරීබව සහ ප්‍රත්‍යක්ෂබව පිළිබඳව වගවෙන, වගකියන ආයතනයක් ලෙස ස්ථාපිත වෙලා තිබුණත්, පසුගිය රජයන් පැවති කාලවලදී ඖෂධ හා උපකරණ පිළිබඳ විශාල දූෂණ හා අක්‍රමිකතා සිදු වුණු බව කවුරුත් දන්නවා. විශේෂයෙන්ම Human Immunoglobulin හා Rituximab ඇතුළු ඖෂධ 5ක ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී හා ඖෂධ සැපයීමේදී සැපයුම්කරු විසින් සිදු කළ වංචාසහගත ක්‍රියා නිසා රෝගීන්ගේ ජීවිත බරපතළ අවදානමකට ලක් වුණා. හදිසි මිලදී ගැනීම්වලට මුවා වී හිටපු සෞඛ්‍ය ඇමති ඇතුළු ඉහළ නිලධාරීන් කළ බාල බෙහෙත් වංචාව ගැන මුළු සමාජයම දන්නවා. පෞද්ගලික වාසි මත නිසි ලියාපදිංචිය නොමැති ඖෂධ සැපයුම්කරුවන් හරහා බාල බෙහෙත් වර්ග රටට ගෙන්වා රෝගීන්ගේ ජීවිත අනතුරේ හෙළනු ලැබුවා විතරක් නොවෙයි, සෞඛ්‍ය පද්ධතිය කෙරෙහි ජනතාව තැබූ විශ්වාසය ඔවුන් නැති කළා. එහිදී ඇතැම් රෝගීන්ට වන්දි ගෙවන්න වුණේ ජීවිතවලින්. සමහර අයට සදාකාලිකවත්, සමහර අයට අර්ධ වශයෙනුත් ආබාධිත තත්ත්වයට පත්ව වන්දි ගෙවන්න සිද්ධ වුණා. මේ සියල්ලම සිද්ධ වුණේ පැවති දූෂිත දේශපාලන සංස්කෘතියේ වැරැද්දෙන්. ඒ නිසා මේ රටේ ජනතාව මීට අවුරුද්දකට කලින් නිවැරදි හා බුද්ධිමත් තීරණයක් අරගෙන පැවති තත්ත්වය වෙනස් කරලා ජනතාවාදී රජයක් පිහිටෙව්වා. ඒ අනුව පැවති දූෂිත දේශපාලන සංස්කෘතිය සියයට 100කින්ම වෙනස් වුණා. අද වනවිට වංචා, දූෂණ, අක්‍රමිකතා නැති ජනතාවාදී දේශපාලන සංස්කෘතියක් රටේ ඇති වෙලා තිබෙනවා.

ඒ වෙනස NMRA එක ඇතුළු රටේ සියලු ආයතන තුළට, අංශවලට සම්ප්‍රේෂණය වෙලා තිබෙනවා. මේ රජය පත්වීමෙන් පසුව NMRA එක තුළ විශාල වෙනස්කම් සිදු වී තිබෙනවා. එහි තත්ත්ව පාලන පරීක්ෂණාගාරයේ වෙනස්කම් රාශියක් සිද්ධ වෙලා තිබෙනවා. එහි මානව සම්පත දියුණු වෙලා තිබෙනවා. යටිතල පහසුකම් දියුණු වෙලා තිබෙනවා. ඖෂධ විශ්ලේෂක තනතුරු ප්‍රමාණය 15කින් පමණ වැඩි කරලා තිබෙනවා. පරීක්ෂණාගාර ධාරිතාව 4ගුණයකින් වැඩි කර තිබෙනවා. ඒ වාගේම පරීක්ෂණ සිදු කරන්න අවශ්‍ය උපකරණවල ප්‍රමාණය වැඩි කර තිබෙනවා. පශ්චාත් අලෙවිකරණ සාම්පල පරීක්ෂාව වාගේම පූර්ව අලෙවිකරණ සාම්පල පරීක්ෂාවද ඉතා කාර්යක්ෂම ලෙස සිද්ධ වෙනවා, මේ වනවිට. ඒ එක්කම ආනයනික සෑම ඖෂධ වර්ගයකටම තත්ත්ව සහතිකයක් දෙන්න බලාපොරොත්තු වෙනවා. අපි ඒ අනුව කටයුතු කරගෙන යනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜகத் குணவர்தன)
(The Hon. (Dr.) Jagath Gunawardana)
දැන් NMRA එකේ ගොඩ ගැසී තිබුණු පොරොත්තු ලේඛනවල තිබුණු ඖෂධ ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනම් වෙලා තිබෙනවා. ඒ අනුව බලපුවාම මෙම ආයතනයේ කාර්යභාරය ඔස්සේ වඩාත් යහපත් සෞඛ්‍ය තත්ත්වයක් රටේ ජනතාවට ලබා දීම සඳහා ජනතාවාදී ලෙස ක්‍රියාත්මක වෙමින් පවතිනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.27]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දසවන පාර්ලිමේන්තුවේ ගෙවුණු අවුරුද්දක කාලය තුළ ගෙනෙන ලද පෞද්ගලික මන්ත්‍රී යෝජනාවලින්, - මේ අවුරුද්දේ විතරක් නොවෙයි, මම පාර්ලිමේන්තුවට පැමිණි පසු - හොඳම පෞද්ගලික මන්ත්‍රී යෝජනාව අද කවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමා ගෙනැවිත් තිබෙනවා. අපි රටේ තිබෙන බෙහෙත්වල ගුණාත්මකභාවය ආරක්ෂා කර ගන්න ඕනෑ. මොකද, අපි බෙහෙතක් ගන්නේ තවත් ලෙඩ වෙන්න නොවෙයි. ඒක තමයි ගිය ආණ්ඩුවට එල්ල වුණු ලොකුම චෝදනාව. රටේ ජනතාව තමන්ගේ දරුවන්ට, තමන්ගේ පවුලේ අයට, තමන්ට බෙහෙතක් ගන්නේ සනීප වෙන්න. ඒ හින්දා මේ යෝජනාවට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා. පාර්ලිමේන්තුවේ ඉන්න තවත් එක් වෛද්‍යවරයෙක් වෙන්නේ නැතිව ඉස්සරහට ඇවිල්ලා මේ ආණ්ඩුවේ නලින්ද ජයතිස්ස අමාත්‍යවරයා සහ නියෝජ්‍ය අමාත්‍යවරයා මේකට මැදිහත් වෙලා අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරයි කියලා අපි විශ්වාස කරනවා. ඒ සඳහා විපක්ෂයේ පූර්ණ සහයෝගය ලබා දෙන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව පත්වෙලා අවුරුද්දකට ආසන්න කාලයක් වෙනවා. හැබැයි, මේ අවුරුද්දකට ආසන්න කාලය තුළ කලින් ආණ්ඩුවට චෝදනා කරනවා හැරෙන්න මේ බෙහෙත්වල අඩුපාඩු සම්බන්ධයෙන් ගත්ත කිසිම විසඳුමක් නම් අපට පේන්නේ නැහැ. මගේ ළඟ තිබෙනවා, ලැයිස්තුවක්. මේ ලැයිස්තුවෙන් කිහිපයක් විතරක් මම කියන්නම්. ලංකාවේ මේ වෙද්දී කරන්නේ නැතිව නැවතුණු surgeries රාශියක් තිබෙනවා. ඉන් කිහිපයක් පමණක් මම කියන්නම්. ඊට අමතරව නැති වෙච්ච IVs රාශියක් තිබෙනවා. මම පළමුවැනි එක කියන්නම්. ගරු නියෝජ්‍ය ඇමතිතුමා ගොඩක් කථා කළ එකක් තමයි Papaverine කියන IV එක. මම හිතනවා, මේක IV එකක් කියලා. එතුමා දිගටම කිව්වා, මේක රුපියල් 70,000ක් වෙනවා, මේක ගණන් වැඩියි කියලා. ඒ වාගේම එතුමා කිව්වා, මේක රුපියල් 300ට ගේනවා කියලා. ඊළඟට කිව්වා, රුපියල් 50,000ට, රුපියල් 40,000ට ගේනවා කියලා. ආපහු රුපියල් 300ට දුන්නා කිව්වා. හැබැයි, අද ලංකාවේ කිසිම රජයේ රෝහලක ඒක නැහැ. නමුත් අද ඒක පෞද්ගලික අංශයෙන් මිලදී ගන්නවා. හැබැයි, ඒක රුපියල් 70,000ක් වෙනවාද එහෙම නැත්නම් රුපියල් 80,000ක් වෙනවාද කියලා දන්නේ නැහැ. ඊට අමතරව Metaraminol කියලා IV එකක් තිබෙනවා. මේක වෛද්‍යවරු නිර්දේශ කරන්නේ low blood pressureවලට. Blood pressure අඩු වුණාම තමයි මේක නිර්දේශ කරන්නේ. මේකත් අද රෝහල්වල නැහැ.

වෛද්‍යවරු low blood sugar ආවාම Dextrose දෙනවා. මේකත් අද රෝහල්වල නැහැ. ඊළඟට Maxolon කියලා IV එකක් තිබෙනවා. ඒක, වෛද්‍යවරු නිර්දේශ කරන්නේ pregnant අයට වමනය - vomiting - එනවා නම්. ඒ වාගේම මේක cancer patientsලාටත් ලබා දෙනවා. මේ බෙහෙතත් මේ වෙද්දී කිසිම රෝහලක නැහැ. ඊළඟට Verapamil කියලා oral drug එකක් තිබෙනවා. මේක වෛද්‍යවරු නිර්දේශ කරන්නේ high blood pressureවලට. ඒකත් මේ වෙනකොට රෝහල්වල නැහැ. ඒ වාගේම paracetamol suppository එකත් රෝහල්වල නැහැ.

ඒ වාගේම Naloxone කියලා බෙහෙතක් තිබෙනවා. මේක drug overdose වුණාම වෛද්‍යවරු නිර්දේශ කරන බෙහෙතක්. සාමාන්‍යයෙන් drugs overdose වෙන්න පුළුවන්. මොනවා හරි medication එකක් overdose එකක් වුණ ගමන් breathing slow වෙන්න පුළුවන්. Breathing slow වෙලා විනාඩි 3ක් ඇතුළත මේ බෙහෙත දුන්නොත් ජීවිතය බේරා ගන්න පුළුවන්. ඒ බෙහෙතත් අද රෝහල්වල නැති තත්ත්වයක් තමයි උදා වෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම මම 2025 ජූලි 4 වැනි දින "ඩේලි මිරර්" පුවත් පතට අවධානය යොමු කරන්න කැමැතියි. එහි මෙහෙම තිබෙනවා, I quote:

> "Patients .......at the Colombo National Hospital are compelled to bring surgical and pharmaceutical items from outside, costing over Rs. 100,000 due to a severe shortage of critical drugs and surgical supplies..."

They include,

> "... antibiotics, heart medication, special pain killers and several other essential items..."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කාට හරි bypass surgery එකක් කර ගන්න ඕනෑ නම් ලංකාවේ තිබෙන්නේ කොළඹ, කරාපිටිය, නුවර, එහෙම නැත්නම් Jaffna කියන රෝහල්. සාමාන්‍යයෙන් ආසන්න වශයෙන් දවසකට operations 15ක් විතර කරන්න වෙනවා. මේ operation එක කරන්න ඕනෑ නම් අද රෝගියෙක් රුපියල් ලක්ෂයක් අතේ අරගෙන තමයි යන්න ඕනෑ. මොකද, රෝහලට ගියාම ඔහුට ලියලා දෙනවා බෙහෙත්. අද වනකොට රෝහලේ වෛද්‍යවරයෙකුට ඒක ලියන්නත් බැහැ. මොකද, මෙතුමන්ලා ඒකත් තහනම් කරලා තිබෙන්නේ. හරි නම් ඒක Directorට දීලා ඒ විධියට එන්න ඕනෑ. හැබැයි, රෝගියා ආවාම වෛද්‍යවරයාට ඒක නොලියා ඉන්නත් බැහැ. මොකද, රෝගියාගේ ජීවිතය නැති වන නිසා වෛද්‍යවරයා ඒක කොහොම හරි ලියලා දෙනවා. හැබැයි, අන්තිමට වැරදිලා හරි මේක අත් අකුරුත් එක්ක ගිහිල්ලා Bribery Commission එකට පැමිණිල්ලක් දැම්මොත්ඒ doctorට හිරේ යන්න වෙනවා. හැබැයි, අද ඇත්තටම වෙන්නේ මේකයි.

මේ වෙද්දී bypass surgery එකක් කරන්න ලියා දෙන ලැයිස්තුවේ තිබෙනවා, transparent dressingsත්. මේ සභාවේ වෛද්‍යවරු ඉන්න නිසා එතුමන්ලා අපට වැඩිය හොඳට මේ ගැන දන්නවා. සාමාන්‍යයෙන් කකුලෙන් ධමනියක් ගන්න operation එකක් කරනකොට එතැන ලොකු තුවාලයක් ඇති වෙනවා. එතකොට එතැනට transparent dressing එකක් දානවා. ඒක ගෙනෙන්න සිදු වෙලා තිබෙන්නේ patientට. Patient තමයි කඩේට ගිහිල්ලා, එහෙම නැත්නම් ෆාමසියට ගිහිල්ලා ඒක අරගෙන එන්න ඕනෑ. ඊළඟට තිබෙනවා, suture materials. ඒවායින් තමයි තුවාල වහන්නේ. Patientට තමයි ඒවාත් ගෙනෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. Heart surgery එකෙන් පස්සේ Ioban කියන dressings දානවා. ඒවා ගෙනෙන්න සිද්ධ වෙලා තිබෙන්නේත් patientට. Tegaderm කියලා dressings තිබෙනවා. මේවා waterproof; මේවා තිබෙන්නේ වතුර යන්න බැරි වෙන්න. ඒවා ගෙනෙන්න සිද්ධ වෙලා තිබෙන්නේත් patientට. ඊට පස්සේ Arteriofix කියලා එකක් තිබෙනවා. මේකෙන් තමයි රෝගියාගේ blood pressure එක උඩ පහළ යන එක බලන්නේ. වෛද්‍යවරුන්ගේ උපදෙස් අනුව මේක IV එකත් එක්ක සම්බන්ධ කරලා තිබෙනවා. ඒක ගෙනෙන්න සිද්ධ වෙලා තිබෙන්නේත් රෝගියාට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව bypass surgery එකක් කරන රෝගීන්ට සාමාන්‍යයෙන් Heparin කියන IV එකක් ලබා දෙනවා. Heparin කියන එක දෙන්නේ ලේ තුනී කරන්නයි. ලේ තුනී කර ගත්තාට පස්සේ සාමාන්‍ය තත්ත්වයට - back to normal - ගෙනෙන්න දෙන්න ඕනෑ Protamine Sulfate කියන තව IV එකක් තිබෙනවා. රෝහලේ ඒකවත් නැහැ. ඒකත් රෝගියාට ගෙනෙන්න සිදු වෙලා තිබෙන්නේ, private තැනකින්. Bypass surgery එකක් කරන්න ඕනෑ නම්, මේ සම්පූර්ණ list එක ලියා දුන්නාම රෝගියාට හරි, එයාගේ පවුලේ කෙනෙකුට රුපියල් ලක්ෂයක් අරගෙන pharmacy එකට ගිහිල්ලා ඒවා අරගෙන එන්න සිදු වෙනවා. ඒ, එක පැත්තක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව තත්පර 30ක කාලයක් දෙන්න.

ඒ වාගේම අතක් කැපිලා ගිහින් plastic surgery එකක් කළොත්, එහෙම නැත්නම් කකුලක් කැපිලා ගියොත් ඒ සඳහා Prolene sutures ඕනෑ නම් අද ඒවා private තැනකින් අරගෙන එන්න ඕනෑ. Monocryl suture material අද රෝහල්වල නැහැ. ඒ වාගේම polyester suture material අද රෝහල්වල නැහැ. SKINPLUS staplers අද රෝහල්වල නැහැ. Plastic surgery එකක් කර ගන්න ගියාම මේවා cover කරන materials අද ගොඩක් රෝහල්වල නැහැ. අද වනකොට කොළඹ මහ රෝහලේත් ඒවා නැහැ. ලංකාව වටේම තිබෙන රෝහල්වල ඒවා නැහැ. අද ඇත්ත තත්ත්වය මේකයි. නමුත් මේවා හංගන්නේ ඇයි?

ඔබතුමන්ලා බලයට පත්වෙලා දැනට අවුරුද්දක් ගතවෙලා තිබෙනවා. ඔබතුමන්ලාට ජාත්‍යන්තර සම්බන්ධතා තිබෙනවා නම් ඒවා පාවිච්චි කරන්න. එහෙම නැත්නම් ටෙන්ඩර් ක්‍රමවලට මේවා ගෙනෙන්න. මේක තමයි ඇත්ත ප්‍රශ්නය. අද වෙද්දී ලංකාවේ රෝහලක් ඇතුළේ bypass surgery එකක් කරගන්න රෝගියාට අවශ්‍ය ද්‍රව්‍ය ගෙන යන්නම රුපියල් ලක්ෂයක් යනවා. රෝහල්වල main IVs ටික නැහැ, බෙහෙත් ටික නැහැ. ඒ නිසා, ගුණාත්මක - quality - products, බෙහෙත් ගෙන්වීම සඳහා වන lab එක සම්බන්ධයෙන් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ගෙන ඒම ගැන කවින්ද ජයවර්ධන මැතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.36]

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதாரப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුව මෙහෙම කථා කරන තැනක් බවට පත්වීම ගැන අපි ඇත්තටම සතුටු වෙනවා. මොකද, ඖෂධවල තත්ත්වය test කරන lab එකේ ගුණාත්මකභාවය ගැන තමයි අද අපි කථා කරන්නේ. නමුත්, මේ පාර්ලිමේන්තුවේ හිටපු මිනිස්සුම තමයි lab එකකින් තියා කිසිම test එකක් කරන්නේ නැතිව special pathway එකක් හදලා බෙහෙත් නැති වතුර බෝතල් ලංකාවට ගෙන්නුවේ. එහෙම බෙහෙත් ගෙන්වලා මිනී මරපු එක සම්බන්ධයෙන් විශ්වාස භංග යෝජනාවක් ගෙනාවාම, පාර්ලිමේන්තුවේ බහුතරය අත් උස්සලා ඒ විශ්වාස භංග යෝජනාවට විරුද්ධව මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඡන්දය පාවිච්චි කරලා, ඒක හරි කියලා අනුමත කළා. එහෙම ඡන්දය පාවිච්චි කරපු මන්ත්‍රීවරු හිටපු රටක් තිබුණේ.

අද ලොකු සංවර්ධනයක් ලබලා තිබෙනවා. ඒකට බොහොම ස්තුතියි. අපි හුඟක් සතුටු වෙනවා. අපි ඇත්තටම NMRA එක ගැන කථා කරනකොට ගොඩක් දේවල් කථා කළා. NMRA එකට සමහරු කැමැති නැහැ. ඒ කැමති නැති වෙන්න හේතුව තමයි NMRA එක තමයි ලංකාවේ ඖෂධ නියාමනය කරන ආයතනය වීම. සමහරු හිතාගෙන ඉන්නවා, තමන්ට කැමැති factory එකක් ලංකාවේ දාලා තමන්ට කැමැති කැමැති විධියට බෙහෙත් හදලා ලංකාවේ මිනිස්සුන්ට ඒ බෙහෙත් දෙන්න. ඒ immunoglobulin බෙහෙත හැදුවේත් ඒ වාගේ තමයි. එක පැත්තකින් ලේ දැම්මාම අනෙක් පැත්තෙන් බෙහෙත එයි කියලා තමයි හිතාගෙන හිටියේ. ලේ දැම්මාද කියලා දන්නේ නැහැ. නමුත් එහා පැත්තෙන් ආවේ වතුර බෝතල්. එහෙම තමයි ලංකාවේ දේශීය කර්මාන්තය කියන එක හැදුවේ. නමුත් අපි ලංකාවේ දේශීය කර්මාන්තය හදන්නේ යම්කිසි ප්‍රමිතියක් සහ වැඩ පිළිවෙළක් ඇතුව. ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලව. ඒක තමයි දැන් තිබෙන වෙනස. මේ NMRA එකට අදාළ lab එක ගැන තමයි අපි අද කථා කරන්නේ. කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව ඉතාම හොඳ යෝජනාවක්. අපි දැනටත් එය ක්‍රියාත්මක කරමින් පවතිනවා.

මේ NMRA එකට අදාළ lab එක ගත්තාම, මේක එක සැරේ අපේ ආණ්ඩුව ආවාට පසුව පහළ වෙච්ච එකක් නොවෙයි. මේ lab එකේ ඉතිහාසය 1990 දක්වා දිව යනවා. 1990 ඉඳලා මේ දක්වා ගත්තාම, මේ දක්වා වෙච්ච සංවර්ධනයේ කථාව තමයි ඔය කිව්වේ. අවුරුදු 35ක සංවර්ධන කථාවක් මම කිව්වේ. ඒ සංවර්ධන කථාවේ අපි අවුරුද්දක කාලයක වගකීම දරනවා. නමුත් මේ අවුරුද්දක කාලයේ තමයි ඒ lab එකේ කරන tests ප්‍රමාණය දෙගුණයක් කරන්න පුළුවන් වුණේ. මේ අවුරුද්දක කාලය තුළ තමයි අපට මේකේ ඉන්න සේවකයන් සංඛ්‍යාව දෙගුණයක් කරන්න පුළුවන් වුණේ. ඒ වාගේම මේ අවුරුද්දක කාලයේ තමයි අපි පළමු වතාවට NMRA එකට ජාත්‍යන්තර ප්‍රමිති සහතික ලබා ගැනීම සඳහා වූ pathway එකක්, එහෙම නැත්නම් වැඩ පිළිවෙළකට අනුගත කරන්න පුළුවන් වුණේ. ඒක නිසා අපේ මේ අවුරුද්ද තුළ මේ NMRA එකේ තිබෙන lab එක අවශ්‍ය ප්‍රමාණයකින්, අපට පුළුවන් උපරිම ප්‍රමාණයකින් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියක අපි යෙදිලා තිබෙනවා. NMRA එක ගත්තාම, ඒකට මුදල්මය ප්‍රශ්නයක් නැහැ. ඒක රුපියල් මිලියන ගණනක් deposits තිබෙන ආයතනයක්. නමුත් lab එකක් ගත්තාම, lab එකක් සංවර්ධනය කිරීමේ යම් යම් කොටස් තිබෙනවා. යම් යම් පියවර තිබෙනවා. අන්තර්ජාතිකව පිළිගත්ත steps ටිකක් තිබෙනවා. ඒ steps අපි අනිවාර්යයෙන්ම අනුගමනය කළ යුතුව තිබෙනවා.

අපි ලංකාවේ ඖෂධ ගත්තාම, අර ඉස්සෙල්ලා කිව්වා වාගේම දේශීය ඖෂධ නිෂ්පාදකයෝත් ඉන්නවා. දැනට ලංකාවේ දෙසිය පනස් ගණනක් විතර ඖෂධ අපි නිෂ්පාදනය කරනවා. ඒ වාගේම අපට අවශ්‍යම ඖෂධ තවත් 863ක් තිබෙනවා. ඒ කියන්නේ තුනෙන් දෙකක ප්‍රමාණයක් අපි ආනයනය කරනවා. එතකොට මේ ලංකාවේ නිෂ්පාදනය කරන ඖෂධ සහ ආනයනය කරන ඖෂධ සියලු දේවල් මේ lab එක ඇතුළේ test කරන්න බැහැ. ඒ නිසා අපි සමහර ඒවා සමහර labsවලට - accredited labs, එහෙම නැත්නම් ලෝකය පිළිගත් සහ අපේ NMRA එක පිළිගත් labsවලට - යවලා තමයි කරන්නේ. යම්කිසි lab tests ප්‍රමාණයක් තමයි දැනට මෙතැනින් අපි කරන්නේ. මේ testsවලට accreditation එක ගන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ කියන්නේ ජාත්‍යන්තර ප්‍රමිතියක් සහිතව මේ testsවල ප්‍රතිඵල ලබා දෙන්න. අනෙක් පැත්තට, test කරන ප්‍රමාණය වැඩි කරන්න අපි උත්සාහ ගන්නවා. ලංකාවේ මේ lab එකට අමතරව අපට ITI එකේ lab එකක් තිබෙනවා. ඒ වාගේම SPC එකේ ඒගොල්ලන්ගේ samples බලන lab එකක් තිබෙනවා. එවැනි labs කිහිපයක් තිබෙනවා. මේ NMRA එකේ lab එකට අමතරව හොඳ lab එකක් අපට තිබෙන්න ඕනෑ. ඒකට හේතුව තමයි, සමහර වෙලාවට මේකෙන්ම disqualify කරන drug එකක් සම්බන්ධ වාර්තාවක් මේකෙන්ම ගන්න එක සාධාරණ නැහැ. ඒ නිසා හොඳ third party lab එකක් තිබෙන්න ඕනෑ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ඉතාම හොඳ ගුණාත්මකභාවයෙන් යුතු lab එකක් ස්ථාපනය කරන්න.

අපි මේ අවුරුද්ද තුළ ඖෂධ විශ්ලේෂකයන් 15දෙනෙක් බඳවා ගත්තා. ඒ වාගේම සහකාර ඖෂධ විශ්ලේෂකයන් 24දෙනෙක් බඳවා ගත්තා. දැන් මේ ගැන කථා කරනකොට කියපු එකක් තමයි, මේකේ Director Board එකේ ඖෂධවේදීන් නැහැ කියන එක. Director board එකක සංයුතිය කොහොම වෙන්න ඕනෑද කියලා ඒකට අදාළ ලේඛනවල තිබෙනවා.

අපි මේ lab එක හැදුවේ 1990දී. ජාතික ඖෂධ නියාමන අධිකාරිය ලංකාවේ පිහිටුවන්නේ 2015 අවුරුද්දේ. එය 2015 අවුරුද්දේ පිහිටුවනකොට ඖෂධ නියාමන අධිකාරියේ - NMRA එකේ - Director Board එකේ ඉන්න ඕනෑ කවුද කියලා ඒ Act එකෙන් තමයි දක්වා තිබෙන්නේ. ඒ Act එකේ දක්වපු නීත්‍යනුකූල පිරිස ඉන්නවා. ඖෂධවේදීන් අවශ්‍ය වන්නේ මේවා පරීක්ෂා කිරීමට සහ ඖෂධවේදීන්ගේ දැනුම අවශ්‍ය වූ තැන්වලට. ඒ අයගේ දැනුම අවශ්‍ය තැන්වලට අවශ්‍ය ඖෂධවේදීන් සංඛ්‍යාව අපි බඳවාගෙන තිබෙනවා සහ ඉදිරියේදී තවත් බඳවා ගැනීමට නියමිතව තිබෙනවා.

දේශීය ඖෂධ කර්මාන්තය ගත්තාම, අපි රජයක් විධියට ඒකට අවශ්‍ය උපරිම පහසුකම් ප්‍රමාණය දීලා තිබෙනවා. නමුත් එහෙම දුන්නාය කියලා එන එන ඖෂධය, තමන් කැමැති කැමැති ඖෂධය, කැමැති කැමැති විධියට ලංකාවේ register කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා NMRA එකත් එක්ක සමහරුන්ට එක එක "ඇරියස්" තිබෙනවා.

ඒ වාගේම NMRA එකේ සභාපතිතුමා ගැනත් කිව්වා. එතුමා ඉතාම දක්ෂ වෛද්‍යවරයෙක්. ඒ වාගේම අපේ ආණ්ඩුව එන්නත් ඉස්සර වෙලා පත් කර තිබුණු කෙනෙක්. අපේ ආණ්ඩුව බලයට එන්න කලින් බොහෝ ආයතනවල සේවය කළ අය ඒ විධියටම ඔවුන්ගේ සේවය දැනුත් කරගෙන යනවා. ඒ නිසා ඔහුත් එක්ක තිබෙන පෞද්ගලික ආරවුලක් විධියටයි මෙය අපට පෙනෙන්නේ. ඇත්තටම සමහර ඖෂධ ගෙන්වීමේදී සිදු වෙච්ච සමහර ක්‍රියාවලි සහ තමන්ට හිතෙන හිතෙන විධියට factories දමාගන්නට ඉඩ නොදීම ගැන තිබෙන "ඇරියස්" තමයි ඒ පෙනෙන්නේ. දැන්

සමහරු හිතාගෙන ඉන්නවා, ඖෂධ කියන්නේ නිකම් ගෙන්වා ඔහේ ලබා දෙන දෙයක් කියලා. එහෙම නැහැ. ඖෂධයක් ගෙන්වනකොට අපි tests ගොඩක් කරනවා. සාමාන්‍යයෙන් අපි pre-delivery sample එකක් බලනවා. ලංකාවට පළමු වරට නම් ඒ ඖෂධය ගෙන්වන්නේ pre-shipment sample එකක් බලනවා. ඒ වාගේම අපි deliver කරන්න ඉස්සර වෙලා pre-delivery sample එකක් බලනවා. ඖෂධ MSD එකේ ගබඩාවල තිබෙනකොට ගබඩාවලදී ප්‍රශ්නයක් වුණාද කියලා බලන්න අපි ඒ ගබඩාවලින් samples අරගෙන බලනවා. නැවත ඒ ඖෂධ වාට්ටුවට හෝ වෙනත් ආයතනයකට යැවූ පසු අපි ඒ pharmaciesවලින් samples අරගෙන test කරනවා. මේ වාගේ ක්‍රියාවලි ගණනාවක් තුළින් මේ testing කරනවා.

ඊට අමතරව මොකක් හෝ complaint එකක් ආවොත්, ඒ ඖෂධවල ගුණාත්මකභාවය පිළිබඳව තීරණය කරන්න කමිටුවක් තිබෙනවා. ඒ කමිටුවට යොමු කළාට පසු ඒ කමිටුවෙන් තීරණය කරනවා, ඒ ඖෂධය තවදුරටත් දෙන එක නවත්වනවාද, දිගටම දෙනවාද කියලා. මොන විධියකින් හෝ අපට complaint එකක් ආවොත් අපි ඒ පිළිබඳව සොයා බැලීමක් කරනවා. සමහර වෙලාවට වෙනත් lab එකකට යවලා හෝ අපි ඒ සොයා බැලීම කරනවා. මේක ඉතාම සංකීර්ණ ක්‍රියාවලියක්. කොතැනකදීවත් වරදක් නොවන විධියට තමයි තමයි මේ ක්‍රියාවලිය හදලා තිබෙන්නේ. ඒක අපි හදපු එකකුත් නොවෙයි. මෙය කාලයක් තිස්සේ හැමෝම එකතු වෙලා, තම තමන්ගේ දැනුම එකතු කරලා හදපු එකක්. ඒ කෙසේ වෙතත්, කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ මෙම යෝජනාව ඉතාම වටිනවා. අපි මේ lab එක තවදුරටත් දිගටම සංවර්ධනය කළ යුතුයි. NMRA එකට ගියොත් එතුමාට කැමැති නම් බලාගන්න පුළුවන්, අපට තිබෙන සංවර්ධනය සඳහා වූ සැලැස්ම. ඒ සැලැස්ම ඇතුළේ අපි දාලා තිබෙනවා, එක් එක් අවුරුදුවල මේ lab එකෙන් අත්පත් කර ගත යුතු ප්‍රගතිය. සෞඛ්‍ය අමාත්‍යාංශයට සම්බන්ධ වූ සියලු ආයතනවලට, අනුබද්ධ සියලු ආයතනවලට අපි target එකක් දීලා තිබෙනවා. එක් එක් ආයතනය, එක් එක් වර්ෂවලදී අත්පත් කරගත යුතු සංවර්ධන ඉලක්ක අපි ලබා දීලා තිබෙනවා. ඒ ඉලක්කවලට ඔවුන් ළඟා විය යුතුයි. ඒ සඳහා අමාත්‍යාංශය විධියට අපි අපේ උපරිම සහයෝගය ලබා දෙනවා.

ඒ වාගේම මෙතැන ලොකු පාඩමක් ගියා, drugs ගැන. වෛද්‍යවරයෙකු විධියට මම වැඩි කාලයක් ගත කළේ හදවත් රෝග සම්බන්ධ වාට්ටුවල. හදවත් රෝග සම්බන්ධයෙන් වූ සියලු ක්‍රියාකාරකම්වලට මම සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ කියපු ඒවා මම කවදාවත් අහපු නැති drugs. ඒ, drugsවල බලපෑම reverse කරන්න ගන්නා drugs. ඒවා ගැනත් කිව්වා. ඒ කියපු හුඟක් ඒවා අද ඉස්පිරිතාලවල තිබෙනවා. ඒ වාගේම antibiotics ගැන වෛද්‍යවරුන්ගෙන් ඇහුවොත් දන්නවා. ඉතිහාසයේ පළමු වතාවට අද තමයි මෙච්චර antibiotics ප්‍රමාණයක් ලංකාවේ ඉස්පිරිතාලවල තිබෙන්නේ. පසුගිය කාලවල ගොඩක් antibiotics ඉස්පිරිතාලවල තිබුණේ නැහැ. ඒ වාගේම bypass සැත්කම් කිසිවක් මේ වන විට නැවතිලා නැහැ.

අද බෙහෙත්වල මිල ගණනුත් කිව්වා. අන්තිම සැරේට ඒවා මිලදී ගන්නේ කීයටද කියලා අපි බලමු. මම එදාට ඒවා මිලදී ගන්නා ගණන ගැන උත්තරයක් දෙන්නම්. ඖෂධ මිලදී ගැනීමේ ක්‍රම තිබෙනවා. සමහර ඖෂධ අපි මධ්‍යම සැපයුම් ඒකකය - MSD එක - මඟින් මිලදී ගන්නවා, SPC එක හරහා. කුඩා ප්‍රමාණවලින් අවශ්‍ය වන සමහර ඒවා දීලා තිබෙන්නේ ආයතනික මිලදී ගැනීම්වලට. එතකොට කුඩා ප්‍රමාණවලින් අවශ්‍ය වන ඖෂධ "නැහැ" කියන ලැයිස්තුවේ තමයි තිබෙන්නේ. මොකද, ඒවාට මුදල් තමයි අපි ඉස්පිරිතාලවලට දීලා තිබෙන්නේ. අද කියපු සමහර නූල් වර්ගත්, needles වර්ගත් ඒ කාණ්ඩයට තමයි වැටෙන්නේ. අපි ඒ ගැන වෙන දවසක කථා කරමු. කොහොම වුණත් අපට පෙනෙනවා, පාර්ලිමේන්තුවක් විධියට ලොකු සංවර්ධනීය අවස්ථාවක් අද තිබෙන බව. බෙහෙත් වෙනුවට වතුර විදපු රටක, තම තමන්ට ඕනෑ විධියට special pathways හදාගෙන කිසිදු ආකාරයක පරීක්ෂණයක් නොකර බෙහෙත් ගෙනාපු රටක අද ඖෂධවල quality එක තව තවත් වැඩිවීම ගැන කථා කරනවා. ඒක බොහොම සංවර්ධනීය අවස්ථාවක්. අපි ඒ ගැන සතුටු වෙනවා. ඒ වාගේම අපි ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ විධියේ යෝජනාවක් ගෙන ඒම ගැන.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.48]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෛද්‍ය හංසක විජේමුණි නියෝජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, මම ඉදිරිපත් කරපු යෝජනාවට රජය වෙනුවෙන් පිළිතුරු සැපයීම පිළිබඳව. ඒ වාගේම මේ සම්බන්ධයෙන් අදහස් දැක්වීම පිළිබඳව ගරු වෛද්‍ය ජගත් ගුණවර්ධන මහතාටත්, මා මිත්‍ර ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමාටත්, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකය පිළිගත් quality control laboratories තිබෙනවා. ඒ පරීක්ෂණාගාර පිළිබඳව ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නම් ඉදිරිපත් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සියලු නම්, තොරතුරු ඇතුළත් ලේඛනයක් මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

මෙවැනි තත්ත්ව පරීක්ෂණාගාරයක් තමයි අපේ රටට අවශ්‍ය වන්නේ. මොකද, එක පැත්තකින් API standardsවලට, ඒ වාගේම GMP standardsවලට අවශ්‍ය තත්ත්ව පරීක්ෂණාගාරයක් අපේ රටට අවශ්‍යයි කියන ස්ථාවරය තහවුරු කරන්න ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ඉදිරිපත් කර තිබෙන, තහවුරු කර තිබෙන තත්ත්ව පරීක්ෂණාගාර ලැයිස්තුව මම සභාගත කළා. අපට ආසන්නයෙන්ම තිබෙන රට තමයි, ඉන්දියාව. ඉන්දියාවේ තත්ත්ව පරීක්ෂණාගාර 228ක් තිබෙනවා. පෞද්ගලික අංශයත්, විශේෂයෙන්ම රජය විසිනුත් එම පරීක්ෂණාගාර පවත්වාගෙන යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්ව පරීක්ෂණාගාර පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයකුත් මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකේ වටිනාකම මෙයයි. හැම ඖෂධයක් සම්බන්ධයෙන්ම තිබෙන ලිපි ගොනු අපි පරීක්ෂා කරලා ලියාපදිංචි කළාට පසුව randomly තමයි ඒ ඖෂධ අපි තත්ත්ව පරීක්ෂණයට ලක් කරන්නේ. එම ඖෂධයෙන් යම්කිසි සංකූලතාවක් ඇති වුණොත් ඒක withhold කරනවා ද, එහෙම නැත්නම් batch එක recall කරනවා ද, ගන්නාවූ ක්‍රියා මාර්ගය මොකක්ද කියන එක පිළිබඳව පරීක්ෂා කරන්නත් මේ තත්ත්ව පරීක්ෂණාගාරයක වටිනාකම අපට වැදගත් වෙනවා. එහෙම

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

නැත්නම් අපට වෙන්නේ අපේ රටේ ජනතාවගේ බදු මුදල් ලක්ෂ ගණනින් වැය කරලා මේ පරීක්ෂණ සිදු කර ගැනීමට සිංගප්පූරුව, ජර්මනිය වැනි ලෝකයේ වෙනත් රටවලට යොමු කරන්නයි. ඒ නිසා එක පැත්තකින් රටේ මුදල් නාස්ති වන එක වැළැක්වීමටත්, අනෙක් පැත්තෙන් රෝගීන්ගේ සහ ඒ පාර්ශ්වවල ජීවිත ආරක්ෂා කිරීමටත්, වෛද්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය කාර්ය මණ්ඩලය කරන ක්‍රියාව පහසුවෙන් කර ගැනීමටත් මේ තත්ත්ව පරීක්ෂණාගාරයක වටිනාකම අපට මතක් කර දෙනවා.

සෞඛ්‍ය ගැන කථා කරපු නිසායි මම මේ ගැන කියන්නේ. එහෙම නැතිව මේ ආණ්ඩුව අපහසුතාවට පත් කරන්න නොවෙයි. මම මේ පිළිබඳව අද ගරු සභාවේදී කථා කරනවා කිව්වාම වෛද්‍යවරුන් සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කිහිප දෙනෙක් මට කථා කළා. ඒ අය විශේෂයෙන්ම කියපු දෙය තමයි, dialysisවලට අවශ්‍ය needles සහ glucose test stripsවල හිඟයක් තිබෙනවා කියන එක. කොළඹ ජාතික රෝහලේ තිබෙන angiography machines පහෙන් හතරක් අක්‍රිය වෙලා තිබෙනවා කියන එකත් ඒ අය මට ප්‍රකාශ කර සිටියා. ඒ වාගේම කොළඹ ජාතික රෝහලේ MRI scannersවල අක්‍රියතාවක් තිබෙනවා කියන එකත් ඔවුන් ප්‍රකාශ කර සිටියා. මේ පිළිබඳවත් අපි අවධානය යොමු කරවන්න ඕනෑ. ඒ නිසා රෝගීන්ගේ රෝග විනිශ්චය කිරීම සඳහා කරන පරීක්ෂණවලට අවශ්‍ය උපකරණ වෙනුවෙන් පහසුකම් සපයන්න කියන ඉල්ලීම මම කරනවා. යම්කිසි අක්‍රමිකතාවක් නිසා biochemistry tests ටිකත් මාස 4ක් තිස්සේ නතර වෙලා තිබෙනවා කියලා අපට තොරතුරු වාර්තා වුණා. ඒ පිළිබඳවත් රජයේ අවධානය යොමු කරන්න කියමින් ගරු අග්‍රාමාත්‍යතුමිය මේ සභාවේ ඉන්න නිසා මේ කාරණයත් මම කියනවා.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, අරලියගහ මන්දිරයේ තිබුණු උත්සවයකදී ලබා දුන් ස්ටිකරයක් මට අද හම්බ වුණා. මේක "1990 සුවසැරිය" කියන එක වෙනුවට "ජාතික හදිසි ගිලන් රථ සේවය" කියලා ගහපු අලුත් ස්ටිකරයක්. මේකේ ඇත්ත නැත්ත මම දන්නේ නැහැ. ගරු අග්‍රාමාත්‍යතුමියනි, මේ ගැනත් පොඩ්ඩක් ඔබතුමියගේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තත්පර 30ක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
එතුමා machines සම්බන්ධයෙන් කියපු කථාව ඇත්ත. MRI scanners සහ angiography machinesවල ප්‍රශ්නයක් තිබෙනවා. ඒකට හේතුව සාමාන්‍යයෙන් ඒ machinesවල ජීව කාලය අවුරුදු 15ක්, 20ක් වීමයි. ඒ ඔක්කෝම වාගේ machines අවුරුදු 15, 20 යල්පැන ගිහිල්ලා. ඒ නිසා යල්පැන ගිය ඒවා වෙනුවට අපි අලුත් ඒවා මිලදී ගැනීම සඳහා ක්‍රියාවලියක් ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම, දැනට තිබෙන ඒවා repair කිරීමත් කරගෙන යනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, පෞද්ගලික මන්ත්‍රී යෝජනා අංක - පා. 47/2025 - ඉදිරිපත් කිරීම, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

## ගොවි ජනතාව වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීම
## விவசாயிகளுக்கான காப்புறுதித் திட்டமொன்றை ஆரம்பித்தல்
## INITIATION OF AN INSURANCE SCHEME FOR THE FARMING COMMUNITY

[අ.භා. 2.53]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "රටක ගොවි ජනතාවගේ සුභසාධනය සැලසීම රජයක වගකීම වන හෙයින්, මෙරට ජනයාගෙන් බහුතරයක් වන ගොවි ජනතාව වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ඇති කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

විශේෂයෙන්ම අපි දන්නවා, අප හැම කෙනෙක්ම ආහාර මත යැපෙන සත්වයන් බව. ගෙදර කෑම මේසේ වාඩි වෙලා කෑම ගන්නකොට, නැත්නම් අපි හෝටලයකට ගිහිල්ලා මුදල් ගෙවලා කෑම ගන්නකොට අපට හොඳ පෝෂ්‍යදායී ආහාර වේලක් ලැබෙන්නේ ඒ පිටුපස විශාල කාර්යභාරයක් සහ කැප කිරීම් ප්‍රමාණයක් කරන ගොවි ජනතාව නිසායි. අපි ජීවත් වෙන්නේ, හුස්ම ගන්නේ ඒ අය නිසායි. හැබැයි, අපේ රටේ ගොවි ජනතාව විශාල කැප කිරීම් කරලා අපට පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා දුන්නාට අපි ගොවි ජනතාව වෙනුවෙන් සාධාරණයක් ඉෂ්ට කරනවාද කියන ප්‍රශ්නය අපට හැම අවස්ථාවකදීම පැන නඟිනවා. ගොවි ජනතාව හැම දාම කබලෙන් ලිපට වැටිලා ඉන්නේ. සූදුවක නියැළෙනවා හා සමානයි, තමන් කාලයක් තිස්සේ කුඹුරට බැහැලා, වපුරලා මහන්සි වෙලා කරන්න තිබෙන ඔක්කෝම කරලා අවසානයේ අස්වනු නෙළලා විකුණන තැනට එනකම් කරන කටයුතු ටික. ඒ අය බොහොම අවිනිශ්චිතතාවක ඉන්නේ. කරන කාර්යයට සාධාරණ මුදලක් තමන්ගේ යැපුමට ලැබෙනවාද කියන විශ්වාසයවත් නැතුව අප ජීවත් කරවන්නට මේ ගොවි ජනතාව කැප වෙනවා.

මේ ගොවි ජනතාව වෙනුවෙන් දැනට වගා හානි රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක වෙනවා. එහි විශාල අඩුපාඩුකම් ගණනාවකුත් තිබෙනවා. ඒ තුළ නොමිලේ ලබා දෙන මුදලකුත් තිබෙනවා. ඒකෙන් ආවරණය වන ප්‍රමාණය අක්කරයකට රුපියල් 40,000යි. ගොවීන්ට ඒ ආවරණය ලැබෙන්නේත් පූර්ණ හානියකදී පමණයි. ඒ නිසා ගොවීන්ට එතැනදී සාධාරණයක් වෙන්නේ නැහැ. ඊට පස්සේ වෙනම රුපියල් 6,400ක් ගෙවලා නැවත රක්ෂණය කරගන්න පුළුවන්. ඒකෙනුත් රුපියල් 100,000 දක්වා ඒ ආවරණය ලැබෙනවා. නමුත්, ඒ පූර්ණ හානියකදී පමණයි. ඒ වාගේම භෝග සීමිත ප්‍රමාණයක් තමයි මේකෙන් ආවරණය වෙන්නේ. අනෙකුත් භෝග වගා කරන ගොවීන් මේකෙන් ආවරණය වෙන්නේත් නැහැ. ඒ නිසා මේ රක්ෂණ ක්‍රමය තවදුරටත් යාවත්කාලීන කරලා, අද කාලයට ගැළපෙන විධියට සකසා ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා වාගේම මේ ගොවි ජනතාව

මේ කටයුතු කරනකොට ජීවිතය පවා අවදානමට ලක් වෙන අවස්ථා තිබෙනවා. විශේෂයෙන්ම ඔබතුමන්ලා දන්නවා, කුඹුරේ කටයුතු කරමින් ඉන්නකොට අකුණු සැර වදිනවා කියලා. ඒ වාගේම, කුඹුරේ ඉන්නකොට සර්ප දෂ්ටනවලට මේ ගොවීන්ට මුහුණ දෙන්න සිදු වෙනවා. අස්වනු නෙළන වේලාවේ "සුනාමි" යන්ත්‍රයට - harvester එකට - නැත්නම් හානකොට ට්‍රැක්ටරයට යට වෙලාත් ජීවිත හානිවලට ලක් වෙන අවස්ථා අපි දැකලා තිබෙනවා. ඒ නිසා මේ සියලු දේවල් තුළ ගොවි ජනතාව විශාල වශයෙන් අවදානම්සහගතව තමයි අපට මේ ආහාර සැපයීම කියන කාරණයේ නියැළිලා ඉන්නේ. ඒ වාගේම ගොවියෙක් රෝහල්ගත වුණොත් ඔහුට යැපෙන්නට ක්‍රමයක් නැහැ. වාගේම ඔහුගේ පවුලේ උදවියටත් යැපෙන්නට ක්‍රමයක් නැහැ. වෙනත් රැකියාවක් කරන කෙනෙකුට නම් නිවාඩුවක් දැම්මත් මාසේ අන්තිමට ඒ රැකියාවෙන් වැටුපක් ලැබෙනවා. හැබැයි, ගොවි ජනතාව ගොවිතැන් කටයුතුවලට යන්නේ නැතුව කුලී වැඩට ගියොත් ගොවිතැන එහෙම පිටින්ම අඩපණ වෙනවා.

රෝහල්ගත වෙලා ඉන්නකොට ඒ අයගේ ජීවන චර්යාව ආරක්ෂා කර ගන්නට, එහෙම නැත්නම් ජීවන චර්යාවේ ඉතුරු කටයුතු කරගෙන යන්න මූල්‍යාවරණයක් ලැබෙන්නේ නැහැ. ඒ වාගේම ජීවිත හානියක් වුණොත් ඒ අයගේ යැපෙන්නන්ට ආවරණය වීමක් නැහැ. එමෙන්ම ඒ අය වයසට ගියාට පසුව එම කටයුතුවල නියැළෙන්න හැකියාවක් නැහැ. ගොවි ජනතාව කියන්නේ බොහොම වෙහෙස මහන්සි වෙලා කටයුතු කරන පිරිසක්. ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක වෙනවා. හැබැයි, අපේ රටේ ගොවීන්ගෙන් කොච්චර අඩු ප්‍රමාණයක් ද ඒකෙන් ආවරණය වෙන්නේ කියන ගැටලුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එක පැත්තකින් ගොවි ජනතාවගේ වගාව ආරක්ෂා කළ යුතු වෙනවා. තව පැත්තකින්, ජීවිත ආරක්ෂා කළ යුතු වෙනවා. තවත් පැත්තකින්, ඒ අයගේ විශ්‍රාම දිවිය අපි ආරක්ෂා කළ යුතු වනවා. වගාව ආරක්ෂා කළාට විතරක් මදි. අස්වනු නෙළලා, විකුණලා අවසන් වෙන කල්, ඔවුන් බලාපොරොත්තු වුණු මුදල ලැබෙන කල්, ආවරණය කළ හැකි විධියේ රක්ෂණ ක්‍රමයකට අපි ගමන් කළ යුතුයි. අපි මේවා ආවරණය කරනවා කියලා රක්ෂණයක් දීලා තිබෙනවා කියලා අත පිහදාගෙන අපට මඟ හරින්න බැහැ. මේ රටේ ජීවනාලිය බඳු, විශාල යන්ත්‍රණයක් තුළ ක්‍රියාත්මක වන, අප ජීවත් කරවන්නට වෙහෙස මහන්සි වන මේ ගොවීන් වෙනුවෙන් මේ කියන කරුණු කාරණා සියල්ල ආවරණය වන රක්ෂණ ක්‍රමයකට අපේ රට යොමු කරවන්නට අපි අවධානය යොමු කරමු කියන යෝජනාව මම කරනවා.

මෙම යෝජනාව ස්ථිර කිරීම සඳහා ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාට මම ආරාධනා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.58]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ කියමනක් තිබෙනවා, "මඩ සෝදා ගත් කළ ගොවියා රජකමටත් සුදුසුයි" කියලා. ඒකෙන්ම පෙනෙනවා, අපේ රටේ ගොවි ජනතාව මොන තරම් වටිනා පිරිසක්ද කියලා. ඒක නිසා අපේ ගොවි ජනතාව ගැන විශේෂ අවධානයක් යොමු කරමින්, ඔවුන් අසරණ නොකර, රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමේ ඇති වැදගත්කම අද ගරු සභාවේ අවධානයට යොමු කිරීම ගැන ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. එතුමා ගෙනාපු ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

විශේෂයෙන්ම වගා රක්ෂණ ක්‍රම තිබෙනවා. ඒ වාගේම විශ්‍රාම වැටුප් ක්‍රමයකුත් තිබෙනවා. නමුත් ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වෙලා ඉන්න ගොවි ජනතාව බොහොම සීමිත ප්‍රමාණයක් බව තමයි මේ වනකොට පෙනෙන්න තිබෙන්නේ. අපි දන්නවා, ගොවි ජනතාවගේ රක්ෂණ ක්‍රම ගැන කථා කරනකොට වගා රක්ෂණය විතරක් නොවෙයි, ජීවිත රක්ෂණය වාගේම තමන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම දක්වා රක්ෂණ ක්‍රම ඇති කිරීම ඇත්ත වශයෙන්ම අවශ්‍ය කාරණයක් කියන එක. අද ගොවි ජනතාව බොහොම අවදානම් තත්ත්වයක තමයි සමහර වෙලාවට ගත කරන්නේ. අපි දන්නවා ගොවිතැන් කරනකොට, වගාවේ නිරත වෙලා ඉන්නකොට අකුණු සැර වැදිලා මිය යන්න සිදු වුණු අවස්ථා තිබෙන බව. ඒ වාගේම සර්පයෝ දෂ්ට කරලා මිය ගිය අවස්ථා වාර්තා වෙනවා. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මැෂින්වලින් අනතුරු සිදු වනවා. ගොවි ජනතාව යන්ත්‍ර සූත්‍ර භාවිත කරනවා. ඒවායින් අනතුරු සිදු වුණු අවස්ථා අනන්තවත් වාර්තා වෙනවා. මී උණ වැනි රෝගවලට ලක් වූවන් ගැන අපේ රජරට ප්‍රදේශයෙන් විතරක් නොවෙයි, ඔබතුමා සහ අප නියෝජනය කරන දකුණු පළාතෙනුත් හැම දාම වාගේ වාර්තා වෙනවා. විශේෂයෙන් ගොවි ජනතාව ඒ අනතුරුවලට ලක් වන බව වැඩියෙන් පෙනෙන්න තිබෙනවා.

රජරට ප්‍රදේශය ගත්තොත්, වකුගඩු රෝගීන් බවට ගොවීන් බොහෝ දෙනෙක් පත් වෙලා සිටිනවා. ඒ විතරක් නොවෙයි. බොහෝ ප්‍රදේශවල අද ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා, වල් අලි ගැටලුව. වල් අලි ප්‍රහාරවලින් අද වනකොට ජනතාව විශාල ප්‍රමාණයකට මිය යන්න සිදු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ගොවි ජනතාවට ඒ තත්ත්වය ඇති වෙලා තිබෙනවා. රෝහල්වලට ගිහිල්ලා ප්‍රතිකාරයක් ගන්න වුණාම, අසනීප වෙලා ඇඳට වෙලා ඉන්න වුණාම ගොවි ජනතාව විශාල වශයෙන් අසරණ තත්ත්වයකට පත් වෙනවා. ඒ වාගේම වෙහෙස මහන්සි වෙලා වැඩ කරලා, ජාතියට බත සපයලා, විවිධ ආකාරයෙන් අපේ ජනතාවට සේවය කරලා ජීවිතයේ සැඳෑ සමය ගත කරනකොට ගොවි ජනතාවට රක්ෂණයක් නැත්නම් හුඟක් වෙලාවට ඔවුන් අසරණ වන තත්ත්වයක් පෙනෙන්න තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තිබෙන්නේ තව විනාඩියක කාලයක් පමණයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබී ඇති වෙලාව සීමිත නිසා දීර්ඝව කථා කරන්න මම බලාපොරොත්තු වන්නේ නැහැ. ගොවි ජනතාව ගැන අපේ ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා මේ විධියට කල්පනා කිරීම ගැන අපි සතුටු වෙනවා. රජයේ අවධානය මේ වෙනුවෙන් යොමු කරයි කියාත් අපි හිතනවා. වී ගොවීන්, තේ ගොවීන් හා එළවලු ගොවීන් ඇතුළු සමස්ත වගාවල නිරත වෙලා ඉන්න ගොවි ජනතාව වෙනුවෙන් මෙවැනි රක්ෂණ ක්‍රමයක් ඇති කරන්න ගෙනා යෝජනාව ස්ථිර කරමින්, ඒ ගැන කථා කරන්න අවස්ථාවක් ලබා දීම ගැන ඔබතුමාටත් ස්තුති කරමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.02]

**ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රථමයෙන් මේ යෝජනාව ගෙන ඒම වෙනුවෙන් විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. ගොවියාට ඇත්තටම රක්ෂණයක් ඕනෑ ජීවිතයට විතරද? ගොවිතැන කියන්නේ ජීවිතයට විතරක් රක්ෂණය දෙන්න ඕනෑ තැනක් නොවෙයි. ඉතිහාසය පුරාවට ගොවීන්ගේ බීජවලට තිබුණු රක්ෂණය අහිමි කරලා තිබුණා. ඒ නිසා අද වැලිමඩ පැත්තේ, නුවරඑළිය පැත්තේ අල ගොවියාගේ බීජවල මිල ගණන් ඉතාම ඉහළ තත්ත්වයකට ආවා. අද අපේ පාරම්පරික බීජවලට තිබුණු අවස්ථාව අහිමි කරලා තිබෙනවා. ඒ නිසා ගොවීන්ට බීජවලටත් රක්ෂණයක් ඕනෑ. මොකද, කෘෂි කර්මාන්තය රඳා පවතින්නේ ප්‍රධාන කාරණා හතරක් එක්ක. ඒ සඳහා බීජ ඕනෑ, වතුර ඕනෑ, ඉඩමක් ඕනෑ, අස්වැන්නට සාධාරණ මිලක් ඕනෑ. මෙන්න මේ කාරණා හතරටම තිබිච්ච රක්ෂණය පසුගිය කාලයේ අහිමි වෙලා තිබුණා.

ඒ විතරකුත් නොවෙයි, ගොවීන්ට ඉඩම් තිබුණත්, ඒ ඉඩමට අස්වැන්න නෙළා ගන්නකම් ආරක්ෂාව තිබෙනවාද? පසුගිය අය වැයට කලිනුත් කරපු කථාවේදී මම කිව්වා, මහියංගනය, උල්හිටිය ප්‍රදේශයේ වර්ෂාවත් එක්ක ඇති වෙච්ච මහා ජල ගැල්මෙන් කුඹුරු සෝදාපාළුවට ලක් වුණු බව. ඔවුන්ගේ ඉඩම්වල ආරක්ෂාව නැති වෙලා තිබුණා. එතැනට රක්ෂණයක් නැහැ; ආරක්ෂාවක් නැහැ. අනෙක් පැත්තෙන් ගත්තාම ගොවීන් ජලයෙන් ස්වයංපෝෂිත වෙලා තිබෙනවාද?

දැනට මාස දෙකකට කලින් බඳුලු ඔය අමුණට මුල් ගල් තියලා වැඩ ආරම්භ කළා. 1963දී මුල් ගල් තියලා පටන් ගත්ත එකෙන් අක්කර 1,750ක් දෙකන්නය වගා කරන්න බැරි වුණා. අපි අවුරුදු 60කට පස්සේ එහි වැඩකටයුතු ආරම්භ කළා. ජලයේ ආරක්ෂාවත්, ජලයේ රක්ෂණයත් ගොවීන්ට තිබුණේ නැහැ. අනෙක් පැත්තෙන් වෙළඳපොළ ආරක්ෂාව, වෙළඳපොළ රක්ෂණය තිබුණෙත් නැහැ. ඒ නිසා තමයි තවමත් බී ලූනු ගොවියාට බී ලූනු ටික පාරේ හලන්න සිද්ධ වෙලා තිබෙන්නේ; අල ගොවියාට සාධාරණය ඉෂ්ට වෙලා නැත්තේ. ඒ නිසා වෙළඳපොළ ආරක්ෂාවත්, වෙළඳපොළ රක්ෂණයත් ඕනෑ. හැබැයි, ඒ මොනවා නැති වුණත්, ඒ රක්ෂණය යෝජනා කරන්න ඕනෑ මේ පාර්ලිමේන්තුවේ පුටුවල හිටපු මන්ත්‍රීවරු පසුගිය කාලයේ ඕනෑ තරම් රක්ෂණය අරගෙන තිබුණා. ඒ නිසා තමයි ගරු ජනාධිපති සහෝදරයා අපට දුන්නු රක්ෂණය අපි ලක්ෂ 10 ඉඳලා ලක්ෂ දෙකහමාරට අඩු කළේ.

ගොවීන්ට ඒ රක්ෂණය ඕනෑ. ඇත්ත, වගා හානි වෙනුවෙන් රක්ෂණයක් ඕනෑ. වගා විතරක් නොවෙයි, ගොවීන්ගේ ජීවිතත් ආරක්ෂා වෙලා නැහැ. වනඅලි ගහලා සමහර අය මැරෙනවා. සමහර අය විවිධ අනතුරුවලට ලක් වෙනවා. ඒ නිසා ඔවුන්ට රක්ෂණයක් අවශ්‍යයි. ඒ ගැන විවාදයක් නැහැ. මේ යෝජනාව හොඳයි. හැබැයි, ඔබතුමන්ලාට මෙවැනි යෝජනා ගේන්න සිද්ධ වෙන්නේ ඇයි? 76 වසරක් තුළ විසඳා ගත්තේ නැති ප්‍රශ්න අපට යොමු කරලා කරන්න පුළුවන්ද කියලා බලනවා. කිසිදේකට බය වෙන්න එපා. අපි ඒක කරනවා. මොකද, මේ පුටුවල ඉන්න ගොඩක් මන්ත්‍රීවරු හොඳට කැත්ත, උදැල්ල හුරු අය. අපේ අත්වල ඕනෑ තරම් කරගැට තිබෙනවා. අපේ කකුල්වල ඕනෑ තරම් දියපට්ට තිබෙනවා. ඒ නිසා කුඹුර ගැන, වෙල ගැන, නියර ගැන, වැව ගැන, අමුණ ගැන, වෙල් ඉපනැල්ල ගැන හොඳට දන්න පිරිසක් තමයි අද මේ ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු, මන්ත්‍රීවරු වෙලා ඉන්නේ. ඒ නිසා ගොවියාගේ දුක, වේදනාව ගැන අපට අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. අපට බඩගින්නේ වේදනාව ගැන අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. අපි ඕනෑ තරම් බඩගින්නේ හිටපු මිනිස්සු. අපට අධ්‍යාපනයේ අමාරුකම කියන්න ඕනෑ නැහැ. අපට ඒක තේරෙනවා. අර ඉස්සෙල්ලා ඉදිරිපත් කරපු පෞද්ගලික මන්ත්‍රී යෝජනාවේ කියැවුණු සෞඛ්‍ය ප්‍රශ්න අපට කියන්න ඕනෑ නැහැ. මේ මහත්වරුන්ගේ නෝනලා සමහර විට බෙහෙත් පෝලිම්වල ඉඳලා නැතුව ඇති. දරුවා හම්බ වෙන්න ගමේ ඉස්පිරිතාලෙට යන්නේ නැතුව ඇති. ඒ පීඩනය, ඒ දුක විඳ දරා ගත්ත මිනිස්සු හින්දා අපි දන්නවා, අපට ඒ යෝජනාව ඉතා හොඳින් ක්‍රියාත්මක කරන්න පුළුවන් බව. ඒක තමුන්නාන්සේලාත් දන්නවා. ඒ නිසා මේ යෝජනාව ගෙන ඒම වෙනුවෙන් ස්තුතිය පුද කරන ගමන් ඉතා හොඳ වැඩ පිළිවෙළක් හදලා ගොවීන්ගේ මූලික කාරණාවලටත් ආරක්ෂාව, රක්ෂණය දෙන ගමන් ගොවියාගේ ජීවිතයටත් රක්ෂණයක් දෙන්න මේ ආණ්ඩුව බැඳී සිටිනවාය කියන කාරණය මතක් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මහතාගේ නම යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[பி.ப. 3.07]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

கௌரவ ரோஹண பண்டார அவர்கள் விவசாயிகளுக்கான காப்புறுதித் திட்டமொன்றை ஆரம்பிக்க வேண்டும் என்ற நல்லதொரு விடயத்தைத் தனிநபர் பிரேரணையாகக் கொண்டுவந்திருக்கின்றார். அதனை உண்மையிலே நாம் வரவேற்பதுடன், அதற்காக அவருக்கு நன்றி சொல்லவும் கடமைப்பட்டிருக்கின்றோம். குறிப்பாக வடக்கு, கிழக்கிலேயுள்ள எங்களுடைய விவசாயிகளைப் பொறுத்தமட்டிலே, அவர்கள் போர்க் கால சூழ்நிலைகளுக்குள் இருந்தவர்கள்; பல இடப்பெயர்வுகளைச் சந்தித்தவர்கள்.

அதனால், அவர்களுடைய வாழ்க்கை முறை என்பது இப்பொழுதும் ஓர் ஏழ்மையான, எளிமையான நிலையிலேயே காணப்படுவதுடன், அவர்கள் எந்தவோர் உயர்ந்த நிலையையும் எட்டாதவர்களாகத்தான் இருக்கிறார்கள். அதற்கு முக்கிய காரணம், எனக்கு முன்னர் பேசிய உறுப்பினர் அவர்கள் சொன்னதுபோல, எங்களுடைய விவசாயிகள் விளைவிக்கின்ற நெல்லாக இருக்கலாம் அல்லது மரக்கறி வகைகளாக இருக்கலாம், அவை அனைத்துக்கும் அறுவடையின்போது உரிய விலை நிர்ணயம் செய்யப்படாத ஒரு நிலை காணப்படுவதாகும். இதன் காரணமாக அவர் களுடைய முதலீடுகளுக்கு ஏற்ற வருமானம் கிடைக்காமையால் அவர்கள் விவசாயத்தில் நட்டத்தை எதிர்கொள்கின்றார்கள்.

பொதுவாக மனைவியின் தாலிக்கொடியைப் புருஷன் இறந்த பின்புதான் கழற்றுவது எங்களுடைய மக்களின் வழக்கம். ஆனால், எங்களுடைய பகுதியிலே இருக்கின்ற விவசாயிகளின் நிலைமையைப் பார்த்தீர்கள் என்றால், ஒவ்வொரு விவசாயியும் தனது மனைவியின் தாலிக்கொடியை அடகு வைத்துத்தான் விவசாயத்தைச் செய்கின்ற நிலை காணப்படுகின்றது. அது ஒரு கொடூரமான விடயம்! அது மாத்திரமன்றி, அவர்கள் தமது கால்நடைகளை அடகு வைக்கிறார்கள்; காணியை அடகு வைக்கிறார்கள்; வங்கியிலே கடனைப் பெறுகின்றார்கள். இப்படியாகப் பணத்தைப் பெற்று விவசாயத்தைச் செய்கின்றபோது இயற்கை அனர்த்தங்களால் அவர்களுக்கு நட்டம் ஏற்படுகின்றது. இயற்கை அனர்த்தங் களாலே ஏற்படுகின்ற பாதிப்புக்களுக்காக விவசாயிகளுக்கு ஒரு காப்புறுதித் திட்டம் இருந்தாலும்கூட, சரியான நேரத்திலே அவர்களுக்குக் குறித்த நட்ட ஈடு வழங்கப்படுவதில்லை. இருந்தாலும்கூட, எங்களுடைய விவசாயிகளுக்குக் காப்புறுதி வழங்கப்படுகின்ற திட்டம் நடைமுறைப்படுத்தப்பட வேண்டும் என்பதை நானும் முன்மொழிகின்றேன். ஏனென்றால், இன்றைக்கு விவசாயத் துறையிலே ஈடுபடுகின்றவர்கள் யானைகளின் தாக்கம், கிருமிநாசினிகளை விசிறுகின்றபோது மூச்சடக்கி இறக்கின்ற நிலை மற்றும் விவசாய இயந்திரங்களைப் பயன்படுத்துகின்றபோது இருதய நோய் காரணமாக இறக்கின்ற நிலை எனப் பல கஷ்டங்களை எதிர்கொள்கின்றார்கள்.

எங்களுடைய நாட்டில் பெரும்பான்மையானவர்கள் வருமானத்தை ஈட்டுகின்ற இரண்டு தொழில் துறையாகக் காணப்படுவது ஒன்று, மீன்பிடித் துறை; இன்னொன்று விவசாயத் துறை. இந்த இரண்டு துறைகளையும் எமது பொருளாதாரத்தின் கண்களாகக் கருதி அரசாங்கம் அவற்றை மேம்படுத்துமாக இருந்தால், உண்மையிலேயே முன்னேற் றகரமாக நாட்டினைக் கொண்டுசெல்லும் வகையில் நாங்கள் செயற்பட முடியும். ஆகவே, விவசாயிகளுக்கான காப்புறுதித் திட்டமொன்றை ஆரம்பித்தல் என்பது விவசாயிகளுக்கு இன்றியமையாததொரு விடயமாக இருக்கின்றது. அரசாங்கம் இதனைக் கவனத்தில் எடுக்க வேண்டும். சேற்றிலே காலை வைத்து எங்களுக்குச் சோறு போடுகின்ற உன்னதமான விவசாயிகளுக்கு விவசாயத் துறையில் ஏதாவது பாதிப்புகள் ஏற்பட்டால், இந்தக் காப்புறுதியினூடாக அவர்களுடைய குடும்பங்கள் - குழந்தைகள், சந்ததிகள் வாழ்வதற்கான வாய்ப்பை உண்டுபண்ண முடியும். எனவே, இந்த விடயத்தை முன்வைத்த கௌரவ உறுப்பினர் ரோஹண பண்டார அவர்களுக்கு நன்றி கூறி, விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඊ.එම්. බස්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.10]

**ගරු ඊ.එම්. බස්නායක මහතා**
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගොවියා වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීම" යන මැයෙන් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ගෙන ඒම පිළිබඳව ගරු රෝහණ බංඩාර මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ආණ්ඩුව හැටියට අපි ඉතිහාසයේ පළමුවැනි වතාවට ගොවියාගේ රක්ෂණය වෙනුවෙන්, ගොවියාගේ ආරක්ෂාව වෙනුවෙන් ගත්තු දැවැන්ත ක්‍රියා මාර්ග ටිකක් මම මේ අවස්ථාවේදී එළි දක්වන්න කැමැතියි. ඒවායෙන් එකක් තමයි, ගොවියාට ඉඩම් ලබා දීම වාගේම ගොවියාට ගොවිතැන කර ගැනීම සඳහා අවශ්‍ය ජලය ලබා දීම. අපි පසුගිය කාලවල දැක්කා, අද මේ ගොවි රක්ෂණය පිළිබඳව කථා කරන හිටපු ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් ඒ ජලාශ භූමි පවා අත්පත් කරගෙන තිබුණු ආකාරය. ඉඩම් සහ වාරිමාර්ග ඇමතිවරයා හැටියට අපේ ලාල් කාන්ත සහෝදරයා අද වන විට ඒ ජලාශ ආරක්ෂා කර ගැනීම වෙනුවෙන්, ජලාශ මැනුම්කරණය පටන් ගෙන තිබෙනවා. ඒ ජලාශ ආරක්ෂා කිරීම, ඒවා සංරක්ෂණය කිරීම ආණ්ඩුව හැටියට අපි ගොවියා වෙනුවෙන් ගෙන තිබෙන පියවරක්. ඒ වාගේම, පසුගිය කාලයේ ගොවීන්ට ලබා දුන් රුපියල් 15,000 මුදල රුපියල් 25,000 දක්වා වැඩි කරලා ලබා දී තිබෙනවා, ගොවියාගේ ආරක්ෂාව වෙනුවෙන්, ගොවිතැනෙහි වැඩිදියුණුව වෙනුවෙන්. අපි එමඟින් ගොවියාගේ ආරක්ෂාව සුරක්ෂිත කරලා තිබෙනවා; ස්ථාවර කරලා තිබෙනවා. ඒවා ආණ්ඩුව හැටියට ගොවියාගේ ආරක්ෂාව වෙනුවෙන්, ගොවියාගේ රක්ෂණය වෙනුවෙන් අප කරපු දේවල්.

අපි දන්නවා, ඉතිහාසය පුරාවට පැවැති හැම ආණ්ඩුවක්ම කරපු දේවල්. ගොවියාට ඉඩම දීලා තිබෙනවා, ඒ ඉඩමට වතුර ටික දීලා තිබෙනවා. ඒ වතුර ටික බටවලින් ගිහින් කුඹුරටම වැටුණා. හැබැයි, ගොවියාගේ අස්වැන්නට ස්ථාවර මිලක් එදා ලබා දුන්නේ නැහැ. ජාතික ජන බලවේගය ආණ්ඩුව හැටියට, ජනතාවාදී ආණ්ඩුව හැටියට, ගොවි ජනතාවගේ ආණ්ඩුව හැටියට අපි ගොවියා ගොවිතැන් කරලා ගන්නා අස්වැන්නට අද වන විට ස්ථාවර මිලක් ලබා දීලා තිබෙනවා. විශේෂයෙන්ම වී වලට ස්ථාවර මිලක් ලබා දීලා තිබෙනවා. ඒ නිසා ආණ්ඩුව හැටියට අපි අද ඒ ගැන සතුටු වෙනවා. ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා කිව්වා වාගේම, පසුගිය ආණ්ඩු කාල පුරාවට ඒ ආණ්ඩු වෙතින්, ඒ ඇමතිවරුන් වෙතින්, ඒ ජනාධිපතිවරුන් වෙතින් ඉෂ්ට කර ගන්න බැරි වෙච්ච දේවල් අපෙන් ඉෂ්ට කර ගන්න පුළුවන් කියන විශ්වාසය තැබීම ගැන, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට අපි ගෞරව කරනවා. ඒ විශ්වාසය අප කෙරෙහි තැබීම පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේමයි, වෙළෙඳ පොළ පිළිබඳ ප්‍රශ්නය ගත්තත්. ගොවීන්ගේ නිෂ්පාදන අළෙවි කර ගැනීම පිළිබඳ ලොකු ප්‍රශ්නයක් එදා තිබුණා. නමුත්, වත්මන් ආණ්ඩුව හැටියට අපි අද ගොවි නිෂ්පාදනවල වෙළෙඳ පොළ ස්ථාවර කරමින් තිබෙනවා. ඒ පිළිබඳව ගොවියා තුළ විශ්වාසය හදමින් තිබෙනවා.ගොවියාගේ නිෂ්පාදන වියදමට සරිලන, එහෙම නැත්නම් නිෂ්පාදන පිරිවැයට සරිලන මිලක් ගොවි නිෂ්පාදන වෙනුවෙන් ලබා දෙන වැඩ පිළිවෙළක් සකස් කරමින් ඉන්නවා. ඒ බව මේ අවස්ථාවේ විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

අවසාන වශයෙන්, මේ යෝජනාව ගෙන ඒම වෙනුවෙන් ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමාට නැවතත් ස්තුතිවන්ත වෙමින්, මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.15]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ ரோஹண பண்டார அவர்களால் கொண்டுவரப்பட்ட "விவசாயிகளுக்கான காப்புறுதித் திட்டமொன்றை ஆரம்பித்தல்" என்ற தனிநபர் பிரேரணையை நாங்கள் வரவேற்கின்றோம். உண்மையாக விவசாயிகள் இந்த நாட்டின் முதுகெலும்பாக இருப்பவர்கள். அவர்கள் இந்த நாட்டுக்காகப் பாடுபட்டு, நாட்டிலுள்ள மக்கள் பசியில்லாமல் வாழ்வதற்குத் தங்களது உயிரை அர்ப்பணித்துத் தியாகம் செய்கின்றவர் களாகக் காணப்படுகின்றார்கள். அந்த வகையிலே, விவசாயிகளைப் பாதுகாக்கவேண்டிய கடமையும் பொறுப்பும் இந்த நாட்டின் அரசுக்கு இருக்கின்றது. ஏனென்றால், கடந்த ஒவ்வொரு காலகட்டத்திலும் விவசாயிகள் கூடுதலாகப் பாதிக்கப்பட்டிருக்கிறார்கள்; பல நட்டங்களை எதிர்நோக் கியிருக்கிறார்கள். விவசாயத்தில் ஏற்பட்ட நட்டம் காரணமாகத் தங்களது உயிரைக்கூட மாய்த்திருக்கிறார்கள். அந்த வகையில், விவசாயத்தினால் அவர்களுக்கு ஏற்படுகின்ற நட்டத்தை ஈடு செய்வதற்கான வழிவகைகளை அரசு செய்ய வேண்டும்.

அது மட்டுமல்ல, கடந்த காலபோகத்தில்கூட விவசாயிகள் வெள்ளத்தினால் மிகவும் பாதிப்புக்கு உள்ளாகியிருந்தாலும் அதற்கான நட்ட ஈட்டுத் தொகை - காப்புறுதித் தொகை - அவர்களுக்குச் சரியான முறையிலே முற்றுமுழுதாக வழங்கப்படவில்லை. வெறுமனே இயற்கை அனர்த்தங்களால் மட்டுமல்லாமல், அதனோடு சம்பந்தப்பட்ட வேறு இழப்புகளும் அவர்களுக்கு ஏற்படுவதைக் காணக்கூடியதாக இருக்கிறது. விசேடமாக, விவசாயிகள் தங்களது இளம் பராயத்திலேயே கூடுதலாகச் சேற்றிலே நின்று விவசாயத்தைச் செய்து இந்த நாட்டுக்காக உழைத்து, மக்களின் பசியைப் போக்குகின் றவர்கள். அவர்கள் தங்களுடைய கடைசிக் காலத்திலே - இறுதிக் காலத்திலே - ஒன்றும் செய்ய முடியாமல் வீட்டிலே முடங்கிக் கிடக்கின்ற ஒரு சூழ்நிலை இருக்கின்றது. அப்படி நாட்டுக்காக உழைத்த விவசாயிகள் வீட்டிலே முடங்கிக் கிடக்கின்ற அவர்களுடைய வயதான காலத்தில் அவர்களுக் கெனச் சிறந்ததொரு காப்புறுதித் திட்டத்தை - ஓய்வூதியத் திட்டத்தை - இலவசமாக நடைமுறைப்படுத்த வேண்டிய கடமையும் பொறுப்பும் இந்த அரசுக்கு இருக்கின்றது. மேலைத்தேய நாடுகளிலே விவசாயிகளைப் பாதுகாப் பதிலேதான் கூடுதலான கவனம் செலுத்தப்படுகின்றது.

அதுமட்டுமல்ல, அவர்கள் விவசாய ரீதியாகக் கடன்களைப் பெறுகின்றபொழுது அந்தக் கடன்களுக்கான வட்டி என்பது மிகவும் அதிகமாகக் காணப்படுகின்றது. Microcredit போன்ற நுண்கடன் வழங்கும் சில நிறுவனங்கள் விவசாயிகளுக்குக் கடன் வழங்கும் சந்தர்ப்பத்தைப் பயன்படுத்தி மீற்றர் வட்டி முறையில் மிகக் கூடுதலான வட்டியை அறவிடுகின்றன. அவ்வாறு கடன் பெற்று விவசாயம் செய்யும்போது, இழப்புகள் ஏற்படின் அவர்கள் அதைத் தாங்கிக்கொள்ள முடியாமல் தமது சொத்துக்களை, நிலங்களை விற்பனை செய்கின்ற துர்ப்பாக்கிய நிலைமைக்குத் தள்ளப்படுகின்றார்கள். எனவே, அந்த விவசாயிகளைப் பாதுகாக்க வேண்டும். அவர்களது நெல்லுக்குரிய நிர்ணய விலையைச் சரியான நேரத்தில் வழங்க வேண்டும். உரிய நேரத்தில் நெல்லின் விலையை நிர்ணயிக்கின்றபோதுதான் அந்த விவசாயிகளைப் பாதுகாக்க முடியும். விசேடமாக அம்பாறை மாவட்டத்தில் கூடுதலான விவசாயிகள் இவ்வாறு பாதிப்புக்குள்ளாகி இருக்கின்றார்கள்.

அதேபோல், அவர்களுக்கு ஏற்படுகின்ற விவசாயப் பயிர் பாதிப்புகளுக்கு உரிய நேரத்தில் அதற்குரிய நஷ்ட ஈட்டுத் தொகையை வழங்க வேண்டும். தியாக மனப்பான்மையுடன் செயற்படுகின்ற விவசாயிகளை இந்த நாடு கைதூக்கிவிட வேண்டும். அந்த வகையில், போற்றப்பட வேண்டியவர்களாக இருக்கின்ற விவசாயிகளை இந்த அரசாங்கம் பாதுகாக்க வேண்டுமெனக் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.19]

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා ගෙන ආ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව වැදගත් යෝජනාවක් විධියට අපි මේ වෙලාවේ ප්‍රකාශ කරනවා. ඒ යෝජනාව අපි අනුමත කරනවා. විශේෂයෙන්ම අපට කියන්න ඕනෑකම තිබෙනවා, අපේ රටේ ගොවි ජනතාව ඉතා වැදගත් කණ්ඩායමක් කියන එක. ඒ පිළිබඳ විවාදයක් නැහැ.

ගොවියා පසුගිය කාල පරාසය තුළ සිය දිවි නසා ගත්තා. ගොවියා අන්ත අසරණ වුණා. ඔවුන්ගේ කනකර, නඟුල, අත්ට්‍රැක්ටරය බැංකුවට සින්න වුණා. උකස්කරුවන්ට සින්න වුණා. වගාවේ ආරම්භයේ සිට අස්වනු නෙළන තැන දක්වා ගොවියා සතුටු වුණා. විවිධ අවස්ථාවල සතුටු වුණා. නමුත්, අස්වනු නෙළන අවස්ථාව වෙනකොට ඒ සතුට පැළදොරින් පැනලා ගියා. මේක තමයි තත්ත්වය. වර්තමානයේත් ඒ ගැටලුව සියයට සියයක් විසඳිලා නැහැ. නමුත්, මේ ගැටලුව විසඳීමට අදාළව අපි ප්‍රවේශයක් අරගෙන තිබෙනවා, අමාත්‍යාංශයක් විධියට, ආණ්ඩුවක් විධියට. වෙන යල කන්නවලට වඩා පසුගිය යල කන්නයේ හෙක්ටෙයාර 80,000කට වැඩි ප්‍රමාණයක් වගා කළා. දැනට තිබෙන තොරතුරු අනුව වෙන මහ කන්නවලට වඩා මේ මහ කන්නයේත් හෙක්ටෙයාර 50,000කට ආසන්න ප්‍රමාණයක් අමතරව වගා කරනවා. ඒ තත්ත්වයත් එක්ක පොහොර සහනාධාරය සඳහා අමතරව මුදල් වෙන් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා වගාව පැත්තෙන් ගත්තාම ගොවියාගේ උනන්දුවක් ඇති වෙලා තිබෙනවා.

පොහොර සහනාධාරය වශයෙන් හෙක්ටෙයාර 2ක් සඳහා ගොවියාට ලැබුණේ, රුපියල් 30,000යි. දැන් රුපියල් 50,000ක් ලැබෙනවා. අතුරු භෝග වගා කරන ගොවීන්ට සහනාධාර ලැබුණේ නැහැ. දැන් ඒ ගොවීන්ටත් හෙක්ටෙයාර දෙකක් සඳහා රුපියල් 30,000ක් ලැබෙනවා. පසුගිය යල කන්නයේත් ඒ සහනාධාරය ලැබුණා. අපනයන භෝග වගා කරන ගොවීන්ට පැළ නොමිලේ ලබා දෙන්නත්, වෙනම ආධාර මුදල් - ණය නොවෙයි - ලබා දෙන්නත් මේ වෙනකොට කටයුතු සූදානම් කර තිබෙනවා; වැඩසටහන් දියත් කර තිබෙනවා. වාරි පද්ධති සකස් කරමින්,

ප්‍රතිසංස්කරණය කරමින් ගොවියාගේ ජල ප්‍රශ්නය විසඳීමට මැදිහත් වෙමින් ඉන්නවා. විශේෂයෙන්ම අපට ඉලක්කයක් තිබෙනවා, 2028 අවසන් වෙනකොට හෙක්ටෙයාරයකින් වී කිලෝ 7,000කට වැඩි ප්‍රමාණයක් ලබා ගැනීමේ සැලැස්මකට යන්න. ඒ සැලැස්මට අනුව අපි දැන් මේ වෙනකොට යම් විද්‍යාත්මක ක්‍රම දියත් කරන්න පටන් අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම ඉදිරියේදී පොහොර භාවිතය අඩු කර ගන්නත්, පොහොර වෙනුවෙන් යන වියදම අඩු කර ගන්නත්, පස විනාශ වෙන එක අවම කර ගන්නත්, අස්වැන්න වැඩි කර ගන්නත් අපි යම් ක්‍රමවලට අතගහලා තිබෙනවා. පස පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය මේ වෙනකොට වේගවත් කරලා තිබෙනවා. එපමණක් නොවෙයි. අලුත් බීජ ප්‍රභේද හඳුන්වා දෙමින්, වැඩි ඵලදාවකට -අස්වැන්නකට - යා හැකි කෘෂිකර්මාන්තයකට අපි මේ වෙනකොට අතගහලා තිබෙනවා. මේ සියලු තත්ත්ව තුළ කුඩා භූමියකින් වැඩි ඵලදාවක් ලබා ගැනීමේ සැලැස්ම ක්‍රියාත්මක වන අතරේ, වෙළෙඳ පොළ ප්‍රශ්නයත් බේරන්න ඕනෑ. වෙළෙඳ පොළ ප්‍රශ්නය බේරන්නේ නැතුව අපි කොච්චර ඉස්සරහට ගියත් වැඩක් නැහැ. නමුත් ඒක එක පාරට කරන්න බැහැ. හැබැයි, එකින් එකට අපි ඒ ගැටලු ටිකත් බේරාගෙන, බේරාගෙන එනවා. තවත් කන්න කිහිපයක් යනකොට අපට යම් තැනකට එන්න පුළුවන්කම තිබෙනවා.

ඊයේත් අපි දවසම ගත කළේ, පේරාදෙනිය, ගන්නෝරුවේ. අපේ කෘෂි නිෂ්පාදනවලට අදාළව රටේ විවිධ ස්ථානවල අද විශාල වශයෙන් අගය එකතු කළ නිෂ්පාදන බිහි වෙනවා. අන්න ඒවාට වටිනාකමක් දීලා, ව්‍යවසායකයන්ට ඉඩකඩ හදලා දීලා, කෘෂි ක්ෂේත්‍රයත් එක්ක ගැට ගැහිච්ච කර්මාන්ත පද්ධතියකට අපි යන්න ඕනෑ. අපි එතැනට අනිවාර්යයෙන් යනවා. ඊට අදාළ මූලික ප්‍රවේශය අපි අරගෙන තිබෙනවා. අන්න ඒ තත්ත්වය තුළ වෙළෙඳ පොළ ප්‍රශ්නයත් බේරන්න ඕනෑ. ඒ සමස්ත ක්‍රියාවලිය ඇතුළේ ගොවියාගේ ආදායම වැඩි වෙනවා; ආදායම වැඩි කරන්න ඕනෑ. ගොවියාට හැමදාටම වැඩ කරන්න බැහැ, මහන්සි වෙන්න බැහැ. ඔබතුමා ඉදිරිපත් කළ යෝජනාව හරි, රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමනි. ඒක අපි පිළිගන්නවා; අනුමත කරනවා. සාමාන්‍යයෙන් අනෙක් මිනිසුන්ට වඩා ටිකක් වැඩියෙන් ගොවියා වැහැරිලා යනවා. ඔහුගේ අඟ පසඟ ටිකක් දුර්වල වෙනවා. දුර්වල වෙලා ඔහු ලෙඩ වෙනවා. උදේත් මෙතැන කියැවුණා, මී උණ ගැන. අනෙක් පැත්තෙන් වකුගඩු රෝගය. ඒ වාගේ ලෙඩවලින් වැඩිපුරම පීඩාවට පත් වෙන්නේ, ගොවි ජනතාව. අන්න ඒ තත්ත්වය තුළ අබල දුබල වෙච්ච ගොවියා ආරක්ෂා කරන්න, යම් කිසි රක්ෂණයක් අවශ්‍යයි. ඒ නිසා ඒ ගැන අපි ගැඹුරින් කල්පනා කරලා තිබෙනවා. ඒ අනුව දැනටත් ක්‍රියාත්මක කරගෙන එන වී, බඩ ඉරිඟු, අල, ලොකු ලූනු, සෝයා, මිරිස් යන භෝග හයක් සඳහා වගාවක් හානි වුණාට පස්සේ ලබා දෙන රක්ෂණ මුදල ලබා දීම අපි අඛණ්ඩව ක්‍රියාත්මක කරගෙන යනවා. ඇත්තටම ඒ මුදල ප්‍රමාණවත් නැහැ, මදි. ඒ මුදල ඉදිරියේදී වැඩි වෙන්න ඕනෑ. අපි ඒ පිළිබඳව සලකා බලමින් ඉන්නවා.

එපමණක් නොවෙයි. මේ වෙනකොටත් කෙසෙල්, රබර්, පොල් වාගේ භෝග රක්ෂණය කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම අනෙකුත් භෝග රක්ෂණය කරමින්, ධීවරයා රක්ෂණය කරමින් ඔවුන් වෙනුවෙන් මැදිහත් වෙමින් ඉන්නවා. ඒ වාගේම ගොවි විශ්‍රාම වැටුප ගැනත් කියන්න ඕනෑ. මේ වෙනකොට 178,753දෙනෙක් ගොවි විශ්‍රාම වැටුප ලබනවා. මේ වෙනකොට ගොවි විශ්‍රාම වැටුපට දායක වෙච්ච ගොවියෝ, පරණ ක්‍රමයට දායක වෙච්ච ගොවියෝ 850,000කට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. ඒ පරණ ක්‍රමය වෙනස් කරලා, ගොවියාට තවත් වාසිසහගත තත්ත්වයක් උදා වන විධියට අලුත් ක්‍රමයක් හඳුන්වා දීලා තිබෙනවා. මේ අවුරුද්ද තුළ 13,000කට වැඩි ප්‍රමාණයක් ගොවි ජනතාව ඒ සඳහා දායක වෙලා තිබෙනවා. ගොවි විශ්‍රාම වැටුපත් තවත් ඉස්සරහට යන්න ඕනෑකම තිබෙනවා.

ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාත්, රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමාත් මතු කළා, අලින්ගෙන් සිදු වන කරදර ගැන. අලියෙක් ගහලා මිනිහෙක් මැරුණොත් ඒ පවුලට මීට කලින් ලැබුණේ, රුපියල් 250,000යි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
අවසන් කරනවා.

අපි අද ඒ මුදල රුපියල් 1,000,000 දක්වා වැඩි කරලා තිබෙනවා. ඉතින් ඒකත් එක්ක අපේ යෝජනාවක් තිබෙනවා. ඒ යෝජනාවට අපි අරමුදල් එකතු කරන්න ඕනෑ; අරමුදල් හදන්න ඕනෑ. ඒකටත් අපේ සැලැස්මක් තිබෙනවා. අපි ඒ සැලැස්ම ක්‍රියාත්මක කරනවා. ඒ අනුව, වයෝවෘද්ධ ගොවි ජනතාව වෙනුවෙන්, ඔහු මැරෙනතුරු කිසියම් දීමනාවක්, කිසියම් වැටුපක් -වේතනයක්- ලැබෙන විධියට ක්‍රමයක් හදන්න ඕනෑ. ඊට අදාළ යෝජනාවක් අප තුළ තිබෙනවා. ඒ යෝජනාව ඉදිරියේදී ක්‍රියාවට නැඟීමට අපි මැදිහත් වෙනවාය කියන කාරණය මේ වෙලාවේ මතක් කරනවා. වයසට ගිය ගොවි ජනතාවට සැනසුම් සුසුම් හෙළන්න පුළුවන් තත්ත්වයක් නිර්මාණය කිරීම සඳහා අනිවාර්යයෙන්ම අපි මැදිහත් වෙනවාය කියන කාරණය ප්‍රකාශ කරමින්, මේ යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමාට අපේ ස්තුතිය පුද කරමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.27]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම යෝජනාව අනුමත කරමින්, මෙම යෝජනාවට දායකත්වය ලබා දෙමින් කථා කළ ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමාට, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමාට, ගරු ඊ.එම්. බස්නායක මන්ත්‍රීතුමාට වාගේම, විපක්ෂයේ ගරු අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමාට සහ ගරු කෝඩීස්වරන් මන්ත්‍රීතුමා ප්‍රමුඛව මේ යෝජනාව වෙනුවෙන් අදහස් දැක්වූ සෑම කෙනෙකුටම මම ස්තුතිවන්ත වනවා.

ආණ්ඩු පක්ෂයෙන් අපට අහන්න ලැබුණේ මේ සියල්ලම කරනවා කියලායි. ඔය කථාව තමයි ඉතිහාසය පුරාවටම මේ පාර්ලිමේන්තුවේ දෝංකාර දුන්නේ. ඒ පාර්ලිමේන්තු නියෝජනය කරපු අපි විපක්ෂයේ හිටපු නිසා, විපක්ෂයේ මන්ත්‍රීවරු විධියට ඔබතුමන්ලාට චෝදනා කර කර ඉන්නවා වෙනුවට මේ යෝජනා ගෙනෙන්නේ මේවා රටේ කවුරුන් හෝ විසින් ඉෂ්ට කළ යුතු කාරණා නිසායි. ඔබතුමන්ලාගේ කථාවලදී බොහොම පැහැදිලිව කිව්වා, මේවා ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලා කටයුතු කරනවා කියලා. මේ සියලු කාරණා අපේ රටේ සුබසිද්ධිය වෙනුවෙන් සිද්ධ වන කාරණා.

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

අපේ ඇමතිතුමාගෙන් මට අහන්න ලැබුණා, ගිය යල කන්නයේ වාගේම මේ මහ කන්නයෙත් වැඩිපුර -ගිය මහ කන්නයට වඩා- හෙක්ටෙයාර 50,000ක් වගා කරන්න සූදානමින් ඉන්නවා කියලා. මේ මොහොත වනවිට අපේ රටේ කීරි සම්බා හිඟයක් තිබෙනවා. ඔබතුමන්ලාගේ සැලැස්ම මොකක්ද කීරි සම්බා වැඩිපුර වගා කරන්න? හැබැයි, ගිය යල කන්නයේ ඔය වාගේම කීරි සම්බා වැඩිපුර වගා කළ නිසා නාඩුවලට වඩා කීරි සම්බා මිල පහළ බැස්සා. එහෙම වුණාම ඒ වගා කරන ගොවියාට දෙන ආරක්ෂණය මොකක්ද? ගිය කන්නයේ වාගේ මේ කන්නයෙත් එතැනටමද අපි පත් වෙන්නේ? මේ මොහොත වනවිට මේ රටේ කීරි සම්බාවල විශාල හිඟයක් තිබෙනවා. තව මාස දෙක තුනක කාලයක් මේ හිඟයත් එක්ක අපි යන්න ඕනෑ. එහෙම නම්, ඔබතුමන්ලා ලබන කන්නයට දැන් ඉඳලාම සැලසුම් කරන්න. ගොවීන් පොලඹවන්න ඕනෑ කීරි සම්බා වගා කරවන්න. ඒ කීරි සම්බා ටිකත් මේ රටේ ප්‍රධාන මෝල් හිමියන් විතරක් මිලදී ගන්නේ නැති වෙන්න වැඩ පිළිවෙළක් සකස් කළ යුතු වනවා. කීරි සම්බා අනෙකුත් මෝල් හිමියන් ළඟත් ගබඩා කරන්න පුළුවන් ශක්තිය ඔබතුමන්ලා ඇති නොකළොත්, වැඩියෙන් වගා කළත් කීරි සම්බා මිල තුට්ටුවට බැහැලා, අවසානයේ ගොවියාත් අසාධාරණයට පත් වෙනවා. කීරි සම්බා ටික ප්‍රධාන මෝල් හිමියන් ළඟට ගියාම, ඒ කට්ටියගේ බ්‍රෑන්ඩ් එකට නියම වෙච්ච මිලක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින සභාවේ වැඩ කටයුතු ඉදිරියට කරගෙන යෑම සඳහා කාලය ලබා ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ප්‍රධාන මෝල්වලට ඒ වී ගියාම ඒ කට්ටියගේ බ්‍රෑන්ඩ් එකට නියම වෙච්ච මිලක් තිබෙන නිසා ඒ හරහා ඇතිවන හිඟය මඟ හරවා ගැනීමට ඔබතුමන්ලා ක්‍රියාත්මක වනවාද? ඒ නිසා, "අපි පොරවල්, අපි සියල්ල දන්නවා, 76 වසරක් නොකරපු නිසා තමයි අපට බලය ලැබුණේ, අපි මේක කරලා පෙන්වන්නම්" කියලා නම් අත පිහදාගන්න බැරි වෙනවා. ඔබතුමන්ලාට දීපු කාලයෙන් වසරකුත් අවසන් වෙලා තිබෙනවා. ඔබතුමන්ලා බලයේ ඉන්න කාලය එන්න එන්න කෙටි වෙනවා. අපි මේක කරනවා, කරනවා කියලා හිටියාට නම් වැඩේ කෙරෙන්නේ නැහැ. ඉස්සර හිටපු අයත් ඕකම තමයි කිව්වේ. ඒ නිසා මේ කටයුත්ත පිළිබඳව සාධාරණව අවධානය යොමු කරලා, ඉක්මනින් මේ සඳහා ආරම්භයක් ගනිමු. මේකට සර්ව සම්පූර්ණ මොඩලයක් අපට ගෙනෙන්න බැරි වෙයි. හැබැයි, ආරම්භයක් ගන්න ඔබතුමන්ලා උත්සාහ කරනවා නම්, විපක්ෂය විධියට සහ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුදෙනා විධියට අපි ඒකට සහයෝගය ලබා දෙන්න සූදානම් කියන කාරණය මේ මොහොතේ මම මතක් කරනවා. මේ රටට බත සපයන, අපේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා දෙන ගොවියා සුරක්ෂිත කිරීම වෙනුවෙන් තමයි මා මේ යෝජනාව ගෙනාවේ. මේ යෝජනාවට සහයෝගය දුන් සෑම කෙනාටම ගෞරවනීය ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්සර අය මහ හැරපු විධියට ඔබතුමන්ලාත් මහ හරන්න එපා කියලා එතුමා කිව්වා. ඉස්සර කරපු අය තමයි ඒ කථා කළේ. අපි කියපු විධියට අනිවාර්යයෙන්ම මේ කටයුතු දැනටමත් ආරම්භ කර තිබෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු අර්ජුන සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

## ජාතික පොලිස් කොමිෂන් සභාවේ ස්වාධීනත්වය තහවුරු කිරීම
## தேசிய பொலிஸ் ஆணைக்குழுவின் சுயாதீனத் தன்மையை உறுதிப்படுத்தல்
## UPHOLDING INDEPENDENCE OF NATIONAL POLICE COMMISSION

[අ.භා. 3.31]

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 19(2) අනුව, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1991 පාර්ලිමේන්තු පනතක් මඟින් ස්ථාපිත කළ පොලිස් කොමිසම වඩාත් ශක්තිමත් ස්වාධීන කොමිසමක් ලෙස ස්ථාපිත කිරීම දහහත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් සිදු කරන ලදී.

> විසි එක්වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් එය නැවතත් තහවුරු කරන ලදී. පොලිස් කොමිසමේ විෂය පථයට අයත් වූ පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ මාරුවීම් විශේෂ ගැසට් නිවේදනයක් මඟින් පොලිස්පතිවරයාට පැවරීමට කටයුතු කරන බවට මාධ්‍ය වාර්තා පළ වී ඇත.
>
> පොලිස් කොමිසමේ ස්වාධීනත්වය තහවුරු කිරීමට වහාම පාර්ලිමේන්තුව මැදිහත් විය යුතු යැයි මම යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්වාධීන කොමිෂන් සභා ඇති වුණේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, යහ පාලනය, සාධාරණත්වය සහ නීතියේ ආධිපත්‍යය වැනි දේවල් ස්ථාපනය විය යුතුයි කියන ඉතාම හොඳ සංකල්පයකින්. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේම තමයි මෙම කොමිෂන් සභා නවය පිහිටුවනු ලැබුයේ. ඒ කොමිෂන් සභා නවය තමයි මැතිවරණ කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව, විගණන සේවා කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව, මුදල් කොමිෂන් සභාව, සීමා නිර්ණය කොමිෂන් සභාව සහ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියලු ආයතන ස්වාධීන වීම ඉතාම වැදගත්. පසුගිය දීර්ඝ ඉතිහාසය තුළ දේශපාලන නායකවරු විශාල ලෙස සටන් කිරීම නිසා තමයි මෙම කොමිෂන් සභා ස්වාධීන කිරීම තුළින් රටේ යහ පාලනය ස්ථාපිත කර ගැනීමට හැකියාව ලැබිලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථාවක් තිබෙනවා "බලය තිබෙනකොට මොළය නැහැ, මොළය තිබෙනකොට බලය නැහැ" කියලා. විශේෂයෙන් ආණ්ඩු පක්ෂයේ සිටිද්දී බලය තමන්ගේ අතට අරගෙන ක්‍රියා කරනකොට, ආණ්ඩු පක්ෂයේ සිටින සියලුම මන්ත්‍රීවරුන්ට ඒකේ පොඩි ආස්වාදයක් තිබෙනවා කියලා හිතෙන්න පුළුවන්. I am glad that the Hon. Prime Minister is also here. I believe she comes from a background where good governance and democracy are upheld. I also believe those norms are still being upheld by you, Hon. Prime Minister and think that you would not be a part of this administration, which is going to actually destroy those norms. ගරු අගමැතිතුමිය වාගේ යහ පාලනය වෙනුවෙන් විශාල ලෙස සටන් කරපු කොටසක් ආණ්ඩු පක්ෂයේත් ඉන්නවා. ආණ්ඩු පක්ෂයේ සිටිද්දී මේක නොදැනෙන්න පුළුවන්. මට මතකයි, මම ආණ්ඩු පක්ෂයේ සිටියදී විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙකුව අත්අඩංගුවට ගත් අවස්ථාවේ, එසේ අත්අඩංගුවට ගන්නවා නම් කථානායකවරයා දැනුවත් කළ යුතුයි කියා කියද්දී ආණ්ඩු පක්ෂයේ කවුරුත් ඒ සම්බන්ධයෙන් කථා කළේ නැහැ. හැබැයි ආණ්ඩු පක්ෂයේ හිටියත් මම නැඟිටලා කිව්වා, මේ රටේ සාධාරණත්වය ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියලා. මොකද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් කියන්නේ යම් වරප්‍රසාදයක් හිමි පුද්ගලයෙක්. මන්ත්‍රීවරයෙකුව සිටිමින් ආණ්ඩු පක්ෂයට විරුද්ධව කථා කරනවා නම්, ගොඩක් වෙලාවට නීතිය ක්‍රියාත්මක කරලා පළිගැනීම්වලට ලක් කරන්න පුළුවන්. ඒ නිසා මම ඒ අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයද, විපක්ෂයද කියලා බලන්නේ නැතිව කිව්වා, අත්අඩංගුවට ගන්නවා නම් අනිවාර්යයෙන්ම කථානායකවරයා දැනුවත් කළ යුතුයි කියලා. ගරු අගමැතිතුමියනි, මම හිතන විධියට ඒ අවස්ථාවේදී මම විතරයි ඒ අදහස ප්‍රකාශ කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව මේ වෙනකොට දැනුවත්ව හෝ නොදැනුවත්ව ඉතාම සාහසික ලෙස මෙම ආයතන දේශපාලනීකරණය කරමින් සිටිනවා. මම ගරු අගමැතිනියගේ අවධානයට මේ කාරණය යොමු කරනවා, එතුමිය අල්ලස් කොමිසම විශ්වාස කරන කෙනෙක් නිසා. ඔබතුමියලා ආණ්ඩු පක්ෂයේ සිටිද්දී ඒක විනෝදාංශයක් වාගේ පෙනෙන්න පුළුවන්. ඒ වාගේම CID එක, පොලීසිය වාගේ ආයතන ආණ්ඩු පක්ෂය යටතේ තිබීමම, ඒ කියන්නේ පොලිස්පතිවරයා පත් කිරීම තුළින්ම යම් ආකාරයකින් දේශපාලනීකරණයක් වෙනවා. පොලිස්පතිවරයා ඇතුළු අල්ලස් කොමිසමේ බලතල දරන සියලු නිලධාරින් ස්වාධීන කොමිෂන් සභා හරහා, ස්වාධීන පුද්ගලයන්ගෙන් පත් කරන්න පුළුවන් නම් අපි ඇත්තටම සන්තෝෂයි. නමුත් ඒක වෙන්නේ නැහැ. ජනාධිපතිවරයාට, විධායකයට යම්කිසි පාලනයකුත් අවශ්‍යයි. අපි ඒක පිළිගන්නවා. හැබැයි ඒ පත් කිරීම තුළම යම් දේශපාලනීකරණයක් තිබෙනවා. ඒ දේශපාලනීකරණය පුළුවන් තරම් දුරට නැති කර ගන්න, සමනය කර ගන්න තමයි මේ කොමිෂන් සභා ටික ස්ථාපනය වුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේම සඳහන් කරනවා, මේ කොමිෂන් සභාවලට පත් කරන නිලධාරින්ගේ ස්වාධීන බව රැක ගන්න නම් ඔවුන් නිර්දේශපාලන පුද්ගලයන් විය යුතුයි කියලා. ඒ සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා, "...පොදු හෝ වෘත්තීය ජීවිතයේ දී කීර්තියට පත්, කිසිදු දේශපාලන පක්ෂයක සාමාජියන් නොවන තැනැත්තන් විය යුතු අතර ඔවුන් නම් කරනු ලැබීම පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබිය යුත්තේ ය" කියලා. මේ පුද්ගලයන්ගේ ස්වාධීන බව, අධ්‍යාපනය, හැදියාව කියන සියලු කාරණා අදාළ කර ගන්නවා, මේ ආයතන ස්වාධීන කර ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අපට ආරංචි වන විධියට, මේ අවස්ථාවේ පොලිස් කොමිසමේ තිබෙන බලතල පොලිස්පතිවරයාට දෙන්න යනවා. මම මේ ගැන විශේෂයෙන්ම ගරු කථානායකතුමාට, දන්වා සිටියා; since he is the Chairman of the Constitutional Council, I have already written a letter to him on 08.10.2025, the first paragraph of which states, I quote:

> "Urgent Parliamentary Intervention Required to Preserve Constitutional Independence of the National Police Commission.
>
> A troubling development requires immediate legislative action. Powers are being transferred from the National Police Commission to the Inspector General of Police, fundamentally subverting our constitutional architecture. This is not an isolated incident - the Executive has repeatedly attempted to undermine the Commission's authority through various means. Constitutional Council must intervene without delay."

මට ආරංචි විධියට, ගරු කථානායකතුමා මේ සම්බන්ධයෙන් යම් පියවරක් ගෙන තිබෙනවා. මේ සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේදී යම් තීන්දුවක් අරගෙන ඒ සම්බන්ධව මේ වෙනකොට කොමිෂන් සභාව දැනුවත් කර තිබෙනවා. ඊයේ තමයි කොමිෂන් සභාවේ ඒ තීන්දුව ගන්න තිබුණේ. යම් කිසි ආකාරයකින් ඒක කල්දමා තිබෙනවා කියලා මට ආරංචියක් ලැබී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණයත් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. එතුමාටත් මතක ඇති, එතුමා විපක්ෂයේ සිටි කාලයේ - මම හිතන විධියට දූෂණ විරෝධී කමිටුවේ සාමාජිකයකු වශයෙන් එතුමා කටයුතු කළ කාලයේ - මේ ආකාරයෙන්ම විපක්ෂයේ සිටිමින් යම් යම් දේවල් සම්බන්ධයෙන් හඬ නැගූ බව. මම හිතන විධියට, එසේ කළේ ආණ්ඩු පක්ෂයෙන් ස්ථාපිත කළ කමිටුවක එතුමා කටයුතු කරද්දී. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අපට පෙනෙනවා, මේ වෙනකොට මේ ආයතන ඉතාම නින්දිත ලෙස දේශපාලනීකරණය කරමින් සිටින බව. මම උදාහරණ දෙන්න කැමැති නැහැ, අධිකරණ කටයුතු පවතින නිසා. හැබැයි, CID එක, ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම අරගෙන බලන්න. CID එකේ සමහර නිලධාරින් කියනවා,

[ගරු නිතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

විශේෂයෙන්ම පළිගැනීම් සිදු කරන්න, විරුද්ධ පාර්ශ්වයේ දේශපාලනඥයන්ට විරුද්ධව කටයුතු කරන්න ඒ අදාළ නිලධාරින් අපට pressurize කරනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන්ට විරුද්ධව යම් යම් චෝදනා එනකොට පොලිස්පතිතුමා, අල්ලස් කොමිසම ක්‍රියාත්මක වෙන්නේ නැති බව අපට පෙනෙනවා. විශේෂයෙන්ම මේ ආණ්ඩුව යටතේ ඒක අපට ඉතා පැහැදිලිව පෙනෙනවා. ඒ වාගේම අර කන්ටේනර් හොරකම සම්බන්ධව ගත්තාම, ඇමතිවරු මාරු කළාට එම නීති කටයුතු ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඇමතිකම් සම්බන්ධයෙන් යම් ආකාරයක සමාලෝචනයක් කර තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව මීට වඩා ක්‍රියාත්මක වෙලා මෙම ආයතන ස්වාධීන කරලා, මෙම ආයතන දේශපාලනීකරණය කිරීම වළක්වයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමා මේ අවස්ථාවේ සභාවේ සිටින නිසා එතුමාගේ ධුර කාලය තුළ රට තුළ සිදු වී තිබෙන අපරාධ සම්බන්ධව මම එතුමාගේ අවධානය යොමු කරවනවා. රට තුළ මෙවැනි තත්ත්වයක් පවතිද්දී, මෙම ආයතන දේශපාලනීකරණය කළොත් රටේ ආරක්ෂාව මීටත් වඩා අවදානම් තත්ත්වයකට පත්වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 වසරේ සිට මේ දක්වා සිදුවී තිබෙන සංවිධානාත්මක අපරාධ සිදුවීම් සම්බන්ධයෙන් වූ වාර්තාවක් මම ලබා ගත්තා. මම එය ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. මෙහි සඳහන් වන ආකාරයට 2024 වර්ෂයේ - එතුමන්ලා බලය ගන්න ළං වෙනකොට - සිදුවී තිබෙන මුළු සිදුවීම් ගණන 74ක්. හැබැයි, ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලය තුළ; මාස 7ක - ජනවාරි, පෙබරවාරි, මාර්තු, අප්‍රේල්, මැයි, ජූනි, ජූලි - කාලය තුළ ඝාතන 64ක් සිදු වෙලා තිබෙනවා. ඒ කියන්නේ, මාස 7ක් ඇතුළත. 2024දී සිදු වුණු ඝාතන ප්‍රමාණය හා සමාන ප්‍රමාණයක් මේ මාස 7 ඇතුළත සිද්ධ වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වාර්තාව **සභාගත*** කරනවා.

2022, 2023 වර්ෂවල සිදුවුණු සිදුවීම් පිළිබඳ විස්තරත් මෙහි සඳහන් වෙලා තිබෙනවා. මට එම වාර්තාවත් ලැබී තිබෙනවා. නමුත් ඊට වඩා විශාල ලෙස මේ මාස 7 ඇතුළත මේ අපරාධ රැල්ල වැඩි වෙලා තිබෙනවා. මාස 7ක දත්ත විතරයි මට ලැබුණේ; ජූලි මාසය දක්වා විතරයි මට ලැබුණේ. ඊට පසුව ඒවා මට ලැබුණේ නැහැ. වෙඩි තැබීම්, තියුණු ආයුධවලින් පහර දීම් හා වෙනත් යනාදී සියල්ලෙහි එකතුව ගත්තොත්, 2022දී සිදුවීම් 76ක් වෙලා තිබෙනවා, 2023දී 102යි, 2024දී 94යි, 2025 මේ මාස 7ට සිදුවීම් 80ක් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. රටේ මේ වාගේ තත්ත්වයක් තමයි දැන් උදා වෙලා තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, සාධාරණව බැලුවොත්, දේශපාලන කණ්ඩායම් අයින් කර බැලුවොත් ඔබතුමාට පෙනී යයි, පොලීසිය යම් යම් අවස්ථාවලදී දේශපාලනික වශයෙන් පළිගැනීම් කරමින් කටයුතු කරන්නේ කොහොමද කියලා. මම වෙනම අවස්ථාවක ඔබතුමාට විශේෂයෙන්ම මේ කාරණා ගෙනහැර දක්වන්නම්. මට ඔබතුමා එක්ක කථා කරන්න හම්බ වුණේ නැහැ, මේ සම්බන්ධයෙන්. හැබැයි ඔබතුමා දන්නවා, මෙවැනි සිදුවීම් වෙන බව. මේ රටේ මේ අපරාධ රැල්ල වැඩි වෙනකොට, මේ මාස 6 තුළ - ඉතුරු මාස 6 අපි ගණන් කරලාත් නැහැ - මෙහෙම වෙලා තිබෙනකොට, විශේෂයෙන්ම පොලිස් කොමිසමට තිබෙන බලතල අනුව පොලීසියේ නිලධාරින්ට ස්වාධීනව කටයුතු කරන්න බැරි තත්ත්වයක් පවතිනවා. Administration එකත් පොලිස්පතිවරයාගේ, ඒ වාගේම විනය සම්බන්ධයෙන් කටයුතු කරන්නේත් පොලිස්පතිවරයා. එතකොට, එක පුද්ගලයායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, please give me one more minute.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ස්වාධීන කොමිෂන් සභා ඇති කළේ, ඒ ආයතන හොඳට පවත්වාගෙන යන්න පුළුවන් වපසරිය හදන්නයි. මම දන්නේ නැහැ, මේකේ ඇත්ත නැත්ත මොකක්ද කියලා. කොමිසමේ බලතල කොමිසමෙන් ඉවත් කරලා පොලිස්පතිවරයාට පැවරුවොත්, දැන් රටේ තිබෙන අපරාධ තත්ත්වයට වඩා බරපතළ තත්ත්වයක් ඉදිරියේදී ඇති වෙන්න පුළුවන්. ඒ වාගේම පොලීසිය කඩා වැටෙන්න පුළුවන්, නිලධාරින්ගේ විශ්වාසය කඩා වැටෙන්න පුළුවන්. ආණ්ඩු මාරුවෙනවා. ඔබතුමන්ලා හැමදාම ආණ්ඩු පක්ෂයේ ඉන්නේ නැහැ. ඊළඟ පාර එන ආණ්ඩුව අවුරුද්දෙන්, දෙකෙන්, තුනෙන් මාරු වෙන්න පුළුවන්. ඒ වාගේම ඊළඟට එන ආණ්ඩුව නරක විදියට ක්‍රියාත්මක වෙන්නත් පුළුවන්. මේවා ඇහෙනකොට ඇමතිතුමා නම් හිනාවෙනවා. එතුමාට මතක ඇති, විරුද්ධ පක්ෂයේ හිටපු කාලයේ එතුමන්ලා කටයුතු කළේ කොහොමද කියලා. ආණ්ඩු පක්ෂයේ ඉන්නකොට මේක තේරෙන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් අගමැතිතුමියගේ හෘදය ස්පන්දනය අනෙක් අයට වඩා පොඩ්ඩක් දැනෙන නිසා, I hope you would intervene and bring some sanity into others also. I also hope you would not lose your good moral values since you are in politics and that you would retain some of those good values for the future as well.

Thank you very much.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.43]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා විසින් පොලිස් කොමිසමේ ස්වාධීනත්වය පිළිබඳව සභාව කල් තබන අවස්ථාවේ ගෙනෙන ලද යෝජනාව මම ස්ථිර කරනවා. පොලිස් කොමිසමට ඇති බලතල සම්බන්ධයෙන්, විශේෂයෙන්ම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විශාල දායකත්වයක් දක්වපු, මේ සංශෝධනය ගෙනෙද්දි පැවති ආණ්ඩුවත් එක්ක කටයුතු කරපු කණ්ඩායමක් තමයි අද බලයේ

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඉන්නේ. ඒ වෙලාවේ JVP එකේ හය දෙනෙකු නැත්නම් පස් දෙනෙකු පාර්ලිමේන්තුවේ හිටියා. ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා හිටියා. සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා, බිමල් රත්නායක ඇමතිතුමා, නලින්ද ජයතිස්ස ඇමතිතුමා ඇතුළුව හය දෙනෙකුගේ සහයෝගයත් ඒ වෙලාවේ මේ කොමිෂන් සභාව පිහිටුවන්න ලැබුණා. මේ කොමිෂන් සභාවට අවශ්‍ය බලතල ටික ලැබෙන්නේත් එතුමන්ලා ඇතුළු ඒ පාර්ලිමේන්තුවේම හිටපු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ඒකට ලැබුණු නිසා. මේකේ තිබෙනවා, appointments ලබා දීම, promotions, transfers, disciplinary control, dismissal of police officers other than the IGP සම්බන්ධව. IGPගේ consultation එක්ක තමයි මේක කරන්න තිබෙන්නේ. පොලිස් කොමිසමට ඒ බලතල ලබා දීලා තිබෙනවා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා. *[බාධා කිරීමක්]* මම කියවන්නම්, පොඩ්ඩක් ඉන්න. ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමනි, ඒක ඔබතුමාගේ අවස්ථාවේදී කියවන්න.

ඊට කලින්, ආනන්ද විජේපාල අමාත්‍යතුමා ගරු සභාවේ ඉන්න නිසා මම එතුමාගෙන් යම් ඉල්ලීමක් කරන්න කැමැතියි. විශේෂ කාර්ය බලකායේ නිලධාරින් දිගින් දිගටම අපෙන් යම් ඉල්ලීමක් කරනවා. පොලිස් දිනය වෙනුවෙන් පොලීසියේ සියලුම නිලධාරින්ට promotions ලබා දීලා තිබෙනවා. PC විධියට හිටපු කෙනෙකුට සාජන් තනතුර දීලා තිබෙනවා. සාජන් විධියට හිටියා නම් SI දීලා තිබෙනවා. SI කෙනෙකුට IP දීලා තිබෙනවා. පොලීසියේ නිලධාරින්ට IP ඉඳන් CI දක්වා promotions දීලා තිබෙනවා. ඒවා දීලා තිබෙන්නේ ජ්‍යෙෂ්ඨත්වය අනුව. වෙනදාට විශේෂ කාර්ය බලකායේ අයටත් පොලිස් දිනයේදී උසස්වීම් ලබා දී තිබුණා. ඔවුන් විශේෂ රාජකාරි ප්‍රමාණයක් ඉටු කරනවා. ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමාගේ ආරක්ෂාවේ ඉඳලාම ඔවුන් රටේ මත්ද්‍රව්‍ය මර්දනය, පාතාලය මර්දනය වෙනුවෙන් විශාල රාජකාරියක් ඉටු කරනවා. හැබැයි, ඔවුන්ට උසස්වීම් ලබා දීලා නැහැ. හැබැයි, විශේෂ කාර්ය බලකායේ අය පොලිස් සේවයට ගියා නම්, ඒ seniority එකට, ඒ සුදුසුකම් පදනම් කරගෙන promotions ලබා දීලා තිබෙනවා. IPලා CI වෙලා තිබෙනවා. මම කලින් කියපු විධියටම උසස්වීම් දීලා තිබෙනවා. ඒ නිසා මම පොලිස් කොමිසමෙන් සහ ඔබතුමන්ලා සියලු දෙනාගෙන්ම ඉල්ලීමක් කරනවා, ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙලා අවශ්‍ය කටයුතු කරන්න කියලා. පොලිස් කොමිසමේ බලතල ගන්න එපා. මොකද, දැනටම පොලීසියේ ස්වාධීනත්වය පිළිබඳව ගැටලු රාශියක් මතුවෙලා තිබෙනවා. දැනටත් transfers පිළිබඳව චෝදනා එල්ල වෙලා තිබෙනවා.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට චෝදනාවක් එල්ල වුණා, OICට කථා කරලා කළුතර දිස්ත්‍රික්කයේ කවුරු හරි පුද්ගලයෙක් පිළිබඳව ඇහුවාම, OIC ඒ පිළිබඳව පොලිස් සටහනක් තැබුවා කිව්වාම ඔහු බෙන්තර ප්‍රදේශයට එකපාරටම transfer වුණා කියලා. ඒ වාගේම මම දැක්කා, ඊයේ දිනයේදීත් පාර්ලිමේන්තුවේදී මේ ගැන කථා වුණා. හිටපු නාවික හමුදාපතිතුමාව අත්අඩංගුවට ගත් අවස්ථාවේදී පොලීසියේ OIC මහත්මයෙකුට threaten කරලා කියනවා, තමන්ගේ post එක තියාගන්න ඕනෑ නම්, තමන්ට transfer නොවී ඉන්න ඕනෑ නම් හිටපු නාවික හමුදාපතිවරයාට විරුද්ධව කට උත්තරය ලබා දෙන්න කියලා. *[බාධා කිරීමක්]* මේක CID එකේ, නමක් නැහැ. *[බාධා කිරීමක්]* මේක නිකම් නොවෙයි. මම එදා අභියාචනාධිකරණයෙන් ගත්ත රිට් එකත් වටගල මහත්මයාට දුන්නා. ඒක ඔබතුමාගේ අතට ලැබිලා ඔබතුමා කියෙව්වා. ඒ හින්දා මම නැවත එය කියවන්න ඕනෑ නැහැ. රිට් එක ඔබතුමාගේ අතට ලැබිලා ඔබතුමා ඒක කියෙව්වා නේ. ඔබතුමා ඒක කියවලා ඒකට උත්තර දුන්නේත් නැහැ. මේක එක පාරක් නොවෙයි, දෙපාරක් මම සභාගත කළා. ඒ හින්දා නැවත කියවන්න ඕනෑ නැහැ. දැනට National Police Commission එකට තමයි බලතල තිබෙන්නේ. National Police Commission එකට බලතල තිබියදී රටේ හිටපු නාවික හමුදාපතිවරයාට විරුද්ධව සාක්ෂි නොදුන්නොත් transfer කරනවා කියලා CID එකෙන් පොලීසියේ OIC මහත්මයෙකුට තර්ජනය කරනවා. එම පොලිස් නිලධාරියා අත්අඩංගුවට ගන්න යන නිසා, ඒක නැවැත්වීමට ඔහු අභියාචනාධිකරණයට ගිහිල්ලා රිට් එකක් ගන්න තැනට අද කටයුතු සිද්ධ වෙලා තිබෙනවා නම් මේ කොමිෂන් සභාවේ බලතල කෙළින්ම පොලිස්පතිවරයාට ගියොත් මොකද වෙන්නේ? එතකොට අර බලතල සම්පූර්ණයෙන්ම පොලිස්පතිවරයාට ලැබුණු ගමන්, "එන්න, මෙන්න මේක කියන්න, නොකිව්වොත් මෙයාව ඇතුළට දමන්න" කියලා කියයි. ආණ්ඩුවට විරුද්ධව වැඩ කරන අය මර්දනය කරන, දඩයම් කරන තැනක් බවට පොලීසිය පත් කර ගන්න එපා.

Good governance නේද, අග්‍රාමාත්‍යතුමියනි. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කිව්වා වාගේම ගරු අග්‍රාමාත්‍යතුමිය ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් බෝඩ් උස්සාගෙන ඒ වෙනුවෙන් හැමදාම සටන් කරපු කෙනෙක්; කොමිෂන් සභා වෙනුවෙන් හැමදාම පෙනී හිටපු කණ්ඩායමේ කෙනෙක්. නමුත් ඔබතුමියව අස් කරන්න තමයි ගොඩක් අය උත්සාහ කළේ. කලින් නම් සමාජ මාධ්‍යවල ගියේ අග්‍රාමාත්‍යතුමිය මාරු කරලා වෙන කෙනෙක් එනවා කියලා. හැබැයි, එතුමාගේ ඇමතිකම තමයි නැති වුණේ. අග්‍රාමාත්‍යතුමියව අයින් කරන්න බැරි වුණා. කමක් නැහැ. ඇමතිතුමන්ලාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. හැබැයි අපි අග්‍රාමාත්‍යතුමියගෙන් හරි ඉල්ලනවා, National Police Commission එකේ තිබෙන බලතල අයින් කරන්න එපා කියලා

අනෙක් එක, අපි කොමිෂන් සභාවට කියනවා, තමන්ට බලතල දීලා තිබෙන්නේ තවත් කෙනෙකුට ඒ දේ දෙන්න නොවෙයි කියලා. මේවාට මෙම බලතල දෙන්න හේතුව, මේ ආයතන ස්වාධීන විය යුතු වීම. මේ ආයතන ස්වාධීන වුණොත් තමයි රටට සාධාරණය ඉෂ්ට වෙන්නේ. එතකොට තමයි පොලීසියේ OIC කෙනෙකුට වෙන්න පුළුවන්, HQI කෙනෙකුට වෙන්න පුළුවන්, ASP කෙනෙකුට වෙන්න පුළුවන්, SP කෙනෙකුට වෙන්න පුළුවන්, DIG කෙනෙකුට වෙන්න පුළුවන්, senior DIG කෙනෙකුට වෙන්න පුළුවන් ස්වාධීනව වැඩ කරන්න පුළුවන් වන්නේ. ඒ සඳහා National Police Commission එක තව empower කරන්න, ඒකේ බලතල ඉවත් කරන්න එපා කියලා අග්‍රාමාත්‍යතුමිය ඇතුළු ආණ්ඩුවෙන් අපි ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.50]

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඔබතුමාත් දන්නවා, අපි ජනතා විමුක්ති පෙරමුණ හැටියටත්, ජාතික ජන බලවේගය හැටියටත් ස්වාධීන කොමිෂන් සභා වෙනුවෙන් සහ ඒ ස්වාධීන කොමිෂන් සභාවල බලතල වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවේ පෙනී හිටපු දේශපාලන ව්‍යාපාරයක් බව. අපි

[ගරු ආනන්ද විජේපාල මහතා]

දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සිද්ධ කරන අවස්ථාවේ සිට විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දක්වා ඒ වෙනුවෙන් මැදිහත් වුණා; කැප වුණා. දැනුත් ඒ වෙනුවෙන් කටයුතු කරමින් ඉන්නවා. හැබැයි, මේ කථා කරන බොහෝදෙනෙක් දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරලා, ඒකේ තිබුණු ස්වාධීනත්වය අහෝසි කරලා, ඒ කොමිෂන් සභාවල බලතල පොලිස් කොමිෂන් සභාව ගත්තාම ඒක මහජන පැමිණිලි විභාග කිරීමට පමණක් සීමා කළා. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ස්වාධීන කොමිෂන් සභාවලට තිබුණු බලතල පොලිස් කොමිෂන් සභාව පවරා ගන්න වෙලාවේ දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂව අත උස්සපු අයත් මෙතැන ඇවිල්ලා අද මේ විවාදය වෙනුවෙන් කථා කරනවා, කටයුතු කරනවා. *[බාධා කිරීමක්]* සමහර අය පැනලා ගියා, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආරක්ෂා කර ගන්න ඉන්නේ නැතිව. ජාතික ජන බලවේගයත්, ජනතා විමුක්ති පෙරමුණත් මේ ස්වාධීන කොමිෂන් සභා වෙනුවෙන් හැම වෙලාවේම පෙනී හිටියා. ඒක අහෝසි කරලා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවාම ඒක අහෝසි කරන්න කටයුතු කරපු අයත් මෙතැන හිටියා.

ඒ වාගේම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා, විශේෂයෙන් ස්වාධීන කොමිෂන් සභාවල බලතල අහෝසි කරනකොට ඒ වෙනුවෙනුත් අත් ඔසවපු අය මේ පාර්ලිමේන්තුවේ අදත් ඉන්නවා. එහෙම අය තමයි අද ජාතික ජන බලවේගය ආණ්ඩුව ස්වාධීන කොමිෂන් සභාවල බලය අහෝසි කරනවා, නැත්නම් බලතල ආපසු ලබා ගන්නවා කියන කාරණාව මේ සභාවට ඉදිරිපත් කරන්නේ. විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙනකොටත් අපි,-

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු ඇමතිතුමනි, අපි එතැන හිටියේ නැහැ කියලා ඔබතුමා පිළිගන්නවා නේ. *[බාධා කිරීමක්]* සමහරු කිව්වාම,-

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
නැහැ, සමහර අය කියලා මම කිව්වේ. ඔබතුමාගේ නම මම කිව්වේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, එතැන point of Order එකක් නැහැ. අපි විවාදය කරගෙන යමු. ගරු ඇමතිතුමා කථා කරන්න.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
සමහර අය. මම කියන්නේ මේ පාර්ලිමේන්තුවේ ඉන්න සමහර අය,- *[බාධා කිරීමක්]* හිටියේ නැත්නම් වාඩි වෙන්නකෝ. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සිට විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දක්වා සමහර මන්ත්‍රීවරු ඒ විධියට කටයුතු කළා විතරක් නොවෙයි, සමහර අය බලතල දෙනකොටත් අත ඉස්සුවා; බලතල අහෝසි කරනකොටත් අත ඉස්සුවා. ඒ විධියට, කිසිදු ප්‍රතිපත්තියක් නැතුව මේ ස්වාධීන කොමිෂන් සභා සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ කටයුතු කරපු ආකාරය මේ රටේ ජනතාව හොඳට දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කිසි ලෙසකවත් මේ ස්වාධීන කොමිෂන් සභාවල බලතල අහෝසි කරන්නවත්, බලතල ආපසු පවරා ගන්නවත් කටයුතු කරන්නේ නැහැ. මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව දිහා බැලුවාම මම මේ ගරු සභාවට පැහැදිලි කරන්න අවශ්‍යයි, විශේෂයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ. ව්‍යවස්ථාව පිළිබඳව. එහි සඳහන් වනවා, පොලිස්පතිවරයා හැර, අනිකුත් සියලු තනතුරුවල පොලිස් නිලධරයන් අනුයුක්ත කිරීම හෝ මාරු කිරීම, උසස් කිරීම, විනය පාලනය කිරීම ආදී බලතල පොලිස් කොමිසමට පැවරෙන බව.

හැබැයි, අපේ වටගල නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ. ව්‍යවස්ථාව යටතේ මොකක්ද තිබෙන්නේ? ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පවරා ඇති ඉහත බලතල කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව පොලිස්පතිවරයා හෝ පොලිස්පතිවරයා විමසා යම් පොලිස් නිලධාරියෙකු වෙත පැවරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ. ව්‍යවස්ථාව ප්‍රකාරව සිදු කිරීමට හැකියාව තිබෙනවා කියලා එහි සඳහන් වෙනවා. ඒ ඕනෑම කොමිසමකට තිබෙන බලතලයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ. ව්‍යවස්ථාව ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරයාට හෝ අදාළ ආයතනයකට පැවරීමේ බලතල, නීත්‍යනුකූල බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දීලා තිබෙනවා. ඒක නීති විරෝධී කටයුත්තක් නොවෙයි. ඒක ව්‍යවස්ථාපිත කටයුත්තක්. ඒ වාගේම මේ කාර්යයන් නිතර නිතර සිද්ධ වෙලා තිබෙනවා. ආයතනගතව තිබෙන රාජකාරි කාර්ය බහුල වෙනකොට, 85,000ක් ඉන්න පොලිස් සේවාවේ කාර්යක්ෂමතාව රඳා පවත්වා ගැනීම සඳහා යම් යම් තීරණ ගන්න ජාතික පොලිස් කොමිසමට බලතල තිබෙනවා. ඒ බලතල පොලිස් කොමිසමට තිබෙන්නේ. එහෙම නැතුව ඇමතිවරයාට හෝ ජනාධිපතිවරයාට ගැසට් එකකින් එහෙම බලතලයක් නැහැ.

ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමන්ලා ඉදිරිපත් කරන යෝජනාවේ මේ ලබා දෙනවාය කියන බලතල පිළිබඳව තීන්දු තීරණ ගත යුත්තේ ජාතික පොලිස් කොමිසමයි. ඒ, ඔවුන්ගේ අභිමතය අනුව. ඒ සඳහා ඉඩකඩ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සලසා තිබෙනවා. ඒ හින්දා මෙතැන නීති විරෝධී කිසිවක් සිද්ධ වෙලාත් නැහැ. සිද්ධ වෙන්න ඉඩකඩකුත් නැහැ. මොකද, මේ සම්බන්ධයෙන් ඕනෑ තරම් පූර්වාදර්ශ තිබෙනවා, ඔබ මේ පිළිබඳව සොයා බැලුවොත්. දිගින් දිගටම මෙවැනි අවස්ථා අපට දකින්න ලැබෙනවා. විශේෂයෙන් 2011 නොවැම්බර් 25වැනි දා ගැසට් නිවේදනයක් මඟින් රාජ්‍ය සේවා කොමිසම විසින් මේ විධියට බලතල ලබා දීලා තිබෙනවා. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, සැලසුම් සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරින්ගේ උසස්වීම්, මාරු කිරීම් පිළිබඳව යම් බලතල ප්‍රමාණයක් කොමිසම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ. ව්‍යවස්ථාව යටතේ ලබා දීලා තිබෙනවා; එහෙම කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඕනෑ තරම් පූර්වාදර්ශ තිබෙනවා. 2016 මැයි 06වැනි දා අංක 1965/37 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් කොමිෂන් සභාව සතු බලතල පොලිස්පතිවරයාට පවරා තිබෙනවා. ඒ අනුව, පත් කිරීම, උසස්

කිරීම, පත්වීම අවලංගු කිරීම, ස්ථාන මාරු කිරීම, විනය පාලන වාගේ දේවල් පවරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. 2017 අප්‍රේල් 24වැනි දා අංක 2016/6 දරන ගැසට් එකෙන් මෙහෙම පවරලා තිබෙනවා. ඒ වාගේම 2020.02.06වැනි දා අංක 2161/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් මේ විධියට බලතල පොලිස් කොමිසම විසින් පොලිස්පතිවරයාට පවරා දී තිබෙනවා. ඒ අනුව 2011 නොවැම්බර් 25වැනි දිනැති අංක 1733/52 දරන අති විශේෂ ගැසට් පත්‍රය සහ 2020 පෙබරවාරි 06වැනි දිනැති අංක 2161/32 දරන අති විශේෂ ගැසට් පත්‍රය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන සාමාන්‍ය ප්‍රතිපාදන යටතේ සිදු වන ඒවා. හැබැයි, මේ බලතල පවරා දුන්නාට පොලිස්පතිවරයාට, ඒ බලතල ලබා ගන්න ආයතනයට හෝ අධිකාරියට කිසිදු ඉඩකඩක් නැහැ, තමන්ට අභිමත ආකාරයෙන් එම බලතල භාවිත කරන්න. ඒ බලතල භාවිත කළ යුත්තේ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන නිර්ණායක පදනම් කරගෙනයි. ඒ හින්දා මේ වෙලාවේ කතිකාවට ලක්වෙලා තිබෙන්නේ පත් කිරීම්, උසස්කිරීම් සම්බන්ධව නොවෙයි. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාගේ යෝජනාවේ තිබෙනවා, "පොලිස් ස්ථානාධිපතිවරු පත් කිරීම..." කියලා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ පත් කිරීම් සිද්ධ වෙන්නේ නැහැ. දැන් කරලා තිබෙන්නේ පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ මාරු වීම්. එහෙම නැතුව පොලිස් ස්ථානාධිපතිවරු පත් කිරීමක් නොවෙයි.

ඔබ දන්නවා, පොලිස් ස්ථානාධිපති ධුරයට පත් වෙන්නේ එක්කෝ උප පොලිස් පරීක්ෂකවරයෙක් නැත්නම් පොලිස් පරීක්ෂකවරයෙක් එහෙමත් නැත්නම් ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙක් බව. A, B, C, D ශ්‍රේණියේ පොලිස් ස්ථාන තිබෙනවා. ඔවුන් උප පොලිස් පරීක්ෂකද, පොලිස් පරීක්ෂකද, ප්‍රධාන පොලිස් පරීක්ෂකද කියන තනතුරු පදනම් කරගෙන, ඒ වාගේම ඔවුන්ගේ කාර්ය සාධනයන් පදනම් කර ගනිමින් ඒ ඒ ස්ථානවලට ස්ථාන මාරු කිරීමක් තමයි සිද්ධ වෙන්නේ. එහෙම නැතුව ඒක පත් කිරීමක් නොවෙයි. මේ වෙලාවේ ඔබතුමන්ලා ගෙනැවිත් තිබෙන යෝජනාවේ තිබෙන්නේ පොලිස් ස්ථානාධිපතිවරු පත් කිරීම කියලා. නමුත්, දැන් කරලා තිබෙන්නේ පත් කිරීමක් නොවෙයි, මාරු කිරීමක්. පොලිස් ස්ථානාධිපතිවරු මාරු කිරීමේ බලතල ගැන තමයි මේ දවස්වල කතිකාවක් ඇතිවෙලා තිබෙන්නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මගේ කථාවෙන් පසුව ඒ ගැන පැහැදිලි කරන්නකෝ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ඔබතුමාගේ යෝජනාවෙන් මම ඒක පැහැදිලි කරගෙන තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
නැහැ, නැහැ, ඔබතුමාට ඒ ගැන පැහැදිලි වෙලා නැහැ. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම පොඩ්ඩක් ඒ ගැන පැහැදිලි කරන්නම්. මම ඔබතුමාට කියන්න කැමැතියි, "පොලිස් කොමිසමේ විෂය පථයට අයත් වූ පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ මාරුවීම් විශේෂ ගැසට් නිවේදනයක් මඟින් පොලිස්පතිවරයාට පැවරීමට..." යනුවෙන් මේ යෝජනාවේ සඳහන් වන බව. ඔබතුමා මේ යෝජනාව කියවන්න. කියවන්න ඉස්සෙල්ලා,-

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ඔබතුමා පැහැදිලි කරන්නේ පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ පත් කිරීම ගැන. මම කියන්නේ පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ මාරුවීම් ගැනයි. ඒක පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ පත් කිරීමක් නොවෙයි, මාරු කිරීමක්. මාරු කිරීම් ගැනයි මේ කථා කරන්නේ. මේ පිළිබඳව නීතිපතිවරයා පැහැදිලි කිරීමකුත් කරලා තිබෙනවා. ඒ කියන්නේ, පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ ස්ථාන මාරු කිරීම් සම්බන්ධ බලතල පොලිස්පතිවරයාට දෙනවාද, නැද්ද කියන එක ගැන කතිකාවක් ඇතිවෙලා තිබෙනවා. මේකට ඕනෑ තරම් පූර්වාදර්ශ තිබෙනවා. ඒ වාගේම ස්ථාන මාරුවීම් ලබා දුන් අවස්ථා පිළිබඳව ඕනෑ තරම් ගැසට් නිවේදන තිබෙනවා. ඉතින්, ඒ පිළිබඳව කිසිදු ගැටලුවක් නැහැ. මේක නීත්‍යනුකූල තත්ත්වයක්. ඒ නීත්‍යනුකූල තත්ත්වය කවුද දෙන්න ඕනෑ? ඇමතිවරයා හෝ අමාත්‍යාංශය නොවෙයි. ඒ නීත්‍යනුකූල තත්ත්වය පොලිස්පතිවරයාට හෝ යම් බලධරයෙකුට දෙනවාද, නැද්ද කියලා තීන්දු කරන්න ඕනෑ, ජාතික පොලිස් කොමිසම. *[බාධා කිරීමක්]* කවුද, බලපෑම් කරන්නේ? ඔබතුමන්ලාගේ කාලයේ වාගේ පොලිස් ස්ථානාධිපතිවරු 184ක් පත් කරනකොට, 182ක්,- *[බාධා කිරීමක්]* සී.ඩී. වික්‍රමරත්න හිටපු පොලිස්පතිතුමා කිව්වේ, පත් කරපු විධිය. ඒ කාලයේ පොලීසියට අත්කර දී තිබූ ඉරණම මොකක්ද කියලා මේ රටේ මහජනතාව දන්නවා.

පොලිස් කොමිසමට බලපෑම් කරලා තිබෙන්නේ කවුද? *[බාධා කිරීමක්]* නැහැ. නැහැ. ඔබතුමා අසත්‍ය ප්‍රකාශ කරන්න එපා; මේ සභාව නොමඟ යවන්න එපා. ජනාධිපතිතුමා කිසි වෙලාවක කියලා නැහැ, ජාතික පොලිස් කොමිසමට බලතල දෙන්න කියලා. බලතල දෙන්න කියලා කියන්න අවශ්‍ය නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා, ජාතික පොලිස් කොමිසමේ අභිමතය අනුව බලතල ලබා දෙන්න පුළුවන් කියලා. ඒක ලොකු ප්‍රශ්නයක් නොවෙයි. මොකද, බලතල ලබා දුන්නා කියලා අත්තනෝමතිකව ඒ බලතල පාවිච්චි කරන්න කිසිවෙකුට ඉඩකඩ ලැබෙන්නේ නැහැ. ඒ සඳහා වන නිර්ණායක හදලා තිබෙනවා; ස්ථානාධිපතිවරු පත් කිරීමේ ක්‍රමවේදයන් තිබෙනවා; ස්ථානාධිපතිවරයෙක් පත් කරනකොට වාර්තා විශාල ප්‍රමාණයක් ගන්න ඕනෑ. විශේෂයෙන් පොලිස් ස්ථානාධිපතිවරයෙක් පත් කරනකොට කොට්ඨාස භාර නිලධාරියාගේ කාර්ය සාධන වාර්තාවක් ගන්න ඕනෑ. ස්ථානාධිපතිවරයා සම්බන්ධයෙන්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ආනන්ද විජේපාල මහතා]

නියෝජ්‍ය පොලිස්පතිවරයාගෙන් කාර්ය සාධන වාර්තාවක් ගන්න ඕනෑ. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගෙන් කාර්ය සාධන වාර්තාවක් ගන්න ඕනෑ. ඊට අමතරව ඔවුන්ට charge sheets තිබෙනවාද, FR cases තිබෙනවාද කියලා බලන්න ඕනෑ. බොහෝ නිර්ණායක පදනම් කරගෙන තමයි පොලිස් ස්ථානාධිපතිවරයෙක් පත් කරන්න පොලිස්පතිවරයා නිර්දේශ කරන්නේ. ජාතික පොලිස් කොමිසම ඒ නිර්ණායක හදලා තිබෙනවා. එම නිසා කිසිම අවස්ථාවක තමන්ට හිමි බලතල පොලිස්පතිවරයාට පැවරීම තුළින් කිසිදු ආකාරයක දේශපාලනීකරණයක් හෝ කිසිදු ආකාරයක අගතියක් කිසිදු නිලධාරියෙකුට සිද්ධ වෙන්නේ නැහැ. ඕනෑ නම් ඕනෑම ස්ථානාධිපතිවරයෙකුගේ ස්ථාන මාරු වීමක් සම්බන්ධ අභියාචනයක් පොලිස් කොමිසම වෙත ඉදිරිපත් කිරීමට ඉඩකඩ ලැබෙනවා. පොලිස් කොමිසම විතරක් නොවෙයි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඇතුළු අනෙකුත් කොමිෂන් සභාත් තමන් සතු බලතල පැවරීම කරලා තිබෙනවා. ඒක සාමාන්‍ය කාරණයක්. ඒක ව්‍යවස්ථාපිත නීතියක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් එකඟ කාරණයක්. මම කියන්නේ, ඒ කාරණය ආණ්ඩුවට අදාළ කාරණයක් නොවෙයි කියලායි. ජාතික පොලිස් කොමිසම විසින් තමයි ඒ සඳහා තීන්දු තීරණ ගත යුත්තේ. කොමිසම විසින් තමයි ගැසට් පත්‍රයක් මඟින්, මේ බලතල දෙනවාද නැද්ද කියලා තීන්දු කළ යුත්තේ.

ඉතින්, මේක තමයි තත්ත්වය. හැබැයි, මේ පිළිබඳ විවාදයේදී කාරණා කිහිපයක් මතු වුණා. ඒ පිළිබඳවත් අදහස් කිහිපයක් දක්වන්න අවශ්‍යයි. අපි මේ වෙනකොට මේ රටේ නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කරන්න කටයුතු කරමින් ඉන්නවා. කිසිලෙසකින්වත් අපි පොලිස් දෙපාර්තමේන්තුව දේශපාලනී-කරණය කරන්න ඉඩ දෙන්නේ නැහැ. අපි දන්නවා, අතීතයේදී මේ දෙපාර්තමේන්තුව සහ ඊට අදාළ පොලිස් කොට්ඨාස විශාල ප්‍රමාණයක් දේශපාලනීකරණය වෙලා තිබුණා. ඔබ දන්නා ප්‍රධාන කාරණයක් තමයි, පොලිස් ස්ථානාධිපතිවරු 184ක් පත් කරනකොට එයින් 182ක් සංවිධායකයන්ගේ නිර්දේශ මත පත් කරපු ආකාරය මේ රටේ හිටපු පොලිස්පතිවරයෙක් ප්‍රසිද්ධියේ සමාජයට ප්‍රකාශ කළ බව. එම තත්ත්වය අපි මේ වෙනකොට ඉවත් කර තිබෙනවා. පොලීසිය දේශපාලනීකරණයෙන් ඉවත් කර තිබෙනවා. CID එක දේශපාලනීකරණය කර තිබෙනවා කියලා මෙතැන වැරදි ප්‍රචාර යවා තිබෙනවා. අද වෙනකොට පොලීසිය සක්‍රියව රාජකාරි කරමින් ඉන්නවා. නිවැරදිව වැටලීම් කරමින් ඉන්නවා. තරාතිරම නොබලා වැරදිකරුවන්ට එරෙහිව නීතිය ක්‍රියාවේ යොදවන්න කටයුතු කරමින් ඉන්නවා. බොහෝ අය එයින් බියට පත් වෙලා තිබෙනවා. එහෙම නැතිව දේශපාලනීකරණක් සිද්ධ වෙලා නැහැ. කිසි ලෙසකින්වත් අපි මේක දේශපාලනීකරණය කරන්න ඉඩ දෙන්නේ නැහැ. අපි එදාත් පෙනී සිටියා මේ ස්වාධීන කොමිසම වෙනුවෙන්. එදාත් අපි පෙනී සිටියා රාජ්‍ය ආයතනවල ස්වාධීනත්වය වෙනුවෙන්. අපි රාජ්‍ය සේවා ආයතන ස්වාධීන කරනවා විතරක් නොවෙයි, ඒ ආයතන කාර්යක්ෂම කරනවා. ඔවුන්ට පැවරී තිබෙන බලතල නිසි ලෙස ක්‍රියාවේ යොදවන්න අපි ඔවුන් මෙහෙයවනවා. ඒක තමයි ඇමතිවරයා හැටියට මගේ වගකීම.

මේ ආයතන වඩා කාර්යක්ෂම කිරීම, ඒවාට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම, අවශ්‍ය උසස්වීම් ලබා දීම, අවශ්‍ය මානව සම්පත ලබා දීම, ඵලදායී ලෙස ක්‍රියාත්මක වන යන්ත්‍රණයක් බවට මේ ආයතනය පත් කිරීම තමයි අපි කරන්නේ. එහෙම නැතිව කිසි ආකාරයක දේශපාලනීකරණයක් සිද්ධ වෙන්නේ නැහැ. අපරාධයක යෙදෙන ඕනෑම පුද්ගලයෙක්, පොලිස් ස්ථානාධිපතිවරයෙක් වුණත් යම් අපරාධයක නියුක්ත වෙලා තිබෙනවා නම් ඒ අය පවා අත්අඩංගුවට ගන්න මේ පොලීසියම මේ වෙනකොට කටයුතු කරමින් ඉන්නවා. ඒ නිසා තමයි 400කට ආසන්න පිරිසක් මේ වෙනකොට -මේ වසරේ ජනවාරි සිට මේ දක්වා කාලය තුළ- වැඩ තහනමට ලක් වෙලා තිබෙන්නේ. අපි ඒක තරාතිරම නොබලා කරන දෙයක්. ඔහු පොලිස් නිලධාරියෙක්ද, හමුදා නිලධාරියෙක්ද, වෙනත් නිලධාරියෙක්ද, දේශපාලනඥයෙක්ද කියන එක අපට අදාළ වන්නේ නැහැ, යම් නීති විරෝධී කර්තව්‍යයක යෙදී සිටිනවා නම් ඒ අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වටපිටාව මේ වෙනකොට සැකසී තිබෙනවා. පොලීසිය නිදහස්ව, ස්වාධීනව, කාර්යක්ෂමව කටයුතු කරමින් සිටිනවා. ඒ ගැන මේ රටේ ජනතාවට අපි සහතිකයක් දෙනවා. මේ රටේ නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කිරීමේ කර්තව්‍යයේදී පොලීසිය කරන කාර්යභාරය අපි අගයනවා. නිවැරදිව, සාධනීය දිශානතියකට දැන් මේ දෙපාර්තමේන්තුව ගමන් කරමින් සිටිනවා. සක්‍රිය ලෙස සංවිධානාත්මක අපරාධ මර්දනය කෙරෙහි යොමු වෙලා තිබෙනවා.

සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කිව්වා, මාස 5ට සිද්ධි 80ක්ද කොහේද වුණාය කියලා. ඒ සංඛ්‍යාලේඛන නිවැරදි නැහැ, ගරු මන්ත්‍රීතුමනි. කොහොම වුණත්, මේ අපරාධ සිද්ධ වෙන්නේ මොන ආකාරයෙන්ද කියා මෑතකදී ඉන්දුනීසියාවේ සිට අත්අඩංගුවට අරගෙන ගෙනාපු පාතාල අපරාධකරුවන් මේ වෙනකොට ප්‍රකාශ කරමින් ඉන්නවා. මේවාට සම්බන්ධ කවුද කියලා අපි අනාගතයේදී මේ පාර්ලිමේන්තුවටත් කරුණු ඉදිරිපත් කරනවා. මේක අපරාධකාරයන්ගේ දේශයක් කළේ කවුද, ඒවා පවත්වාගෙන ගියේ කොහොමද, මත්ද්‍රව්‍ය ජාවාරමට ඔවුන්ගේ තිබෙන සබඳතා මොනවාද කියාත් අපි අනාගතයේදී හෙළි කරනවා. කොහොම වුණත්, මේ රට මතින් තොර රටක් කිරීම සඳහාත්, විශේෂයෙන්ම සංවිධානාත්මක අපරාධවලින් තොරව මේ රටේ ජන ජීවිත වඩා සුරක්ෂිත කිරීමේ සියලු ක්‍රියාමාර්ග අපි ගන්නා බවත් ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වෛද්‍ය නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.05]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදයේ විශේෂත්වයක් තිබෙනවා. ඒ තමයි මේ විවාදය ඉල්ලපු ආකාරය. මට මතක විධියට විපක්ෂයෙන් මේ විවාදය ඉල්ලා සිටියේ මේ අවුරුද්දේ පළමු වතාවට. ස්ථාවර නියෝග 19 යටතේ තිබෙනවා, හදිසි පොදු වැදගත්කමකින් යුක්ත කාරණා සාකච්ඡා කිරීම සඳහා විවාද ලබා ගන්නා විධිය. ඒ අනුව තමයි මීට දවස් දෙකකට කලින් මේ ඉල්ලීම කළේ. මන්ත්‍රීවරු 20දෙනෙක් නැඟිටලා හදිසි පොදු වැදගත්කමකින් යුත් දෙයක් කථා කරන්න අවස්ථාව ඉල්ලුවොත්, ඒ අවස්ථාව දෙන්න පුළුවන් කියන ප්‍රතිපාදනය යටතේ තමයි මේ ඉල්ලීම කළේ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
දැන් ඒ 20දෙනාම ඉන්නවාද?

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

ඒක තමයි මම බැලුවේ. දැන් බැලුවොත්, මන්ත්‍රීවරු හතරදෙනයි ඉන්නේ. මම කථා කරලා බැලුවාම පාර්ලිමේන්තු පරිශ්‍රයේම ඉන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරු 19දෙනායි. ඔන්න, හදිසි පොදු වැදගත්කමේ තරම්! ඔය තත්ත්වය තමයි තිබෙන්නේ. එවෙලෙට එවෙලෙට කථා කර කර යනවා.

මේ යෝජනාව මොකක්ද? ගරු ඇමතිතුමා සඳහන් කළා වාගේම, පොලිස් කොමිසම විසින් පොලිස්පතිට පොලිස් ස්ථානාධිපතිවරු මාරු කිරීම සඳහා වූ බලතල පවරන්න කටයුතු කර තිබෙනවා කියන කාරණය ගැන තමයි මේ කථා කරන්නේ.

එතකොට දැන් එතැන ව්‍යවස්ථාපිත වැරැද්දක් තිබෙනවා ද? එහෙම නැත්නම් මේ උදවිය කළා වාගේ අපි මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරලා මොකක් හරි බලය අඩු කිරීමක් කරන්න යනවා ද? කලින් කිව්වා වාගේ ඔබතුමන්ලාටත් මතක විධියට අපේ රටේ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා, දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. අද මේ විපක්ෂයේ ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන දෙක තුනකටම අත උස්සපු මන්ත්‍රීවරු ඉන්නවා. ඔවුන් ස්වාධීන කොමිෂන් සභාවල බලය අඩු කරන්නත් අත උස්සලා තිබෙනවා. ආයෙත් අවුරුදු කිහිපයකින් ස්වාධීන කොමිෂන් සභාවල බලය වැඩි කරන්නත් අත උස්සලා තිබෙනවා. මම හිතන විධියට ඒ සමහර උදවිය මේ පාර පාර්ලිමේන්තුවට තේරුණේ නැහැ. නැත්නම් ඒ අවස්ථා තුනටටම පක්ෂව අත උස්සපු කට්ටියකුත් මෙතැන ඉන්නවා. ස්වාධීන කොමිෂන් සභාවල බලය අඩු කරන්න විතරක් අත උස්සපු කට්ටියත් ඉන්නවා. ඒක මරු වැඩක්. අද මේ කොමිෂන් සභා ගැන කථා කරන්නේ මෙන්න මේ වාගේ කට්ටියක්. නමුත් අද කරන මේ වැඩේ මොකක්ද? මේක එහෙම එකක් නොවෙයි. ව්‍යවස්ථා සංශෝධනයක් කරලා හරි බලය අඩු කිරීමක් නොවෙයි මේ කරන්නේ. ව්‍යවස්ථානුකූලව ලංකාවේ ස්වාධීන කොමිෂන් සභාවලට තිබෙන බලය ගැනයි මේ කියන්නේ. ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඏ. (1) ව්‍යවස්ථාවෙහි මෙසේ සඳහන්ව තිබෙනවා:

> "කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන කාණ්ඩවල පොලිස් නිලධරයන් පත්කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීමේ සහ ඔවුන් සේවයෙන් පහ කිරීමේ ලා කොමිෂන් සභාව සතු බලතල කොමිෂන් සභාව විසින් නම් කරනු ලැබිය යුතු (කොමිෂන් සභාවේ සාමාජිකයන්ගෙන් සමන්විත නොවන) කමිටුවක් වෙත, කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේ ය."

ඉතින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන එකක් තමයි මේ කරන්නේ. ඒ නිසා මේක අමුතු එකක් නොවෙයි. ඒ වාගේම, මේක පොලිස් කොමිසමේ අභිමතය පරිදි කරන්නේ. මේකේ තිබෙනවා, ඕනෑම මොහොතක මේ බලතල නැවත පවරා ගන්නත් පුළුවන් කියලා. ඒ වාගේම, මීට අදාළ නිර්ණායක, සීමා මොනවාද කියලා ගරු ඇමතිතුමා කරුණු ඉදිරිපත් කළා. එම නිසා මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව සිද්ධ වෙන වැඩක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ පොලීසිවලට පොලිස් ස්ථානාධිපතිවරු පත්කිරීමේ ක්‍රියාවලිය ඉතිහාසයේ කොහොමද වුණේ කියලා අපි දන්නවා. ඒ කාලයේ පොලීසියට ඇඟිලි ගැසීම්, දේශපාලන මැදිහත්වීම් තිබුණේ මොන මට්ටමින් ද කියලාත් අපි දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවේ ඉන්නේ මැරිලා ඉපදිච්ච මිනිස්සු නොවෙයි නම් මේ හැම කෙනෙක්ම ඒ ගැන දන්නවා. පොලීසියට ගියාම OIC නැඟිට්ටාම OICගේ පුටුවේ වාඩිවෙලා orders දීපු අය පිළිබඳ දේශපාලන ඉතිහාසයක් තිබෙනවා. ලංකාවේ පොලීසිය වැඩ කරපු විධියක් තිබෙනවා. දැන් ව්‍යවස්ථානුකූලව යම්කිසි ක්‍රියාවලියක් සිද්ධ වෙනවා. පොලීසියේ අකාර්යක්ෂමතා, අවශ්‍යතා වාගේම මේ මොහොතේ රටේ යම්කිසි තත්ත්වයකුත් තිබෙනවා. අවුරුදු ගණනක්, දශක ගණනක් ගොඩ නඟපු සංවිධානාත්මක අපරාධ ජාලය, මත්ද්‍රව්‍ය ජාලය අද වන විට බිඳ වට්ටමින් තිබෙනවා. ඒ සියල්ල ඇතුළේ මේ මෙහෙයුමට අදාළ කටයුතු යම් කාර්යක්ෂමතාවකින් කර ගන්න, ඒ යන කාලය අඩු කර ගන්න අවශ්‍යතාව තිබෙනවා. ඒ නිසා තමයි අභිමතය පරිදි ඒ සාකච්ඡා එන්නේ.

දැන් කියනවා නේ, පොලීසියට බලපෑම් කරනවා කියලා. කාටද බලපෑම් කරලා තිබෙන්නේ? පොලිස් කොමිසමේ කාටද බලපෑම් කරලා තිබෙන්නේ? මේක අපි පත් කරපු කොමිසමකුත් නොවෙයි නේ. මේ පොලිස් කොමිසමේ සිටින සාමාජිකයන් අපේ ආණ්ඩුවෙන් පත් කරපු අය නොවෙයි. මීට කලින් ඔබතුමන්ලාගේම ආණ්ඩුවලින් පත් කරපු පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයන් තමයි මේ ඉන්නේ. එහෙම නම් කියන්නකෝ, ඒ කාටද අපි බලපෑම් කරලා තිබෙන්නේ කියලා? මොකක්ද කරලා තිබෙන බලපෑම? එහෙම එකක් නැහැ. ඇත්තටම ඇයි දැන් මේ වෙලාවේ කලබල වෙන්නේ? මේ රටේ තිබෙන තත්ත්වය මොකක්ද? මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධවලට එරෙහිව ක්‍රියාත්මක වීම, ඒ ක්‍රියාත්මක වන විධිය, ප්‍රබල අපරාධකාරයන්, සැකකරුවන් අරගෙන එන එක, ඒ පරීක්ෂණ කෙරෙන එක ඒ ඔක්කෝම මැද්දේ තමයි, පොලීසියේ මාරුවීම් වෙන්නේ කොහොමද, එහෙම නැතිව මෙහෙම කළොත් හොඳයි නේද වාගේ සාකච්ඡා ගේන්නේ, ව්‍යවස්ථානුකූලව සියලු දේවල් කරලා තිබියදී. මේ යෝජනා ගේන්නේත් අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරමින් මේ කොමිෂන් සභාවල බලය අඩු කරන්න, වැඩි කරන්න මාරු වෙන මාරු වෙන ආණ්ඩු අනුව අත උස්සපු මිනිස්සු. ඒ නිසා මේක සද්භාවයෙන් කෙරෙන සාකච්ඡාවක් නොවෙයි. ඒක තමයි පළමුවැනි එක.

ඒ වාගේම, ගරු ඇමතිතුමාත් පැහැදිලි කළා වාගේ පොලීසියේ OIC තනතුර කියන්නේ ස්ථානීය තනතුරක්. 2025 ජනවාරි 27වැනි දා නීතිපති දෙපාර්තමේන්තුව විසින් ඉතා පැහැදිලිව ඒක නිරවුල් කර තිබෙනවා, පොලීසියේ SI, IP, CI කියන තනතුරු තුනේම සිටින නිලධාරි මහත්ම මහත්මීන්ට OIC තනතුර ගන්න පුළුවන් කියලා. ඒක තනතුරුවලින් උසස් කිරීම හෝ පහත් කිරීම නොවෙයි කියන එක ඉතාම පැහැදිලිව නීතිපති දෙපාර්තමේන්තුවෙන් නිරවුල් කර තිබෙනවා. ඒ අනුව තමයි පොලිස් කොමිසමේ අභිමතය පරිදි මේක කරන්නේ ගැටලුවක් ඇති වෙන්නේ නැති නිසා. ඒ වාගේම, හදිසි තීරණ ගත යුතු වෙලාවක, මේ දේවල් කළ යුතු වෙලාවක මේ ආකාරයේ සාකච්ඡාවක් පදනම් විරහිතව කළාම මොකද වෙන්නේ? දැන් මේ හදන්නේ මොකක්ද? මන්ත්‍රීවරු 20දෙනෙක් නැඟිටලා, පුදුම හදිසි අවශ්‍යතාවක් තිබෙනවා වාගේ තමයි පෙන්නුවේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පාර්ලිමේන්තුවට අලුත් වුණාට, ස්ථාවර නියෝග කියවාගෙන ගියාම තේරෙන දෙයක් තිබෙනවා නේ. එක් එක් අවස්ථාවලදී වැඩ කරන්න ඕනෑ විධිය ගැන නේ මේකේ තිබෙන්නේ. මේකට අනුව පක්ෂ නායක රැස්වීම්වලට අනුව න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම් ඇතුළු ඒ සියලු දේවල් කරලාත්, අද උදේ ගන්න ඕනෑ සාකච්ඡාවක් තිබෙනවා නේ. මේ ඔක්කෝම තිබියදී බලය කාට වැඩිපුර තිබුණත් මේ කටයුතු කළ යුතු විධියක් තිබෙනවා නේ. ඒකට හදපු Standing Orders නේ මේවා. මන්ත්‍රීවරු 20දෙනෙක් මේ සභාවේ නැඟිටලා අත උස්සලා, "මේක හදිසි තත්ත්වයක්, අපි කථා කරන්න ඕනෑ" කිව්වාට පස්සේ, "හරි, එහෙනම් කථා කරමු" කියන්න වෙනවා. එහෙම තමයි මේ විවාදය ගත්තේ.

[ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා]

එහෙම ගත්තාට, දැන් ඒ නැඟිටපු මන්ත්‍රීවරු 20දෙනාත් නැහැ, අත උස්සපු කට්ටියත් නැහැ; ඒ කවුරුවත් දැන් නැහැ. නමුත් මේක ගැන කථා කරනවා. පොලිසිය සම්බන්ධයෙන්, පොලිස් නිලධාරින්ගේ මාරුවීම් සම්බන්ධයෙන් කථා කරන මේ වෙලාවේ එහෙම ගැටලුවක් තිබෙනවා.

මේ ආණ්ඩුව, අවුරුදු ගණනක් තිස්සේ පමා වෙමින් තිබුණු පොලිස් නිලධාරින්ගේ උසස්වීම් ලබා දෙන්න කටයුතු කරපු ආණ්ඩුවක්; පොලිස් නිලධාරින්ගේ වැටුප් සම්බන්ධ ප්‍රශ්න, බඳවා ගැනීම් සම්බන්ධ ප්‍රශ්න ආදී සියල්ලටම හරියාකාරව ආමන්ත්‍රණය කරමින් යන ආණ්ඩුවක්. ඒ වාගේම, පොලිස් නිලධාරින් ඇතුළු රාජ්‍ය නිලධාරින් සම්බන්ධයෙන් අපට තිබෙනවා දැක්මක්. අවුරුදු ගණනක්; දශක ගණනක් මේ රටේ දේශපාලන ක්‍රමයම දූෂණයට, වංචාවට, අල්ලසට, පගාවට යට වෙනකොට පොලිසිය විතරක් ඒකෙන් බේරිලා තිබෙන්නේ නැහැ. ඒකේ තේරුම, එහි සිටින සියලු නිලධාරින් දූෂිතයි කියන එක නොවෙයි. මේ රටේ හොරු අල්ලලා තිබෙන්නේත් ඒ පොලිසියම තමයි, මේ රටේ අපරාධ අල්ලලා තිබෙන්නේත් ඒ පොලිසියම තමයි, මේ රටේ මිනීමරුවන් අල්ලලා තිබෙන්නේත් ඒ පොලිසියම තමයි. පසුගිය දවස්වල පිටරට ගිහිල්ලා, ජීවිත අවදානමක් අරගෙන, මෙහෙයුමක් කරලා සංවිධානාත්මක අපරාධ නායකයන් අරගෙන ආවේත් ඒ පොලිසියම තමයි. අපට ඒ ගැන අදහසක් තිබෙනවා. දූෂණය තිබෙනවා, වංචාව තිබෙනවා. ඒවා නවත්වන්න ඕනෑ. හරි මිනිස්සු ඉස්සරහට ගන්න ඕනෑ. මොකද, දශක ගණනක් කුණු වෙන්න දීපු රාජ්‍යයක එහෙම නොවී තිබෙන්න විධියක් නැහැ නේ. එතකොට මේ සියල්ල සලකා බලා, කිසිදු බලපෑමකින් තොරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව එය සිදු කළාට පස්සේ, අවුරුදු දෙකෙන් දෙකට ඒ කොමිෂන් සභාවල බලය අඩු කරන්න, වැඩි කරන්න දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටයි, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටයි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටයි -ඒ ඔක්කෝටම- අත උස්සපු මිනිස්සු දැන් ඇවිල්ලා කියනවා, "අම්මෝ! මාර වැඩක් වෙනවා නේ. බලන්න, පොලිසිය දේශපාලනීකරණය කරන්න යන්නේ" කියලා. මේකට දේශපාලනීකරණය කරනවා කියලා කියන්නේ, මීට කලින් තමන්ගේ ආණ්ඩු කාලවලදී පොලිසිය දේශපාලනීකරණය කරනවා කියන එක මෙතුමන්ලා දැකලා නැතුවද දන්නේ නැහැ. මේක එහෙම දෙයක් නොවෙයි. විපක්ෂය මේ සාකච්ඡාව පවා ගන්නේ ඇයි කියලා අපට තේරෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියනවා. මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, සමහරුන්ට බලය තිබෙන කොට මොළය නැහැ, මොළය තිබෙන කොට බලය නැහැ කියලා. ඇත්තටම මට කියන්න තිබෙන්නේ මේකයි. සමහරු ඉන්නවා, බලය තිබෙන කොටත් මොළය නැහැ, බලය නැති වුණාමත් මොළය නැහැ. ඒ අය වැඩ කරන විධියෙන් තේරෙන්නේ ඒකයි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.14]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා අප මන්ත්‍රීවරුන් 20දෙනෙකුට වැඩිය එකතු වෙලා කරුණු දක්වලා අද සභාව කල් තබන අවස්ථාවේ මේ යෝජනාව ගෙන ආවේ හදිසි කාරණයක් නිසා. ආණ්ඩුවට තේරුණේ නැති වුණාට, ඊයේ සිද්ධ වෙන්න තිබිච්ච දෙයක් මේ නිසා නතර වුණා. ඒකයි මට කියන්න තිබෙන්නේ. පසුගිය දා පොලිස් කොමිසම රැස්වුණා. ඒගොල්ලන්ට බලපෑම් කරලා තිබුණේ එම බලය ලබා දෙන්න කියලායි. නමුත් ඒක සිද්ධ වුණේ නැහැ. ඒක තමයි මේකෙන් සිද්ධ වුණු ප්‍රධාන කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බැලුවාම ආණ්ඩුව පැත්තේත් කට්ටිය නැහැ නේ. වෙනදා කිව්වා නේ, "අපේ මන්ත්‍රීවරු 159දෙනාම ඉන්නවා. මේ බලන්න, අපේ කට්ටිය දැන් ඉන්න හැටි" කියලා. වෙනදා එහෙම කිව්වාට දැන් එහෙම කට්ටියක් නැහැ. මේ වෙලාවේ ආණ්ඩුව පැත්තේ ඉන්නේ 15දෙනකු පමණයි. එහෙම නම් ආණ්ඩුව මේ වෙලාවේත් තියාගන්න එපායැ, මන්ත්‍රීවරු 159දෙනා. ඒකත් නැහැ.

ඒ වාගේම, මම මේ කාරණයත් කියන්න ඕනෑ. දැන් තමුන්නාන්සේලා දහසයවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආදිය ගැන කිය කියා ඉන්න එපා. මොකද, ඒවා කරපු කට්ටියට වැරදිච්ච හින්දා තමයි ජනතාව තමුන්නාන්සේලාට බලය දුන්නේ. දැන් තමුන්නාන්සේලාත් ඇවිල්ලා ඉන්නේ ඒකම කරන්න නම් අලුතින් ආණ්ඩුවක් හදන්න ඕනෑ නැහැ නේ. එහෙම නම්, ඒ හිටපු අයටම ආණ්ඩුව දෙන්න තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මොකක්ද මේ කරමින් ඉන්නේ? මේ ගැටලුව හදිසියේ ආපු එකක් නොවෙයි. 2025.02.24වැනි දායි මෙය ඉස්සෙල්ලාම පටන් ගන්නේ. 2025.02.24වන දින "ලංකාදීප" පුවත්පතේ පළ වෙලා තිබෙනවා "ඕ.අයි.සීලා මාරුවට කොමිසමයි, වැඩබලන පොලිස්පතියි සීතල යුද්ධයක", "වැඩබලන පොලිස්පති යැවූ ලිපියක් ප්‍රතික්ෂේප කරලා", "මම නමට විතරක් සීමා වෙලා: පොලිස්පතිගෙන් දොස්", "ඕ.අයි.සීකමට නම් ඇතත් සුදුස්සන් නෑ", "පත්වීම් පිට පාරෙන් බෑ" යනුවෙන්. ඔන්න එකක්. මේක තමයි මේ අර්බුදය පළමුවෙන්ම පටන් ගන්නා තැන. ජනාධිපතිතුමා මොකක්ද කියන්නේ, කටුකුරුන්දට ගිහිල්ලා? 2025.04.07වැනි දා කටුකුරුන්ද පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ දී පැවැති උත්සවයට ජනාධිපතිතුමා සහභාගි වුණා. එම උත්සවය පිළිබඳව 2025.04.09 "දිනමිණ" පුවත්පතේ පළ වී තිබෙනවා. එතුමා කියනවා, "මේ පොලිස් කොමිසමට මම මේ කියන්නේ. මේ පත්වීම් සමහර ඒවා කරනකොට පොලිස් කොමිසම අදිමදි කරනවා. මතක තියාගන්න" කියලා. එහෙමයි කියන්නේ. "...අදිමදි කරනවා. මටත් අදිමදි කරන්න පුළුවන්" කියලාත් කියනවා. මොකක්ද මේ කරන්නේ? පොලිස් කොමිසමට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ තිබෙන්නේ. මේ පුවත්පතේ දිනය 2025.04.09වන දා. එතකොට 2025.02.24 ඉඳලා මේ අර්බුදය දිගින් දිගටම ඇදගෙන

යනවා. ඊළඟට පොලිස් කොමිසම නිවේදනයක් නිකුත් කරනවා, බැරිම තැන. වැඩබලන පොලිස්පතිවරයායි, පොලිස් කොමිසමයි අතර තිබෙන මේ සීතල යුද්ධය අවසානයේ 2025.03.04වන දා ජාතික පොලිස් කොමිෂන් සභාව නිකුත් කරනවා, මාධ්‍ය නිවේදනයක්. ඒ මාධ්‍ය නිවේදනය මඟින් මේ පොලිස්පතිවයාට දෙනවා, උත්තර ටිකක්.

එම මාධ්‍ය නිවේදනයේ 6 වැනි ඡේදය මම කියවන්නම්. එහි මෙසේ සඳහන් වෙනවා:

> "2023 මැයි මස වර්තමාන ජාතික පොලිස් කොමිෂන් සභාව පත්වීමෙන් අනතුරුව, ඉහත සඳහන් කරන ලද ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ (1) ව්‍යවස්ථාවේ සඳහන් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඇතැම් කාර්යය සහ කර්තව්‍ය පැවරීම යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊඊ ව්‍යවස්ථාව ප්‍රකාරව 2023.07.20 දිනැති අංක 2341/51 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව පොලිස්පතිවරයාට සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්වරු, නියෝජ්‍ය පොලිස්පතිවරු, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරු සහ පොලිස් අධිකාරිවරු සහ සහකාර පොලිස් අධිකාරිවරු වෙත, පොලිස් කොස්තාපල්වරයාගේ සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක (පොලිස් ස්ථානාධිපතිවරුන්/ මූලස්ථාන පොලිස්පරීක්ෂකවරුන් හැර) දක්වා වූ නිලධාරින් සම්බන්ධයෙන් ඉහත සඳහන් 155ඒ (1) ව්‍යවස්ථාව ප්‍රකාරව බලතල පවරා දී ඇත."

එහි 7වන ඡේදයේ මෙසේ ද සඳහන් වෙනවා:

> "එමෙන්ම මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන්, පොලිස් ස්ථානාධිපතිවරුන් සහ සහකාර පොලිස් අධිකාරි, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි, නියෝජ්‍ය පොලිස්පති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් සම්බන්ධයෙන් වූ ඉහත කී 155උ (1)(ආ) ව්‍යවස්ථාවේ සඳහන් බලතල ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත රඳවා තබාගෙන ඇත."

ඔවුන් කියනවා, "අපි ඒ බලතල රඳවා තබාගෙන තිබෙනවා. ඒක කරන්නේ අපි." කියලා. පොලිස්පතිට ඒක කරන්න බැහැ. ඒක නිසා තමයි ඒගොල්ලන් කියන්නේ, "ඒක අපි රඳවා තියාගෙන ඉන්නවා" කියලා. මම මේ මාධ්‍ය නිවේදනය **සභාගත*** කරනවා.

මේ මාධ්‍ය නිවේදනය කියවා බලන්න. මෙය කියවා බැලුවාම තේරෙනවා, කොයි තරම් බලපෑමක් පොලිස් කොමිසමට කරලාද කියලා. පොලිස් කොමිසමට එවැනි බලපෑමක් ආවාම තමයි ඒගොල්ලෝ මෙහෙම කියන්නේ. ඒගොල්ලෝ මෙම මාධ්‍ය නිවේදනයේ 9වන ඡේදයේ මෙසේ කියනවා:

> "තවද ශ්‍රී ලංකා පොලිසියේ 80,000කට අධික වූ නිලධාරින් සංඛ්‍යාවකින්, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පත්කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම සහ විනය පාලන කටයුතු සිදු කරනු ලබන්නේ පොලිස් ස්ථානවල මූලස්ථාන පොලිස් පරීක්ෂක/පොලිස් ස්ථානාධිපති තනතුරු හොබවන නිලධාරින් 607 දෙනෙකු සහ රාජ්‍ය නිවේදිත නිලධාරින් (විශේෂ කාර්ය බලකාය ඇතුළු) 813 දෙනෙකු එනම් නිලධාරින් 1420 ක පමණ වූ ප්‍රමාණයක් සම්බන්ධයෙන් පමණි."

එකී නිලධාරින් 1420දෙනා සම්බන්ධයෙන් පමණයි ඒ අය කටයුතු කරන්නේ. ඒ නිලධාරින් 1420දෙනා සම්බන්ධයෙන්වත් කටයුතු කරන්න ඉඩ දෙන්න, ඒකට අතගහන්න එපා කියලායි කියන්නේ. කවුද මේ කියන්නේ? පොලිස් කොමිසම. මොකක්ද මේ ප්‍රශ්නය? මේ කියන්නේ, වැඩ බලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහත්මයාත් එක්ක තිබුණු ගැටලු. මේ මාධ්‍ය නිවේදනයේ තවත් කරුණු ඇති තරම් තිබෙනවා. ඒ සියල්ල කියන්න මට වෙලාවක් නැහැ. ඒ නිසා මම තවත් වැදගත් කාරණයක්, දෙකක් විතරක් කියන්නම්.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මෙහි 11වන ඡේදයේ මෙසේ කියනවා:

> "... ක්‍රියාත්මක කර ඇත්තේ පොලිස්පතිවරයාගේ ඉල්ලීම් මත හෝ පොලිස්පතිවරයාගේ නිර්දේශ මත විනා අත්තනෝමතිකව හෝ හුදෙක් ජාතික පොලිස් කොමිෂන් සභාවෙහි වුවමනාවට නොවන බව අවධාරණය කරනු ලබන අතර එවැනි ඉල්ලීම් සලකා බැලීමේදී එම ඉල්ලීම්වල ඇති සාධාරණත්වය, යුක්තිසහගත බව, සේවා අවශ්‍යතාවය, ප්‍රායෝගිකත්වය, අදාළ නිලධාරින්ට ඇතිවන බලපෑම් ආදී සියලු කරුණු පිළිබඳව විශ්ලේෂණාත්මක අධ්‍යයනය කොට දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමටත් පසුව තීරණවලට එළඹීම ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සෑම විටම සිදු කර ඇත."

ඒ වාගේම, එහි 12වන ඡේදයේ මෙසේ කියනවා:

> "වර්තමාන ජාතික පොලිස් කොමිෂන් සභාව පත්වීමෙන් පසු පොලිස්පති ධුරය හෝ වැඩ බලන පොලිස්පති ධුරය දරන නිලධාරින් දෙදෙනෙක් සමඟ සහයෝගයෙන් කටයුතු කර ඇති අතර, වර්තමාන වැඩ බලන පොලිස්පති ධුරය දරන වැඩ බලන පොලිස්පතිවරයා සමඟද කටයුතු කරනු ලබන්නේත් එලෙසමය."

මේ වාගේ බලපෑම් ආවා. එතුමන්ලා පැහැදිලිව කියනවා, 2024.07.09 දින මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන්/පොලිස් ස්ථානාධිපතිවරුන් 210ක් ස්ථානමාරු කරන්න කරපු ඉල්ලීම එතුමන්ලා ඉටු කළේ නැහැ කියලා.

මේ විධියට තමයි මේ රණ්ඩුව සිදු වෙමින් තිබෙන්නේ. මේ රණ්ඩුවේ අවසානයට තමයි දැන් ඇවිත් තිබෙන්නේ, අර කියපු විධියට බලය පාවිච්චි කරන්න. මම දැන් ඒ ගැන කියන්නම්. දැන් තමුන්නාන්සේලා නිලධාරින් 34දෙනෙක් මාරු කරලා තිබෙනවා. ඒවාට කිසිම පදනමක් නැහැ. මම කියන්නම්. මේ මාරුකිරීම් ටික කරන්නේ 2025.02.10 පොලිස් කොමිසමේ නිර්දේශ අනුව කියලා තමයි කියන්නේ. නමුත් මාරු කිරීම් කරන්නේ 2025.10.06වැනි දා. පොලිස්පති අත්සන් කරනවා. මොකක්ද මේ කරන්නේ? මේකේ සඳහන්ව තිබෙන්නේ මොකක්ද? කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 263 III කාර්ය වගන්තිය යටතේ තමයි මාරු කරලා තිබෙන්නේ. 268 කාර්ය වගන්තියේ මොකක්ද කියන්නේ? එහි කියනවා, ස්ථාන මාරුකිරීම් කරන විධිය. "වාර්ෂික ස්ථාන මාරු යටතේ සලකා නොබලන ලද පහත සඳහන් කර ඇති හේතු මත නිලධාරියෙකු විසින් කරන ලද විශේෂිත වූ ස්ථාන මාරු..." යනාදි වශයෙන් සඳහන් වනවා. සමහරු එහෙම ඉල්ලීම් කරලා නැහැ. මතක තියා ගන්න. මම තව කියන්නම්. කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 263 III කාර්ය වගන්තියේ සඳහන් වනවා, "මූලික විමර්ශනයක් ආරම්භ කිරීමට පෙරාතුව හෝ මූලික විමර්ශනයක් පවත්වාගෙන යන අතරතුර අනාවරණය වී ඇති කරුණු මත හෝ උද්ගතව ඇති කරුණු මත..." කියලා.

මේ මාරු කර තිබෙන අය සම්බන්ධයෙන් මූලික විමර්ශන මොකවත් කරලා නැහැ. සාමාන්‍යයෙන් වෙනදා අදාළ පරීක්ෂණ කරලා තමයි ඒවා කරන්නේ. නමුත්, තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ? දානවා කාර්යසාධන වාර්තාවක්, පොලිස් ස්ථානාධිපතිට. සහකාර පොලිස් අධිකාරිගෙන් ගෙන්වා ගන්නවා. එයාගේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිගෙන් ගෙන්වා ගන්නවා. නියෝජ්‍ය පොලිස්පති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ඉවත් කරන්න ඕනෑ අයට ගහනවා, "කාර්යසාධන වාර්තාව සාමාන්‍යයි" කියලා. ඉතින්, කට්ටිය මාරු කරනවා. තමුන්නාන්සේලාට තියාගන්න ඕනෑ කෙනාට ගහනවා, "ඉතා හොඳයි, හොඳයි. ඉතා හොඳයි" කියලා. එහෙම ගැහුවාම ඒ පොලිසියේ OIC නතර වෙනවා. ඒක තමයි තමුන්නාන්සේලා කරන්නේ. ඉවත් කරන්න ඕනෑ OICට ගහනවා එයාගේ කාර්යසාධන වාර්තාව සාමාන්‍යයි කියලා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? 2025දී පොලිස් ස්ථානාධිපතිවරුන් 134දෙනෙකු මාරු කරලා තිබෙනවා. ස්ථානාධිපතිවරුන්ගේ සම්මුඛ පරීක්ෂණයක් තියලා තිබෙනවා,

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

2023දී. තමුන්නාන්සේලා ඒ ලැයිස්තුව අරගත්තාද? තමුන්නාන්සේලා ආවේ පරණ වැඩේ කරන්න නොවෙයි නේ. පරණ වැඩේ කළත් ඒ මිනිසුන් පරණ වැඩේ කරන කොට අඩුම තරමින් සම්මුඛ පරීක්ෂණයක් තියලා ඒකේ ලැයිස්තුවෙන් තමයි ගත්තේ.

1, 2, 3, 4 කියලා ගත්තා. දැන් ලංකාවේ පොලිස් ස්ථාන "A", "A-2", "B", "C", "D" විධියට ශ්‍රේණිගත කරලා තිබෙනවා. "D" ශ්‍රේණියේ police stationsවල ඉන්න ඕනෑ සමහර අය "A" ශ්‍රේණියේ police stationsවලට මාරු කරලා දමනවා. මම කියන්නේ තමුන්නාන්සේලා විධිමත් පරීක්ෂණයක් කරලා විධිමත් වැඩ පිළිවෙළක් හදලා ඒ අනුව ඕනෑ දෙයක් කර ගන්න කියලායි. එතකොට අපට ප්‍රශ්නයක් නැහැ.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

***නැඟී සිටියේය.***
எழுந்தார்.
*rose.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා පසුව කථා කරන්න. මගේ වෙලාව ගන්න එපා.

මේ ලැයිස්තු හදන්නේ කවුද? දැන් තමුන්නාන්සේලා බණිනවා නේ, අපි ඉස්සර කථා කරපුවා ගැන. "ජාතික පොලිස් කොමිසම ස්ථාපිත කිරීම" කියන මාතෘකාව යටතේ මම 2006 පෙබරවාරි 14වැනි දා සභාවේ කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මම ඒ තොරතුරු ටික **සභාගත*** කරනවා, ඔබතුමන්ලාට බලාගන්න.

මම ඒ කාලයේත් කථා කරලා තිබෙනවා, පොලිස් කොමිසම පිළිබඳව. එදා මේ යෝජනාවේදී බිමල් රත්නායක මැතිතුමාත් කථා කරලා තිබෙනවා. මම මේ යෝජනාව ඉදිරිපත් කළ අවස්ථාවේ බොහොම පැහැදිලිව ලිපි ඉදිරිපත් කරලා තිබෙනවා. මේ OIC මාරු කරන්න ගෝඨාභය රාජපක්ෂට යවපු ලිපියත් මම ඉදිරිපත් කරලා තිබෙනවා. මේවාට අපි එදාත් විරුද්ධ වුණා, අදත් විරුද්ධයි. ඒක මතක තියාගන්න. අපි කිසි දවසක ඒවාට පක්ෂව කථා කරලා නැහැ. තමුන්නාන්සේලා පහර ගහනකොට ඔක්කොටම ගහන්න යන්න එපා. මම මේකට එදාත් විරුද්ධ වුණා. පොලිස් කොමිසම තිබියදී ගෝඨාභය රාජපක්ෂලා කරපු මාරුකිරීම්වලට විරුද්ධව අපි 2006දීත් කථා කළා. මම එදා ඒ යෝජනාව ඉදිරිපත් කළාට පසුව මේ පාර්ලිමේන්තුවේදී බිමල් රත්නායක මැතිතුමාත් ඒ සම්බන්ධයෙන් කථා කළා. ඒ හැන්සාඩ් වාර්තාව මා සතුව තිබෙනවා. ඒ නිසා නිකම් මඩ ගහන්න ලැහැස්ති වෙන්න එපා.

ඉස්සර පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඇමතිට ලියුම් අරිනවා. ඇමතිවරයාට ලියුම් යවලා කියනවා, "අනේ මෙයා නිසා අපට ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒ නිසා මෙයා අයින් කරන්න" කියලා. දැන් මොකද කරන්නේ? දැන් ඒවා නැහැ. දැන් අලුත් ක්‍රමය අනුව WhatsApp කරනවා. කාටද? අපේ ඇමතිතුමාට WhatsApp කරනවා. අපේ වටගල මහත්මයාට WhatsApp කරනවා. WhatsApp කරලා, "සර්, මේකට මොනවා හරි කරලා දෙන්න" නැත්නම්, "සහෝදරයා, මේක කරලා දෙන්න" කිව්වාම, වටගල මහත්මයායි, රවි සෙනෙවිරත්න මහත්මයායි, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රණවීර මහත්මයායි ඉඳගෙන ලැයිස්තුව හදනවා. ලැයිස්තු හදලා යවනවා, පොලිස් කොමිසමට. පොලිස් කොමිසමෙන් ඒක පොලිස්පතිට යවනවා. පොලිස්පති මාරුවීම් ටිකට ලියුම් ගහනවා. මේවා කෙරෙන්න පරක්කු වෙච්ච නිසා තමයි දැන් මේ කවල් එක තිබෙන්නේ.

මම මේ කාරණයත් කියන්න කැමතියි. තමුන්නාන්සේලා ඕනෑ දෙයක් කරගන්න. ඕනෑ OIC කෙනෙක් මාරු කරගන්න. මම නම් අපේ පොලීසියේ OIC මාරු කරන්න හෝ තියාගන්න කියලා කවදාවත් ඉල්ලලාත් නැහැ, ඉල්ලන්නෙත් නැහැ. මොකද, අපට OIC හිටියත් එකයි, නැතත් එකයි. වැරැදි වැඩ කරන්නේ නැත්නම් අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. මොකද, අරක්කු අල්ලන එක ගැනයි, හොර අරක්කු පෙරන එක ගැනයි අපි කථා කරන්නේ නැහැ නේ. මම දැක්කා නේ, එක්කෙනෙක් OIC මහත්මයාට කථා කරපු හැටි. වැලිගම ප්‍රාදේශීය සභාවේ උපසභාපති රාජ්‍ය නිලධාරින්ට කථා කරන හැටි දැක්කා නේ. තමුන්නාන්සේලා දැන් ඒවා කරගෙන යනවා.

දැන් බලන්න, සමහර කට්ටිය දාලා තිබෙන්නේ මොනවා කරන්නද? CI මහත්වරු, HQI මහත්වරු දාලා තිබෙනවා, සාමාන්‍ය රාජකාරිවලට. ඒකයි තිබෙන ප්‍රශ්නය. අවුරුදු ගණනක් තිස්සේ ශක්තිමත්ව වැඩ කරපු මිනිස්සු තමයි මේ මාරු කරන්නේ. තමුන්නාන්සේලා පොලිස් සේවයට ගන්න ඕනෑ ශක්තිමත් මිනිස්සු නේද? ඒ අය සාමාන්‍ය රාජකාරිවලට දැම්මාම ඒ අයට සිද්ධ වෙන අසාධාරණය ගැන හිතලා බලන්න. මෙන්න මේකයි අපි කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව කාරණයක් කියන්න කැමතියි. ලබන අප්‍රේල් මාසය වෙනකොට පොලිස් කොමිෂන් සභාවේ කාලය අවසාන වෙනවා. දැන් පොලිස් කොමිසමේ සභාපතියි, සාමාජිකයෝයි මොකද කරන්නේ? තරහා කරගන්නේ නැතිව, පුළුවන් නම් ඊළඟ වතාවෙත් පොලිස් කොමිසමේ වාඩිවෙන්න හිතාගෙන මේ වැඩේට හා කියලා අත උස්සලා කටයුතු කරනවා. ඇයි? තමුන්නාන්සේලාට බයේ. මම කියනවා, මීට වැඩිය හොඳයි පොලිස් කොමිසම වහලා දමන එක කියලා. පොලිස් කොමිසමේ ඉන්න කට්ටිය ගෙදර යන්න. ඒ අය ඉඳලා තේරුමක් නැහැ. මොකද, ඒ අය ඇවිල්ලා තිබෙන්නේ ස්වාධීන පොලිස් කොමිසමට. තමුන්නාන්සේලාට ඒක එපා නම් වහලා දමන්න.

ඒ වාගේම මම තව කරුණු දෙකක් කියන්න කැමැතියි, ඇමතිතුමාත් මෙතැන ඉන්න නිසා. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නියෝගයක් ගත්ත පොලිස් ස්ථානාධිපතිවරුත් දැන් තමුන්නාන්සේලා මාරු කරලා තිබෙනවා. ඒවා වැරදියි. මේ, පසුගිය ආණ්ඩුවෙන් කරපු ඒවාමයි. අපි පසුගිය ආණ්ඩුවේ හිටපු මිනිස්සු නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

---

***** පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

දැන් බලන්න ගරු ඇමතිතුමනි, ආබාධිත පොලිස් නිලධාරින් 400ක් විතර ඉන්නවා. තමුන්නාන්සේලාත් ඒ ගැන දන්නවා. මම හිතන විධියට, ඊටත් වැඩියි. Accident වෙලා, මොනවා හරි වෙලා කකුල් කැඩුණු අය එහෙම ඉන්නවා. ඒ අයට මොකක්ද කරලා තිබෙන්නේ? කලින් ඒ අයට දුන්නේ සුළු රාජකාරි. දැන් බලන්න, කුරුණෑගල ඇතුළු හැම ප්‍රදේශයකම ඒ මිනිස්සු පාරට දමලා තිබෙනවා වැඩ කරන්න කියලා. ඒවා වැරදියි.

ඊළඟට මේ කාරණය බලන්න. මිනිහෙක් අරක්කු පෙරනවා නම්, පොලීසියේ OICට ඒක බේරා ගන්න බැරි නම් මොකක්ද කරන්නේ? 54 ගහලා ඇතුළට දමනවා. කෑගල්ල බන්ධනාගාරයේ ඉන්න පුළුවන් 400කට විතරයි. නමුත් අද 1,000කට වැඩිය ඉන්නවා. මැගසින් බන්ධනාගාරයේ ඉන්න පුළුවන් 600කට. අද වෙනකොට 2,400ක් ඉන්නවා. කරුණාකරලා මෙන්න මේ කාරණය ගැනත් හිතන්න.

අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමතියි. තමුන්නාන්සේලා උප පොලිස් පරීක්ෂකවරු හයසිය ගණනකට උසස්වීම් දුන්නා.

ඒ සියලුම උසස්වීම් සම්බන්ධයෙන් විශාල අර්බුදයක් තිබෙනවා. ඒ සම්බන්ධව අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා. ඒ වාගේම පොලිස් කොමිසමට ස්වාධීනව කටයුතු කරන්න ඉඩ දෙන්නේ නැත්නම් කරුණාකර පොලිස් කොමිසම විසුරුවා හරින්න යෝජනාවක් ගේන්න. තමුන්නාන්සේලාට මන්ත්‍රීවරු 159දෙනෙක් ඉන්නවා. අත උස්සලා ඒ යෝජනාව සම්මත කරන්න. එතකොට පොලීසියත් ඉවරයි, පොලිස් කොමිසමත් ඉවරයි, තමුන්නාන්සේලාට කැමති කෙනෙක් දමාගන්න. බොහොම ස්තුතියි.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු ඇමතිතුමා. කාලය පිළිබඳ ප්‍රශ්නයකුත් තිබෙනවා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කියපු බොහෝ දේ ඇත්ත නොවෙයි. විශේෂයෙන් මේ සියලු මාරුවීම් සිද්ධ කළේ පොලිස් කොමිසමේ අනුමැතිය සහිතව. එතුමාගේ කථාව අවසානයේදී කිව්වා, ආබාධිත නිලධාරින් රාජකාරියට යොදවා තිබෙනවා කියලා. දැනට uniformed staff 4,000ක් ඉන්නවා uniforms අඳින්නේ නැතුව. සැහැල්ලු රාජකාරි කරන අයට බලපෑමක් කරලා නැහැ. නමුත්, දෙවැනි වතාවේ පවත්වපු වෛද්‍ය මණ්ඩලයකින් සමහර අය නැවත රාජකාරියේ යොදවා තිබෙනවා. ඒක වෛද්‍ය මණ්ඩලයේ තීන්දුවක්. ඒ හැර ආබාධිත කිසිදු නිලධාරියෙක් ඔය කියන රාජකාරියේ යොදවලා නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.28]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය ගෙනා මේ යෝජනාව, ඇත්තටම බබා හම්බ වෙන්න කලින් ළමයාට නමක් දමනවා වාගේ එකක්. ඊයේ මන්ත්‍රීවරු 20දෙනෙක් නැඟිටිනකොට මම හිතුවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා තමයි පොලිස් කොමිසම මොකක් හරි කරන්න යනවා නම් කරන්නේ කියලා. අපි දැක්කා, ඊයේ යෝජනාවක් ගෙනැල්ලා ඒකත් ඒගොල්ලන්ට boomerang වුණා. අද මේ යන විධියට නම් ඒ 20දෙනාත් නැහැ. ඇත්තටම, දැන් boomerang වෙන්නයි යන්නේ. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කවුරු හරි මට කියන්න, තමුන්නාන්සේලාගේ යෝජනාවට අනුව - සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාගේ යෝජනාවට අනුව - කොමිසම අනාගතයේදී යමක් කරනවා නම්, එහි කිසි යම් නීතිවිරෝධී තත්ත්වයක් තිබෙනවාද කියලා. ඩී.වී. චානක මන්ත්‍රීතුමා එතුමාට අවශ්‍ය කොටස කිව්වා. නමුත්, 155ඡ.(2) කොටස කිව්වේ නැහැ. එහි මෙසේ සඳහන්ව තිබෙනවා:

> "එවැනි යම් බලතල පැවරීමක් කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්විය යුත්තේ ය."

මොකක්ද "එවැනි" කියන්නේ? ඒ මාරුවීම් සම්බන්ධව. දැන් මේ කථා කරන්නේ ඒක නේ. මාරුවීමට අදාළව යමක් කරනවා නම්, ඒක ගැසට් පත්‍රයේ පළ කරලා කරන්න පුළුවන්. එහෙම නම්, දැන් මේ කරන්න යන වැඩේ නීතිවිරෝධී තත්ත්වයක් නැහැ නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මම මේ කියන්න උත්සාහ කරන්නේ,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, අපට ඒ ගැන කරුණු කියන්න කිව්වා නේ -

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඔබතුමාට කියන්න කිව්වේ නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමාට කියන්න කිව්වේ නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කිව්වා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
නැහැ, නැහැ ඩී.වී. චානක මන්ත්‍රීතුමාට කිව්වේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කවුරු හරි එක්කෙනෙක් කියන්න කිව්වා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

එතකොට, මෙකේ නීතිවිරෝධී තත්ත්වයක් නැහැ. *[බාධා කිරීමක්]* මගේ කථාවෙන් පසුව කියන්නකෝ. නීතිවිරෝධී තත්ත්වයක් නැති කාරණාවක් තුළ තමයි අපි මේ සාකච්ඡාව අරගෙන යන්නේ. විපක්ෂයේ කිසිදු මන්ත්‍රීවරයෙක් කිව්වේ නැහැ,- *[බාධා කිරීමක්]*

අපි හිතමු, මේ යෝජනාවට අනුව කොමිසම බලය පවරනවා, පොලිස්පතිවරයාට. පොලිස්පතිවරයා අදාළ ස්ථාන මාරුවීම් ටික කරනවා කියලා. අපි එහෙම හිතමු. එතකොට මේ කිසිදු මන්ත්‍රීවරයෙක් කිව්වේ නැහැ එයින් අගතියට පත් වෙන යම් නිලධාරියෙක් ඉන්නවා නම්, එයාට මොකක්ද වෙන්නේ කියන එක. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59වෙනි ව්‍යවස්ථාවට සම්බන්ධ 155ඒ. (1) ව්‍යවස්ථාවේ මොකක්ද තිබෙන්නේ? ඒකෙන් කියන්නේ කොමිෂන් සභාවට අභියාචනා කිරීම සම්බන්ධයෙන්. ඊට එහා ගිය තව එකක් තිබෙනවා. ඒ, 59. (1) සහ 155ඔ. ව්‍යවස්ථා. ඒ අනුව, පරිපාලන විනිශ්චයාධිකාරියකට යන්න පුළුවන්. අගතියට පත් වෙන නිලධාරියෙක් ඉන්නවා නම්, ඔහුට කොමිසමට අභියාචනයක් කරන්න පුළුවන්.

එයින්ද අතෘප්තිමත් නම්, ඔහුට පරිපාලන විනිශ්චයාධිකාරියට යන්න පුළුවන්. අවශ්‍ය නම් ඕනෑම නිලධාරියෙකුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 සහ 126 ව්‍යවස්ථා පාවිච්චි කරලා, මාසයක් ඇතුළත මූලික මිනිස් අයිතිවාසිකම් නඩුවක් පවරන්න පුළුවන්. මොකක්ද මේ හදිසිය? මොකක්ද මේ ප්‍රශ්නය? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මේ බලය අවශ්‍ය නම්; පොලිස්පතිවරයාට මේ බලය අවශ්‍ය නම්, ඒකට පැහැදිලි හේතුවක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ රටේ දැවැන්ත මෙහෙයුම් ප්‍රමාණයක් කර ගෙන යන බව ඔබතුමා දන්නවා. නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ පාතාල ක්‍රියාකාරකම් මර්දනයට අදාළව දැවැන්ත ක්‍රියාකාරකම් ප්‍රමාණයක් අද රටේ සිදු කරගෙන යනවා. ආයතන ප්‍රධානියෙකුට යම් මට්ටමක අභිමතයක් තිබිය යුතුයි, තමන්ට සුදුසු නිලධරයෙක් යොදවා ගෙන ඒ අදාළ කාර්යය ඉෂ්ට කර ගන්න. එතකොට, කොමිසමේ තිබෙන එම බලයේ තත්ත්වය තමයි පොලිස්පතිවරයාට මේ දීලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බැලුවා මේ කලබලය මොකක්ද කියලා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, point of Order එකක් ගන්න කාරණාවක් නැහැ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

මොකක්ද මේ කලබලය? අපි දැක්කා, මන්ත්‍රීවරුන් 20දෙනෙක් එකතු වෙලා කෑගහලා, මේ යෝජනාව ඉදිරිපත් කරන්න අවසර ඉල්ලුවා. මම නම් කියන්නේ, මෙය පාර්ලිමේන්තුවේ කාලය අපරාදේ නාස්ති කිරීමක් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පස්සේ ගරු කථානායකතුමා තීරණය කරන්න ඕනෑ, එවැනි දේවල් සම්බන්ධයෙන්. ඇත්ත වශයෙන්ම එවැනි violation එකක් නැත්නම්, මොකක්ද මේ තිබෙන හදිසිය? එවැනි තත්ත්වයක් නැත්නම් මේ ගරු සභාවේ කාලය නාස්ති කරන්න අවස්ථාවක් දෙන්න බැහැ. මේ අයට මොකක්ද වුණේ? දැන් ඇතැම් අය -නම් කිව්වොත් ටිකක් අවුල්- මේ ගරු සභාව ආමන්ත්‍රණය කළේ පත්තර කැලිවලින්. පත්තර කැලි ගෙනැල්ලා, පත්තර කැලිවලින් සාක්ෂි තහවුරු කරනවා. එයට සාක්ෂි ආඥාපනතේ කියන්නේ, "ප්‍රවාදක සාක්ෂි" කියලා. පත්තර කැලි ගෙනැල්ලා ඒවායේ තිබෙන දේවල් කියමින් මෙතැන කථා කරනවා. මෙතුමාගේ යාළුවා ඊයේ තංගල්ල පොලිසියට ගිහිල්ලා අන්තිමට කිව්වේ මොකක්ද? "මමත් දන්නේ නැහැ ඉතින්, ඔය ජනමාධ්‍යවලින් කියපු දේ තමයි මම කිව්වේ" කියලා. *[බාධා කිරීමක්]* ඒත් පත්තර කැලිවලින්. ඒක නිසා පත්තර කැලි ගෙනැල්ලා, මේ ගරු සභාවේ නිකම් කරුණු කියලා මේක තීරණය කරන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔවුන්ගේ යම් ඉලක්කයක් තිබෙනවා කියන එක අපට පෙනෙනවා. ඔවුන්ගේ ඉලක්කය මොකක්ද? අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට පහර ගහන එක. ඔවුන්ගේ ඉලක්කයක් තිබෙනවා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පහර ගහන්න. ඇයි ඒ? මේ ආයතන ස්වාධීන ක්‍රියාකාරිත්වයක් ඇතුළේ සමහර වැරදි සම්බන්ධයෙන් අත පොවයි කියලා ඒගොල්ලන් හිතුවේ නැහැ. නීත්‍යානුකූල ක්‍රියාවලිය අනුව ගිහිල්ලා රනිල් වික්‍රමසිංහ වාගේ කෙනෙකුට අත තියයි කියලා මෙගොල්ලන් හිතුවේ නැහැ. විපක්ෂය පැත්තේ ඉඳගෙන කථා කරපු මන්ත්‍රීවරයා "ඔය වැඩේ හොඳයි ද, වැඩි නැද්ද ඔයගොල්ලෝ කරපු වැඩේ" කියලා ඇහුවා. "ඔයගොල්ලෝ" කිව්වාට, අපි නොවෙයි ඒවා කරන්නේ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව. ඒවා කරන්නේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව. තේරුණාද? ඒ වාගේ ආයතන අතීතයේ එවැනි දේවල් සඳහා අත ගහලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අපි දේශපාලනය නැමැති හිස අයින් කළාට පස්සේ ඔවුන්ට ධෛර්යයක් ආවා; ශක්තියක් ආවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඒ ශක්තිය ආවාට පස්සේ, ස්වාධීන ක්‍රියාවලියක් ඇතුළේ රනිල් වික්‍රමසිංහව අත්අඩංගුවට ගන්න ඕනෑ වුණා. අන්න එතකොට මෙගොල්ලෝ කලබල වුණා, "මාර වැඩේ! දැන් නම් ගල් රෝල අපේ පැත්තටත් එනවා වාගේ. දැන් මේකෙන් බේරෙන්න මොකක් හරි කරන්න ඕනෑ" කියලා. එදා මන්ත්‍රීවරුන් 20දෙනෙක් නැඟිට්ටා. දැන් කෝ ඒ 20දෙනා? අපෙන් අහනවා, ඔයගොල්ලන්ගේ මන්ත්‍රීවරුන් කෝ කියලා. දැන් මේ එන ගමන හරි පැහැදිලියි. මෙගොල්ලන්ට වුවමනාවක් තිබෙනවා. ගරු අධිකරණයේ ක්‍රියාවලියට ඇඟිල්ල දිගු කරලා, අධිකරණයේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පසුගිය ටිකේම ප්‍රශ්න කර කර ආවා. මොකක්ද, මෙගොල්ලන්ට ඕනෑ කරන්නේ? සිවිල් සමාජය ව්‍යාකූල කරන්න. එතකොට ඒගොල්ලන්ට දේශපාලනය කරන්න පහසුයි. සිවිල් සමාජය ව්‍යාකූල කරන්න, අවුල් කරන්න මොකක් හරි මෙතැනට ගෙනැල්ලා, පත්තර කැලිවලින් යම් යම් දේවල් කියන්න උත්සාහ කරනවා.

ඒක අස්සෙත් කියනවා, අග්‍රාමාත්‍යතුමියගේ තනතුර පිළිබඳව. අනේ, මොනවාද මේ කථා? අපේ ප්‍රශ්නය අපි බේරා ගන්නම්. අනේ, මේවාට නම් කලබල වෙන්න එපා, මේ සභාවේ කාලය ගන්නත් එපා. තේරුණාද? ඒක නිසා මේ යන ගමන - *[බාධා කිරීමක්]*

දැන් මේ මොකක්ද වෙලා තිබෙන්නේ? තමන්ට - *[බාධා කිරීමක්]* මෙහෙමයි වුණේ. එක මන්ත්‍රීවරයෙක් දැන් සංඛ්‍යාලේඛනයක් ඉදිරිපත් කළා. මාර වැඩේ! 2024දී මෙන්න මෙච්චරක් අපරාධ සිද්ධ වෙලා තිබෙනවා කියලා කිව්වා. මම එක ප්‍රශ්නයක් අහන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පසුගිය දවස්වල කථාවක් නිර්මාණය වුණා. මෙගොල්ලන්මයි එය

නිර්මාණය කළේ. ඒ මොකක්ද? "දවසේ වෙඩිල්ල. " මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙඩිල්ල නතර වෙලා දැන් ඒක "දවසේ ඇඞිල්ල"ට පරිවර්තනය වෙලා! "දවසේ ඇඞිල්ල" දැන් තිබෙන්නේ. ඉතින්, ඒ නිසා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දවසේම ඇඞිල්ල.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
දවසේම ඇඞිල්ල! දැන් මොකක් මොකක් හරි හොයාගෙන ඇවිල්ලා, කිසිදු සාධකයක් නැතුව -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
විනාඩි දෙකයිද? හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ පැහැදිලි කරන්නේ වෙන මොකක්වත් නොවෙයි. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා මට කියන්න, තමුන්නාන්සේලාගේ කථාව ඇතුළේ, මේ ගෙනාපු යෝජනාව ඇතුළේ කිසිම නීති විරෝධී තත්ත්වයක් ගැන තිබෙනවාද කියලා? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන කැල්ලක් අරගෙන, කිසිදු නීති විරෝධී කාරණයක් නැති තත්ත්වයක් තුළ මේ කරන්න යන දේ පිළිබඳව දැන් මෙතැන ඇවිල්ලා කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා -

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Thank you.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා, මට මයික් එක හම්බ වුණා. ඔබතුමා මට කියන්න කියලා කිව්වා. ඒකයි මම කියන්නේ. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ස්වාධීන කොමිසමට දීලා තිබෙන බලතල, බලපෑම් කරලා ඉවත් කරන්න එපා. බලපෑම් කරලා ඒ බලතල ඉවත් කරන්න එපා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

සහ පොලිස්පතිවරයා බලපෑමක් කළා, ස්වාධීන කොමිසමට ස්වාධීනව කටයුතු නොකිරීමට. ඒ නිසා, දයාසිරි ජයසේකර මැතිතුමා කිව්වා වාගේ මාස කිහිපයකින් එහි කාලය අවසන් වන නිසා - *[බාධා කිරීමක්]* පත්වීම් සම්බන්ධයෙන් බලපෑම් ඇති කරලා ඔවුන්ව නිහඬ කරන්න එපා. නීත්‍යානුකූල නොවෙන්න පුළුවන්. ව්‍යවස්ථාපිත වෙන්න පුළුවන්. හැබැයි, ව්‍යවස්ථාපිත හැම එකක්ම හරි දෙයක් කියලා අපට පිළිගන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ "යන්නේ කොහේද? මල්ලේ පොල්" න්‍යාය තමයි ගෙනියන්නේ. දැන් මේ ගෙනැල්ලා තිබෙන යෝජනාව, අනියමාර්ථයේ අසම්භාව්‍යක් ක්‍රියාවක්. "වැසි වැස්සොත්, ගඟ ගලයි". හරිද? මේ, අනාගතයේ වෙන්න තිබෙන දෙයක්. තේරුණාද? අනාගතයේ මෙන්න මෙහෙම Commission එකක් ඇති කරන්න යනවාය කියලා හීනෙන් දැකලා. දැන් මේගොල්ලන්ට වෙලා තිබෙන්නේ මොකක්ද? හීන දකිනවා. නින්ද යන්නේ නැහැ. මොකද, තමන් කරපු වැරදිවලට- *[බාධා කිරීමක්]* මෙහෙම නේ. සමහර අය වෙක් ගහපු ඒවා තිබෙනවා. සමහර අයගේ වාහන ප්‍රශ්න තිබෙනවා. *[බාධා කිරීමක්]* පොදු දේපළ සම්බන්ධ වැරදි තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇලෝසියස්ගේ list එකේ ඉන්නවා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඔව්. එක එක lists පෙනෙනවා. ඉතින්, රෑ එළි වෙනකල් නින්ද යන්නේ නැහැ. නින්ද යන්නේ නැතිවෙනකොට මෙතැන ඇවිල්ලා යෝජනා ගෙනෙනවා. යෝජනාව boomerang වෙනවා. ඊයේ යෝජනාව boomeranged; අද යෝජනාවත් boomeranged.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
අනික් කාරණාව තමයි බැඳුම්කර සිද්ධිය. "බැඳුම්කරය, බැඳුම්කරය" කියලා කෑ ගහනවා ලු, සමහර ගෙවල්වල, හීනෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මෙවැනි යෝජනා ඇත්ත වශයෙන්ම "එදා වේල ටුවර්ස්" වාගේයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මෙවැනි යෝජනා විවාදයට ගනිද්දී අපි සැලකිලිමත් විය යුතුයි. නැත්නම් මේ සභාවේ කාලය අපරාදේ. *[බාධා කිරීම්]* ඉන්නකෝ මම පාඨයක් දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමා. කාලය අවසානයි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
බොරුවක් සමාජගත කරලා පැය 24ක් ගෙන යන්න බැරි වුණා. තේරුණාද? [බාධා කිරීම්] ඉන්නකෝ කියන්න. [බාධා කිරීම්] මෙහෙමයි, හරිද? [බාධා කිරීම්] මෙහෙමයි. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඔබතුමන්ලාගේ මඩ බලකාය තමයි ඒක සමාජගත කළේ. *[බාධා කිරීම්]* දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාගේ මඩ බලකාය තමයි ඒක සමාජගත කළේ. පැය 24ක් යන්න හම්බ වුණේ නැහැ, බොරුව අකුළා ගන්න සිද්ධ වුණා. *[බාධා කිරීම්]* ඒ නිසා දැන් ගෙනෙන බොරු පැය විසිහතරේ බොරු. *[බාධා කිරීම්]* දැන් ගෙනෙන බොරු පැය 24යි තිබෙන්නේ. පැය 24න් සියල්ල ආපස්සට යනවා. *[බාධා කිරීම්]* ඒ නිසා අපේ ඉලක්ක- *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීම්]* මේ වෙලාවේ විපක්ෂය විසින් ජනාධිපතිවරයාත්, අපේ අමාත්‍ය මණ්ඩලයේ කිහිපදෙනෙකුත් ඉලක්ක කරගෙන සංවිධානාත්මකව අප වෙත එල්ල කරන මඩ ව්‍යාපාරයක් තිබෙනවා. *[බාධා කිරීම්]* ඒවාට කිසිදු පදනමක් නැහැ. ඒවා අපි ප්‍රතික්ෂේප කරනවා. *[බාධා කිරීම්]* මේ ගෙනැවිත් තිබෙන යෝජනාවටත් කිසිදු පදනමක් නැහැ කියලා යෝජනා කරමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.42]

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඇත්තවශයෙන්ම විපක්ෂය තමන්ගේ දේශපාලන බංකොලොත්භාවය අද දින සභාව කල් තැබීමේ යෝජනාව හරහා ගෙනැල්ලා තිබෙන බව තමයි පෙනෙන්න තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කිරීම, ස්ථිර කිරීම සහ මේ යෝජනාවට දාලා තිබෙන අත්සන් දිහා බැලුවාම මේකේ හාස්‍යජනක බව සහ දෛවෝපගත බව පෙනෙනවා. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් ස්ථාපිත කළ, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් අවලංගු කළ ස්වාධීන පොලිස් කොමිසම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් නැවත බලාත්මක කරලා තිබියදී, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා නැවත මේ ස්වාධීන කොමිෂන් සභා අහෝසි කළා. මේ යෝජනාව ගෙනෙන අත්දැකීම් සහිත අපේ මන්ත්‍රීතුමා ඒ අවස්ථාවේ ඊට විරුද්ධ නොවී ඡන්දය ප්‍රකාශ කිරීමෙන් තොරව සභාවට නොපැමිණ සිටි තැනැත්තෙක්. *[බාධා කිරීමක්]* ඔබතුමා, ඔබතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මම?

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
ඔව්. මා ළඟ තිබෙනවා, ඡන්දය දුන් අයගේ නාම ලේඛනය. ඔබතුමා ඡන්දය ප්‍රකාශ කිරීමෙන් තොරව පිට වෙලා ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම මේ වෙලාවේ සභාවේ නැහැ, ඩී.වී. චානක මන්ත්‍රීවරයා. ඩී.වී. චානක මන්ත්‍රීවරයා ස්වාධීන කොමිෂන් සභා අවශ්‍ය නැහැ කියලා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂව අත ඔසවපු තැනැත්තෙක්. මේවා කියන කොට සභාවේ ඉන්න බැහැ. ගලේ පහරපු බළලාට වෙච්ච වැඩේ ඩී.වී. චානක මන්ත්‍රීවරයාට අද වෙලා තිබෙන්නේ. මොකද, රාජපක්ෂ රෙජිමය එක්ක එකතු වෙලා ස්වාධීන කොමිෂන් සභාවලට එරෙහිව, ඒවා අවලංගු කරන්න ගෙනාපු ව්‍යවස්ථා සංශෝධනවලට අත ඔසවලා අද ඇවිල්ලා ස්වාධීන කොමිෂන් සභාවල අයිතිවාසිකම් ගැන කිඹුල් කඳුළු හෙළනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නම කිව්වේ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
මම නමක් සඳහන් කළේ නැහැ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමා, පොඩි ප්‍රශ්න දෙකක් අහන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, කෙටියෙන් කියන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන වෙලාවේ මම හිටියේ නැහැ; ඒ පාර්ලිමේන්තුවේ මම හිටියේ නැහැ.

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
ඔබතුමාගේ නම තිබෙනවා, අරගෙන බලන්න. මගේ අතේ නාම ලේඛනය තිබෙනවා. අවශ්‍ය නම් මා එය එවන්නම්. *[බාධා කිරීමක්]* ඒ ලේඛනය ඔබතුමාට ලබා දෙන්න පුළුවන්. ඡන්දය ප්‍රකාශ නොකරපු ගොඩේ ඔබතුමාගේ නම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විපක්ෂය තමන්ගේ දේශපාලන බංකොලොත්භාවය වහගන්න මුහුදට හත් ගව්වක් දුර තිබියදී අමුඩ ගහන බවක් තමයි පෙනෙන්න තිබෙන්නේ. මොකද, රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, පොලිස් කොමිසමට පැවරිලා තිබෙන බලතල ප්‍රකාරව, පොලිස් කොමිසමට කළ හැකි යැයි නීතියෙන් සම්මත වෙලා තිබෙන යමක් මෙතෙක් කර නැති අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් මේ සභාවට යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මම මේ සභාවේ අවධානය යොමු කරවනවා මේ කාරණයට. ස්වාධීන කොමිෂන් සභා සම්බන්ධයෙන් මේ රටේ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පටන් විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දක්වා සංශෝධන ගෙනැවිත් තිබෙනවා. අද දවසේ මේ විපක්ෂයේ වාඩිවෙලා ඉන්න රෝහිත අබේගුණවර්ධන, දිගම්බරම්, නාමල් රාජපක්ෂ, රවුෆ් හකීම් කියන මහත්වරුන් විතරක් නොවෙයි, ඉතා කනගාටුවට කාරණාවක් තමයි, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂව දයාසිරි ජයසේකර මහත්මයාත් ඡන්දය ලබා දී තිබෙන එක. ඡන්දය දීලා විතරක් නොවෙයි, ඊට පක්ෂව පාර්ලිමේන්තුවේදී කථාවකුත් කරලා තිබෙනවා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂව පාර්ලිමේන්තුවේදී ඡන්දය දීලා, එදා කොමිෂන් සභා එපා කියලා ඒ ගැන පාර්ලිමේන්තුවේදී කථා පවත්වපු අය එවැනි තර්ජනයක් නැති වෙලාවක අද එනවා, මේකේ ස්වාධීනත්වයක් ගැන කථා කරන්න. මේ ගැන විපක්ෂය ලජ්ජා වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන පොලිස්පතිවරයා ඇතුළු පොලීසියට අපි ස්තුතිය පළ කරන්න ඕනෑ, අද දවසේ කරන මේ කාර්යභාරය සම්බන්ධයෙන්. මේ රට කොහේද තිබුණේ? මේ රටේ පොලීසිය කොහොමද ක්‍රියාත්මක වුණේ? විධායකය, විධායකය යටතේ පැවති පොලීසිය වැනි ආයතන එකතු වෙලා අපරාධ රාජ්‍යයක් ගොඩනහලායි තිබුණේ.

මේ රටේ ජනතාවට පුළුවන්, එදා දවසයි අද දවසයි සංසන්දනය කරලා බලන්න. දේශබන්දු තෙන්නකෝන්, අනුර සේනානායක වාගේ කුප්‍රකට, දූෂිත නිලධාරින් මේ රටේ පාලකයෝත් එක්ක එකතු වෙලා අපරාධ රාජ්‍යයක් පවත්වාගෙන ගිය රටක්, මේක. ලසන්ත වික්‍රමතුංග ඝාතන නඩුවේදී පොලිස් නිලධාරින් කීදෙනෙකු සාක්ෂි සැඟවීමේ වරද මත අත්අඩංගුවට ගත්තාද? පොලීසිය විසින් එවැනි අපරාධ රාජ්‍යයක් පවත්වාගෙන ගිය රටක්, මේක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ අවස්ථාවේදී කියනවා මේ රටේ ජනතාවට, මේ රටේ අපරාධ රාජ්‍යය කොහොමද පැවතුණේ කියන එක සහ අද දවසේ පොලීසිය කොහොමද ක්‍රියාත්මක වෙන්නේ කියන එක සම්බන්ධව සංසන්දනාත්මක අධ්‍යයනයක් කර ගන්න කියලා. මේ සභාවට වාගේම මේ රටේ මහජනතාවටත් මම කියනවා, මෑතකදී නිකුත් වුණු, ප්‍රවීණ මාධ්‍යවේදී කසුන් පුස්සවෙල මහත්මයාගේ, "අපරාධ රාජ්‍යයක් - අසංක්ෂිප්ත පරිච්ඡේදයක්" කියන පොත අධ්‍යයනය කරන්න, ඒ වාගේම ප්‍රවීණ මාධ්‍යවේදී තරිඳු ජයවර්ධනගේ, "දේශ බන්ධු - වධක රාජ්‍යයක යුනිෆෝම් දෝංකාරය" වැනි පොත් අධ්‍යයනය කරලා බලන්න කියලා. එතකොට මේ යෝජනාව ගේන මහත්වරුන් ආණ්ඩු කරපු කාලයේ තිබුණු පොලීසියයි, අද පොලීසියයි අතර වෙනස හඳුනා ගන්න පුළුවන්, ජාතික ජන බලවේගයේ රජය මේ රටේ ස්වාධීන පොලීසියක් නිර්මාණය කළේ කොහොමද කියන එක හඳුනා ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වෙනකොට මේ රටේ පොලීසිය ස්වාධීනව, අපක්ෂපාතීව සහ කාර්යක්ෂමව විමර්ශන කටයුතු කරගෙන යමින් සිටිනවා. මෙච්චර කාලයක් පසුගිය රජයන් යටතේ දේශපාලන අනුග්‍රහය, රැකවරණය මත යැපුණු, ජීවත් වුණු සංවිධානාත්මක අපරාධකරුවන් දැන් අත්අඩංගුවට ගන්නවා. ඒ වාගේම මත්ද්‍රව්‍ය, මත්ද්‍රව්‍ය නිෂ්පාදනාගාර වටලමින් සිටිනවා. ඒ එක්කම බොහෝ දේශපාලනඥයන්ට ඔවුන්ගේ අතීත දේශපාලන ක්‍රියාකාරකම්, දේශපාලන මගඩි හේතුවෙන් චෝදනා නැඟෙමින් තිබෙනවා. අපට පේනවා, පොලීසිය ස්වාධීන වෙනකොට, මේ රටේ මෙතෙක් කල් දේශපාලනය කළ බොහෝ කණ්ඩායම්වලට චෝදනා එන එක දරාගන්න බැරිවෙනකොට තමයි මේ පදනම් විරහිත යෝජනා පාර්ලිමේන්තුවට ගෙනැල්ලා මේ සභාවේ කාලය කා දමන්නේ කියන එක. තමන් එක්ක එකතු වෙලා මේ රටේ කූට ව්‍යාපාර කළ අය, මත්ද්‍රව්‍ය ව්‍යාපාර කළ අය, සන්නද්ධ අපරාධවලට සම්බන්ධ වුණු අය නීතියේ රැහැනට අහුවෙනකොට තමන් ඉස්සර සම්බන්ධකම් පැවැත්වූ ඔවුන් බේරා ගැනීමේ වුවමනාවෙන්ද මෙවැනි යෝජනා ගේන්නේ කියලා අපට සැකයක් ඇති වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය විසින් ගෙන එන ලද මේ යෝජනාව සම්පූර්ණයෙන්ම මේ සභාවේ කාලය කා දැමීමක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මෙම ගෙන එන ලද යෝජනාව මේ රටේ පවතින නීතිමය තත්ත්වය මත කිසිදු නීතිමය වැරැද්දක් අනාවරණය වන කාරණයකුත් නොවෙයි. දයාසිරි ජයසේකර මහත්මයා කිව්වා, ඒගොල්ලන් හොඳ නැති හින්දා තමයි අපට බලය දුන්නේ කියලා. ඒගොල්ලන් නොවෙයි මේවාට අත ඉස්සුවේ ඔයගොල්ලන්. ඔයගොල්ලන් හොඳ නැති හින්දා තමයි අපට බලය දුන්නේ. ජාතික ජන බලවේගයේ රජය මේ රටේ පොලීසියේ, පොලිස් කොමිසමේ ස්වාධීනත්වය තහවුරු කරනවා, අපරාධ රාජ්‍යයක්ව පැවති මේ රටේ අපරාධ මර්දනය කිරීමට, මේ රට යහපත් රටක්, පොහොසත් රටක් විදියට නිර්මාණය කිරීමට අවශ්‍ය දේශපාලන නායකත්වය දෙමින්, ඒ දේශපාලන මැදිහත්වීම කරන බව ප්‍රකාශ කරමින්, ලබා දුන් අවස්ථාව සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු යූ.පී. අබේවික්‍රම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.51]

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය විසින් ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාව දිහා බැලුවාම අපට කල්පනා වෙන්නේ, මේ මහත්වරුන් තමන්ගේ ඉතිහාසය පුරා කටයුතු කළ ආකාරයයි.

[ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා]

විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය, නිදහස, අයිතිවාසිකම් තහවුරු කරනවා, කොමිෂන් සභා, ශ්‍රී ලංකා පොලිසිය වාගේ ආයතන ස්වාධීන කරන්න ඕනෑ වාගේ කාරණා පිළිබඳව මේ මහත්වරු කරන කජ්පරක් දේශනා, එහෙම නැත්නම් ඉදිරිපත් කරන කරුණු දිහා බැලුවාම අපට කියන්න තිබෙන්නේ එක දෙයයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේගොල්ලන්ගේ දේශපාලන ව්‍යාපාර හරහා ඉතිහාසය පුරාම මෙම ස්වාධීන ආයතනවලින් මේ රටේ ජනතාව වධාත්ම පීඩාවට පත් කරපු, ඒ වෙනුවෙන් කටයුතු කරපු අවස්ථාවල ඊට එරෙහිව කටයුතු කළ දේශපාලන ව්‍යාපාරයක වර්තමාන නියෝජිතයන් හැටියට ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න, මෙම කොමිෂන් සභාවල ස්වාධීනත්වය ආරක්ෂා කරන්න අපට අයිතියක්, උරුමයක් තිබෙනවා වාගේම අපි ඒ වෙනුවෙන් පෙනී සිටිනවා.

විශේෂයෙන්ම 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වා දුන්නාට පසුව ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට එහි මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් හඳුන්වා දීලා, එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බලාත්මක කරනු ලැබුවා. හැබැයි, 1978දී මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය බලාත්මක වුණාට 1994 වෙනකල් මේ රටේ හිටපු පාලකයින් කටයුතු කළේ කොහොමද කියලා ඔබ දැක්කා. දසදහස් සංඛ්‍යාත, නැත්නම් ලක්ෂ ගණනක් අපේ තරුණ තරුණියන් ඝාතනය කරලා, පාරවල් ගාණේ මරා දමපු තත්ත්වයක් දකින්නට තිබුණා. ඒ වාගේම අපේ නායකයෝ ඝාතනය කරපු වාතාවරණයක් තිබුණා. ඒ අවස්ථාවලදී මේ මූලික අයිතිවාසිකම් නීතිය ඒ ආකාරයෙන් ක්‍රියාත්මක වුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මට තව කාරණයක් මතක් වෙනවා. අපි නීතිය ඉගෙන ගන්නකොට අහපු කියමනක් තිබෙනවා, "කවර ආකාරයේ විශිෂ්ට නීතියක් වුණත්, ඒ නීතිය බලගන්වන, නැත්නම් ඒ නීතිය ක්‍රියාවට නංවන පාලකයන්ගේ තිබෙන ආකල්ප සහ ඔවුන්ගේ ස්වභාවය අනුව එම නීතියේ විශිෂ්ටත්වය හෝ එම නීතියේ ඵලදායීතාව තීරණය වෙනවා" කියලා. නීති පොත්වල කවරාකාරයේ නීති තිබුණත්, මේ රටේ හිටපු පාලකයින් කටයුතු කරපු ආකාරය ඉතිහාසය පුරාවටම ඔබ දැක්කා.

1994දී චන්ද්‍රිකා ආණ්ඩුව බලයට පත් වනකොට මේ නරුම ක්‍රමය -මේ විධායක ජනාධිපති ක්‍රමය - අවසන් කරන එකඟතාව මත අපි එම තරගයෙන් ඉවත් වුණා. ඉන් පසුව බලයට පත් වෙච්ච චන්ද්‍රිකා ආණ්ඩුව කටයුතු කරපු ආකාරයත් අපි දැක්කා. ඉන්පසුව 2001දී පරිවාස ආණ්ඩුව හදලා, ඒ මොහොත වනවිට අපට මන්ත්‍රීවරුන් දහදෙනෙක් ලබා දීලා තිබුණා. ඉතිහාසයේ පළමුවැනි වතාවට ඒ මන්ත්‍රීවරු දහදෙනා පාවිච්චි කරලා තමයි අපි ඒ පරිවාස ආණ්ඩුව හරහා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්න කටයුතු කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන 21ක් මේ වනකොට ගෙනැල්ලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ව්‍යවස්ථා සංශෝධන 21 අතරින් මේ රටේ ජනතාව වෙනුවෙන්, මේ රටේ ප්‍රගතිශීලීත්වය වෙනුවෙන් ගෙනාපු එකම ව්‍යවස්ථා සංශෝධනය තමයි, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. එවැනි සංශෝධනයක් වෙනුවෙන් අපි පෙනී සිටිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම ව්‍යවස්ථා සංශෝධනය හරහා අපි ස්වාධීන කොමිෂන් සභා හතක් පිහිටෙව්වා. ඊට පසුව 2001දී බලයට පත් වෙච්ච රනිල් ආණ්ඩුව එම ස්වාධීන කොමිෂන් සභා paralyze කරන තත්ත්වයට පත් කළා. 2005න් පස්සේ තත්ත්වය ගැන කථා කරලා වැඩක් නැහැ. ඊට පසුව රාජපක්ෂ පාලනය ඇවිල්ලා, 2010, 2015, 2019 කාලවල මේ ව්‍යවස්ථා සංශෝධන හරහා ඔවුන්ගේ අවශ්‍යතා සඳහා කටයුතු කළා. විශේෂයෙන්ම 1978දී ජේ.ආර්. ජයවර්ධන පාලන කාලයේ ජනාධිපති ධුර කාලය දීර්ඝ කරන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනාවා. ඒ වාගේම පාර්ලිමේන්තු කාලය දීර්ඝ කරන්න ව්‍යවස්ථා සංශෝධන ගෙනාවා. මහින්ද රාජපක්ෂ මහත්තයා 2010දී බලයට පත් වුණාට පසුව පුළුවන් තරම් කාලයක් බලයේ ඉන්න පුළුවන් ආකාරයට දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. ඒ සංශෝධනවලටත් මේ මහත්වරු උදවු කළා; අත එසවූවා. ඒ අය තමයි අද මේ ස්වාධීන කොමිෂන් සභා වෙනුවෙන් පෙනී සිටින්නේ. අපේ දේශපාලන ව්‍යාපාරය මේ ආයතනවල ස්වාධීනත්වය, ක්‍රියාකාරීත්වය වෙනුවෙන් හැමදාම පෙනී හිටපු, මහජනයාගේ අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කරපු ව්‍යාපාරයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන් දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් බලගන්වන ලද කොමිෂන් සභාවල ස්වාධීනත්වය දැන් තමයි මේ රටේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වෙමින් පවතින්නේ. ඉතිහාසයේ කවදාවත් අද වාගේ මේ සමාජයට දැනුමක් තිබුණේ නැහැ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ඇතුළු මේ තරම් කොමිෂන් සභා මේ රටේ තිබෙනවාය කියලා. ඉතිහාසයේ පළමුවැනි වතාවට මේ විමර්ශන කොමිෂන් සභාවලට තම බලය ක්‍රියාත්මක කිරීමේ නිදහස හිමි වීමත් එක්ක දැන් මේගොල්ලන් භීතියට පත් වෙලා ඉන්නේ. ඒ තත්ත්වය තුළ භීතියට පත් වෙච්ච මහත්වරුන් දැන් මේවාට ස්වාධීනත්වය ඕනෑ, මේවාට ස්වාධීනත්වය ඕනෑ කියලා කෑ ගහන තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා. මේක ස්වාධීනත්වය නොවෙයි.

අපේ නජිත් ඉන්දික මන්ත්‍රීතුමා කියනවා මට ඇහුණා, බලය තිබෙනකොට මොළය නැහැ, මොළය තිබෙනකොට බලය නැහැ කියලා වෙනත් මන්ත්‍රීවරයෙක් කිව්වාය කියා. මම හිතන විධියට මේගොල්ලන්ට මොළය නැත්තේ නැහැ. මේගොල්ලන්ට හැම දාම මොළය තිබුණා, තමන් වෙනුවෙන්, තමන්ගේ බලය වෙනුවෙන් මේ ආයතන පාවිච්චි කරන්න; මේවා දූෂිත ආයතන බවට පත් කරන්න. විශේෂයෙන්ම රාජපක්ෂ සමයේ මේ කොමිෂන් සභා බල රහිත කරලා තමන්ගේ ගෝලයන්ට, තමන්ගේ හෙංචයියන්ට, නැත්නම් තමන්ගේ දේශපාලන චන්දිහට්ටයන්ට මහජන මුදල්වලින් කෝටි-ප්‍රකෝටි ගණන් වියදම් කරන මහලු මඩම් බවට මේවා පත් කර තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් තමයි ඉතිහාසයේ පළමුවෙනි වතාවට මේ ස්වාධීන කොමිෂන් සභා තමන්ගේ බලයත් එක්ක රටට දැනෙන, මහජනයාට දැනෙන වැඩ කොටස ආරම්භ කරලා ක්‍රියාත්මක වෙමින් පවතින්නේ. එවැනි තත්ත්වයක් තුළ තමයි මේ විපක්ෂයේ මහත්වරුන් ඉතිහාසය පුරාම තමන් කළ වැරදිවල ආනුෂංගික ප්‍රතිඵල තමන් පසුපස එළවා ගෙන එනකොට භීතියට පත්ව මෙහෙම කථා කරන්නේ. විශේෂයෙන්ම පොලිස් කොමිෂන් සභාව මේ මොහොත වනවිට තම ව්‍යවස්ථාවට අනුකූලව රට තුළ ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් -දැනට එවැනි ක්‍රියාවක් සිද්ධ නොවුණු තත්ත්වයක් තුළ පවා- භීතියට පත් වෙලා තමයි මම හිතන විධියට ඔවුන් මේ යෝජනාව ගෙනෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව මේ හැම කොමිෂන් සභාවක්ම තමන්ට නියමිත බලය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබෙනවා.

විශේෂයෙන්ම ඔබතුමන්ලාට මතක ඇති, රනිල් වික්‍රමසිංහ මහතා අරගළයෙන් පසුව 8වන විධායක ජනාධිපති හැටියට බලය ලබා ගෙන මැතිවරණ කොමිෂන් සභාවේ බලය අභියෝගයට ලක් කරපු හැටි. ඔහුගේ පක්ෂයෙනුත් මැතිවරණයට ඉදිරිපත් වුණා. විශේෂයෙන්ම පළාත් පාලන මැතිවරණය පවත්වන්නේ නැති නිසා අධිකරණයටත් ගියා. ඔබතුමන්ලාට මතක ඇති, පළාත් පාලන මැතිවරණය පවත්වන්න අධිකරණ තීන්දුවක් අනුව දින

නියම වෙලා තිබියදී, මැතිවරණය පවත්වන්නේ නැතුව ඔහු තමන්ට අවශ්‍ය විධියට සියලු බලතල අත්තනෝමතික විධියට පාවිච්චි කළ හැටි. ඒ කාල වකවානුවේ පොලිස් ස්ථානාධිපතිවරු පත් කළ ආකාරයත් ඔබතුමන්ලාට මතක ඇති. හිටපු පොලිස්පතිවරයා කියපු ආකාරයට, පත් කරපු පොලිස් ස්ථානාධිපතිවරුන් 184කින්, 182ක්ම ආසන සංවිධායකවරු, එහෙම නැත්නම් ජනතාවගෙන් ගුටි කා පලා ගියපු පාලකයන්ගේ නියෝජිතයෝ. ඒ කට්ටියත් එක්ක එකතු වෙලා 8වන විධායක ජනාධිපති හැටියට රනිල් වික්‍රමසිංහ මේ කොමිෂන් සභාවලට අත් කර දී තිබුණු ඉරණම ඔබ දැක්කා.

විශේෂයෙන්ම ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකාවක් වන රේණුකා ඒකනායක පසුගිය දිනෙක ඉල්ලා අස්වී තිබුණා. ඇය හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ හිටපු ලේකම්ගේ බිරිඳ. ඒ අනුව බැලුවාම එම ආයතනවල ස්වාධීනත්වයක් පැවතුණාද කියන එක මම හිතන විධියට මේ රටේ ජනතාවට පැහැදිලි වෙයි. ඒ වාගේම ඒ කාලයේ මැතිවරණ කොමිෂන් සභාව මඟින් මැතිවරණය පවත්වන්න අවශ්‍ය සියලු කටයුතු කර තිබියදී මුදලුත් නැහැ, මැතිවරණයකුත් නැහැ කියලා කලිසම හැලි හැලී රනිල් වික්‍රමසිංහ කියපු හැටි මේ රටේ ජනතාවට මතක ඇති. නමුත් අද වනවිට පළමුවෙනි වතාවට මේ ආයතනවලට බලය ලැබී තිබෙනවා. අපි ඒ වෙනුවෙන් පෙනී සිටිනවා. මේ හැම ආයතනයක්ම ක්‍රියාත්මක වෙන්නේ මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන්, මේ රටේ ජනතාවගේ නිදහස වෙනුවෙන් කියන කාරණය මතක් කරමින්, මට මේ කාලය ලබා දීම සම්බන්ධව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.00]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට අද මෙම යෝජනාව ගෙන එන්නට ප්‍රධාන වුණු කරුණ මොහොතකට කල් ගිහින් තිබෙනවා. දැන් මේ අය කියනවා, එහෙම එකක් නැහැ; හීනෙන් දැකලා කියලා. හැබැයි, ඉතින් හීනෙන් දැක්කා වාගේ තමයි. මොකද, අපි විශේෂ කාරක සභාවක් ඉල්ලා සිටියා, පසුගිය දවස්වල. එම විශේෂ කාරක සභාව ලබා දෙන්න අද දවසේ එකඟතාවට එනකොට, අන්න අමාත්‍ය මණ්ඩල සංශෝධනයකුත් ඇවිල්ලා. පන්නපු කන්ටේනර් 323 සම්බන්ධව විමර්ශනයට අපි විශේෂ කාරක සභාවක් ඉල්ලුවා. අද එම විශේෂ කාරක සභාව පත් කරන්න මෙහෙන් අනුමැතිය ලැබෙනකොට, කැබිනට් මණ්ඩලයේ සංශෝධනයකුත් ඇවිල්ලා. ඇති ඒකෙන් බේරුණා, අගමැතිතුමිය. අගමැතිතුමිය නැතුව ගිහිල්ලා පත් වෙන්න තිබුණු එකක්, ඊට ඉස්සර වෙලා මේක ගෙනා නිසා අග්‍රාමාත්‍යතුමිය බේරී තිබෙනවා වාගේ තමයි අපට තේරුම් යන්නේ.

විපක්ෂය විධියට අපි ගෙනෙන කරුණු කාරණා තුළ බොහෝ දේවල් සිද්ධ වෙනවා. අපි විශ්වාස භංග යෝජනාවක් ගෙනෙනකොට මෙතුමන්ලා අහනවා, ඕක ගෙනාවාට වැඩක් තිබෙනවාද, numbers තිබෙනවාද කියලා. හැබැයි, numbers අවශ්‍ය නැහැ. අපි විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා, කෙහෙළිය රඹුක්වැල්ල මහතාට විරුද්ධව. අපිට ඒක දිනන්න බැරි වුණා. හැබැයි, අද කෙහෙළිය රඹුක්වැල්ලට අත් වී තිබෙන ඉරණම මොකක්ද? අපි මෙවරත් විශ්වාස භංගයක් ගෙනෙන්න යනකොට, මෙතුමන්ලා දැන ගත්තා වැඩේ මොකක්ද කියලා. ඒ නිසා එම විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න දෙන්නේ නැතුව හැංගුවා. එහෙම කරලා මේ යෝජනාව ගෙනාවාම මෙතුමන්ලා කියනවා, මේක ගෙනාවේ හීනෙන් දැකලා ලු. අපි මේ යෝජනාව ගෙනා නිසා පොලිස් කොමිසමට අදාළව ගහන්න ගිය ගැසට් එක ප්‍රමාද වෙලා තිබෙනවා. මේක සෙල්ලම් කාරණයක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා දැන් ක්‍රමානුකූලව යන්න උත්සාහ දරන්නේ කොතැනටද? මහින්ද රාජපක්ෂ මැතිතුමා කිව්වා, අපි බයියෝ කියලා. බයියෝ හැටනව ලක්ෂයක් තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමන්ලා ආරක්ෂා කරගෙන, පොහොට්ටුව රැකගෙන හිටියේ. ඒ බයියෝ මේ සැරේ මැතිවරණයේදී ඉස්සරහට "ජෙ" අකුර දාගෙන "ජෙබයියෝ" වුණා. ඒ ජෙබයියෝ දැන් පොඩ්ඩ පොඩ්ඩ "ජෙ" අකුර මකනවා. මොකද, "ජෙබයියෝ වෙලා කර ගත්තු ගොන්කම" කියලා. "අපි රැවටුණා, අපි අන්ධ වුණා, අපි "ජෙ" අකුරක් ඉස්සරහට දමාගෙන ජෙබයියෝ වෙලා කරගත්තු මෝඩකම කියනවා. රටත් ඉවරයි. අපි රැවටුණා කියන එක අපට අමු අමුවේම පේනවා කියමින් "ජෙ" අකුර මකමින් යනවා, ඒ බයියෝ ටික; හැටනව ලක්ෂයේ ඒ කොටස. ඒ නිසා මේ කට්ටිය දැන් බලනවා ජෙබයියෝ ටික නැති වුණාට පස්සේ මොකද කරන්නේ කියලා. දැන් පේනවා නේ රාජපක්ෂවරුන්ට ගහන ගැහිල්ල. මොකද, රාජපක්ෂලා ගහලා වැට්ටුවොත් තමයි ජෙබයියෝ ටික රැකෙන්නේ. හැබැයි, ඒකෙනුත් රැකගන්න බැහැ. ඒ නිසා මෙතුමන්ලා උත්සාහ කරනවා, "දැන් වැඩේ වරදින්නයි යන්නේ, දැන් එහෙනම් අර පරණ සෙල්ලමට යන්න ඕනෑ" කියලා. පොලිස් රාජ්‍යයක්, පොලීසියට සහ දේශපාලනයට යට වෙච්ච රාජ්‍යයක් නිර්මාණය කර ගන්න ඕනෑය කියන තැනට යනවා. ඒකට අවශ්‍ය ප්‍රධාන තැන පොලීසිය.

මගේ දේශපාලනය ආරම්භ කළේ, ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයකු විධියට. මැතිවරණයක් තිබෙන කාලයක මම රැස්වීමකට ගිහිල්ලා එනකොට මාත් එක්ක ගිය වයසක මාමා කෙනෙකුට ඔළුව පැළෙන්න ගැහුවා. මගේ මාමා කෙනෙක් නොවෙයි, දේශපාලන හිතවතෙක්. නමුත් මම "මාමා" කියලා කථා කරන්නේ. ලේ පෙරාගෙන හිටපු මාමාට පොලීසියට යන්න කියලා, අනෙක් කට්ටිය බස්සලා මමත් පොලීසියට ගියා. මම පොලීසියට යනකොට ගුටි කාපු කෙනා පොලීසියේ පැමිණිල්ල ලියන තැන ඉස්සරහා කොන්ක්‍රීට් බංකුවේ වාඩිවෙලා ඉන්නවා. ගහපු කෙනා - ඒ මන්ත්‍රීවරයා - ඇවිල්ලා සරම කරේ තියාගෙන බැණ බැණ ඉන්නවා. OIC මහත්තයා reception එක ඉස්සරහා තිබෙන පුටුවේ වාඩිවෙලා ඉන්නවා. ගහපු කෙනා reception එක ළඟ, සරම කරේ තියාගෙන - බීලා හිටියේ - බිත්තියට හේත්තු වෙලා, කුණුහරුපෙන් බැණ බැණ ඉන්නවා, පැමිණිල්ල ලියන්න දෙන්නේ නැතිව. එයාගේ පැමිණිල්ල ලියන්න කියනවා. ඒ කියන්නේ ගහපු කෙනාගේ. OIC මහත්තයා පුටුවේ වාඩිවෙලා ඉන්නවා. OICට නැඟිටින්න කොන්ද පණ තිබුණේ නැහැ. දෙමළ චිත්‍රපටවල වාගේ. මම තුෂ්ණීම්භූත වෙලා බලාගෙන හිටියා මොකක්ද දැන් කරන්නේ කියලා. අපි රැකවරණය බලාගෙන පොලීසියට ගියා. පොලීසිය ඇතුළේ තනිකරම ඒකාධිපති තත්ත්වයක්. පොලීසියේ අය ඔක්කෝම පැත්තකට වෙලා හිටියේ. එක පොලිස් නිලධාරියකුට විතරයි කොන්ද තිබුණේ, කට වහගනින් කියලා කියන්න. ඊට පස්සේ එතැන හිටපු IP මහත්තයා ඇවිල්ලා ඔහු උඩ තට්ටුවට එක්කගෙන ගියා කට වහගන්න කියලා. එහෙම පොලීසි තිබුණේ. මම OIC මහත්තයාට ගිහිල්ලා කිව්වා, "අපට පැමිණිල්ල ලියන්න ඕනෑ නැහැ, අපි යනවා" කියලා. මගේ ඒ වචනයට එතුමාට නැඟිට්ටුණා. මම හිතුවේ නැඟිටලා ආපු විධියට අර කෙනාට කන පැළෙන්න ගහයි කියලා.

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

හැබැයි, දොර තල්ලු කරනකොටම OIC ගේ බුද්ධියට ආවා, "මම මෙහෙට මේකේ OIC වෙන්නේ නැහැ, මට ගෙදර යන්න වෙනවා, නැත්නම් වෙන පොලීසියකට යන්න වෙනවා" කියලා. ඒ නිසා ආපහු ගිහිල්ලා වාඩි වුණා, අර කෙනාට වචනයක්වත් කියන්නේ නැතිව. ඔබතුමන්ලා ආයෙත් නිර්මාණය කරන්න හදන්නේ අන්න ඒ පොලීසිය. ඒකයි අපි මේ කියන්නේ.

ඔබතුමන්ලාගේ තුන් හතර දෙනෙක් විපක්ෂයේ ඉන්න කාලයේ ඔය දේවල්වලට තමයි පාර්ලිමේන්තුවේදී කට කැඩෙනකම් කෑ ගැහුවේ. ස්වාධීන කොමිෂන් සභා ගෙනෙද්දී ඒවාට විරුද්ධ වෙනකොට ඔබතුමන්ලාගේ කණ්ඩායමත් පලු යන්න බැණ්ණා. හැබැයි, අද ඔබතුමන්ලාටත් ජෙබයියෝ මැකිලා ගිහින් බයියෝ වෙන්න යන එක වළක්වා ගන්න, දේශපාලනය ආරක්ෂා කර ගන්න පොලීසියේ රැකවරණය අවශ්‍ය වෙලා තිබෙනවා. දේශපාලන අතකොළුවක් බවට පොලීසිය පත් කර ගැනීමේ වුවමනාව මත කටයුතු කරනවා. මුලින්ම ස්වාධීන කොමිෂන් සභාවලට මුට්ටිය දමලා බැලුවා. ඒ නිලධාරින් භය කරලා, තර්ජනය කරලා ඒ අය ලවා තමන්ගේ වැඩ කරගන්න කටයුතු කරනවා. මේ කොමිෂන් සභාවල ඉන්න නිලධාරින්ට අපි කියනවා කොන්ද කඩා ගන්න එපා කියලා. මේ කොමිෂන් සභා ටික ගෙනාවේ මේ රටේ ජනතාවගේ උත්තරීතර ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නයි. ඒ කොමිෂන් සභාවල නිලධාරින් විධියට පත් වෙච්ච ඔබතුමන්ලා මේ රටේ මුර දේවතාවුන්; මේ රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න පත් වෙච්ච නිලධාරින්. ඒ නිසා ඔබට ලැබිච්ච බලතල, මේ රටේ දේශපාලනයට වහල්වෙලා, දේශපාලන බියගුළුකමට පාවා දෙන්න යනවා නම් ඒක තරම් විශාල ද්‍රෝහීකමක් තවත් නැහැ කියන එක මේ රටේ ස්වාධීන කොමිෂන් සභාවල ඉන්න නිලධාරි මහත්වරුන්ට අපි මතක් කරන්න කැමැතියි.

ඔබට දී තිබෙන්නේ මේ රටේ ලක්ෂ දෙසියවිස්සක් වන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය තහවුරු කිරීමේ බලය. ඒක ඔබතුමන්ලා තුට්ටුවට දමලා, කවුරුහරි ඒකාධිපතියෙකු බල තණ්හාවෙන් කරන චෝදනාවකට යටපත් වෙලා තමන්ට තිබෙන බලය නීත්‍යානුකූලව වෙනත් කෙනෙකුට පවරන්න හදනවා නම් ඒක මේ රටේ ලක්ෂ දෙසියවිස්සකට කරන ද්‍රෝහීකමක්. ඒ නිසා අපි ගෞරවයෙන් මේ කාරණය මතක් කරනවා. මේ රටේ ස්වාධීන කොමිෂන් සභාවලට පත් වෙච්ච නිලධාරින් වන ඔබතුමන්ලා මේ රටේ මුර දේවතාවුන් වහන්සේලා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන ස්වාධීන කොමිෂන් සභාවල ආරක්ෂාව තහවුරු කිරීම වෙනුවෙන් පත් කළ නිලධාරින් ඔබතුමන්ලා. ඔබතුමන්ලා මේ රටේ දේශපාලන අතකොළු බවට පත්වෙලා, තාවකාලිකව අවුරුදු හතරකට පහකට පත්වෙලා එන දේශපාලනඥයන්ගේ හිතසුව පිණිස තමන්ට භාර වුණු වගකීම් ඉෂ්ට කරන එක මඟ හරින්න එපා කියන කාරණය අපි මතක් කරන්න කැමැතියි.

ඔබතුමන්ලා ඇහුවා, "අපි කොහේද පොලීසියට බලපෑම් කරලා තිබෙන්නේ?" කියලා. පොලීසියෙන් කළුතර දිස්ත්‍රික්කයේ කසිප්පු අල්ලාගෙන charge sheet දැම්මා කියලා, call කරලා බැණලා ඒ නිලධාරියා මාරු කරලා යැව්වේ කාගේ කාලයේද? ගිය සතියේ මොනරාගල දිස්ත්‍රික්කයේ තිබෙන පොලීසියකට පැනලා යකා නැටුවේ කවුද?

ඔබතුමන්ලාත් දැන් ක්‍රමානුකූලව පරණ සුපුරුදු තැනට එන්න හදනවා. අර රාජපක්ෂලා ඇති කරපු, මේ රටේ ස්වාධීන කොමිෂන් සභා ඇති වෙන්න කලින් පොලීසිය තිබුණු තැනට පොලීසිය ගෙනෙන්න ඔබතුමන්ලා කැස කවනවා කියන එක අපට පැහැදිලිව පෙනෙනවා. මේ රටේ ස්වාධීන කොමිෂන් සභා ඇති කරපු හින්දා තමයි, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරපු හින්දා තමයි පාපිසි යට ඉන්න ඕනෑ අයත්, පොල් ලෙලි වාගේ ගහගෙන ආපු අයත් අද පාර්ලිමේන්තුවේ ඉන්නේ. මේ කොමිෂන් සභා නොතිබුණා නම් එහෙම වෙන්නේ නැහැ.

ඒ කාලයේ ඔබතුමන්ලාට කොයි තරම් දේවල් වුණාද? දේශපාලනය කරපු ජේවීපී එකේ පරණ කට්ටිය ඒ ගැන දන්නවා. හන්දියක රැස්වීමක් කරන්න දුන්නාද? පොලීසියෙන් ඇවිල්ලා ඔබතුමන්ලාට ගහලා එළෙව්වේ. එහෙම යුගයක් තිබෙනකොට ඔබතුමන්ලාට දේශපාලනය කරන්න අවශ්‍ය ආරක්ෂාව, රැකවරණය ලබා දුන්නේ මේ ස්වාධීන කොමිෂන් සභා ටික. ඒ කොමිෂන් සභා ටිකට පින් සිද්ධ වෙන්න තමයි ඔබතුමන්ලා අද පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ, ඔබතුමන්ලා අමාත්‍යාංශ දරන්නේ, ආණ්ඩු දරන්නේ. ඒ නිසා ඒවා තවත් ඉස්සරහට යා යුතුයි. මේ රට මෙතැනට ගෙනෙන්න විශාල ප්‍රමාණයක් ලේ හලලා තිබෙනවා. මේ රටේ ජීවිත දහස් ගණනක් නැති වෙලා තිබෙනවා, දේශපාලනය හරහා. දේශපාලනයට යටපත් වෙච්ච පොලීසි නිසා, සාධාරණයක් ඉෂ්ට නොවුණු නිසා දහස් ගණනක් මිනිස්සු ලේ හලලා තිබෙනවා; රැකියා අහිමි කරගෙන තිබෙනවා. ඒ ඔක්කෝම ඇතුළේ මේ කොමිෂන් සභා නිසා අද වෙනකොට රට යම්කිසි ප්‍රමාණයකින් මෙතැනට ගෙනැල්ලා තිබෙනවා.

ඔබතුමන්ලා කියනවා, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා, දහඅටවන සංශෝධනය ගෙනාවා, දහනවය ගෙනාවා, විස්ස ගෙනාවා, විසිඑකත් ගෙනාවා කියලා. ඔය ඔක්කෝම ගෙනාවා. විස්ස, විසිඑක ගෙනෙනකොට නම් අපි පාර්ලිමේන්තුවේ හිටියා. විසිවන සංශෝධනය ගෙනෙනකොටත් අපි මේ වාගේම කථා කළා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ මේ කොමිෂන්වල බල වැඩි කරන්න. එතකොට දහනව වන සංශෝධනයට අත උස්සපු කට්ටියට චෝදනා කරන්න ඔබතුමන්ලාට බැහැ. දහහත්වන සංශෝධනයෙන් ඇති කරලා දහඅටෙන්, දහනවයෙන් ඒවායේ බලය වැඩි කරලා ගෙනාවේ. විසිවන සංශෝධනය ගෙනාපු කෙනාට මොකද වුණේ? මේවාට අත තියන්න ගිහින්, විසිවන සංශෝධනය ගෙනැල්ලා අවුරුද්දක් ඉන්න පුළුවන් වුණාද?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගුටි කාලා ගෙදර ගියේ.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඔව්. ගුටි කාලා ගෙදර ගියේ. ඉන්න තැන හොයා ගන්න බැරිවුණා. මුහුදට පැනලා ගියේ. මේවා පිළිබඳව සත්‍යයක් තිබෙනවා. විශ්වයෙන් මේවාට උත්තර දෙනවා. ඔබතුමන්ලාට බලය ලැබෙනකොට ඒකෙන් උන්මාදයට පත් වෙලා, උමතු වෙලා මේ වාගේ දේවල් කරන්න හදලා, මේවා තුට්ටුවට දාලා කටයුතු කරන්න හදන්න එපා. මේවාට උත්තර දෙන්න කට්ටියක් ඉන්නවා. ඒ නිසා තමයි සමහර අයට මුහුදලට පැනලා යන්න සිද්ධ වුණේ. ඒකාධිපතිත්වය නිර්මාණය කරලා, තමන්ට ඕනෑ විධියට, තමන්ගේ කටින් පිටවන වචන චක්‍රලේඛ සේ සලකා කටයුතු කරන්න කියලායි කිව්වේ. හැබැයි, චක්‍රලේඛ ගහන්න ගිය මිනිහාට, කටින් පිටවන වචන චක්‍රලේඛ සේ සලකන්න කියපු මිනිහාට අවසානයේ මුහුදට පැනලා ගිහින් තමයි ජීවිතය රැක ගන්න සිද්ධ වුණේ. ඔබතුමන්ලාටත් මේ පොදු න්‍යාය එහෙමමයි.

ඇමතිතුමා කිව්වා, ආබාධිත පොලිස් නිලධාරි මහත්වරු රාජකාරියට යොදවා තිබෙන බව. ඒ වාගේම ආබාධිත නිලධාරි මහත්වරු විශාල ප්‍රමාණයක් transfer කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]* බොරු නොවෙයි. ආබාධිත නිලධාරින් නිවස ආසන්නයේ තිබෙන පොලීසියකට රාජකාරි කරන්නට,- *[බාධා*

*කිරීමක්]* ගරු ආනන්ද විජේපාල ඇමතිතුමනි, ඔබතුමා උත්තර දුන්නා නේ. මම කියන දේ බොරු නම් පොලීසියේ කට්ටියගෙන් අහලා බලන්න. මම මේ කියන කථාව පොලීසියේ නිලධාරි මහත්වරු දන්නවා. ආබාධිත වීම නිසා නිවසට ළඟ පොලිස් ස්ථානයේ සැහෙන කාලයක් සේවය කරගෙන හිටපු පොලිස් නිලධාරි මහත්වරු විශාල ප්‍රමාණයක් අද වෙනකොට ඔබතුමන්ලා transfer කරලා තිබෙනවා. දැන් ඒ කට්ටියට ජීවන රටාව හදා ගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. දැන් හුරු වෙලා තිබෙන ක්‍රමය සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඔබතුමන්ලා රාජකාරිමය වශයෙන් කරන ඒවාට අපි බාධා කරන්නේ නැහැ. හැබැයි, ආබාධිත වෙලා නම් ඕනෑම කෙනෙකුට ඒ කාරණය නිසා එතැන ඉන්න දෙන්න ඕනෑ. ඇයි ඒ අවස්ථාව මෙතුවක් කාලයක් දීලා තිබුණේ? එසේ දී තිබුණු දෙයක් ඔබතුමන්ලා වෙනස් කරන්න හදනවා නම් ඒක විශාල වැරැදි කාර්යයක්. මොකද, ඒ සමහර අය රාජකාරියේ යෙදී ඉන්නකොට ආබාධිත වුණු අවස්ථා තිබෙනවා. සමහර අය ස්වාභාවිකව, සෞඛ්‍ය තත්ත්වය නිසා ආබාධිත වුණු අවස්ථා තිබෙනවා. හැබැයි, රාජකාරි වශයෙන් ඉන්නකොට ආබාධිත තත්ත්වයට පත් වෙච්ච කට්ටියටත් ඔබතුමන්ලා මේ තත්ත්වය උරුම කර දී තිබෙනවා.

ඔබතුමන්ලා මේ transfer කරන්න හදන්නේ ඇයි? අද සිවිල් ආරක්ෂක බලකායේ කමිටු පිහිටුවන්න ගමට එනකොටත් "මේ කට්ටියගේ නම් ටික දාන්න" කියලා අපට OIC මහත්තයා පණිවුඩ එවා තිබෙනවා. අන්න ඒ තත්ත්වය ඇති කර ගන්න නේද ඔබතුමන්ලා මේ හදන්නේ? "ගමේ සිවිල් ආරක්ෂක කමිටු හදනකොට මෙන්න මේ කට්ටිය පත් කරන්න කියලා අපට පණිවුඩ එවලා තිබෙනවා, ඒ නිසා මේ කට්ටිය අනුමත කරන්න ඔබතුමා කැමැති වෙන්න" කියනවා. එහෙමත් සීමිත තැනක විතරයි OIC මහත්තයා එහෙම කිව්වාම කෙනෙක් නැගිටලා "නැහැ, අපි ඒකට කැමැති නැහැ" කියන්නේ. ඒ අභියෝග කරන්නේ ගමේ බොහොම සීමිත පිරිසක්. ගමේ අය OIC මහත්තයාට හයයි. මොකද හේතුව? නඩුත් හාමුදුරුවන්ගේ, බඩුත් හාමුදුරුවන්ගේ වාගේ නේ. උසාවියට යනතුරු කෙරුම්කාරයා පොලීසිය. උසාවියට යනකොට ගොරකා, දඩ මස් කරලා යවන්නත් දන්නවා.

ඔබතුමන්ලා පසුගිය දවස්වල කිව්වා, අපි මත්ද්‍රව්‍ය මෙච්චර කිලෝ ගණන් ඇල්ලුවා කියලා. හැබැයි, ඔබතුමන්ලා හොඳටම දන්නවා, -පොලීසියේ මහත්වරුත් දන්නවා. මේක වැරැදි විධියට මම දකින්නේත් නැහැ. සමහර විට මේක ඒ කට්ටිය මැඬලන්න කරන උත්සාහයක් වෙන්න පුළුවන්- අයිස් ඇල්ලුවාම අජිනොමොටෝ දානවා. අහුවෙන්නේ මිලිග්‍රෑම් ගාණක්. නමුත්, ජාවාරම විධියට පෙන්වන්න ඕනෑ නිසා අජිනොමොටෝ දාලා ජාවාරම කරන විධියට උසාවියට දානවා. කමක් නැහැ. ඒ කට්ටිය ඒකෙන්- *[බාධා කිරීම්]* ඉස්සර නොවෙයි දැන්. දැන් වෙන්නේ. කුඩු අහු වුණාම බෙහෙත් කරල්වල කුඩු ටික අරගෙන දාලා, කුඩු ජාවාරමට තිබෙන්න ඕනෑ ප්‍රමාණය හදලා දානවා. ඒක අපේ පොලීසියේ මහත්වරු සද්භාවයෙන් කරනවා නම් ඒකට අපි ගරු කරනවා. මොකද, ඒ හරහා ඒ කට්ටිය හිරේ දාලා කාලයක් තිස්සේ හිර ගෙදර තියන්න ඕනෑකමට ඒක කරනවා නම් ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒ වාගේම කෙනෙකුගෙන් පළි ගන්නත් ඒකම පොලීසියට කරන්න පුළුවන්කම තිබෙනවා. බැරිකමක් නැහැ.

ඒ නිසා ඔබතුමන්ලා මේ බලපෑම් කරලා, බය කරලා පොලීසිය අතට ගන්න හදන්නේ ගිලිහිලා යන ජන වරම, ජන මතය පොලීසිය හරහා නැවත ආරක්ෂා කර ගන්නයි කියන එකත් මතක තියා ගන්න. පොලීසිය හරහා ඒක කර ගන්න ගියාට ඔබතුමන්ලාට කවදාවත් එහෙම රැකෙන්න හම්බ වෙන්නේ නැහැ. ඒ කාල සීමාව දැන් පැනලා ඉවරයි; ලෝකය ප්‍රජාතන්ත්‍රවාදී අරගල ඇති වන තැනට ඇවිල්ලා ඉවරයි. අද රටේ බහුතරයක් දෙනා ජනමාධ්‍යවේදියෝ. මොකද, හැම කෙනෙකුගේම අතේ mobile phone එකක් තිබෙනවා. අද මිනිස්සු නැඟී සිටිනවා. ඉස්සර වාගේ නොවෙයි. හැමෝම අද ජනමාධ්‍යවේදීන් බවට පත් වෙලා. ඒ නිසා පොලීසිය පාලනය කරලා, යටපත් කරලා, OIC මහත්තයා අතට අරගෙන ගමේ මිනිසුන් යටපත් කරගෙන ඡන්ද පදනම ආරක්ෂා කරගෙන යන්න නම් මේ හදන්නේ, ආණ්ඩුව ගන්නා ඒ උත්සාහය බොහොම පහත් මට්ටමේ තිබෙන එකක් කියලා තමයි කියන්න තිබෙන්නේ.

අනෙක් පැත්තෙන් ඔබතුමන්ලා කිව්වා, "අපි කොහේවත් තැනක බලපෑම් කරලා නැහැ. රනිල් වික්‍රමසිංහ අත්අඩංගුවට ගත්තු එක ගැන අපි දන්නේ නැහැ" කියලා. හැබැයි, යූටියුබ් මහත්වරු ජේන කියනවා. බෙර ගහලා ආවේශ වෙලා, "ආ ආ.. දැන් මෙහෙමයි, මෙහෙමයි" කියලා, පසුව කියනවා, "ඇප ඇප ඇප ඇප!" කියලා. ආවේශයෙන් එහෙම කියනවා, දෙවැනි සැරේ. නමුත් පළමුවෙනි සැරේ ගැම්මෙන්, බොහොම උජාරුවෙන් කියනවා, "අනිවාර්යයෙන් අත්අඩංගුවට ගන්නවා, එහෙම ගත්තේ නැත්නම් මම මේක අයින් කරලා දානවා" කියලා. දෙවැනි පාර බෙර ගහලා ආරූඪයෙන් කියනවා, "ආ ඔව් ඔව්, ඇප ඇප ඇප! ඇප හම්බ වෙනවා!" කියලා. එහෙම කියන තැනට කොහොමද පත් වුණේ ඔබතුමන්ලා කියන ඔය ස්වාධීනත්වය තිබෙනවා නම්? ඒක වුණේ කොහොමද කියලා ඔබතුමන්ලා දන්නේ නැත්නම්, කොහොමද අර යූටියුබ් කරන කෙනෙක් එහෙම කියන්නේ? එහෙම වෙන්නේ ඔබතුමන්ලා නීතියේ ස්වාධීනත්වය ආරක්ෂා කරන හින්දාද, දේශපාලන බලපෑමක් නැහැ කියලා ඔබතුමන්ලා කියන හින්දාද? ඒ නිසා බොරු කරන්න හදන්න එපා, ඇමතිතුමා. උගුරට හොරා බෙහෙත් කන්න බැහැ. මේ කරන දේවල් හැම දෙයක්ම මේ රටේ ජනතාවට දැනෙනවා. ඒ නිසා මේ රටේ ස්වාධීන කොමිෂන් සභාවලට පත් වෙච්ච නිලධාරීන්ට අපි බොහොම ගෞරවයෙන් කියනවා, ඔබතුමන්ලා ස්වාධීනව කටයුතු කරන්න කියලා.

ඒ වාගේම ආණ්ඩුවේ ඔබතුමන්ලාටත් කිව යුතු කාරණයක් තිබෙනවා. ඔබතුමන්ලා විපක්ෂයේ සිටියදී මේ රටේ ස්වාධීන කොමිෂන් සභා ස්ථාපනය කරලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවේ හඬ නැඟුවා. විශේෂයෙන්ම අනුර කුමාර දිසානායක මැතිතුමා, බිමල් රත්නායක මැතිතුමා, විජිත හේරත් මැතිතුමා ආදී අය විපක්ෂයේ ඉඳගෙන විශාල භූමිකාවක් ඉෂ්ට කරලා, ඒ වෙනුවෙන් හඬ නඟලා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම වෙනුවෙන් ඇති කර ගත් කුලුනු තමයි මේවා. බලයට ඇවිත් මාස හයක්, අවුරුද්දක් යනකොට ඔබතුමන්ලාට ඒ කුලුනු ටික අමතක වෙනවා. ඒවා අමතක වෙන තැනට යන්න දෙන්න එපා. "දේශපාලන බලය ගත්තාම මොළේ නැහැ" කියන කථාව තමයි ඔය තහවුරු වෙන්නේ. ඔබතුමන්ලා කියනවා, "අපට මොළේ තිබෙනවා" කියලා. නමුත් මොළේ නැත්තටම නැති වෙලායි තිබෙන්නේ. දැන් බලයෙන් උමතු වෙලා මොළේ යටපත් වෙලා; විනාශ වෙලා. ඔළුවවත් තිබෙනවාද කියලා පරීක්ෂා කර ගන්න. ඔළුව උඩද දන්නේ නැහැ වාඩි වෙලා ඉන්නේ. ඒ නිසා හරියට පරීක්ෂා කර බලන්න කියන කාරණය අපි ඔබතුමන්ලාට කියනවා. දේශපාලනඥයාගේ තත්ත්වය ඒකයි. "මොළේ තියෙන කොට බලය නැහැ, බලය තියෙන කොට මොළේ නැහැ" කියන කථාව රටේ නිකම්ම හැදිච්ච කථාවක් නොවෙයි නේ. ඒක හදපු එකා මොකා වුණත්, කට කහනවට කියපු එකක් වුණත් ඒක තවමත් ලෝකයේ පෙනෙන්නට තිබෙන ධර්මතාවක්. ඒක ඔබතුමන්ලාගෙනුත් හොඳින්ම ඔප්පු වෙනවා. ඔබතුමන්ලා අද පත් වෙලා තිබෙන තත්ත්වය එක්ක සහ කියන කතන්දර එක්ක බැලුවාම පෙනෙනවා, එදා කියපු කථා ඔක්කෝම අද වෙනස් වෙලා තිබෙන බව.

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ යෝජනාව මොකක්ද? සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක්. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ගෙන ආපු ඔබතුමා මේ ගරු සභාවේ ඉන්නම ඕනෑ ද? ඔබතුමාට මේ යෝජනාව ඉදිරිපත් කරලා ගිහින් එළියේ සිට මේ කථාවලට ඇහුම්කන් දෙන්න බැරිද? හැබැයි, පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ගෙනාවොත්, ඒකට උත්තර දෙන්න අවසානයේ අවස්ථාවක් එන හින්දා සභාවේ රැඳී ඉන්න ඕනෑ. පසුගිය දවසක මම සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කරලා ගිහින් පුස්තකාලයේ හිටියා. මෙන්න ඇමතිතුමා නැඟිටලා බණිනවා, "යෝජනාව ගෙනාපු මන්ත්‍රීත් මෙතැන නැහැ" කියලා. ඒ මන්ත්‍රීතුමා මෙතැන ඉන්න ඕනෑ කියලා නීතියක් තිබෙනවාද? සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනාවාම මෙතැන ඉන්න ඕනෑ කියලා එකක් නැහැ. *[බාධා කිරීමක්]* එයාට ලණුව දීලා නොවෙයි. ඔබතුමන්ලාගේ ඇමතිතුමාට කවුරු හරි ලණුව දීලා. මොකද, උමතු වෙලා ඉන්නේ, පිස්සු වෙලා ඉන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ගෙනාවා. අවසානයේ පිළිතුරු කථාව කරන්න ඕන නිසා අවසන් වනකල් මම මෙතැන රැඳිලා හිටියා. හැබැයි, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනාවාම ඒක ඉදිරිපත් කරලා ඕනෑ නම්, මේ සභාව ඇතුළේ ඉන්නත් පුළුවන්. එහෙම නැත්නම් පුස්තකාලයේ ඉන්නත් පුළුවන්. එහෙමත් නැත්නම් committee එකකට යන්නත් පුළුවන්. එහෙම ගියා කියලා, මෙතැන නැති වුණා කියලා, ඇමතිවරයා කථා කරන කොට ඇමතිගේ පම්පෝරිය අහන්න අපි මෙතැන ඉන්න ඕනෑද? එහෙම වුවමනාවක් නැහැ. ඒකවත් දන්නේ නැති, ඒ තරම් උද්දාමයට පත් වෙච්ච, උමතු වෙච්ච කට්ටියක්. බලයෙන් පිම්බිලා ඉන්නේ. එහෙම කට්ටියක් තමයි අද මේ විවිධ උත්සාහ දරන්නේ. ඔබතුමන්ලාට කර ගන්න බැහැ. ඒ නිසා මුට්ටිය දමලා බලනවා. ඔබතුමන්ලා මුට්ටිය දාලා බලන්න හැදුවාට, මුට්ටිය දානකොටම කුඩු පට්ටම් වෙන්න ගහන්න මේ රටේ ජනතාව සූදානම් කියන එක අපට පෙනෙනවා. ඒ නිසා කොමිෂන් සභාවලට පත් වෙච්ච නිලධාරින්ට අප නැවත නැවතත් කියන්නේ මේකයි. මේ රටේ ස්වාධීන කොමිෂන් සභාවකට කවුරු හරි නිලධාරියෙකු පත් වුණා නම්, ඔබට කොන්ද කෙළින් තියාගෙන, දෙපයින් හිටගෙන මේ රටේ ලක්ෂ 220ක් වෙච්ච ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය තහවුරු කරන්න ශක්තියක් නැත්නම් කරුණාකර ඒවායෙන් ඉල්ලා අස් වෙලා යන්න. ඒ මිස ස්වාධීන කොමිෂන් සභාවලට දීපු බලතල එක එකාගේ දේශපාලන අයිතීන් වෙනුවෙන් පාවා දෙන්න සූදානම් වෙන්න එපා. ඒ කාරණයත් මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අග්‍රාමාත්‍යතුමිය.

[අ.භා. 5.16]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

දැන් විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කළ දේවල් ඇහුවාම ඇත්තටම අපි නම් බෙහෙවින් සතුටු වෙනවා. මොකද දන්නවාද? අපි කාලයක් තිස්සේ,- *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, යන්න එපා. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා ඉන්න. පොඩ්ඩක් ඉන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්න. මේක අහගෙන යන්න.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
අපේ දේශපාලන ගමන තුළ, දේශපාලන ව්‍යාපාරය තුළ ස්වාධීන කොමිෂන් සභා වෙනුවෙන් අපි තනිවම අරගළ කළා. අපි තනිවම ඒ වෙනුවෙන් පෙනී සිටියා. බලයේ නොසිටි කාලයේත් අපි ඒ වෙනුවෙන් පෙනී සිටියා. අපට දැන් විපක්ෂයකුත් ඉන්නවා ස්වාධීන කොමිෂන් සභා වෙනුවෙන් පෙනී සිටින. ඉතින් ඒක ගැන අපි බෙහෙවින් සතුටු වෙනවා. *[බාධා කිරීමක්]* නැහැ, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි. When the Eighteenth Amendment to the Constitution was taken up and these Independent Commissions were to be removed, you were very conveniently absent. So, you did not defend it.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන කොට ඔබතුමා සිටියා නේ.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
On the day the Eighteenth Amendment to the Constitution was brought in to take away the Independent Commissions, you were absent. - *[Interruption.]* Maybe, let us hope so.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට දවස් දෙකකට ඉස්සර වෙලාද කොහේදෝ අපි දැක්කා, මෙතැන විශාල ශබ්දයක් කරලා, අපේ විපක්ෂය මේ යෝජනාව පිළිබඳ ඉල්ලීම කළා. අපි විපක්ෂයට ගරු කරනවා. මොකද, පාර්ලිමේන්තු සම්ප්‍රදාය තුළ විපක්ෂය අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරනවා. විපක්ෂය යම්කිසි මාතෘකාවක් මතු කළාම අප ඒක ඉතාම බැරෑරුම් ලෙස ගන්නා නිසා තමයි අපට අමාත්‍යාංශවල වැඩ තිබියදීත් අපේ ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන් ඇතුළු කිහිප දෙනෙක්ම මේ වෙලාවේ මේ සභාවේ රැඳී ඉන්නේ. විපක්ෂයෙන් වැදගත් යෝජනාවක් ගෙනාවාම අපි ඒකට ගරු කරලා ඒ වෙනුවෙන් අදහස් දක්වන්න මෙහි රැඳී සිටිනවා. එදා විශාල ශබ්දයක් කරලා, මන්ත්‍රීවරුන් 20දෙනෙකු නැඟිටලා මේ යෝජනාව පිළිබඳ කාරණය ඉදිරිපත් කළාම ආණ්ඩුව හැටියට අපි ඒකට එකඟ වුණා. ඒ විවාදයට වෙලාවක් දෙන්න අපි එකඟ වුණා. නමුත්, ඒ මන්ත්‍රීවරුන් 20දෙනාගෙන් දැන් ඉතිරි වෙලා ඉන්නේ ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා විතරයි. Hon. Sujeewa Senasinghe, we would have taken you all and the intent of this Debate far more seriously, had there been, at least, one or two of those Hon. Members with you to support. Unfortunately, that is not happening. That is what is very clear.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Please take my time and answer because I have plenty of time to answer since you have no one to speak on your behalf. එතුමාට වෙලාව දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
අග්‍රාමාත්‍යතුමියගේ වෙලාවෙන් දෙන්නම් ලු.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Thank you, Hon. Prime Minister. I am more than capable of listening to you by myself and holding the fort for the Opposition.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
I am sure you have the capacity to do that on your own, but I think -

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඒ වාගේම, තවත් පොඩි කාරණාවක් කියන්න තිබෙනවා. ගරු සභානායකතුමාගේ පුටුවේ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු වාඩි වෙලා ඉන්නවා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
හරි, හරි. ඒක අපි බලාගන්නම්.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ඒක අපි බලාගන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව මේ යෝජනාව වෙනුවෙන් අදාළ බැරෑරුම්කමින්, වැදගත්කමින් තමයි අප පෙනී සිටින්නේ. විපක්ෂය එසේ කටයුතු නොකරන එක ගැන අපි කනගාටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන කථා කරපු විධියට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වන කිසි දෙයක් වෙලා නැහැ කියන එක ඉතාම පැහැදිලියි. පොලිස් කොමිසම සම්බන්ධවත් එහෙමයි. මෙතැනදී උදාහරණ අරගෙන පෙන්වා තිබෙනවා. Police Commission එකට බලය තිබෙනවා to delegate its authority to the IGP. ඒක ව්‍යවස්ථානුකූලයි. එහි කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒ කාරණය අල්ලාගෙන තේ විපක්ෂය මේ කාරණය දැන් මතු කරන්නේ, මේ තුළින් පොලිස් කොමිසමට තිබෙන බලතල දුර්වල කරනවා කියලා. නමුත්, ඒ පත්වීම් කරන්නත්, ඒ ස්ථාන මාරු කරන්නත්,- ඇත්තටම මෙතැන බලය දීලා තිබෙන්නේ ස්ථාන මාරු කිරීම් කරන්නයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතකොට ඒක කළ යුත්තේත් පොලිස් කොමිසමෙන්ම දෙන guidelinesවලට අනුව. ඊට එහා යන්න විධියක් නැහැ. ඒ වාගේම තමයි, ඒ කරන ස්ථාන මාරු, ඒ ගන්නා තීරණ, IGP ගන්නා තීරණ ඒ මාර්ගෝපදේශවලට විරුද්ධ නම් appeal කරන්නත් ඒ හා සමාන අවස්ථා 3ක් තිබෙනවා. පොලිස් කොමිසමටම නැවත වතාවක් appeal කරන්න පුළුවන්. ඒක එකක්. එහෙම නැත්නම්, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයට appeal කරන්න පුළුවන්. එහෙමත් නැත්නම්, FR එකක් දමන්නත් පුළුවන්. ඉතින්, මේ තුළින් කාගේවත්, කොතැනකවත් අයිතිවාසිකමක් දුර්වල වීම හෝ උල්ලංඝනය වීම හෝ වෙන්නේ නැහැ. IGPට තනි මතයට හැසිරෙන්න බලයක් නැහැ. මුලින්ම ඔහු ක්‍රියා කළ යුත්තේ පොලිස් කොමිසම විසින්ම පනවනු ලබන guidelines අනුව. ඒ guidelinesවලට අනුව හරියට ක්‍රියාත්මක වුණේ නැහැ කියලා කාට හෝ හිතෙනවා නම්, ඒකට එරෙහිව appeal කිරීමේ හැකියාව තිබෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Yes, Hon. Sujeewa Senasinghe, please speak.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Thank you very much.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමාට මේ සටන තනිවම ගෙන යන්න සිදුවී තිබෙන නිසා කාලය ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
I am more than capable of handling it. Thank you very much.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ඔබතුමා තනිවම කරන සටන අපි අගය කරනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු අගමැතිතුමියනි, මම ඔබතුමියගේ අවධානය යොමු කරවනවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් පරිදි මේ කොමිෂන් සභාවේ බලතල කෙරෙහි. එහි 155උ. (1) (අ) සහ 155උ.(2) ඇතුළු ඊට සමගාමීව සඳහන් ව්‍යවස්ථාවල ඉතාම පැහැදිලිව මෙසේ සඳහන් වෙනවා.

"පොලිස්පතිවරයා පත් කිරීම හැර, පොලිස් නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, සේවයෙන් පහ කිරීමේ, විනය පාලනය කිරීමේ කටයුතු සහ; පොලිස් නිලධරයකුට හෝ පොලිස් සේවයට එරෙහිව මහ ජනතාවගෙන් ලැබෙන පැමිණිලි බාර ගැනීම ඇතුළු මේ සියලු කාරණාත්, ඒ වාගේම පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් වූ සියලු කාරණා සඳහා කටයුතු සැලසීමට ද මේ කොමිෂන් සභාවට බලය පැවරිලා තිබෙනවා."

ගරු අගමැතිතුමියනි, අපි කියන්නේ මේකයි. අපි සියලුදෙනාම සටන් කරලා ඒ ලබා දුන්නු බලය සහිත ස්වාධීන කොමිෂන් සභාව නරකයි කියලා කවුරුවත් කියන්නේ නැහැ නේ. ඇයි ඒක ආපසු,-

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ඔබතුමන්ලාගේ දේශපාලන සම්ප්‍රදාය තුළ නම් ඒවාට විරුද්ධ වුණා. ඒ නිසාම තමයි ඒකට සටන් කරලා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන්න පුළුවන් වුණේ. කමක් නැහැ. හරි, දැන් අපි සියලුදෙනාම එකඟයි නේ. දැන් අපි සියලුදෙනාම ස්වාධීන කොමිෂන් සභාවලට එකඟයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියැවුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ. (1) (අ) ව්‍යවස්ථාවට අදාළ කරුණු නේ. ඔබතුමා 155ඌ. (2) ව්‍යවස්ථාව ටිකක් කියවන්න. එහි මෙසේ සඳහන්ව තිබෙනවා.

"එවැනි යම් බලතල පැවරීමක් කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය."

හරිද? ඒ කියන්නේ බලය පැවරීම, delegating authority is also allowed. This is not the first time this has happened. This had happened before also. The Commission has the power to delegate certain authorities and to provide guidelines on how that authority is delegated.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු අගමැතිතුමියනි,-

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳ ප්‍රශ්නයකුත් අපට තිබෙනවා. එම නිසා ඉක්මනින් කියන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු අගමැතිතුමියනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. Legally, it can be done; morally, considering the situation, it cannot be done. That is what we are saying.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
හරි, thank you very much. දැන් අපි,-

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
In an emergency situation, it is allowed, but there is no emergency here. We are not disputing the law.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
You are making a moral point, is it? Very good. We are very pleased about that.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Yes, a moral point and why the Commission had been established. The purpose of establishing the independent National Police Commission is not to delegate power back to the IGP. That should not be done. So, why are you all doing it?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
I would then suggest, Hon. Member, that it would have been far more useful had the Opposition brought in a Motion to amend that constitutional provision which delegates authority. If you think that that is the problem, that the Commission should not delegate its power, why do you not bring in a Motion to amend the Constitution so that that cannot happen?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
Still, that is the law.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Yes.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Can I have the mike, please?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට mike එක දෙන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
That provision is for an urgency, Hon. Prime Minister, not for you to do it *ad hocly*. If there is any situation where that power should be delegated, it can be delegated. You all have not given us good reasons as to why it has been delegated now. So, please tell us why it has been delegated? Since the Commission had been established for a certain purpose, why it is delegated back to the IGP? There is no necessity at all.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම අපි මේ වෙලාවේ රටේ පොලීසිය කරන කාර්යභාරය ගැනත් හොඳින් තේරුම් ගනිමු. මේ වෙලාවේ අපි ඇත්ත වශයෙන්ම පොලීසියට ස්තුතිවන්ත විය යුතුයි. මොකද, ඔවුන් මේ වෙලාවේ මත්ද්‍රව්‍යවලට එරෙහිව කරන වැඩ කටයුතු, ඒවාට එරෙහිව කරන විමර්ශන, වැටලීම් කියන මේ සියල්ල අතිශයින්ම වැදගත්. ඒ වාගේම අපි හොඳින් දන්නවා, මේ මත්ද්‍රව්‍ය සමඟ අපේ රටට එන්නේ මත්ද්‍රව්‍ය පමණක් නොවෙයි කියලා. මේවා අපේ රටේ පාතාලය එක්කත් සම්බන්ධයි. පාතාලය එක්ක සම්බන්ධයි විතරක් නොවෙයි, ඒ මත්ද්‍රව්‍ය ව්‍යාපාර දේශපාලනය එක්කත් සම්බන්ධයි කියන එක මේ වෙනකොට අපි සියලුදෙනා හොඳින් දන්නවා. මෙන්න මේක අපි කඩන්න ඕනෑ. මත්ද්‍රව්‍යත්, පාතාල ලෝකයත්, දේශපාලනයත් අතර තිබෙන සම්බන්ධතාව, ඒ network එක කඩන එක තමයි මේ වෙලාවේ අපට කරන්න පුළුවන් ලොකුම වැඩේ. ප්‍රමුඛතාවක් අරගෙන අපි කළ යුතු දේ ඒකයි. අපේ තරුණ පරපුර, අපේ දරුවන් බේරා ගන්න නම්, අපේ ගෙවල්වල සිදුවන හිංසන වළක්වා ගන්න නම්, අපේ සමාජ අර්බුදය වළක්වා ගන්න නම් මෙන්න මේ තුන අතර තිබෙන සම්බන්ධය, ඒ network එක අපි කඩන්නම ඕනෑ. අන්න ඒක වෙනුවෙන් තමයි මේ වෙලාවේ පොලීසිය මැදිහත් වෙන්නේ. මේ වෙලාවේ පොලීසිය ඒකට මැදිහත් වන විධියට, ඒ වේගයට, ඒ කාර්යක්ෂමතාවට පොලිස් කොමිසමත් ඒ හා සමානව වැඩ කරන්න ඕනෑ. OIC කෙනෙක් පත් කිරීමේ බලය පමණයි National Police Commission එක මේ වෙලාවේ පොලීසියේ IGPට delegate කරලා තිබෙන්නේ.

මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හොඳින් දන්නවා, මේ ත්‍රිත්වයට එරෙහිව කරන මේ සටනේදී ඇතුළේ අයත් මේකට සම්බන්ධයි කියලා. අපි කැමති වුණත්, නැති වුණත් මේවාට පොලීසියේ සම්බන්ධතා තිබෙනවා, බන්ධනාගාරයේ සම්බන්ධතා තිබෙනවා, අධිකරණයේ සම්බන්ධතා තිබෙනවා. මේ වෙනකොටත් පොලීසියේ අපි-

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Let me finish my thought. Then, you can have my time again.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවෙත් පොලීසියේ කීපදෙනෙක්, 400කට කිට්ටු ප්‍රමාණයක් interdict කරලා ඉන්නේ, මේ විධියට එක එක දේවල්වලට තමන්ගේ බලය අවභාවිත කිරීම නිසා. 2,000කට එහා පිරිසකට charge sheets දීලා තිබෙනවා. හමුදාවේ කට්ටියත් මේකට සම්බන්ධයි. මෙවැනි තත්ත්වයක් තුළ ඇත්ත වශයෙන්ම අපට ඇතුළත් සුද්ධ කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඇතුළ සුද්ධ කරනකොට තමන් භාරයේ ඉන්න පොලීසියේ කණ්ඩායම ගැන හොඳම ඇගැයීමක් තිබෙන්නේ කාටද? IGPට. පොලිස්පතිට පුළුවන් වෙන්න ඕනෑ, charge sheets නැති, දක්ෂ, ඉක්මනින් වැඩ කරන්න පුළුවන්, පිරිසිදු අය, ඔහුට විශ්වාස අය මේ වෙලාවේ මේ වෙනුවෙන් පත් කරන්න. මම හිතන්නේ ඒක හොඳ දෙයක්. එහෙම නැතුව දේශපාලනඥයකුගේ කැමැත්තට කවුරුවත් මාරු කරන එක නොවෙයි කළ යුත්තේ. IGP මේ වෙලාවේ මේ කරන මෙහෙයුමට උපකාරයක් හැටියටයි මේක වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැවතත් එතුමාට කාලය ලබා දෙන්න, එතුමා තනියෙන් කරන සටනට අපි වටිනාකම දෙන නිසා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
තනි සටනට ජය වේවා!

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු අගමැතිතුමියනි, බොහොම ස්තුතියි.

මීට වැඩිය ව්‍යසන අවස්ථා මේ රටේ තිබිලා තිබෙනවා. මේ පනත් ගෙනෙනකොට ඔබතුමියලා, අපි සටන් කරනකොට 1990 ඉඳලාම මීට වැඩිය ත්‍රස්තවාදය වැනි අවස්ථා තිබිලා තිබෙනවා. ඔබතුමිය කියන විධියට පොලිස් කොමිසමේ ඉන්න ඒ.එම්. ලලිත්, කේ. කරුණාහරන් මහත්මයා, දිල්ෂාන් ජයසූරිය මහත්මයා, ඒ.ඒ.එම්. ඉල්ලියාස් මහත්මයා, ජයන්ත ජයසිංහ මහත්මයා, තනූජා ප්‍රනාන්දු මහත්මිය යන මේ අයට ඒ හැකියාව නැද්ද? ඔබතුමිය කියන ඉල්ලීම් කළොත් පොලිස් කොමිසමේ-

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
මම ඒක කියන්නේ නැහැ කිසිසේත්ම, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම නොවෙයි ඒක කියලා තිබෙන්නේ. අපි කවුරුවත් ඒ ගැසට් එක ගහලා නැහැ. National Police Commission එකයි ඒක තීරණය කරලා තිබෙන්නේ. අපි කිසිසේත්ම කියලා නැහැ, ඒ ගොල්ලන්ට ඒ හැකියාව නැහැ කියලා. ඔවුන් ගත්ත තීරණයක් තමයි, ඔවුන්ට තිබෙන බලය delegate කරන එක. ඔවුන්ට කාර්යක්ෂමතාවක් නැහැ, හැකියාවක් නැහැ කියලා අපි කියලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න. මේ තනි සටන කරන සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාට මගේ කාලයෙන් වෙලාව දුන්න නිසා මටත් තව වුට්ටක් වැඩිපුර වෙලාව දෙන්න, මගේ අදහස කියලා ඉවර කරන්න.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක අපි කවුරුවත් කියපු දෙයක් නොවෙයි. ඒක පොලිස් කොමිසම තීරණය කරපු දෙයක්. අපි හිතනවා, මේ වෙලාවේ පොලිස් කොමිසම මේ කරන්නේ පොලීසිය තවත් ශක්තිමත් කරන්න, දිරිගන්වන්න, IGPට ස්වාධීනව වැඩ කරන්න බලය ලබාදීමක් මිස, දේශපාලන අධිකාරියට ඕනෑ ඕනෑ විධියට පොලීසියට නටන්න ඉඩ දෙන එක නොවෙයි කියලා. අපි ඇත්තටම පොලිස් කොමිසමට ඒ විශ්වාසය, ගරුත්වය දෙනවා. දේශපාලන අධිකාරිය මේ ක්‍රියාව අවභාවිත කරනවා කියලා හිතනවා නම්, පොලිස් කොමිසමට ඕනෑ වෙලාවක මේ බලය නැවත පවරා ගන්නත් පුළුවන්. නැද්ද, ගරු නියෝජ්‍ය ඇමතිතුමා? පුළුවන්.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
පුළුවන්.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

පුළුවන්. ඒ විශ්වාසය අපට තිබෙනවා මේ පොලිස් කොමිසම ගැන. ඒ නිසා අපට මේක ප්‍රශ්නයක් නොවෙයි. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, මම දන්නේ නැහැ ඒක ඔබතුමාට ප්‍රශ්නයක්ද කියලා. නමුත් මේ වැටලීම්, මේ විමර්ශන එන්න එන්න තමන්ට කිට්ටු වෙනකොට සමහරු කලබල වෙනවා. ඒ කලබලයත් එක්ක වැරදි තැනින් මේක අල්ලා ගන්නවා. ඇත්තටම මේ කොමිෂන් සභාවල ස්වාධීනත්වය ගැන කැක්කුමක් තිබෙනවා නම් මම යෝජනා කරන්නේ, මේ කොමිෂන් සභා ශක්තිමත් කරන්න ගන්න ඕනෑ පියවර ගැන අපි කථා කරමු කියලායි. ඒ වෙනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වෙනස් වෙන්න ඕනෑ දේවල් ගැන යෝජනා ඉදිරිපත් කරන්න. නමුත් මේ තැනින් තැන අල්ලාගෙන - ඊයේත් ඒක නේ වුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ ප්‍රතිපත්තිවලට අනුව නොවෙයි අපි ක්‍රියාත්මක වෙන්නේ කියලා ලොකු යෝජනාවක් ගෙනැල්ලා ඊයේ මොකක්ද වුණේ? අපේ මැති ඇමතිවරුන්ට අවස්ථාවක් දුන්නා, අපට හොඳ platform එකක් හදලා දුන්නා, අපි මේ මාස 10ට කරපු වැඩ ටික මොනවාද කියලා කියාගන්න. ඒකටත් අපි ස්තුතිවන්ත වෙනවා. අපි මේ අවස්ථාවේත් විශේෂයෙන්ම ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ ස්වාධීන කොමිෂන් සභා වෙනුවෙන් මේ platform එක හදලා දීම පිළිබඳවත්, ඔබතුමා තනියෙන් මේ සටන කිරීම පිළිබඳවත්.

අපට ඉතාම සන්තෝෂයි. අද විපක්ෂයත් ආණ්ඩුවත් එකම තැනකට ඇවිල්ලා තිබෙනවා, මේ කොමිෂන් සභාවේ ස්වාධීනත්වය රැක ගන්න ඕනෑ කියලා. ඒ වෙනුවෙන් අපි සියලුදෙනාට එකතු වෙලා වැඩ කරන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඡන්දය ගන්න වෙලාවේ ඔබතුමා සිටියේ නැතත්, - රට ගිහිල්ලා හිටියාද දන්නේ නැහැ - ඉදිරියේදී අපි කොමිෂන් සභා ශක්තිමත් කරන්න ගන්න පියවරවලදී ඔබතුමා තනි සටනක් කරයි කියලා අපට විශ්වාසයි.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ. භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2025 ඔක්තෝබර් 21 වන අඟහරුවාද පූ. භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி. ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2025 ஒக்ரோபர் 21, செவ்வாய்க்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m.., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 9.30 a.m. on Tuesday, 21st of October, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.